# ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්ම
# ගාල්ල මහා නගර සභාව, ශ්‍රී ලංකාව (2024 - 2030)



ඉදිරිපත් කළ දිනය: 2023 නොවැම්බර්

මෙය "ටෙට්රා ටෙක්", ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද නියෝජිත ආයතනය (USAID) විසින් (පිවිතුරු නගර නීල සාගර වැඩසටහන යටතේ සමාලෝචනය සඳහා ප්‍රකාශනය කරන ලදී.

පිවිතුරු ගාලු නගරයක් සඳහා වන සහයෝගීතා ව්‍යාපෘතිය

ගිවිසුම් අංකය ( **AID-OAA-1-14-00059/7200AA19F00016**
ගිවිසුම් කාලය ( 2019 අගෝස්තු 29 සිට 2024 අගෝස්තු 27 දක්වා
ගිවිසුම් නියෝජිතඃ ක්ලෙයාර් රොමානික්

**මෙම වාර්තාව සකසන ලද්දේඃ**

HELP-O

දුරකථන අංකය : +94 912230818
විද්‍යුත් තැපැල් ලිපිනය : info@helpo-srilanka.org

"ටෙට්රා ටෙක්" සම්බන්ධීකරණ තොරතුරුඃ

ජොන් ඇන්ජින්, අංශ ප්‍රධානී
විද්‍යුත් තැපැල් ලිපිනය: Jon.Angin@cleancitiesblueocean.org

ග්‍රෙබ්රියෙල් ජොන්සන්, ව්‍යාපෘති කළමනාකරු
විද්‍යුත් තැපැල් ලිපිනය : Gabrielle.Johnson@cleancitiesblueocean.org

මෙය "ටෙට්රා ටෙක්", ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද නියෝජිත ආයතනය (USAID) විසින් (පිවිතුරු නගර නීල සාගර වැඩසටහන යටතේ USAID ගිවිසුම් අංක AID-OAA-I-14-00059/7200AA19F00016 මගින්) සමාලෝචනය සඳහා ප්‍රකාශනය කරන ලදි.

## වියාචනය

මෙය ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද නියෝජිත ආයතනය (USAID) හරහා ඇමරිකානු ජනතාවගේ සහයෝගය මගින් ප්‍රකාශනයට පත් කරන ලදි. මෙහි අන්තර්ගතය "ටෙට්‍රා ටෙක්"හි වගකීම වන අතර එම අන්තර්ගතයෙන් ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද නියෝජිත ආයතනයේ (USAID) හෝ එක්සත් ජනපද රජයේ අදහස් පිළිබිඹු කිරීමක් ඉඳුරා ම සිදු නොවේ.

# කෘතඥතාව

"පිවිතුරු ගාල්ල නගරයක් සඳහා වන සහයෝගිතා ව්‍යාපෘතිය (CACG) " යටතේ ඒකාබද්ධ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්ම (ISWMAP) ක්‍රියාත්මක කිරීම දුෂ්කර කාර්යයක් වූ අතර USAID විසින් අපට ලබා දුන් මූල්‍ය හා තාක්ෂණික සහාය නොමැතිව එය කළ නොහැකි වනු ඇත. එබැවින්, ශ්‍රී ලංකා සහ මාලදිවයිනේ USAID-CCBO කණ්ඩායමට, දේශීය අධ්‍යක්ෂ නිලංක විජයනායක මහත්මිය, ප්‍රදාන විශේෂඥ රොෂාන් දැලබණ්ඩාර මහතා, , ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ විශේෂඥ යූ.ජී. ඒකනායක මහතා, ධාරිතා සංවර්ධන සහ පාලන කළමනාකරු රාජා ෂන්මුගරාජා මහතා, අධීක්ෂණ, ඇගයීම් සහ ඉගෙනුම් විශේෂඥ කලණි රණසිංහ මෙනවිය, මූල්‍ය සහ පරිපාලන කළමනාකරු ලෝගරාමනන් තිල්ලින්දරාසා මහතාට ස්තුති වන්ත වෙමි.

ගාල්ල මහ නගර සභාවේ හිටපු නගරාධිපති ප්‍රියන්ත ජී සහබන්දු මහතා, නියෝජ්‍ය නගරාධිපති ෆවුසුල් නියාස් මහතා ඇතුළු සියලුම සභා මන්ත්‍රීවරුන්ට ගාල්ලේ CACG ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා අපට ලබාදුන් ඉමහත් සහයෝගයට මාගේ විශේෂ ස්තුතිය පුදකර සිටිමි.

එමෙන්ම නාගරික කොමසාරිස් තුෂාර රස්නායක මහත්මිය, නියෝජ්‍ය නාගරික කොමසාරිස් දිලිනි සුමාලි මහත්මිය, ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෛද්‍ය සී.ඩී පතිරගේ මහතා, ප්‍රධාන ප්‍රජා සංවර්ධන නිලධාරී සව්මාර් ආදිලි මහතා, සහකාර ඉංජිනේරු සුජීව පෙතන්ගොඩ මහතා ඇතුලු ගාල්ල මහ නගර සභාවේ අනෙකුත් සියලුම ජ්‍යෙෂ්ඨ සහ කනිෂ්ඨ කාර්ය මණ්ඩලය ද මෙම ඇගයීම සාර්ථකව නිම කිරීම සඳහා ඔවුන්ගේ වටිනා දායකත්වය අප වෙත ලබා දුන් අතර ඒ සඳහා මාගේ විශේෂ ස්තුතිය පුද කරමි.

තවද, අපගේම HELP-O ව්‍යාපෘති කණ්ඩායම, අධීක්ෂණ, ඇගයීම් සහ ඉගෙනුම් උපදේශක ආචාර්ය රෝහණ රත්නායක මහතා , ඝන අපද්‍රව්‍ය කළමනාකරණ විශේෂඥ පද්මසිරි මුණමලේ මහතා, ව්‍යාපෘති කළමනාකාර එම්.එස් දේශප්‍රිය මහතා, ආයතන සම්බන්ධීකාරක ලසිත උදය කුමාර මහතා, ප්‍රජා සම්බන්ධීකාරක චතුර රාජිත මහතා, හිටපු ප්‍රජා සම්බන්ධීකාරක බුද්ධික සෝමරත්න මහතා, ව්‍යාපෘති නිලධාරී යසිතා ඉරේෂා මෙනවිය , ව්‍යාපෘති නිලධාරී සුපුන් සුරංජිත් මහතා, හිටපු ව්‍යාපෘති නිලධාරී ලහිරු මධුරංග උඩුමලගල මහතා, හිටපු ව්‍යාපෘති නිලධාරිනී තක්ෂලා විතාරණගේ මහත්මිය, හිටපු ව්‍යාපෘති නිලධාරිනී හංසි සඳු තාරකා මෙනවිය, හිටපු ව්‍යාපෘති නිලධාරිනී දිල්ෂානි දිනුෂිකා මහත්මිය, තොරතුරු තාක්ෂණ නිලධාරී චමෝත් ටෙරාන් මහතා, ප්‍රධාන ගණකාධිකාරී ගුණතිලක පනාම්බලාන මහතා සහ හිටපු ගණකාධිකාරී චන්දි දේවකී මෙනවිය විසින් ඔවුන්ගෙන් ලද විශිෂ්ට සහයෝගයට නැවත මා බෙහෙවින් කෘතඥ වෙමි.

චතුර වැලිවිටිය,
CEO HELP-O

# කාර්ය සාරාංශය

මෙම ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්ම (ISWMAP), HELP-O (මානව හා පරිසර සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීමේ සංවිධානය) විසින් ගාල්ල මහා නගර සභාව (GMC) වෙනුවෙන්, "පිවිතුරු ගාල්ල නගරයක් සඳහා වන සහයෝගිතා ව්‍යාපෘතිය (CACG)" එනම්, ටෙට්‍රා ටෙක් (Tetra Tech) විසින් ක්‍රියාත්මක කරනු ලබන USAID (ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද නියෝජිතායතන) පිවිතුරු නගර, නීල සාගර (CCBO) ප්‍රමුඛ වැඩසටහනෙහි මූල්‍ය හා තාක්ෂණික සහාය ඇතිව HELP-O සහ ගාල්ල මහා නගර සභාව විසින් සහයෝගයෙන් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතිය යටතේ සකස් කරන ලදි.

ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ පරමාර්ථය වනුයේ, සියලුම ගෘහස්ථ, කාර්මික, වාණිජ හා සේවා අංශවලින් ජනනය වන වඩාත්ම බලපෑම්කාරී ඝන අපද්‍රව්‍ය ආවරණය වන පරිදි නිශ්චිත ඉලක්ක, අරමුණු, උපායමාර්ග, ක්‍රියාමාර්ග, වැදගත් අදියර සහ කාර්ය හා කර්තව්‍ය දක්වමින් ගාල්ල මහා නගර සභාව සඳහා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ තනි ක්‍රියාකාරී සැලැස්මක් ලබා ගැනීමයි. ඵලදායී 3R පාදක (අඩු කිරීම, නැවත භාවිත කිරීම, ප්‍රතිචක්‍රීකරණය) ඝන අපද්‍රව්‍ය කළමනාකරණයක් සඳහා ශක්‍ය හා දැනුමැති මහා නගර සභාවක් ඇති කිරීම, නගර ව්‍යාප්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා දැනුම හා කැපවීම ඇති පාර්ශ්වකරුවන්ගේ කණ්ඩායමක සහයෝගී සහාය සහතික කිරීම, සහ අවසන දී, පුනරාවෘත්තීය, නිර්මාණශීලී හා නව්‍ය ඝන අපද්‍රව්‍ය කළමනාකරණ විසඳුම් සහිතව ගාල්ල නගරය ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනයන්ට සහ ලොව පුරා, ආදර්ශ නගරයක් බවට පත් කිරීම උදෙසා නාගරික ඝන අපද්‍රව්‍ය සම්බන්ධයෙන් ප්‍රශස්ත හා තිරසර විසඳුමක් වෙනුවෙන් ක්‍රියාමාර්ග ගනු ලබන බව මෙම ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්ම මගින් තහවුරු කෙරේ. මීට අමතරව, මෙම සැලැස්ම හුදු චක්‍රීය ආර්ථික මූලධර්ම සහතික කිරීම සඳහා නව්‍ය ප්‍රවේශයන් වෙත යොමුව කසළ ජනනය හැසිරවීමේ වර්තමාන ගාල්ල මහා නගර සභා භාවිතාවෙන් ඔබ්බට යන පියවරකි.

අනෙකුත් නගරවලට සමානව, ගෘහස්ථ, වාණිජ, කාර්මික සහ සේවා අංශ ගාල්ල මහා නගර සභාව ප්‍රදේශය තුළ විශාල කසළ ප්‍රමාණයක් ජනනය කරන අතර එමගින් සැලකිය යුතු මට්ටමක සෞඛ්‍ය හා පාරිසරික ගැටලු පැන නැගේ. මෙය 2022 නොවැම්බර් සහ 2023 පෙබරවාරි අතර CCBO සහාය යටතේ HELP-O විසින් පවත්වන ලද මූලික කසළ තක්සේරු සමීක්ෂණය (BWAS) සහ කසළ විගණනය සහ අනුලක්ෂණ අධ්‍යයනයට (WACS) පෙර කිසිවෙකු විසින් අධ්‍යයනය කර හෝ තක්සේරු කර නොමැත. ගාල්ල මහා නගර සභා ප්‍රදේශයේ ජනනය වන කසළවලින් දළ වශයෙන් තුනෙන් එකක් (31.43%) ගාල්ල මහා නගර සභාව විසින් එකතු කරනු ලබන බවත්, ඉතිරි කසළ ප්‍රමාණය අවිධිමත් ක්‍රම මගින් එකතු කරනු ලැබීම හෝ පිළිස්සීම, වළ දැමීම හෝ ඉවතලීම මගින්, සෞඛ්‍ය හා පාරිසරික ගැටලු ඇති කරමින් පරිසරයට බැහැර කෙරෙන බව ඉහත අධ්‍යයන දෙක මගින් අනාවරණය කරන ලදි.

ඉහත අධ්‍යයනයන්ට අනුව, ගෘහස්ථ, වාණිජ, කර්මාන්ත සහ සේවා අංශ එක්ව ගත් කල වාර්ෂිකව දළ වශයෙන් කසළ මෙ.ටොන් 24,958.7ක් ජනනය කරන බව අනාවරණය විය. මෙයින් ගාල්ල මහා නගර සභාව විසින් කසළ මෙ.ටොන් 7,840.2ක් (31.43%) ස්වකීය පවතින සම්පත් උපයෝජනය කර ගනිමින් එකතු කරනු ලැබේ. මීට අමතරව, ගාල්ල මහා නගර සභා ප්‍රදේශයෙහි සැලකිය යුතු ලෙස කසළ ජනනය වන විශේෂිත ස්ථාන (hotspots) කිහිපයක් (උ.දා:- රෝහල්, පාසල්, සංචාරක හෝටල්, ආපනශාලා, ධීවර වරාය, බන්ධනාගාරය සහ නාවික හමුදා කඳවුර) පවතින අතර, එම ස්ථාන භාවිත කරන්නන්/ එම ස්ථානයන්හි සංචාරය කරන්නන් අධික වීම, ඉහළ ප්‍රමාණයෙන් කසළ ජනනය වීම සහ එම ස්ථානයන්හි කසළ විධිමත්ව කළමනාකරණය අපහසුතා පැවතීම හේතුවෙන් එම ස්ථාන කෙරෙහි විශේෂ අවධානයක් අවශ්‍ය වේ. තවද, මූලික කසළ තක්සේරු සමීක්ෂණයෙහි අනාවරණයන්ට අනුව, ඌන පහසුකම් සහිත ප්‍රජාවන් කිහිපයක් ද ඔවුන්ගේ කසළ කළමනාකරණය සම්බන්ධයෙන් ඒ

හා සමාන ගැටලුවලට මුහුණ දෙති. තවද, ගාල්ල මහා නගර සභාව කේන්ද්‍ර කර ගනිමින් සිදු කරන ලද විස්තීර්ණ සේවා පිරිවැය විශ්ලේෂණයෙහි දී (COSA) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා ගාල්ල මහා නගර සභාව විසින් මෙ.ටොන් එකකට රු. 21,359.00 (ඇ.ඩො. 67.81) වැය කරන බව අනාවරණය විය. ආදායම් විශ්ලේෂණට අනුව, ඝන අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් එකක ආදායම රු. 1365.64ක් බවත්, එය ඝන අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් එකක් කළමනාකරණය කිරීමේ දී දරනු ලබන පිරිවැයට වඩා සැලකිය යුතු ලෙස අඩු (රු. 19,993.00කින්) බවත් අනාවරණය විය. එබැවින්, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වසර ගණනාවක් පුරා ගාල්ල මහා නගර සභාවට සැලකිය යුතු සෞඛ්‍ය හා පාරිසරික ගැටලු ඇති කිරීම පමණක් නොව, ශ්‍රී ලංකාවේ අනෙකුත් පළාත් පාලන ආයතනවලට ද සමාන අත්දැකීම් විදහා දක්වමින් උග්‍ර මූල්‍ය භාරයක් බවට ද පත්ව ඇත.

මෙම ගැටලු විසඳීම සඳහා, ගාල්ල මහා නගර සභාව (සහ අනෙකුත් පළාත් පාලන ආයතන) 1947 අංක 29 දරන මහා නගර සභා ආඥාපනත, 01/2015 පළාත් සභා සහ පළාත් පාලන චක්‍රලේඛය, ජාතික පාරිසරික පනත අංක 1627/19-2009.11.10, දකුණු පළාත් සභාවේ සම්මත අතුරු ව්‍යවස්ථාව (අංක 1834 - 2013.10.25, අංක 1834 - 2013.10.27 යනාදිය යටතේ විවිධාකාර නෛතික විධිවිධාන අනුව ක්‍රියාකිරීමට කැප වී සිටියි. ඉහත සඳහන් පරිදි, විධිවිධාන 25ක් අතුරින් ගාල්ල මහා නගර සභාවෙහි අනුකූලතාව ගත් කල විධිවිධාන 03ක් සඳහා පූර්ණ අනුකූලතාවක් ද (12%), විධිවිධාන 12ක් සඳහා අර්ධ අනුකූලතාවක් ද (48%), විධිවිධාන 10ක් සඳහා අනුකූලතාව නොමැති වීමක් ද (40%) පවතින බව අනාවරණය වී ඇත. පරිසර අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය, සහ වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව වැනි විවිධ රාජ්‍ය ආයතනවලින් ද ගාල්ල මහා නගර සභාව වෙත ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා සහාය ලැබේ. මීට අමතරව, ඝන අපද්‍රව්‍ය කළමනාකරණයෙහිලා ගාල්ල මහා නගර සභාව සමග සහයෝගයෙන් වැඩ කිරීමට හැකියාව සහ උද්යෝගය ඇති බොහෝ පාර්ශ්වකරුවන් නගරයේ ද සිටිති. මෙම පාර්ශ්වකරුවන්ගෙන් සමහරෙක් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් ගත් කල, ඉතා වැදගත් වන අතර ඉන් සමහරෙක් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මැදිහත්වීමක් සම්බන්ධයෙන් ඉහළ බලපෑම් සහගත බවක් පෙන්නුම් කරති.

වත්මන, ගාල්ල මහා නගර සභාව එහි පවතින සම්පත් උපයෝජනය කර ගනිමින් ඉතා ප්‍රශංසනීය කසළ කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කරයි. ගාල්ල මහා නගර සභාව සතුව පරිපූර්ණ ඝන අපද්‍රව්‍ය එකතු කිරීමේ පද්ධතියක් පවතින අතර එහි දී විධිමත් රටාවකට අනුව, වෙන් කළ කසළ පමණක් එකතු කරනු ලැබේ. ගෘහස්ථ, වාණිජ, කර්මාන්ත සහ සේවා අංශ සඳහා පිළිවෙළින් ආයතන 81%, 85%, 64% සහ 78% ආවරණය වන පරිදි දොරින් දොරට ළඟා වී කසළ එකතු කිරීමේ සේවාව ක්‍රියාත්මක වේ. පොදු කසළ බැහැර කිරීමේ තැන් ද නියමිත ස්ථානවල සපයා ඇත (උදා: බස් පර්යන්ත, ගාලු කොටුව). ගාල්ල මහා නගර සභාව සතුව හීන්පැන්දලහි කසළ එකතු කිරීමේ මධ්‍යස්ථානයක් සහ කොම්පෝස්ට් අංගනයක් (Kawashima) සහ වියළි හා ප්‍රතිචක්‍රීකරණය කළ හැකි කසළ එකතු කිරීමේ, බේල් කිරීමේ සහ ගබඩා කිරීමේ පහසුකමක් දඩැල්ලෙහි (COWAM මධ්‍යස්ථානය) ඇත. මෙම පහසුකම් ද්විත්වයම පවතින්නේ ගාල්ල මහා නගර සභා ප්‍රදේශයෙහිම ය.
මීට අමතරව, USAID සහාය ඇතිව, ගාල්ල මහා නගර සභාව විසින් පුරවැසියන් සඳහා වඩාත් ඉහළ ගණයේ සේවාවක් සැපයීම සඳහා එහි ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය වැඩිදියුණු කිරීමට උත්සාහ කර ඇත. කසළ එකතු කිරීමේ ගමන් මාර්ග ප්‍රශස්තකරණය, ශ්‍රම බලකාය සඳහා පුහුණුව සහ දැනුවත්භාවය සහ හීන්පැන්දල ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වාහන ඇණිය සහ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම USAID සහාය ඇතිව ගාල්ල මහා නගර සභාව විසින් අත්පත් කර ගෙන ඇති එම වර්ධනයන්ගෙන් සමහරකි.

එම සියලු වැඩිදියුණු කිරීම් මධ්‍යයේ වුව ද, ගාල්ල මහා නගර සභාව තවමත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් බොහෝ අභියෝගවලට මුහුණ දෙයි. නිදසුනක් වශයෙන්, කසළ එකතු කිරීම සම්බන්ධයෙන් ගත් කල, ගාල්ල මහා නගර සභාව වෙත පිරියම් කිරීමට අපහසු, සැලකිය යුතු මිශ්‍ර කසළ ප්‍රමාණයක් තවමත් ලැබෙමින් පවතින බවත්, බොහෝ කසළ එක්රැස් කරන වාහන

ඉතා පරණ හෝ පාවිච්චි කළ නොහැකි තත්ත්වයේ පවතින බැවින් ඒවා ගර්හිත ලෙස සලකා අපහරණය කිරීම හෝ අලුත්වැඩියා කිරීම කළ යුතු බවත් අනාවරණය වී ඇත. එසේම, කසළ පිරියම් කිරීම සම්බන්ධයෙන් ගත් කල, බොහෝ පහසුකම් උපරිම ධාරිතාවෙන් ක්‍රියාත්මක නොවන අතර ඒවායෙහි සේවය කරන කම්කරුවන්ට, විශේෂයෙන් කාන්තා කම්කරුවන්ට අවශ්‍ය ප්‍රමාණවත් සනීපාරක්ෂක සහ වෙනත් පහසුකම් නොමැත. කසළ බැහැර කිරීම සම්බන්ධයෙන් ගත් කල, බාධාවන් සහ පරිසර දූෂණය සම්බන්ධයෙන් මහජන විරෝධතා සහ උත්සුකතා බහුල බැවින්, වඩාත් සනීපාරක්ෂක හා පරිසර හිතකාමී බැහැර කිරීමේ යාන්ත්‍රණයක් සහ කසළ බැහැර කිරීම සම්බන්ධයෙන් ප්‍රජා දුක්ගැනවිලි විමසීමට යාන්ත්‍රණයක් තිබිය යුතු ය. එලෙසම, ගාල්ල මහා නගර සභාව ඝන අපද්‍රව්‍ය කළමනාකරණයෙහිලා සාර්ථක වීමට නම්, ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලියේ බොහෝ අභියෝග විසඳිය යුතු ය.

ඒ අනුව, මෙම සැලැස්ම ගාල්ල මහා නගර සභාව ප්‍රදේශය තුළ සමස්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා රාමුවක් සපයයි. ලෝක උරුම භූමි භාගයක් (එනම් ගාලු කොටුව) ලෙස සහ ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ සංචාරක ගමනාන්තයක් වන්නා වූ නගරයක් ලෙස ගාල්ලේ වැදගත්කම සැලකිල්ලට ගනිමින්, මෙම සැලැස්මේ දැක්ම "ගාල්ලඃ ශ්‍රී ලංකාවේ පිවිතුරුම ගමනාන්තය" යනුවෙන් යොදා ඇත. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධ පහත දැක්වෙන මූලධර්ම මගින් මෙම දැක්ම මෙහෙයවනු ලැබේඃ එනම්, චක්‍රීය ආර්ථිකය, ජීවන චක්‍ර සලකා බැලීම්, 3R සංකල්පය (අඩු කිරීම, නැවත භාවිත කිරීම, ප්‍රතිචක්‍රීකරණය), දූෂකයා විසින් ගෙවනු ලැබීම, ප්‍රතිලාභියා විසින් ගෙවනු ලැබීම හා හානිපූරණය, වගකීම් බෙදාගැනීම සහ මහජන භාරය යන මූලධර්ම වේ. එළදායී 3R පාදක (අඩු කිරීම, නැවත භාවිත කිරීම, ප්‍රතිචක්‍රීකරණය) ඝන අපද්‍රව්‍ය කළමනාකරණයක් සඳහා ශක්‍ය හා දැනුමැති මහා නගර සභාවක් ඇති කිරීම, නගර ව්‍යාප්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා දැනුම හා කැපවීම ඇති පාර්ශ්වකරුවන්ගේ කණ්ඩායමක සහයෝගී සහාය සහතික කිරීම, සහ අවසන දී, පුනරාවෘත්තීය, නිර්මාණශීලී හා නව්‍ය ඝන අපද්‍රව්‍ය කළමනාකරණ විසඳුම් සහිතව ගාල්ල නගරය ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනයන්ට සහ ලොව පුරා, ආදර්ශ නගරයක් බවට පත් කිරීම උදෙසා නාගරික ඝන අපද්‍රව්‍ය සම්බන්ධයෙන් ප්‍රශස්ත හා තිරසර විසඳුමක් සහතික කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් ඉලක්ක 05ක් ගොඩනගා ඇත. එක් එක් ඉලක්කය යටතේ, ඉලක්ක හා සම්බන්ධ විවිධ පැති සලකා බලා අරමුණු කිහිපයක් සකස් කර ඇත. උපායමාර්ග සකස් කිරීමේ දී ඒවා වඩාත් යථාර්ථවාදී සහ ක්‍රියාත්මක කළ හැකි බවට පත් කිරීමට අවධානය යොමු විය. වැදගත්කම හා හදිසි අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින්, උපායමාර්ග ප්‍රමුඛතා අනුපිළිවෙළට සකස් කරන ලද අතර, ප්‍රමුඛතා මට්ටම අනුව එම උපායමාර්ග ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව තීරණය කරන ලදී. උපායමාර්ග ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ කාර්ය හා කර්තව්‍ය මෙම සැලැස්ම යටතේ දැනට සිටින/පවතින හෝ පිහිටුවීමට නියමිත අදාළ නිලධරයන්ට හා ආයතනවලට පවරා ඇත. මෙම සියලු ඉලක්ක, අරමුණු සහ උපායමාර්ග සම්පාදනය කරන ලද්දේ නගර පාර්ශ්වකරුවන් සමග උපදේශන සාකච්ඡා වට කිහිපයක් සහ පෙර පැවති ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලසුම් සහ අධ්‍යයනයන් පිළිබඳ පුළුල් අධ්‍යයනයක් ඇතුළත් සහයෝගී අභ්‍යාසයක් මගිනි.

වත්මන, ගාල්ල මහා නගර සභා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය යනු ගාල්ල මහා නගර සභා ප්‍රදේශය තුළ ජනනය වන කසළ පවතින සම්පත් යොදා ගනිමින් හැසිරවීමේ කාර්යයකි. කෙසේ වෙතත්, මෙම සැලැස්ම ක්‍රියාත්මක කිරීම මගින්, ගාල්ල මහා නගර සභාව විසින් පියවරක් ඉදිරියට යනු ඇතැයි අපේක්ෂා කෙරේ, එහිලා මෙම මහා නගර සභාව තීරණ ගැනීමේ දී කසළ දත්ත සහ තොරතුරු මත රඳා පවතිනු ඇත; ඝන අපද්‍රව්‍ය කළමනාකරණයෙහිලා සහයෝගී ප්‍රවේශයක් අගය කරනු ඇත; විවිධ වියදම් අඩු කර ගැනීම් සහ ආදායම් උත්පාදන මාර්ග සොයා බලනු ඇත; නිර්මාණාත්මක සහ නව්‍ය ඝන අපද්‍රව්‍ය කළමනාකරණ භාවිතාවන් අනුගමනය කර එම තොරතුරු අනෙකුත් නගර සමග බෙදා ගන්නා අතර අවසාන වශයෙන්, සංචාරකයන් සඳහා 'ශ්‍රී ලංකාවේ පිවිතුරුම ගමනාන්තය' බවට පත්වීමේ දිගුකාලීන දැක්ම මගින් පෙරට මෙහෙයවනු ලබනු ඇත.

# පටුන


| | |
|---|---|
| කාර්ය සාරාංශය | II |
| වගු ලැයිස්තුව | VI |
| රූප සටහන් ලැයිස්තුව | VII |
| සිතියම් ලැයිස්තුව | VII |
| කෙටි යෙදුම් | VIII |

**1. හැඳින්වීම**

**2. පසුබිම් තොරතුරු**

**3. මෙහෙයුම් කමිටුව**

අ. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ගාල්ල මහා නගර සභාවේ වත්මන් ආයතනික සැකැස්ම

**4. පාර්ශ්වකාර විශ්ලේෂණය**

**5. ඝන අපද්‍රව්‍ය කළමනාකරණ නීති සහ රෙගුලාසි**

අ. ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සහ නීති
ආ. අනුකූලතා අවශ්‍යතා
ඇ. ගාල්ල මහා නගර සභාවෙහි ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අනුකූලතා තත්ත්වය

**6. කසළ ප්‍රක්ෂේපණ සහ ලක්ෂණ**

අ. ජනවිකාස පැතිකඩ
ආ. වත්මන් කසළ ජනනය, බැහැර කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය
ඇ. කසළ සංයුතිය
ඈ. කසළ ප්‍රක්ෂේපණය

**7. වත්මන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය**

අ. කසළ එකතු කිරීම සහ මෙහෙයුම්
ආ. ප්‍රවාහනය
ඇ. ප්‍රභවස්ථානයේ දී කසළ අඩු කිරීම සහ නැවත භාවිතය
ඈ. ඝන අපද්‍රව්‍ය යටිතල පහසුකම්/පිරියම් කිරීම සහ වෙළඳපොළ
ඉ. ප්‍රජාව වෙත ළඟා වීම සහ අධ්‍යාපනය

**8. ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා විකල්ප**

අ. වත්මන් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියට අවශ්‍ය වන්නා වූ වැඩිදියුණු කිරීම්
ආ. ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා විකල්ප

**9. දැක්ම, ඉලක්ක, අරමුණු සහ උපායමාර්ග**

**10.** මූල්‍ය විශ්ලේෂණය

අ. සේවා පිරිවැය විශ්ලේෂණය
ආ. ආදායම් විශ්ලේෂණය
ඇ. සේවා පිරිවැය විශ්ලේෂණයෙහි ප්‍රමුඛ අනාවරණ

**11.** අරමුදල් විකල්ප

අ. ස්වයං-උත්පාදිත අරමුදල් විකල්ප
ආ. තෙවන පාර්ශ්වීය අරමුදල් විකල්ප

**12.** ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම

**13.** ප්‍රමුඛ කාර්යසාධන දර්ශක

**ඇමුණුම්**

# වගු ලැයිස්තුව

1 වගුව: ගාල්ල මහා නගර සභා ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේ විවිධ පාර්ශ්වකාර නියැලීම් මට්ටම් විශ්ලේෂණය

2 වගුව: SWM ප්‍රධාන සංරචකයන් සම්බන්ධයෙන් GMC අනුකූලතා තත්ත්වය (2022 ජුලි)

3 වගුව: 2023 සිට 2030 දක්වා ජනගහන පුරෝකථනය

4 වගුව: GMC ප්‍රදේශයේ ආංශික කසළ ජනනය

5 වගුව: සමස්ත කසළ ජනන ප්‍රක්ෂේපණය

6 වගුව: 2023 සිට 2030 දක්වා කසළ වර්ගය අනුව ඇස්තමේන්තුගත කසළ ජනන ප්‍රමාණය

7 වගුව: 3R ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සේවා සැපයීම සඳහා භාවිත කරන වාහන හා යන්ත්‍ර ඇණිය

8 වගුව: 3R ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සේවා සැපයීම් ක්‍රියාවලියෙහි යොදාගත් සේවක සංඛ්‍යාව

9 වගුව: කසළ එකතු කිරීම් ප්‍රවර්ධනයේ ප්‍රතිඵල

10 වගුව: හීන්පැන්දල සිට මොන්රොවියා වත්ත දක්වා කසළ ප්‍රවාහනය සඳහා
වෙන් කරන ලද වාහන හා යන්ත්‍ර ප්‍රමාණය

11 වගුව: හීන්පන්දල සිට මොන්රෝවියා වත්ත දක්වා කසළ ප්‍රවාහනය සඳහා යොදවන ලද සේවක සංඛ්‍යාව

12 වගුව: 2023 දී දඩැල්ල COWAM මධ්‍යස්ථානයේ දී PET බෝතල් එකතු කිරීම

13 වගුව: 2023 දී දඩැල්ල COWAM මධ්‍යස්ථානයේ දී C&D කසළ එකතු කිරීම

14 වගුව : ඉලක්ක, අරමුණු සහ උපායමාර්ග

15 වගුව: 2022 වර්ෂය සඳහා GMCහි 3R/SWM ප්‍රතිඵලයන්හි සමස්ත සාරාංශය

16 වගුව: තොග වශයෙන් කසළ ජනනය කරන්නන්ගෙන් කලාපීය වශයෙන්
එකතු කර ගන්නා ලද කසළ එකතු කිරීමේ ගාස්තු

17 වගුව: ප්‍රමුඛ කාර්ය සාධන දර්ශකයන්හි වත්මන් තත්ත්වය හා ඉලක්ක

18 වගුව: සවිස්තරාත්මක දැක්ම-දිශානත SWOT විශ්ලේෂණය

19 වගුව: එකතු කිරීම් පිරිවැයෙහි ප්‍රවර්ග විභේදනය

20 වගුව: කසළ ප්‍රවාහන පිරිවැය

21 වගුව: COWAMහි වෙන් කළ කසළ පිරියම් කිරීමේ පිරිවැය

22 වගුව: ගාල්ල මහා නගර සභාවේ දඩැල්ල COWAM පහසුකමෙහි
කසළ පිරියම් කිරීමේ පිරිවැය විභේදනය

පිවිතුරු ගාලු නගරයක් සඳහා වන සහයෝගීතා ව්‍යාපෘතිය

23 වගුව: හීන්පැන්දල පහසුකමෙහි කසළ පිරියම් කිරීමේ පිරිවැය විභේදනය

24 වගුව: කසළ ප්‍රවර්ගය හා ස්ථානය අනුව බැහැර කිරීමේ පිරිවැය විභේදනය

25 වගුව: වීදි පිරිසිදු කිරීමේ පිරිවැය විභේදනය

26 වගුව: ජල මාර්ග හා නීති විරෝධි ලෙස කසළ බැහැරලීම් ස්ථාන පිරිසිදු කිරීමේ පිරිවැය ප්‍රභේදනය

# රූප සටහන් ලැයිස්තුව

1 රූප සටහන: BWAS සැලසුම් වැඩමුළුව

2 රූප සටහන: BWAS ගණන්දීමේ නිලධාරී පුහුණුව

3 රූප සටහන: ආංශික මූලික කසළ තක්සේරු අධ්‍යයනය

4 රූප සටහන: තෙත් කසළ මිශ්‍ර කිරීමේ සහ චතුර්ථභාගයන්ට වෙන් කිරීමේ ක්‍රියාවලිය

5 රූප සටහන: වියළි කසළ වෙන් කිරීමේ ක්‍රියාවලිය

6 රූප සටහන: ගාල්ල මහා නගර සභාව සතු කසළ එකතු කිරීමේ වාහන ඇණියෙහි බර මැනීම

7 රූප සටහන: සමස්ත කසළ සංරචකවල සංයුතිය

8 රූප සටහන: දිරාපත් නොවන කසළ සංයුතිය

9 රූප සටහන: ප්ලාස්ටික් අපද්‍රව්‍ය සංයුතිය

10 රූප සටහන: 2022 දී ගුවන් මගින් ලබාගත් පරිශ්‍ර දර්ශන

11 රූප සටහන: ගුවන් මගින් ලබාගත් COWAM පරිශ්‍ර දර්ශන

12 රූප සටහන: ගාල්ල මහා නගර සභාවේ සමස්ත කසළ ප්‍රවාහ රූප සටහන

13 රූප සටහන : මොන්රෝවියා වත්ත පරිශ්‍රයේදී කසළ බෑම

14 රූප සටහන: ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්ම සැකසීම

15 රූප සටහන : ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්ම සැකසීම

16 රූප සටහන: ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්ම සැකසීම - ගාල්ල මහා නගර සභා කාර්ය මණ්ඩල උපදේශන සැසිය

# සිතියම් ලැයිස්තුව

1 සිතියම : ගාල්ල මහා නගර සභා ප්‍රදේශයේ පිහිටීම

2 සිතියම: ගාල්ල මහා නගර සභාවේ පරිපාලන කලාප පහ

3 සිතියම: ගාල්ල මහා නගර සභාවේ කලාප සිතියම

4 සිතියම: කසළ පිරියම් කිරීම සඳහා GMCහි ප්‍රධාන යටිතල පහසුකම්

# කෙටි යෙදුම්

| | |
|---|---|
| ISWMAP | ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්ම |
| HELP-O | මානව හා පරිසර සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීමේ සංවිධානය |
| GMC | ගාල්ල මහා නගර සභාව |
| CACG | පිවිතුරු ගාල්ල නගරයක් සඳහා වන සහයෝගිතා ව්‍යාපෘතිය |
| USAID | ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද නියෝජිතායතනය |
| CCBO | "පිවිතුරු නගර, නීල සාගර" වැඩසටහන |
| SWM | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය |
| BWAS | මූලික කසළ තක්සේරු සමීක්ෂණය |
| WACS | කසළ විගණනය හා අනුලක්ෂණ අධ්‍යයනය |
| UNESCO | එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානය |
| JICA | ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය |
| MT | මෙට්‍රික් ටොන් |
| PS | ප්‍රාදේශීය සභා |
| GNDs | ග්‍රාම නිලධාරී කොට්ඨාස |
| 3R | අඩු කිරීම - නැවත භාවිතය - ප්‍රතිචක්‍රීකරණය |
| SBC | සමාජ හැසිරීම් වෙනස |
| MC | මහා නගර සභාව |
| NGOs | රාජ්‍ය නොවන සංවිධාන |
| CDCs | ප්‍රජා සංවර්ධන කවුන්සිල |
| UDA | නාගරික සංවර්ධන අධිකාරිය |
| MEPA | සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය |
| FAO | ආහාර හා කෘෂිකර්ම සංවිධානය |
| UN | එක්සත් ජාතීන් |
| LAs | පළාත් පාලන ආයතන |
| CEA | මධ්‍යම පරිසර අධිකාරිය |
| DS | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| CBOs | ප්‍රජා මූල සංවිධාන |
| HHs | ගෘහ |
| CLG | පළාත් පාලන කොමසාරිස් |
| MRF | ප්‍රතිසාධන පහසුකම |
| SPLGD | පළාත් පාලන දෙපාර්තමේන්තුව, දකුණු පළාත |
| EPR | නිෂ්පාදකයාගේ විස්තීර්ණ වූ වගකීම |
| SWOT | ශක්තීන්, දුර්වලතා, අවස්ථා, තර්ජන |
| COSA | සේවා පිරිවැය විශ්ලේෂණය |

පිවිතුරු ගාලු නගරයක් සඳහා වන සහයෝගීතා ව්‍යාපෘතිය

| | |
|---|---|
| LKR | ශ්‍රී ලංකා රුපියල් |
| PPP | රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව |
| PAYT | ඉවතලන විට ගෙවීම |
| KPIs | ප්‍රමුඛ කාර්ය සාධන දර්ශක |
| IWCs | අවිධිමත් කසළ එකතු කරන්නන් |

# 1. හැඳින්වීම

මෙම ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්ම (ISWMAP), HELP-O (මානව හා පරිසර සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීමේ සංවිධානය) විසින් ගාල්ල මහා නගර සභාව (GMC) වෙනුවෙන්, "පිවිතුරු ගාල්ල නගරයක් සඳහා වන සහයෝගිතා ව්‍යාපෘතිය (CACG)" එනම්, ටෙට්‍රා ටෙක් (Tetra Tech) විසින් ක්‍රියාත්මක කරනු ලබන USAID (ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද නියෝජිතායතන) පිවිතුරු නගර, නීල සාගර (CCBO) ප්‍රමුඛ වැඩසටහනෙහි මූල්‍ය හා තාක්ෂණික සහාය ඇතිව HELP-O සහ ගාල්ල මහා නගර සභාව විසින් සහයෝගයෙන් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතිය යටතේ සකස් කරන ලදි. පිවිතුරු ගාල්ල නගරයක් සඳහා වන සහයෝගිතා ව්‍යාපෘතියේ අරමුණ වනුයේ ප්ලාස්ටික් අපද්‍රව්‍ය ජනනය අඩු කිරීම සහ නගර ව්‍යාප්ත කසළ කළමනාකරණ පද්ධතියක් ප්‍රවර්ධනය කිරීම මගින් ගාල්ල නගරයේ කාර්යක්ෂම ඝන අපද්‍රව්‍ය කළමනාකරණ (SWM) පද්ධතියක් ප්‍රවර්ධනය කිරීමයි.

ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ පරමාර්ථය වනුයේ, සියලුම ගෘහස්ථ, කාර්මික, වාණිජ හා සේවා අංශවලින් ජනනය වන වඩාත්ම බලපෑම්කාරී ඝන අපද්‍රව්‍ය ආවරණය වන පරිදි නිශ්චිත ඉලක්ක, අරමුණු, උපායමාර්ග, ක්‍රියාමාර්ග, වැදගත් අදියර සහ කාර්ය හා කර්තව්‍ය දක්වමින් ගාල්ල මහා නගර සභාව සඳහා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ තනි ක්‍රියාකාරී සැලැස්මක් ලබා ගැනීමයි. ඵලදායී 3R පාදක (අඩු කිරීම, නැවත භාවිත කිරීම, ප්‍රතිචක්‍රීකරණය) ඝන අපද්‍රව්‍ය කළමනාකරණයක් සඳහා ශක්‍ය හා දැනුමැති මහා නගර සභාවක් ඇති කිරීම, නගර ව්‍යාප්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා දැනුම හා කැපවීම ඇති පාර්ශ්වකරුවන්ගේ කණ්ඩායමක සහයෝගී සහාය සහතික කිරීම, සහ අවසන දී, පුනරාවෘත්තීය, නිර්මාණශීලී හා නව්‍ය SWM විසඳුම් සහිතව ගාල්ල නගරය ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනයන්ට සහ ලොව පුරා, ආදර්ශ නගරයක් බවට පත් කිරීම උදෙසා නාගරික ඝන අපද්‍රව්‍ය සම්බන්ධයෙන් ප්‍රශස්ත හා තිරසර විසඳුමක් වෙනුවෙන් ක්‍රියාමාර්ග ගනු ලබන බව මෙම ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්ම මගින් තහවුරු කෙරේ.

ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රම කිහිපයකින් ප්‍රජාව සමඟ සම්බන්ධීකරණයක් පවත්වා ගැනීමට තීරණ ගන්නන්ට වටිනා මෙවලමක් විය හැකි ය. පහත දැක්වෙන්නේ එහි ප්‍රධාන ප්‍රතිලාභ කිහිපයකිඃ

- කසළ කළමනාකරණයට සම්බන්ධ ප්‍රජාව සහ පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධීකරණය
- පවතින කසළ කළමනාකරණ භාවිතාවන් සහ ක්‍රියාත්මක වන පද්ධති අවබෝධ කර ගැනීම
- අභියෝග, අඩුපාඩු සහ වත්මන් පද්ධති අවශ්‍යතා හඳුනා ගැනීම
- අවස්ථා හඳුනා ගැනීම සහ වැඩිදියුණු කිරීම් සඳහා ප්‍රමුඛතා සැකසීම
- සම්පත්, මූල්‍ය සහ අයවැය අවශ්‍යතා හඳුනාගැනීම (ප්‍රාග්ධන පිරිවැය සහ මෙහෙයුම් පිරිවැය)
- ඉලක්ක නියම කිරීම සහ සෑම වසරකම ප්‍රගතිය මැන බැලීම
- සැලැස්ම ක්‍රියාත්මක වන විට ප්‍රමුඛතා නැවත සළකා බැලීම සහ වෙනස් කිරීම
- සැලසුම් ඉලක්ක, නිර්දේශිත වැඩිදියුණු කිරීම් සහ ක්‍රියාත්මක කිරීමේ කාල සටහන ප්‍රජාවට, පාර්ශ්වකරුවන්ට සහ බාහිර ආයතනවලට සන්නිවේදනය කරීම
- සමාජ සහ හැසිරීම් වෙනස් කිරීමේ වැඩසටහන් සංවර්ධනය කිරීම
- ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා පුළුල් සහ පරිපූර්ණ ප්‍රවේශයක් සැපයීම
- කසළ කළමනාකරණය සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ දී තීරණ ගන්නන්ට මඟ පෙන්විය හැකි වීම

- කසළ කළමනාකරණය සඳහා රෙගුලාසි සහ මාර්ගෝපදේශ ඇතුළත් වීම සහ ප්‍රජාව තුළ නිසි කසළ බැහැර කිරීමේ භාවිතාවන් බලාත්මක කිරීමට භාවිතා කළ හැකි වීම

ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්මෙහි කසළ කළමනාකරණ අභියෝගවලට මුහුණ දීමේ දී ප්‍රජාව සමඟ සම්බන්ධීකරණය පවත්වා ගැනීමට තීරණ ගන්නන් සඳහා මාර්ග සිතියමක් ලෙස ක්‍රියා කරයි. එය සහයෝගිතාව ප්‍රවර්ධනය කරයි, මහජනතාව දැනුවත් කරයි, සහ ප්‍රජාවගේ විශේෂිත අවශ්‍යතා සහ අභිමතයන් සඳහා කසළ කළමනාකරණ උපායමාර්ග මනාව සකස් කර ඇති බව සහතික කරයි.

ගාල්ල මහා නගර සභාව වෙනුවෙන් ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සඳහා තක්සේරු කිහිපයක අනාවරණ සහ නිර්දේශ මූලිකව පදනම් කර ගැනිණි.

I. 2022 නොවැම්බර් සහ 2023 පෙබරවාරි අතර කාලපරිච්ඡේදය තුළ පවත්වන ලද මූලික කසළ තක්සේරු සමීක්ෂණය (BWAS),
II. 2023 ජනවාරි මස පවත්වන ලද කසළ විගණනය සහ අනුලක්ෂණ අධ්‍යයනය (WACS)
III. 2022 අගෝස්තු සහ 2023 මැයි අතර කාලපරිච්ඡේදය තුළ පවත්වන ලද 3R/ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සේවා සැපයීම සම්බන්ධයෙන් ගමන් මාර්ග ප්‍රශස්තකරණය සහ පරීක්ෂණ ධාවනය
IV. 2023 අගෝස්තු මස පවත්වන ලද 3R/සේවා පිරිවැය විශ්ලේෂණය
V. 2023 ඔක්තෝබර් පවත්වන ලද 3R/ඝන අපද්‍රව්‍ය පාලන කළමනාකරණ අරමුදල් විකල්ප
VI. 3R/ඝන අපද්‍රව්‍ය පාලන කළමනාකරණ පරතරය විශ්ලේෂණය, 2022 අගෝස්තු
VII. සහභාගීත්ව ප්‍රවේශයක් හරහා ගාල්ල මහා නගර සභාව සහ නගරයේ විවිධ පාර්ශ්වකරුවන් විසින් ක්‍රියාවෙහි යොදවන වර්තමාන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ භාවිතාව

ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ දී, පරිසර අමාත්‍යාංශයෙන් ලැබුණු මගපෙන්වීම මත 2018-2019 දී සකස් කරන ලද ඔවුන්ගේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම අධ්‍යයනය කිරීම සඳහා මීගමුව මහා නගර සභා බල ප්‍රදේශයට නිරීක්ෂණ චාරිකාවක් සිදු කරන ලදි. ගාල්ල මහා නගර සභාව නියෝජනය කරමින් පුද්ගලයින් 30 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් මීගමුව මහා නගර සභා බල ප්‍රදේශයේ එක් දින පරිශ්‍ර චාරිකාවකට සහ උපදේශන සැසියකට සහභාගී විය. එහි අරමුණ වූයේ උගත් පාඩම් ග්‍රහණය කර ගැනීම සහ ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී මුහුණ දෙන අභියෝග තේරුම් ගැනීමයි. ගාල්ල මහා නගර සභාව සඳහා වඩාත් ප්‍රායෝගික සහ තිරසර ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්මක් සංවර්ධනය කිරීමේ දී මෙම නිරීක්ෂණ චාරිකාවෙන් ලබාගත් දැනුම සහ අත්දැකීම් බෙහෙවින් ප්‍රයෝජනවත් විය.

ඉහත නිරීක්ෂණ චාරිකාවට අමතරව, ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමෙහිලා ඔවුන්ගේ දැනුම හා අදහස් ලබා ගැනීම සඳහා නගරයේ ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ කණ්ඩායම් සමඟ උපදේශන සැසි තුනක් (03) පවත්වන ලදි. (1) ගාල්ල මහා නගර සභා නියෝජිතයන්, (2) පෞද්ගලික, රාජ්‍ය සහ රාජ්‍ය නොවන අංශ නියෝජිතයන්, සහ (3) ව්‍යාපෘති කණ්ඩායමෙහි තාක්ෂණික දායකත්වය සැපයිය හැකි ප්‍රජා නියෝජිතයන් සමඟ මෙම උපදේශන සැසි පවත්වන ලදි. මෙම උපදේශන සැසි සඳහා කාන්තා සහ අනෙකුත් සුළුතර කණ්ඩායම්වල සහභාගිත්වය සහතික කරන ලදි.


පිරිවැය ඵලදායී ලෙස ස්වකීය කසළ කළමනාකරණය කිරීම සඳහා කෙටි හා දීර්ඝකාලීන උපායමාර්ග හා විකල්ප හඳුනා ගැනීමට, ඇගයීමට සහ ගොඩනැගීමට, සහ එමගින් මහජන සෞඛ්‍යය සහ පාරිසරික තිරසර බව සහතික කිරීම සඳහා පළාත් පාලන ආයතන සතුව තමන්ගේම ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්මක් තිබිය යුතු ය. ඒ අනුව, වත්මන් ගාල්ල මහා නගර සභා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය කේන්ද්‍ර කර ගනිමින් සිදු කරන ලද අවශ්‍යතා විශ්ලේෂණයක, අදාළ නීති/ රෙගුලාසි සමාලෝචනයක, 3R සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධව දැනට පවතින ප්‍රවණතා සහ මනා පරිචයන් පිළිබඳ තක්සේරුවක, සහ මහජන සෞඛ්‍යය හා පරිසරයේ තිරසාර බව සහතික කිරීම සඳහා පිරිවැය ඵලදායී ලෙස කසළ කළමනාකරණය කිරීමේ කෙටි කාලීන හා දිගු කාලීන උපාය මාර්ග සහ ක්‍රියාමාර්ග සම්පාදනයක දළ විශ්ලේෂණයක් මෙම ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්ම මගින් ලබා දේ.

එපමණක් නොව, මෙම ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්ම යනු කසළ කළමනාකරණ භාවිතාවන්, කසළ එකතු කිරීම සහ බැහැර කිරීම සම්බන්ධයෙන් ගාල්ල මහා නගර සභාව සඳහා තාර්කික මග පෙන්වීමක් මෙන්ම දිගුකාලීන දැක්මකි. පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වයෙන් ගාල්ල මහා නගර සභාවෙහි 3R භාවිතාවන් සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙහිලා මෙය ප්‍රයෝජනවත් මාර්ගෝපදේශ අත්පොතක් වනු ඇත. එසේම, කසළ එකතු කිරීම, ප්‍රවාහනය, බැහැර කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය ඇතුළු නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ශක්තිමත් කිරීමට අවශ්‍ය දේශීය ප්‍රතිපත්ති, වැඩසටහන්, ප්‍රවේශයන් සහ සැලසුම් හඳුනා ගැනීමට මෙය ප්‍රයෝජනවත් අභ්‍යාසයක් වනු ඇත. උපදේශන සැසිවල දී පළ වූ අදහස් අන්තර්ගත කරමින් අදාළ ක්‍රියාකාරකම් සඳහා වූ ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම සකස් කරන ලදි.

# 2. පසුබිම් තොරතුරු

ගාල්ල ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ අගනුවර වේ (1 සිතියම). යුනෙස්කෝ (එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානය) ලෝක උරුම අඩවියක් ලෙස නම් කිරීම හේතුවෙන් නගරය ප්‍රමුඛ සංචාරක ගමනාන්තයක් ලෙස සැලකේ. නගරයේ සංස්කෘතිය සහ ලන්දේසි කොටුවේ යටත් විජිත ගෘහනිර්මාණ ශිල්පය දේශීය හා විදේශීය සංචාරකයන් විශාල සංඛ්‍යාවක් ආකර්ෂණය කර ගනී (Dharmasiri, 2019; Jayasekara and Karunarathna, 2019). එලෙසම, ගාල්ල යනු දකුණු පළාතෙහි සීඝ්‍රයෙන්ම වර්ධනය වන නාගරික හා සේවා මධ්‍යස්ථානය මෙන්ම එම පළාතෙහි අගනගරය වේ. එය සමස්ත දකුණු කලාපයම සඳහා සේවා මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කරන අතර අනෙකුත් නගර සම්බන්ධ කරන ප්‍රධාන ගමන් මාර්ගය ඔස්සේ දෛනිකව විශාල සංගමන ජනගහනයක් ආකර්ෂණය කර ගනී.

ගාල්ල මහා නගර සභා සම්පත් පැතිකඩට අනුව, ගාල්ල මහා නගර සභා ප්‍රදේශයේ වත්මන් ජනගහනය 103,600ක් පමණ වේ. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2012 සමීක්ෂණ දත්තවලට අනුව, ගාල්ල කඩවත් සතර ප්‍රදේශයේ (ගාල්ල මහා නගර සභාව පිහිටා ඇති) සාමාන්‍ය ජනගහන වර්ධනය දළ වශයෙන් 0.75%කි.




*සිතියම 1: ගාල්ල මහා නගර සභා ප්‍රදේශයේ පිහිටීම (HELP-O විසින් සකස් කරන ලදි.)*


අනෙකුත් නගරවලට සමානව, ගෘහස්ථ, වාණිජ, කර්මාන්ත සහ සේවා අංශ ගාල්ල මහා නගර සභා ප්‍රදේශය තුළ සැලකිය යුතු කසළ ප්‍රමාණයක් ජනනය කරන අතර එමගින් සැලකිය යුතු සෞඛ්‍ය හා පාරිසරික ගැටලු පැන නැගේ. මෙය 2022 නොවැම්බර් සහ 2023 පෙබරවාරි අතර CCBO සභාය යටතේ HELP-O විසින් පවත්වන ලද මූලික කසළ තක්සේරු සමීක්ෂණය (BWAS) සහ කසළ විගණනය සහ අනුලක්ෂණ අධ්‍යයනයට (WACS) පෙරාතුව රාජ්‍ය, රාජ්‍ය නොවන සංවිධාන හෝ නගර ව්‍යාප්ත පර්යේෂණ කිසිවක් මගින් අධ්‍යයනය කර හෝ තක්සේරු කර නොමැත. ජපන්

ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතන (JICA) ඇස්තමේන්තු තහවුරු කරමින්, ගාල්ල මහා නගර සභා ප්‍රදේශයෙහි ජනනය වන කසළවලින් ආසන්න වශයෙන් තුනෙන් එකක් (31.43%) ගාල්ල මහා නගර සභාව විසින් එකතු කරනු ලබන බවත්, ඉතිරි කසළ ප්‍රමාණය අවිධිමත් ක්‍රම මගින් එකතු කරනු ලැබීම හෝ පිළිස්සීම, වළ දැමීම හෝ ඉවතලීම මගින්, සෞඛ්‍ය හා පාරිසරික ගැටලු ඇති කරමින් පරිසරයට බැහැර කෙරෙන බව ඉහත අධ්‍යයන දෙක මගින් අනාවරණය කරන ලදි. දිරාපත් වන සහ දිරාපත් නොවන දෙයාකාරයේම එකතු නොකළ කසළ බහුතරය නිරන්තර හදිසි ගංවතුර සහ ගිං ගඟ, මෝඩ ඇළ සහ මොරගොඩ ඇළ වැනි ප්‍රධාන ජල ප්‍රභව මගින් කෙලින්ම සාගරයට රැගෙන යයි.

මූලික කසළ තක්සේරු සමීක්ෂණයෙහි (BWAS) මෙන්ම කසළ විගණනය සහ අනුලක්ෂණ අධ්‍යයනයෙහි (WACS) ප්‍රතිඵලයන්ට අනුව, ගෘහස්ථ, වාණිජ, කර්මාන්ත සහ සේවා අංශ එක්ව ගත් කල දිනකට ආසන්න වශයෙන් කසළ මෙ.ටොන් 68.38ක් ජනනය කරන බව අනාවරණය විය. මෙයින් කසළ මෙ.ටොන් 21.48ක් (31.43%) ගාල්ල මහා නගර සභාව විසින් ස්වකීය පවතින සම්පත් උපයෝජනය කර ගනිමින් එකතු කරනු ලැබේ. මීට අමතරව, ගාල්ලෙහි සැලකිය යුතු ලෙස කසළ ජනනය වන විශේෂිත ස්ථාන (hotspots) කිහිපයක් ඇති අතර, එම ස්ථාන භාවිත කරන්නන්/ එම ස්ථානයන්හි සංචාරය කරන්නන් අධික වීම, ඉහළ ප්‍රමාණයෙන් කසළ ජනනය වීම සහ එම ස්ථානයන්හි කසළ විධිමත්ව කළමනාකරණය අපහසුතා පැවතීම හේතුවෙන් එම ස්ථාන කෙරෙහි විශේෂ අවධානයක් අවශ්‍ය වේ. එම ස්ථානයන්ට රෝහල්, පාසල්, සංචාරක හෝටල්, ආපනශාලා, ධීවර වරාය, බන්ධනාගාරය සහ නාවික හමුදා කඳවුර ඇතුළත් වේ. තවද, මූලික කසළ තක්සේරු සමීක්ෂණයෙහි අනාවරණයන්ට අනුව, ඌන පහසුකම් සහිත ප්‍රජාවන් කිහිපයක් ද ඔවුන්ගේ කසළ කළමනාකරණය සම්බන්ධයෙන් ඒ හා සමාන ගැටලුවලට මුහුණ දෙති.

වත්මන, 1947 අංක 29 දරන නගර සභා ආඥාපනත සහ එයට ඉන් පසුව සිදු කරන ලද සංශෝධන යටතේ ගාල්ල මහා නගර සභා ප්‍රදේශය තුළ කසළ එකතු කිරීමේ හා කළමනාකරණය කිරීමේ ප්‍රධාන වගකීම ගාල්ල මහා නගර සභාව විසින් දරනු ලැබේ. කොළඹ සහ මහනුවර මහා නගර සභාවන්ට පසුව ශ්‍රී ලංකාවේ තුන්වන මහා නගර සභාව ලෙස, ගාල්ල මහා නගර සභාව 1866 නොවැම්බර් 17 වන දින පළ කරන ලද ගැසට් අංක. 357 යටතේ පිහිටුවන ලදි. ගාල්ල මහා නගර සභාවෙහි භූමි ප්‍රමාණය වර්ග කි.මී. 16.5ක් පමණ වන අතර, දකුණෙන් සහ නිරිත දෙසින් සාගරයට මායිම් වන අතර, බටහිරින් සහ වයඹින් හික්කඩුව ප්‍රාදේශීය සභාවට ද, උතුරින් බෝපෙ-පෝද්දල ප්‍රාදේශීය සභාවට ද, නැගෙනහිරින් අක්මීමන ප්‍රාදේශීය සභාවට ද සහ ගිනිකොන දෙසින් හබරාදූව ප්‍රාදේශීය සභාවට ද මායිම් වේ. නාගරික මන්ත්‍රීවරුන් තේරී පත්වන නාගරික කොට්ඨාස 20කින් (2වන සිතියම) සහ ශ්‍රී ලංකාවේ බිම් මට්ටමේ පරිපාලන කොට්ඨාස වන ග්‍රාම නිලධාරී වසම් 43කින් ගාල්ල මහා නගර සභාව සමන්විත වේ.

පරිපාලනයේ පහසුව සඳහා, ගාල්ල මහා නගර සභා ප්‍රදේශය මහමෝදර, රිච්මන්ඩ්, කරාපිටිය, මොරගොඩ සහ ගාලු බසාර් (කඩවීදිය) ලෙස කලාප පහකට බෙදා ඇති අතර, සෑම කලාපයක්ම නාගරික කොට්ඨාස කිහිපයකින් සහ සමාන ජනගහන අනුපාතයකින් සමන්විත වේ (සිතියම 3).




*2 සිතියම: ගාල්ල මහා නගර සභාවේ පරිපාලන කලාප පහ*
*(ගාල්ල මහා නගර සභා GIS ඒකකය විසින් සකස් කරන ලදි.)*

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ වර්තමාන ජාතික සහ ප්‍රාදේශීය ප්‍රතිපත්තිවලට අමතරව (උදා: කසළ කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය 2016 සහ ප්ලාස්ටික් කසළ කළමනාකරණය පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2021), ගාල්ල මහා නගර සභාව මුහුණ දෙන ඉහත සාකච්ඡා කළ අභියෝග ශ්‍රී ලංකාවේ බොහෝ පළාත් පාලන ආයතනවල බහුලව දක්නට ලැබේ. ක්ෂේත්‍ර මට්ටමේ අධ්‍යයනයන්හි අනාවරණයන්ට අනුව, පළාත් පාලන ආයතනයන්හි ප්‍රමාණවත් දැනුමක් සහ ධාරිතාවක් නොමැතිකම සහ 3R/ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව මහජනතාව සතු දැනුවත්බව අල්ප වීම මෙම අභියෝගවලට ප්‍රධාන හේතු වේ. පිළිගත නොහැකි හෝ නීති විරෝධී ක්‍රියාකලාපයන්ට පිළියම් යෙදීමෙහිලා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් නීති බලාත්මක කිරීමේ හිඩැස් හෝ නෛතික ලේඛන නොමැතිකම ද මෙම ප්‍රයත්නයේ දී ප්‍රධාන අභියෝගයක් බව පෙනී යයි. එබැවින්, පළාත් පාලන ආයතනවල පවතින වත්මන් සම්පත් පරතර සඳහා අරමුදල් අවස්ථා හෝ විකල්ප සොයන අතරම, ප්‍රගතිශීලී 3R/ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියක් උදෙසා මහජනතාව හා පරිපාලකයන් අතර ධනාත්මක සමාජ චර්යා වෙනසක් (SBC) ගොඩනැගීම මෙන්ම නීති විරෝධී හා පිළිගත නොහැකි ක්‍රියාකලාපයන් පාලනය කිරීමට ආධාරක නෛතික හා නියාමන ලේඛන ඇති බව සහතික කිරීම අත්‍යවශ්‍ය වේ.

# 3. මෙහෙයුම් කමිටුව

## අ. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ගාල්ල මහා නගර සභාවේ වත්මන් ආයතනික සැකැස්ම

ගාල්ල මහා නගර සභාව පිහිටුවා ඇති 1947 අංක 29 දරන මහා නගර සභා ආඥාපනත මගින්, මහා නගර සභා වෙත ස්වකීය ප්‍රදේශ තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් වගකීම දැරීමේ විධිනියෝගය පවරා ඇත. ආඥාපනතට අනුව, ඝන අපද්‍රව්‍ය කළමනාකරණයෙහිලා මහා නගර සභා සතු වගකීම් කිහිපයක් පහත දැක්වේ.

- **කසළ එකතු කිරීම:** ස්වකීය ප්‍රදේශයන්හි ඇති කුටුම්භ, ව්‍යාපාර සහ වෙනත් ආයතනවලින් ඝන අපද්‍රව්‍ය එකතු කිරීමේ වගකීම දැරිය යුතු ය.

- **කසළ ප්‍රවාහනය:** මහා නගර සභා විසින් ඝන අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ ස්ථානවල සිට බැහැර කිරීමේ පරිශ්‍ර වෙත එම අපද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේ වගකීම දැරිය යුතු ය.

- **කසළ බැහැර කිරීම:** මහා නගර සභා විසින් ඝන අපද්‍රව්‍ය ආරක්ෂිතව සහ පරිසර හිතකාමී ලෙස බැහැර කිරීමේ වගකීම දැරිය යුතු ය.

- **මහජනයා දැනුවත් කිරීම:** මහා නගර සභා විසින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ භාවිතාවන් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ වගකීම දැරිය යුතු ය.

- **රෙගුලාසි බලාත්මක කිරීම:** මහා නගර සභා විසින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ රෙගුලාසි බලාත්මක කිරීමේ වගකීම දැරිය යුතු ය.

තවද, ආඥාපනත මගින් මහා නගර සභාවන්ට පහත දෑ සඳහා බලය ලබා දී ඇත:

- ඝන අපද්‍රව්‍ය කළමනාකරණ රෙගුලාසි උල්ලංඝනය කරන්නන්ට දඩ පැනවීම
- ඝන අපද්‍රව්‍ය කළමනාකරණ රෙගුලාසිවලට අනුකූල නොවන ව්‍යාපාර වසා දැමීම
- ඝන අපද්‍රව්‍ය කළමනාකරණ රෙගුලාසි උල්ලංඝනය කරන්නන්ට එරෙහිව නීතිමය පියවර ගැනීම

නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති සහ නාගරික කොමසාරිස් යනු මහා නගර සභාවක ප්‍රධාන නිලධරයන් තිදෙනා වන අතර, මහා නගර සභාවකට අයත් වන ඉහත කාර්ය හා කර්තව්‍ය සම්බන්ධයෙන් ඔවුහු විවිධ වගකීම් දරති. කෙසේ වෙතත්, සභාව කාර්යක්ෂමව ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා ඔවුහු සියලු දෙනාම එක්ව කටයුතු කරති. නගරාධිපති යනු මහා නගර සභාවේ ප්‍රධානියා ය. ඔහු/ඇය මන්ත්‍රීවරුන් විසින් තෝරා පත් කර ගනු ලබන අතර සභා රැස්වීම්වල මුලසුන දැරීමට සහ සභාව වෙනුවෙන් තීරණ ගැනීමට බලය ඔහු/ඇය සතු වේ. නගරාධිපතිවරයා මහජනතාවට සහ අනෙකුත් රාජ්‍ය ආයතනවලට සභාව නියෝජනය කිරීමේ වගකීම දරයි. නියෝජ්‍ය නගරාධිපතිවරයා මහ නගර සභාවේ දෙවැනි ප්‍රධානියා වේ. ඔහු/ඇය නගරාධිපතිවරයාට ඔහුගේ/ඇයගේ රාජකාරියට සහාය වන අතර නගරාධිපතිවරයාට තම රාජකාරිය ඉටු කිරීමට නොහැකි වුවහොත් නගරාධිපතිවරයා ලෙස කටයුතු කරයි. සභාවේ දෛනික කටයුතු අධීක්ෂණය කිරීම ද නියෝජ්‍ය නගරාධිපතිවරයා හට පැවරේ. නාගරික කොමසාරිස්වරයා නගර සභාවේ ප්‍රධාන විධායක නිලධාරියා වේ. ඔහු/ඇය පළාත් රජය විසින් පත් කරනු ලබන අතර සභාවේ තීරණ ක්‍රියාත්මක කිරීමේ වගකීම දරයි. සභාවේ කාර්ය මණ්ඩලය සහ සම්පත් කළමනාකරණය කිරීමේ වගකීම ද නාගරික කොමසාරිස්වරයා සතුය. නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති සහ නාගරික කොමසාරිස්ගේ නිශ්චිත වගකීම් 1947 අංක 29 දරන මහා නගර සභා ආඥාපනතෙහි දක්වා ඇත.

නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති සහ නාගරික කොමසාරිස් විසින් ගාල්ල මහා නගර සභා පරිපාලනයෙහි වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. මහා නගර සභා ඵලදායී ලෙස ක්‍රියාත්මක වන බව සහ මහා නගර සභා ජනතාවට අවශ්‍ය සේවාවන් සපයන බව සහතික කිරීමේ වගකීම එම නිලධරයන් සතු ය. ඉහත ප්‍රධාන කාර්ය භාර තුනෙහි අධිකාර  බලය යටතේ, ගාල්ල මහා නගර සභාව තුළ ස්ථාවර කමිටු පහක් පවතින අතර, ඒ සෑම කමිටුවක්ම කමිටු සභාපතිවරයෙකු විසින් මෙහෙයවනු ලැබේ. ස්ථාවර කමිටු සහ ඒවායේ වගකීම් පහත දැක්වේ.

- **මූල්‍යඃ** අයවැයකරණය, ආදායම් එකතු කිරීම සහ වියදම් ඇතුළුව ගාල්ල මහා නගර සභාවෙහි මූල්‍ය කටයුතු අධීක්ෂණය කිරීම සඳහා මෙම කමිටුව වගකිව යුතු ය.

- **කර්මාන්ත, නගර සංවර්ධනය, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය, සැලසුම්කරණය, සහ ජලය සහ විදුලියඃ** මෙම කමිටුව කර්මාන්ත, නගර සංවර්ධනය, ඝන අපද්‍රව්‍ය කළමනාකරණ, සැලසුම් සහ ජල හා විදුලි සේවා සැපයීම සම්බන්ධ කරුණු අධීක්ෂණය කරයි.

- **නිවාස, ප්‍රජා සංවර්ධන සහ ළමා සුභසාධනයඃ** මෙම කමිටුව නිවාස, ප්‍රජා සංවර්ධනය සහ ළමා සුභසාධනය අධීක්ෂණය කිරීම සඳහා වගකීම දරයි.

- **සෞඛ්‍ය සහ සනීපාරක්ෂාවඃ** මාර්ග සහ ගොඩනැගිලි කමිටුවඃ මෙම කමිටුව සෞඛ්‍ය සහ සනීපාරක්ෂාව සම්බන්ධ කරුණු අධීක්ෂණය කරයි.

- **පරිසරය, පොදු උද්‍යාන, ක්‍රීඩා සහ සංස්කෘතික කටයුතුඃ** පරිසරය, පොදු උද්‍යාන, ක්‍රීඩා සහ සංස්කෘතික කටයුතු සම්බන්ධ කරුණු අධීක්ෂණය කිරීම සඳහා මෙම කමිටුව වගකිව යුතු ය.

සෑම ස්ථාවර කමිටුවක්ම සභා මන්ත්‍රීවරයෙකුගේ සභාපතිත්වයෙන් ක්‍රියාත්මක වන අතර තවත් මන්ත්‍රීවරු කිහිප දෙනෙක් සාමාජිකයන් වශයෙන් කටයුතු කරති. ස්ථාවර කමිටු තම විෂය පථය තුළ ඇති කරුණු පිළිබඳව සාකච්ඡා කිරීමට සහ නිර්දේශ ඉදිරිපත් කිරීමට කලින් කලට රැස්වේ. අනතුරුව, ස්ථාවර කමිටුවල නිර්දේශ සභාව විසින් අනුමැතිය සඳහා සලකා බලනු ලැබේ.

2023 දෙසැම්බර් වන විට, තේරී පත් වූ සභාවක් නොමැති බැවින්, මෙම ස්ථාවර කමිටු නාගරික කොමසාරිස්වරයාගේ විෂය පථය යටතේ පවතී. කසළ කළමනාකරණයේ සමස්ත වගකීම නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුවට පැවරී ඇති අතර අනෙකුත් දෙපාර්තමේන්තු ස්වකීය විෂය පථය තුළ සමස්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණයෙහිලා දායක වේ. නාගරික ඉංජිනේරුවරයා සමස්ත මානව සම්පත් කළමනාකරණය, කසළ එකතු කිරීම සහ කසළ බැහැර කිරීම අධීක්ෂණය කරන අතර ප්‍රධාන තාක්ෂණික නිලධාරියා තාක්ෂණික කළමනාකරණය සම්බන්ධයෙන් වගකීම දරයි. කසළ එකතු කිරීම, ප්‍රවාහනය සහ පිරියම් කිරීම යනා දී කාර්යයන්හි දී, ඝන අපද්‍රව්‍ය පද්ධතියට අනුයුක්ත කර ඇති මානව සම්පත් කළමනාකරණය කිරීමෙහිලා නාගරික ඉංජිනේරුවරයාට සහාය වීමේ වගකීම ද තාක්ෂණ නිලධරයා විසින් දරනු ලබයි. ප්‍රජා සංවර්ධන නිලධාරීන්ගේ වගකීම වන්නේ කසළ කළමනාකරණය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම වන අතර ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා ඝන අපද්‍රව්‍ය කළමනාකරණයෙහි සෞඛ්‍ය අංගය අධීක්ෂණය කරයි.

# 4. පාර්ශ්වකාර විශ්ලේෂණය

3R (අඩු කිරීම, නැවත භාවිත කිරීම, ප්‍රතිචක්‍රීකරණය) සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ (SWM) සේවා සැපයීම සම්බන්ධයෙන් වන පාර්ශ්වකාර විශ්ලේෂණයට කසළ කළමණාකරණ මුලපිරීම්වල සාර්ථකත්වයෙන් බලපෑමට ලක් වන හෝ ඊට බලපෑම් කළ හැකි පුද්ගලයන්, කණ්ඩායම් සහ සංවිධාන හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම ඇතුළත් වේ. 3R /ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සේවා සැපයීම හා සම්බන්ධ වූ හෝ ඉන් බලපෑමට ලක් වූ සියලුම අදාළ පාර්ශ්වකරුවන් හඳුනා ගැනීමෙන් පාර්ශ්වකාර විශ්ලේෂණ ක්‍රියාවලිය ආරම්භ කරන ලදි. මෙය මූලික වශයෙන් මෙහෙයවන ලද්දේ HELP-O කණ්ඩායම විසිනි. ඒ අනුව, පාර්ශ්වකරුවන්ට රාජ්‍ය ආයතන, පළාත් පාලන ආයතන, කසළ කළමනාකරණ සමාගම්, පාරිසරික සංවිධාන, ව්‍යාපාර, ප්‍රජා සාමාජිකයන් සහ නියාමන ආයතන ඇතුළත් වේ.

විශ්ලේෂණයේ දෙවන පියවර ලෙස, ඝන අපද්‍රව්‍ය කළමනාකරණයෙහිලා සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරන හෝ ඉටු කළ හැකි ගාල්ල මහා නගර සභා ප්‍රදේශයේ වඩාත්ම බලගතු සහ වැදගත් පාර්ශ්වකරුවන් හඳුනා ගැනීම සඳහා, ගාල්ල මහා නගර සභාව සහ CCBO වෙතින් ලැබුණු යෙදවුම් සහිතව පහත වගුව සකස් කරන ලදි. පාර්ශ්වකරුවන් ශ්‍රේණිගත කිරීම සඳහා 1-5 Likert පරිමාණයක් භාවිත කර, ඔවුන්ගේ විෂයපථය සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ආශ්‍රිත ක්‍රියාකාරකම්වල වත්මන් නියැලීම මත පදනම්ව, ඉහළ බලපෑම - ඉහළ වැදගත්කම, ඉහළ බලපෑම - අඩු වැදගත්කම, අඩු බලපෑම - ඉහළ වැදගත්කම සහ අඩු බලපෑම - අඩු වැදගත්කම යනුවෙන් ප්‍රවර්ග හතරකට ඔවුන්ව බෙදා වෙන් කරන ලදි. මෙම වගුව දෙස බැලූ පමණින් වඩාත්ම බලගතු සහ වැදගත් පාර්ශ්වකරුවන් පහසුවෙන් හඳුනා ගත හැකි ය.

*1 වගුව: ගාල්ල මහා නගර සභා ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේ විවිධ පාර්ශ්වකාර නියැලීම් මට්ටම් විශ්ලේෂණය*

| ඉහළ මට්ටමේ අවශ්‍යතාව හා ඉහළ මට්ටමේ බලපෑමක් සහිත පාර්ශ්වකරුවන් | ඉහළ මට්ටමේ බලපෑමක් හා අවම අවශ්‍යතාව සහිත පාර්ශ්වකරුවන් |
|---|---|
| 1. ගාල්ල මහා නගර සභාව<br>2. මානව හා පරිසර සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීමේ සංවිධානය (HELP-O)<br>3. පිවිතුරු නගර, නීල සාගර වැඩසටහන, USAID<br>4. ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>5. පරිසර ඒකකය, පොලිස් ස්ථානය<br>6. ප්‍රධාන ලේකම් කාර්යාලය, දකුණු පළාත<br>7. පළාත් පාලන දෙපාර්තමේන්තුව, දකුණු පළාත<br>8. පරිසර අමාත්‍යාංශය, දකුණු පළාත<br>9. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව<br>10. ගාලු උරුම පදනම<br>11. රාජ්‍ය නොවන සංවිධාන (NGOs) (උදා .-DEIHERM, Janathakshan)<br>12. මධ්‍යම පරිසර අධිකාරිය (CEA)<br>13. ගාල්ල මහා නගර සභාව යටතේ ස්ථාපිත ප්‍රජා සංවර්ධන | 1. විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන(උ.දා.- රුහුණු විශ්වවිද්‍යාලය, NIBM, ICBT, ESOFT යනාදිය.)<br>2. වාණිජ මණ්ඩලය<br>3. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව |

| | |
|---|---|
| සභා (CDCs)<br>14. සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය (MEPA), ගාල්ල<br>15. නාගරික සංවර්ධන අධිකාරිය (UDA), ගාල්ල<br>16. වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව<br>17. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA)<br>18. රජයේ රෝහල් (e.g. කරාපිටිය ශික්ෂණ රෝහල, මහමෝදර ශික්ෂණ රෝහල, ආයුර්වේද රෝහල - මීගොල්ල)<br>19. පෞද්ගලික රෝහල් (e.g.- ආසිරි රෝහල, සමූපකාර රෝහල, රුහුණු රෝහල, Queensbury රෝහල)<br>**20.** දේශීය හා විදේශීය සංචාරකයන් සඳහා පහසුකම් සපයනු ලබන හෝටල් සහ ආපන ශාලා | |
| ඉහළ මට්ටමේ අවශ්‍යතාව හා අවම බලපෑමක් සහිත පාර්ශ්වකරුවන්<br>1. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල<br>2. ධීවර වරාය, ගාල්ල<br>3. දිස්ත්‍රික් වාරිමාර්ග කාර්යාලය, ගාල්ල<br>4. පාසැල්<br>5. උපදේශන කණ්ඩායම්<br>6. අවදානමට ලක්විය හැකි කණ්ඩායම්<br>7. අඩු පහසුකම් සහිත ජනාවාස - උදා: බොම්බේ කාසල් වත්ත, මොහිදීන් වත්ත, සලාමියා වත්ත (ගෙවල් 70), වයිනා ගාර්ඩන් යනාදිය.<br>8. කසළ ඒකරාශී කරන්නන් හා කසළ එකතු කරන්නන් (උදා: සී/ස සන් පේපර් (පුද්.) සමාගම)<br>9. අවිධිමත් කසළ එකතු කරන්නන් (IWCs)<br>10. නිෂ්පාදකයන් සහ පාරිභෝගික වෙළඳ නාම (උදා: කොකා කෝලා, ඉන්සි සිමෙන්ති, එලිෆන්ට් හවුස් යනාදිය) | අවම බලපෑමක් සහිත හා අවම අවශ්‍යතාව සහිත පාර්ශ්වකරුවන්<br>**Low Influence, Low Importance**<br>1. Galle Fort Army Camp (Gemunu)<br>ගාලු කොටුව හමුදා කඳවුර (ගැමුණු)<br>2. Southern Naval Base, Sri Lanka Navy<br>දකුණු පළාත් නාවික මූලස්ථානය, ශ්‍රී ලංකා නාවික හමුදාව<br>3. Provincial Department of Land<br>පළාත් ඉඩම් දෙපාර්තමේන්තුව<br>4. Galle Prison ගාල්ල බන්ධනාගාරය<br>5. Railway Stations (e.g.- Galle, Richmond Hill) දුම්රිය ස්ථාන (උදා :- ගාල්ල, රිච්මන්ඩ් හිල්) |

ඉහත වගුවට අනුව, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් ගත් කල නගරයේ බොහෝ පාර්ශ්වකරුවන් ඉතා වැදගත් වන අතර, ඔවුන්ට ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කෙරෙහි ද විශාල බලපෑමක් කළ හැකි ය. මධ්‍යස්ථ නැතහොත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කෙරෙහි අඩු වැදගත්කමක් සහ අඩු බලපෑමක් ඇති පාර්ශ්වකරුවන් කිහිප දෙනෙකු පමණක් හඳුනාගෙන ඇත. නගර ව්‍යාප්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණයෙහිලා මෙම වැදගත් සහ බලගතු පාර්ශ්වකරුවන් ආයතනගත රාමුවක් මගින් සම්බන්ධ කර ගැනීමට ගාල්ල මහා නගර සභා මට්ටමින් විස්තීර්ණ යාන්ත්‍රණයක් තිබීමේ අවශ්‍යතාව මින් ඇඟවේ. විවිධ ප්‍රදානක අරමුදල් ව්‍යාපෘති යටතේ බොහෝ පාර්ශ්වකරුවන්ගේ සංසද සහ මෙහෙයුම් කමිටු පිහිටුවා තිබුණ ද, ඝන අපද්‍රව්‍ය කළමනාකරණයෙහි විවිධ පාර්ශ්වකරුවන් සක්‍රියව සම්බන්ධ කර ගැනීම සඳහා එවැනි සංසද ආයතනගත කිරීමට නීතිමය විධිවිධාන නොමැතිකම ගාල්ල මහා නගර සභාවෙහි වත්මන් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියේ අඩුපාඩුවක් බව නිරීක්ෂණය වී ඇත. පාර්ශ්වකරුවන්ට දේශීය ප්‍රජාවේ සිට ගෝලීය පරිසරය දක්වා විවිධ මට්ටම්වලින් ධනාත්මක වෙනස්කම් ඇති කිරීමට ස්වකීය විශේෂඥතාව, සම්පත් සහ ප්‍රයත්න මගින් දායක වීමෙන් 3R/ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සේවා සැපයීමේ බලපෑම සාමූහිකව හැඩගැස්විය හැකි ය. තිරසර කසළ කළමනාකරණ මූලාරම්භයන් සාර්ථක කර ගැනීම සඳහා විවිධ පාර්ශ්වකරුවන් අතර සහයෝගීතාව සහ මැදිහත්වීම අත්‍යවශ්‍ය වේ.

# 5. ඝන අපද්‍රව්‍ය කළමනාකරණ නීති සහ රෙගුලාසි

ශ්‍රී ලංකාවේ කසළ කළමනාකරණය ප්‍රධාන අභියෝගයකි. එක්සත් ජාතීන්ගේ (UN) ආහාර හා කෘෂිකර්ම සංවිධානයට (FAO) අනුව දිනකට රට තුළ ඝන අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 7,000ක් ජනනය වන අතර එම කසළවලින් අඩක් පමණක් එකතු කෙරේ. ඉතිරිවන කසළ එක්කෝ විවෘත බිම් පිරවුම්වලට බැහැර කිරීම හෝ එළිමහනේ පිළිස්සීම නිසා පරිසර දූෂණය හා සෞඛ්‍ය ගැටලු ඇතිවේ. ශ්‍රී ලංකාවේ කසළ කළමනාකරණයට ඇති ප්‍රධාන අභියෝග අතර ශීඝ්‍ර ජනගහන වර්ධනය සහ නාගරීකරණය, ප්‍රමාණවත් ලෙස කසළ එකතු නොකිරීම, බැහැර කිරීමේ පහසුකම් නොමැතිකම සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ මහජනතාවගේ දැනුවත්භාවය නොමැතිකම ඇතුළත් වේ. වර්තමානයේ ශ්‍රී ලංකාවේ ජනගහනය වසරකට 1.2%ක වේගයකින් වර්ධනය වන අතර නාගරික ජනගහනය ඊටත් වඩා වේගයෙන් වර්ධනය වේ (සංගණන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව 2011). මෙය රටේ කසළ කළමනාකරණ යටිතල ව්‍යුහයට පීඩනයක් එල්ල කරන අතර ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වඩාත් ක්‍රමානුකූල ප්‍රවේශයක් ඉල්ලා සිටින අතර, එය ශක්තිමත් සහ විස්තීර්ණ නීතිමය රාමුවකින් සහාය වේ. ගාල්ල මහා නගර සභාව ඇතුළුව ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන (LAs) විසින් සම්මත කරනු ලබන ශ්‍රී ලංකාවේ පවතින ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ප්‍රතිපත්ති/නීති පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

## අ. ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සහ නීති

- මහා නගර සභා ආඥාපනත - 1947 අංක 29,
- පළාත් සභා සහ පළාත් පාලන චක්‍රලේඛය 01/2015,
- ජාතික පාරිසරික පනත (අංක 1627/19 - 2009.11.10)
- ජාතික පරිසර ප්‍රතිපත්තිය (2022 ජුනි 28 දිනැති අංකඃ අමප-22/0711/523/011 දරන අමාත්‍ය මණ්ඩල තීරණය) - තිරසර ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධව
- ජාතික පාරිසරික ක්‍රියාකාරී සැලැස්ම 2022 - 2030 (2022 දී ප්‍රකාශනයට පත් කළ)
- ජාතික පාරිසරික ක්‍රියාකාරී සැලැස්ම 2022 - 2030 (2022 දී ප්‍රකාශනයට පත් කළ) - 6 වන තේමාව - සාකල්‍ය කසළ කළමනාකරණය
- කසළ කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය 2019 (2019 ඔක්තෝබර් 01 දින, අංක CP19/2049/104/044-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමත කරන ලද) - ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධව
- ශ්‍රී ලංකාව සඳහා තිරසර පරිභෝජනය සහ නිෂ්පාදනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය (2019) - කසළ සම්බන්ධව (ඇමුණුම 3.4)
- ශ්‍රී ලංකාවේ දේශගුණ විපර්යාස පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය - කසළ කළමනාකරණය සම්බන්ධව
- ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම (NAPPWM) 2021-2030.

සභාව විසින් අනුමත කර ඇති ක්‍රියා පටිපාටි මගින් ගාල්ල මහා නගර සභාවෙහි ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ප්‍රතිපත්තියෙහි අරමුණ සඳහා ඉහත ව්‍යවස්ථාපිත විධිවිධාන අනුගමනය කර ඇත.

ජාතික අවශ්‍යතා සහ ප්‍රමිතීන් සමග ගාල්ල මහා නගර සභාවෙහි ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අනුකූලතා මට්ටම අවබෝධ කර ගැනීම සඳහා, CCBO විසින් USAID සහාය ඇතිව 2021/2022 දී " ඝන අපද්‍රව්‍ය පාලන පරතරය විශ්ලේෂණයක් (Solid Waste Governance Gap Analysis)" සිදු කර ඇත. 2022 අගෝස්තු මාසයේ දී ප්‍රකාශයට පත් කරන ලද වාර්තාවට අනුව, මෙම විශ්ලේෂණයේ ප්‍රධාන අනාවරණ පහත කොටස් මගින් නිරූපණය කෙරේ.

## ආ. අනුකූලතා අවශ්‍යතා

ඝන අපද්‍රව්‍ය ගැටලු සම්බන්ධයෙන් ගාල්ල මහා නගර සභාවෙහි අනුකූලතා සහ ප්‍රමිති අවශ්‍යතා නියම කෙරෙන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පාලනය සම්බන්ධ ජාතික සහ උප-ජාතික නෛතික ලේඛන (ආඥාපනත/පනත්/නීති/ප්‍රතිපත්ති) සමාලෝචනය කිරීම පිණිස සහ එම ප්‍රමිතීන් සපුරාලන්නේ ද යන්න තීරණය කිරීම, සහ එසේ නොවන්නේ නම් එම අනුකූලතා පරතර පියවීම සඳහා නිර්දේශ මාලාවක් ඉදිරිපත් කිරීම පිණිස "පිවිතුරු නගර, නීල සාගර" වැඩසටහන (CCBO) විසින් පවත්වන ලද පාලන පරතරය විශ්ලේෂණයට (Solid Waste Governance Gap Analysis) අනුව, පරිසරය ආරක්ෂා කිරීම සහ කසළ කළමනාකරණය සම්බන්ධයෙන් පළාත් පාලන මට්ටමේ දී වගකීම දරන ප්‍රමුඛ ජාතික මට්ටමේ රාජ්‍ය අධිකාරීන්/නියාමන ආයතන පහත දැක්වේ.

- ශ්‍රී ලංකා පරිසර අමාත්‍යාංශය (1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත)
- පළාත් සභා සහ පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශය (1947 අංක 29 දරන මහා නගර සභා ආඥාපනත)
- මධ්‍යම පරිසර අධිකාරිය (CEA; 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ ජාතික පාරිසරික පනතේ නියෝග/රෙගුලාසි බලාත්මක කිරීමේ අධිකාරිය),
- සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය (MEPA) (2008 අංක 25 දරන සමුද්‍රීය දූෂණ වැළැක්වීමේ පනතෙහි අධිකාරිය),
- වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව (2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ පනත),
- නාගරික සංවර්ධන අධිකාරිය - UDA (1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතෙහි අධිකාරිය)
- සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී (පළාත් පාලන ආයතනවලට අනුයුක්ත) - MOH (1980 අංක 26 දරන ආහාර පනත, 1862 අංක 15 දරන කරදර ආඥාපනත සහ 1987 අංක 03 දරන නිරෝධායනය හා රෝග වැළැක්වීමේ ආඥාපනතෙහි අධිකාරිය)
- මහා නගර සභා (සහ අනෙකුත් පළාත් පාලන ආයතන) (1947 අංක 29 දරන මහා නගර සභා ආඥාපනතෙහි අධිකාරිය).

**"පිවිතුරු නගර, නීල සාගර"** වැඩසටහනෙහි එම ඝන අපද්‍රව්‍ය පාලන පරතර විශ්ලේෂණ වාර්තාවට අනුව පළාත් සහ පළාත් පාලන මට්ටමේ අවශ්‍යතා පහත දැක්වේ.

- දකුණු පළාත් සභා සම්මත අතුරු ව්‍යවස්ථා (අංක 1834 - 2013.10.25, අංක 1834 - 2013.10.27)

2016.08.30 දින ගාල්ල මහා නගර සභා අංක 342 මගින් සම්මත කරන ලද පළාත් සම්මත අතුරු ව්‍යවස්ථාව 2016.09.02 දිනැති ගැසට් නිවේදනය මගින් පිළිගැනීමට ලක් විය.

## ඇ. ගාල්ල මහා නගර සභාවෙහි ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අනුකූලතා තත්ත්වය

CCBO ඝන අපද්‍රව්‍ය පාලන පරතර විශ්ලේෂණ වාර්තාව, ඝන අපද්‍රව්‍ය කළමනාකරණයෙහි ප්‍රධාන කොටස්, එනම් සැලසුම් කිරීම, නෛතික හා ප්‍රතිපත්ති, මූල්‍ය කළමනාකරණය, සේවා සැපයීම, මානව සම්පත්, ප්‍රජා නියැලීම, බලාත්මක කිරීම, සමුද්‍ර සුන්බුන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය යනාදිය පිළිබඳ විශ්ලේෂණය මත පදනම්ව ගාල්ල මහා නගර සභාවෙහි නියාමන අනුකූලතා මට්ටම පෙන්නුම් කෙරෙන සාරාංශයක් ඉදිරිපත් කරයි (2 වගුව). ගාල්ල මහා නගර සභාවේ ඝන අපද්‍රව්‍ය/පරිසරය සහ/හෝ පළාත් පාලන ආයතන (GMC) සඳහා වන විශේෂිතව සඳහන් කර ඇති නියාමන හෝ අනිවාර්ය අවශ්‍යතා හා සම්බන්ධ සමස්ත විධිවිධාන 25ක් "පිවිතුරු නගර, නීල සාගර" වැඩසටහන විසින් අතුරු ව්‍යවස්ථා, සභා යෝජනා, අභ්‍යන්තර ප්‍රතිපත්ති, සභා කමිටු, සහ විශේෂ අංශ සහ ක්‍රියා පටිපාටි ඇතුළත් ගාල්ල මහා නගර සභා ලේඛන සමග විශ්ලේෂණය කර ඇත. සැලකිය යුතු කරුණක් වූයේ මූල්‍ය කළමනාකරණය, සමුද්‍රීය සුන්බුන් (සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ විධිවිධාන යටතේ සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් සිදු කරන පරිදි) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය යන සංරචකයන්ට අදාළව ඝන අපද්‍රව්‍ය කළමනාකරණයෙහිලා අන්තර්ගත කිරීමට ගාල්ල මහා නගර සභාවට අනිවාර්ය කළ යුතුව තිබූ සංරචක කිසිවක් හමු නොවීම ය.

2 වගුව : SWM ප්‍රධාන සංරචකයන් සම්බන්ධයෙන් GMC අනුකූලතා තත්ත්වය (2022 ජූලි)

| ප්‍රවර්ගය | මුළු විධිවිධාන | පූර්ණ අනුකූලතාව | | අර්ධ අනුකූලතාව | | අනුකූලතාව නොමැති | |
|---|---|---|---|---|---|---|---|
| | | අනිවාර්ය | ජාතික ප්‍රතිපත්ති නිර්දේශ | අනිවාර්ය | ජාතික ප්‍රතිපත්ති නිර්දේශ | අනිවාර්ය | ජාතික ප්‍රතිපත්ති නිර්දේශ |
| සැලසුම් | 02 | - | - | - | 03 | 02 | - |
| නීති හා ප්‍රතිපත්ති | 07 | 01 | - | 02 | 01 | 02 | - |
| සේවා සැපයීම | 06 | - | - | 04 | 04 | - | 02 |
| මානව සම්පත් | 01 | - | - | - | 02 | - | - |
| ප්‍රජා නියැලීම | 06 | - | - | 02 | 03 | - | 03 |
| බලාත්මක කිරීම | 05 | 01 | 01 | 02 | 01 | 01 | - |
| සමුද්‍රීය කසළ | - | - | | - | | - | |
| ස්ත්‍රී-පුරුෂ සමාජභාවය | - | - | | - | | - | - |
| එකතුව | | 02 | 01 | 10 | 14 | 05 | 05 |
| **මුළු එකතුව** | **25** | **03** | | **24** | | **10** | |
| ප්‍රතිශතය | | **12%** | | **65%** | | **40%** | |

*(මූලාශ්‍රය: ඝන අපද්‍රව්‍ය පාලන පරතර විශ්ලේෂණය , USAID-CCBO, 2022*

විධිවිධාන 25ක් අතුරින් ගාල්ල මහා නගර සභාවෙහි අනුකූලතාව ගත් කල විධිවිධාන 3ක් සඳහා පූර්ණ අනුකූලතාවක් ද (12%), විධිවිධාන 12ක් සඳහා අර්ධ අනුකූලතාවක් ද (48%), විධිවිධාන 10ක් සඳහා අනුකූලතාව නොමැති වීමක් ද (40%) පවතී. ඒ අනුව, ගාල්ල මහා නගර සභාව විසින් 3ඝ/ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා විශ්වාසදායක සහ මනා බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට අත්‍යවශ්‍ය වන අර්ධ අනුකූලතා හෝ නියාමන අනුකූලතාවලින් 88%කට අනුගත වීම සඳහා ඔවුන්ගේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය වැඩිදියුණු කිරීම සලකා බැලිය යුතු බව CCBO නිර්දේශ කරයි.

අනුකූලතා මට්ටම පිළිබඳ ඉහත සවිස්තරාත්මක තක්සේරුව මත පදනම්ව, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික අවශ්‍යතාවන්ට පූර්ණ වශයෙන් අනුකූල වීම සඳහා "පිවිතුරු නගර, නීල සාගර" වැඩසටහන් වාර්තාව මගින් පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරනු ලැබ ඇත.

1. ගාල්ල මහා නගර සභාවෙහි බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම සඳහා පහත සඳහන් කොටස් අවධානයට ලක් කෙරෙන සහා අතුරු ව්‍යවස්ථා සකස් කිරීම සහ බලාත්මක කිරීම.

   අ. ප්ලාස්ටික් සහ ප්ලාස්ටික් බෑග් පිලිස්සීම වැළැක්වීම

   ආ. විශේෂ අවස්ථා/ උත්සව සඳහා අවසර දීමේ දී අනිවාර්ය කොන්දේසියක් ලෙස සැරසිලි සඳහා පොලිතින් භාවිතය වැළැක්වීම

   ඇ. බිත්ති හෝ ගොඩනැගිලිවල හෝ වෙනත් අනවසර ස්ථානවල පෝස්ටර් හෝ දැන්වීම් ප්‍රදර්ශනය කිරීම වැළැක්වීම සහ ප්‍රචාරණ පුවරු සවිකිරීමේ රෙගුලාසි

   ඈ. වායුගෝලීය දූෂණය පාලනය කිරීම; ශබ්ද දූෂණය පාලනය කිරීම

   ඉ. සෞඛ්‍යයට සහ පරිසරයට උපද්‍රවකාරී කවර හෝ ද්‍රව්‍යයක් ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම සහ බැහැර කිරීම පාලනය

   ඊ. අවිධිමත් කසළ එකතු කරන්නන්ගේ (අවසරපත්‍ර) සහ කසළ ඒකරාශි කරන්නන්ගේ (වෙළඳ බලපත්‍ර) මෙහෙයුම් සඳහා විධිමත් සහ නීතිමය ආරක්ෂාව සඳහා අවසර පත්‍රයක්/බලපත්‍රයක් ලබා දීමේ ක්‍රියා පටිපාටිය සහ කොන්දේසි

   උ. කිසිඳු පුද්ගලයෙකු කිසිඳු ජාතික මහා මාර්ගයක් දෙපස නාගරික ඝන අපද්‍රව්‍ය බැහැර නොකළ යුතු ය.

   ඌ. අදාළ පළාත් පාලන ආයතනය හෝ ඒ වෙනුවෙන් ඔවුන් විසින් බලය පවරන ලද කිසියම් පුද්ගලයෙකු හෝ පුද්ගල මණ්ඩලයක් විසින් එම කාර්යය සඳහා නම් කර ඇති ස්ථාන හැර වෙනත් කිසිදු ස්ථානයක ඝන අපද්‍රව්‍ය බැහැර නොකළ යුතු ය.

   එ. කිසිඳු පුද්ගලයෙක ප.ව 6.00 සිට පෙ.ව 6.00 දක්වා කාලය තුළ හැර ජාතික මහාමාර්ගයේ දෙපස නියමිත ස්ථානයකින් නාගරික ඝන අපද්‍රව්‍ය එකතු කිරීම හෝ එකතු කිරීමට සැලැස්වීම සිදු නොකළ යුතු ය.

   ඒ. අදාළ ගෘහයන්ගෙන් ගෘහස්ථ කසළ එකතු කිරීම ඒ වෙනුවෙන් බලය ලත් ඕනෑම පුද්ගලයෙකු හෝ පුද්ගල මණ්ඩලයක් විසින් පෙ.ව. 6.00 සිට පස්වරු 6.00 දක්වා කාලය තුළ සිදු කළ හැකි ය.

2. 3R/ඝන අපද්‍රව්‍ය කළමනාකරණය (ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මෙහෙයුම්වලදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය මූල ප්‍රවාහගත කිරීම පිළිබඳ විශේෂ සඳහනක් සහිතව) සම්බන්ධව ගාල්ල මහා නගර සභාවෙහි ස්ථාවරය ශක්තිමත් කිරීම සඳහා ඉහත වගුවල ප්‍රකාශිත කොටස් සැලකිල්ලට ගනිමින් ගාල්ල මහා නගර සභාව සඳහා අභ්‍යන්තර 3R/ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්තියක් සකස් කිරීම.

3. දැනටමත් සම්මත කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ - දකුණු පළාත් අංක 1834, 2013.10.25 22 (i) වගන්තියට අනුව අවසරපත්‍ර/බලපත්‍ර ලබා දීමෙන් කසළ එකතු කරන්නන්/ඒකරාශි කරන්නන් (aggregators)/නැවත භාවිත කරන්නන්/ ප්‍රතිචක්‍රීකරණය කරන්නන් නියාමනය කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කිරීමට සභා පත්‍රිකාවක්/ සභා යෝජනාවක් ඉදිරිපත් කිරීම.

4. පළාත් සම්මත අතුරු ව්‍යවස්ථාවේ/ මහා නගර සභා ආඥාපනතේ වගන්තිවලට අදාළව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් වෙත බලතල පැවරීමේ හැකියාව සොයා බැලීම.

5. සියලුම ගෘහයන්ට කසළ එකතු කිරීමේ සේවා අඛණ්ඩව ලබා දෙන්නේ කෙසේ ද යන්න තීරණය කිරීම සඳහා එකතු කිරීමේ කාර්යක්ෂමතා අධ්‍යයනයක් ගාල්ල මහා නගර සභාව විසින් සිදු කිරීම.

6. අනාගත අලෙවිය සඳහා (PET බෝතල්, විද්‍යුත් අපද්‍රව්‍ය සහ ඉදිකිරීම් සහ බිඳ හෙලීම් වැනි) ගාල්ල මහා නගර සභා පහසුකම්වල ඒකරාශී කළ හැකි ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය එකතුව වැඩි කිරීමේ ක්‍රම හඳුනා ගැනීම සඳහා එහි වත්මන් එකතු කිරීමේ ක්‍රමය ගාල්ල මහා නගර සභාව විසින් සමාලෝචනය කිරීම.

# 6. කසළ ප්‍රක්ෂේපණ සහ ලක්ෂණ

ගාල්ල මහා නගර සභා ප්‍රදේශයේ කසළ ගැටලුව සම්බන්ධ ඉහත සාකච්ඡාව සහ ගාල්ල මහා නගර සභාවෙහි 3R/ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියා පටිපාටි විශ්ලේෂණය, සම්පත් උපයෝජ්‍යතාව සහ අනුකූලතා පරතර සහ නිර්දේශයන් යනාදිය ගාල්ල මහා නගර සභා ප්‍රදේශය තුළ, අංශ අනුව කසළ වෙන් කිරීමේ භාවිතාවන් පිළිබඳ මූලික තක්සේරුව සහ කසළ කළමනාකරණ සේවා තක්සේරුව (BWAS), CACG ව්‍යාපෘතිය යටතේ සිදු කිරීමට මං පාදන ලදි. තවද, ගාල්ල මහා නගර සභා ප්‍රදේශය තුළ ජනනය වන සහ එකතු කරනු ලබන කසළ ප්‍රමාණය පිළිබඳ දැනුම් පරතර සැලකිල්ලට ගනිමින් එම CACG ව්‍යාපෘතිය යටතෙහිම, කසළ විගණනය හා අනුලක්ෂණ අධ්‍යයනය පවත්වන ලදි. ගාල්ල මහා නගර සභා ප්‍රදේශයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ගැටලුවෙහි වත්මන් සන්දර්භය අවබෝධ කර ගැනීම සඳහා මූලික තක්සේරුවේ සහ කසළ විගණනයේ ප්‍රමුඛ අනාවරණ පහත කොටස්වලින් ඉදිරිපත් කෙරේ.

## අ. ජනවිකාස පැතිකඩ (Demographic Profile)

2011 ජාතික සංගණනයට අනුව ගාල්ල මහා නගර සභා ප්‍රදේශයේ ජනගහන ප්‍රමාණය 101,159කි. මෙය 2001 ජාතික සංගණනයේ වාර්තා වූ 103,246ක ජනගහනයට සාපේක්ෂව අඩුවීමක් පෙන්නුම් කරයි. කෙසේ වෙතත්, ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2022 සම්පත් පැතිකඩට අනුව, ගාල්ල මහා නගර සභා බල ප්‍රදේශයේ ජනගහනය 103,600කි. මේ අතරින් බහුතරය සිංහල (91%), ජන වර්ගය ද, අනතුරුව පිළිවෙළින් දෙමළ (7%) සහ මුස්ලිම් (2%) ජනවර්ග ද වේ. එසේම, ආගම අනුව ජනගහනයෙන් බහුතරය බෞද්ධ (82%), වන අතර, අනතුරුව පිළිවෙළින් ක්‍රිස්තියානි (12%) සහ හින්දු (6%) වේ.

ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට අනුව, ගාල්ල මහා නගර සභා ප්‍රදේශයේ ජනගහන වර්ධන වේගය වසරකට 0.75%කි. එබැවින් 2030 සැලසුම් කාලය අවසන් වන විට ජනගහනය 109,981ක් දක්වා වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කළ හැකි ය.

3 වගුව : 2023 සිට 2030 දක්වා ජනගහන පුරෝකථනය

| වර්ෂය | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 |
|---|---|---|---|---|---|---|---|---|---|
| 0.75% වර්ධනයක දී පුරෝකථනය කෙරෙන ජනගහනය | 103,600 | 104,377 | 105,160 | 105,949 | 106,743 | 107,543 | 108,349 | 109,162 | 109,981 |

ගාල්ලේ ජනගහන වර්ධනයට සංචාරක ව්‍යාපාරයේ ව්‍යාප්තිය සැලකිය යුතු ලෙස බලපා ඇත. නගරය ඉතා ප්‍රියමනාප සංචාරක ගමනාන්තයක් වන අතර මෑත වසරවල දී ගාල්ලට පැමිණෙන සංචාරකයන් සංඛ්‍යාව ඉහළ ගොස් ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස සංචාරක ක්ෂේත්‍රය වර්ධනය වී ශ්‍රී ලංකාවේ අනෙකුත් ප්‍රදේශවලින් ජනතාව ආකර්ෂණය කර ගනිමින් නව රැකියා අවස්ථා නිර්මාණය වී ඇත. නිෂ්පාදන, කෘෂිකර්මාන්තය සහ ධීවර කර්මාන්තය ගාල්ලේ පිහිටා ඇති කර්මාන්ත කිහිපයකි. මෙම ක්ෂේත්‍රවල පිබිදීම සහ ඒවායින් ඇති කළ නව රැකියා අවස්ථාවල ප්‍රතිඵලයක් ලෙස ජනතාව මෙම ප්‍රදේශයට බහුලව පැමිණෙති. ජනගහනය වැඩිවීම නිසා නගරයේ යටිතල පහසුකම් අඩාල වී ඇත. නගරයේ මාර්ග, පාසල් සහ රෝහල් සියල්ල මධ්‍යගතව පිහිටා ඇත. ගාල්ලේ ජනගහන වැඩිවීමට බලපා ඇති තවත් අංගයක් වන්නේ ගම්බද ප්‍රදේශවලින් පදිංචිකරුවන් සංක්‍රමණය වීමයි. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශ බොහෝවිට දිළිඳු සහ ඌන සංවර්ධිත ප්‍රදේශ වන බැවින් බොහෝ ජනතාව වඩා හොඳ අවස්ථා

සෙවීම සඳහා ගාල්ලෙහි පදිංචියට පැමිණ ඇත.

## ආ. වත්මන් කසළ ජනනය, බැහැර කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය

ගාල්ල මහා නගර සභා ප්‍රදේශයේ වර්තමාන කසළ උත්පාදනය, බැහැර කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා ගැනීම සඳහා, මූලික කසළ තක්සේරු සමීක්ෂණය (BWAS) සහ කසළ විගණනය සහ අනුලක්ෂණ අධ්‍යයනය (WACS) යන අධ්‍යයනයන්හි අනාවරණ ඉතා වැදගත් වේ.

මූලික කසළ තක්සේරු සමීක්ෂණය මගින් ගෘහස්ථ, වාණිජ, කර්මාන්ත සහ සේවා අංශ වැනි ප්‍රධාන අංශ කෙරෙහි අවධානය යොමු කරමින්, නගර ව්‍යාප්ත කසළ ජනනය; එකතු කිරීම හා ප්‍රවාහනය, බැහැර කිරීමේ ක්‍රම; 3R/ඝන අපද්‍රව්‍ය කළමනාකරණ භාවිතාවන්හි වත්මන් තත්ත්වය, සහ වත්මන් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය සහ ඒ හා සම්බන්ධ ගැටලු හා අභියෝග පිළිබඳව ප්‍රජාවගේ හා අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ අදහස් සම්බන්ධයෙන් වත්මන් දත්ත හා තොරතුරු රැස් කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදි. මීට අමතරව, කසළ ප්‍රශ්නයට දායක වන සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේ දී සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරන තවත් අංශ කිහිපයක් ද මෙම තක්සේරුවේ දී සලකා බලන ලදි. මෙම අංශවලට කසළ ඒකරාශි කරන්නන් (waste aggregators), ආගමික ස්ථාන, සෞඛ්‍ය අංශය යනාදිය ඇතුළත් වේ.

මූලික කසළ තක්සේරු සමීක්ෂණය ගෘහස්ථ ඒකක 1,830ක්, වාණිජ ඒකක 586ක්, කර්මාන්ත ඒකක 214ක් සහ සේවා අංශයේ ආයතන 174ක් ඇතුළත් නියැදි සමීක්ෂණයක් ලෙස පවත්වන ලදි. මීට අමතරව, සෞඛ්‍ය අංශය, ආගමික අංශය සහ කසළ එක්රැස් කරන්නන් නියෝජනය වන පරිදි පිළිවෙළින් ආයතන 30ක්, 29ක් සහ 21ක් මූලික කසළ තක්සේරු සමීක්ෂණය සඳහා තෝරා ගන්නා ලදි. තවද, නීති විරෝධීව කසළ බැහැර කරන්නන් 16ක්, ගාල්ල මහා නගර සභා කම්කරුවන් 12ක්, ගාල්ල මහා නගර සභා අධීක්ෂකවරු 10ක්, පරිසර පොලිස් නිලධාරීන් 2ක්, සංචාරකයන් 9ක්, සහ ප්‍රජා මූලික සංවිධාන (CBOs)/ රාජ්‍ය නොවන සංවිධාන 9ක් සමග මූලික කසළ තක්සේරු සමීක්ෂණය යටතේ සම්මුඛ සාකච්ඡාවක් සිදු කරන ලදි.

ආංශික සමීක්ෂණ සහ සම්මුඛ සාකච්ඡාවල ප්‍රමුඛ අනාවරණ මූලික කසළ තක්සේරු අධ්‍යයනය (BWAS) වාර්තාවෙහි සවිස්තරාත්මකව ඉදිරිපත් කෙරේ.





*රූප සටහන 1: BWAS සැලසුම් වැඩමුළුව (මූලාශ්‍රය: BWAS වාර්තාව, 2023)*



*රූප සටහන 2: BWAS ගණන්දීමේ නිලධාරී පුහුණුව (මූලාශ්‍රය: BWAS වාර්තාව, 2023)*



*රූප සටහන 3: ආංශික මූලික කසළ තක්සේරු අධ්‍යයනය (මූලාශ්‍රය: BWAS වාර්තාව, 2023)*

ප්‍රධාන අංශ, නීතිවිරෝධී ලෙස අපද්‍රව්‍ය බැහැර කරන්නන්, අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකයට අනුයුක්ත ගාල්ල මහා නගර සභාවේ නිලධාරීන් සහ ආගන්තුකයන් සමඟ පවත්වන ලද සම්මුඛ සාකච්ඡා සහ කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡාවල ප්‍රතිඵල අනුව, නගරයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා වන ප්‍රධාන නිර්දේශවල සාරාංශයක් පහත දැක්වේ.

- ගාල්ල මහා නගර සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ යාන්ත්‍රණය ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම, නීති විරෝධී ලෙස කසළ බැහැර කිරීම අවම කිරීම යනාදිය සඳහා විවිධ පාර්ශ්වකාර කණ්ඩායම්වල ප්‍රවේදිතා/අවශ්‍යතා හඳුනාගෙන ඒවා පිළියම් ලබා දීම සඳහා ක්‍රියාකාරී සැලැස්මකට අන්තර්ගත කිරීම.
- ගාල්ල මහා නගර සභාව සහ නගර පාර්ශ්වකරුවන් අතර තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා ඵලදායී ද්වි-මාර්ග සන්නිවේදන යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම.
- සමාජ හැසිරීම් වෙනසක් ඉලක්ක කර ගනිමින්, ගාල්ල මහා නගර සභාව ආශ්‍රිත ක්‍රියාකාරකම්වල නිරතව සිටින (කාන්තාවන්, ළමුන්, තරුණයන් වැනි අවදානමට ලක් විය හැකි කණ්ඩායම් ඇතුළුව) විවිධ ක්‍රියාකාරී කණ්ඩායම්වල ක්‍රියාකාරී සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා නිශ්චිත දැනුවත් කිරීම් හා ධාරිතා ගොඩනැගීමේ පුහුණුවක් ලබා දීම සහ යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම.
- සේවා සැපයීම, සම්පත් සහ ගාල්ල මහා නගර සභාවේ සේවකයන්ගේ ධාරිතාව පුළුල් කිරීම හරහා ගාල්ල මහා නගර සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය වැඩිදියුණු කිරීම.
- කසළ ඒකරාශි කරන්නන්, ප්‍රතිචක්‍රීකරණය කරන්නන්, විකල්ප නිෂ්පාදන සංවර්ධකයන් වැනි (ගාල්ල මහා නගර සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ යාන්ත්‍රණයෙන් පරිබාහිර) ඝන අපද්‍රව්‍ය කළමනාකරණයෙහි නියැලෙන අයට අවකාශ සහ අවස්ථා ලබා දීම සහ ගාල්ල මහා නගර සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියට ඔවුන් ඇතුළත් කර ගැනීම.

- සමාජ හැසිරීම් වෙනසක් සඳහා යාන්ත්‍රණ ප්‍රවර්ධනය කරන අතරම, ව්‍යවස්ථාපිත විධිවිධාන මගින් අනුබල සපයන්නා වූ, සමස්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය සඳහා විධිමත් ක්‍රියාත්මක කිරීමේ සහ අධීක්ෂණ/ඇගයීමේ යාන්ත්‍රණයක් ඇති බවට සහතික වීම.

කසළ විගණනය සහ අනුලක්ෂණ අධ්‍යයනය (WACS) යනු ව්‍යාපෘතිය යටතේ ඉටු කර භාර දිය යුතු ප්‍රධාන කටයුත්තක් වන ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්ම (ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්මෙහි) සංවර්ධනය කිරීමේ ප්‍රධාන පියවරකි. කසළ විගණනය සහ අනුලක්ෂණ අධ්‍යයනය යටතේ ගාල්ල මහා නගර සභා ප්‍රදේශයේ කසළ ජනන සහ කසළ එකතු කිරීමේ රටාව විශ්ලේෂණය කරන ලදි. මෙම අධ්‍යයනය මගින් මහමෝදර කලාපය, රිච්මන්ඩ් හිල් කලාපය, කරාපිටිය කලාපය, මොරගොඩ කලාපය සහ ගාලු බසාර් කලාපය ඇතුළු සමස්ත ගාල්ල මහා නගර සභා ප්‍රදේශය ආවරණය කරන ලදි. විශේෂයෙන්ම ප්ලාස්ටික් අපද්‍රව්‍ය කෙරෙහි අවධානය යොමු කරමින් අංශ අනුව විවිධ නාගරික ඝන අපද්‍රව්‍යවල සංයුතිය හඳුනා ගැනීම, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධව අනාගත තීරණ ගැනීමේ දී ගාල්ල මහා නගර සභාවේ සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ භාවිතය සඳහා විවිධ නාගරික සන අපද්‍රව්‍ය වර්ග පිළිබඳ දත්ත සමුදායක් නිර්මාණය කිරීම, ගාල්ල මහා නගර සභාව සඳහා ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට අවශ්‍ය ඝන අපද්‍රව්‍ය කළමනාකරණ දත්ත රැස් කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණු විය.

මධ්‍යම සීමා ප්‍රමේයය පදනම ලෙස ගෙන ක්ෂේත්‍ර අනුව සමස්ත ජනගහනයේ ප්‍රමාණය සලකා බලා, නේවාසික, වාණිජ, කර්මාන්ත සහ සේවා යන ප්‍රධාන අංශ නියෝජනය කරමින් පිළිවෙළින් WACS සඳහා නියැදි 101, 70, 50 සහ 30ක් වශයෙන් සමස්ත ඒකක 251ක් හඳුනා ගන්නා ලදි.



4 රූප සටහන: තෙත් කසළ මිශ්‍ර කිරීමේ සහ චතුර්ථභාගයන්ට වෙන් කිරීමේ ක්‍රියාවලිය (මූලාශ්‍රය: *(WACS)* වාර්තාව, 2023)




*5 රූප සටහන: වියළි කසළ වෙන් කිරීමේ ක්‍රියාවලිය (මූලාශ්‍රය: WACS වාර්තාව, 2023)*

කසළ විගණනයේ දෙවන අදියර ලෙස ගාල්ල මහා නගර සභාවෙහි දෛනික කසළ එකතු කිරීමේ වාහන ඇණිය කිරා බැලීම හීන්පැන්දල භූමියේ දී සිදු කරන ලදි.






*6 රූප සටහන: ගාල්ල මහා නගර සභාව සතු කසළ එකතු කිරීමේ වාහන ඇණියෙහි බර මැනීම (මූලාශ්‍රය: WACS වාර්තාව, 2023)*

කසළ විගණනය සහ අනුලක්ෂණ අධ්‍යයනය මගින් ගෘහස්ථ අංශයේ, වාණිජ අංශයේ, කර්මාන්ත අංශයේ සහ සේවා අංශයේ කසළ ජනනය ක්‍රමානුකූල ක්‍රියාවලියක් තුළ ගණනය කරන ලදි. ඉහත අංශ සඳහා කසළ විගණනය සහ අනුලක්ෂණ අධ්‍යයනයෙහි ප්‍රතිඵල සාරාංශයක් පහත වගුවෙන් දැක්වේ.

*4 වගුව : GMC ප්‍රදේශයේ ආංශික කසළ ජනනය (මූලාශ්‍රය: WACS වාර්තාව, 2023)*

| අංශය | GMC ප්‍රදේශයේ ජනනය වන දෛනික මුළු කසළ ප්‍රමාණය (මෙ.ටොන්) | GMC ප්‍රදේශයේ ජනනය වන වාර්ෂික මුළු කසළ ප්‍රමාණය (මෙ.ටොන්) | කසළ ජනනය සමස්තයෙන් ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| ගෘහස්ථ | 52.376 | 19,117.24 | 76.6 |
| වාණිජ | 11.145 | 4067.93 | 16.3 |
| කර්මාන්ත | 2.600 | 949 | 3.8 |
| සේවා | 2.256 | 823.44 | 3.3 |
| එකතුව | 68.377 | 24,957.6 | 100 |

ඉහත දත්ත අනුව, ගාල්ල මහා නගර සභා ප්‍රදේශයේ ඒක පුද්ගල කසළ ජනනය දිනකට කි.ග්‍රෑ. 0.66ක් වශයෙන් ගණනය කර ඇත. කසළ විගණනය සිදු කරන ලද්දේ අධික උද්ධමනය සහ ඊට අනුගාමීව ජීවන වියදම ඉහළ යාම හේතුවෙන් ජනතාව සහ ව්‍යාපාර බොහෝ දුෂ්කරතාවලට මුහුණ දෙමින් සිටින අභියෝගාත්මක කාල සීමාවකය. ඒ අනුව, දිනකට කි.ග්‍රෑ. 0.66 ඒක පුද්ගල කසළ ජනනය මගින්, මිනිසුන්ගේ අඩු වූ පරිභෝජන රටාව සහ වාණිජ හා කර්මාන්ත ආයතනවල පහත වැටුණු භාණ්ඩ අලෙවිය හා නිෂ්පාදනය හේතුවෙන් අඩු වූ කසළ ජනනයක් පිළිබිඹු විය හැකි ය.


0.75%ක වාර්ෂික වර්ධනයක දී, 2030 වන විට ගාල්ල නගර සභා බල ප්‍රදේශයේ ජනගහන ප්‍රමාණය 109,981ක් වනු ඇත. ඒක පුද්ගල කසළ ජනනය එලෙසම පවතී නම්, වසර පහක කාලය තුළ සමස්ත කසළ ජනන ප්‍රමාණය දෛනිකව මෙට්‍රික් ටොන් 3.7ක වැඩිවීමක් වාර්තා කරමින් මෙට්‍රික් ටොන් 72.077ක් පමණ වනු ඇත.

*5 වගුව: සමස්ත කසළ ජනන ප්‍රක්ෂේපණය (මූලාශ්‍රය: WACS ප්‍රතිඵල මත පදනම් වේ)*

| | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | 2024-2030 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 0.75% ක වර්ධනයක දී පුරෝකථනය කරන ලද ජනගහනය | 103,600 | 104,377 | 105,160 | 105,949 | 106,743 | 107,543 | 108,349 | 109,162 | 109,981 | |
| ජනගහන වර්ධනය | - | - | 783 | 789 | 794 | 800 | 806 | 813 | 819 | 5,534 |
| කසළ ජනනයේ දෛනික වර්ධනය (මෙ.ටොන්) | - | - | 0.517 | 0.521 | 0.524 | 0.528 | 0.532 | 0.537 | 0.541 | 3.700 |


## ඇ. කසළ සංයුතිය

පහත 7 රූප සටහන මගින් කසළ විගණනයේ දී සලකා බලන ලද සමස්ත කසළ සංරචකවල සංයුතිය නිරූපණය කෙරේ. ඒ අනුව, නාගරික ඝන කසලවලින් 54% තෙත් (ජෛව හායනයට ලක්විය හැකි, උදා: ගෙවතු අපද්‍රව්‍ය සහ මුළුතැන්ගෙයි අපද්‍රව්‍ය) සහ 27% වියළි ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍යවලින් (උදා: ප්ලාස්ටික්, ලෝහ සහ වීදුරු වර්ග) සමන්විත වේ. අවශේෂ අපද්‍රව්‍ය (උදා: සම්භාණ්ඩ, රෙදිපිළි) සහ විශේෂ අපද්‍රව්‍ය (උදා: අන්තරායකර අපද්‍රව්‍ය, සෞඛ්‍ය ආරක්ෂණ සහ විශාල අපද්‍රව්‍ය) සංයුතිය පිළිවෙලින් 17%සහ 2% කි.





*7 රූප සටහන: සමස්ත කසළ සංරචකවල සංයුතිය (මූලාශ්‍රය: WACS වාර්තාව, 2023)*

දිරාපත් නොවන කසළ සංයුති දත්ත සලකා බලන විට (8 රූපසටහන), වැඩිම ප්‍රමාණයක් ලැබෙන්නේ ප්ලාස්ටික්, රෙදිපිළි සහ වීදුරුවලිනි. මීට අමතරව, මුළු දිරාපත් නොවන කසළවලින් සැලකිය යුතු විශාල ප්‍රමාණයක් (13%) කඩදාසිවලින් ද සමන්විත වේ.




*8 රූප සටහන: දිරාපත් නොවන කසළ සංයුතිය (මූලාශ්‍රය: WACS වාර්තාව, 2023)*




*9 රූප සටහන: ප්ලාස්ටික් අපද්‍රව්‍ය සංයුතිය (මූලාශ්‍රය: WACS වාර්තාව, 2023)*

9 රූප සටහනෙහි දැක්වෙන පරිදි, ප්ලාස්ටික් අපද්‍රව්‍ය වර්ගවල සංයුතිය විශ්ලේෂණය කිරීමේ දී, LDPE ඉහළම අනුපාතය 35% කි. දෙවන ඉහළම ප්‍රමාණය HDPE (25%) වේ. PVC, PP සහ PS වර්ගයේ ප්ලාස්ටික් කුඩා ප්‍රමාණවලින් සමන්විත වන අතර පිළිවෙළින් 18%, 25% සහ 14% වේ.

ගාල්ල මහා නගර සභා ප්‍රදේශය තුළ කසළ එකතු කිරීම සම්බන්ධයෙන් ගත් කල, තෙත් කසළ, වියළි කසළ සහ මිශ්‍ර කසළ එකතු කිරීමේ වාර්ෂික සාමාන්‍යය අනුපිළිවෙළින් ගත් කල ආසන්න වශයෙන් මෙ.ටොන් 5,679.8, මෙ.ටොන් 1,500 සහ මෙ.ටොන් 721.2ක් වන බව අනාවරණය වී ඇත. ඒ අනුව, ගාල්ල මහා නගර සභාව විසින් වසරකට සමස්ත සාමාන්‍ය එකතුකිරීම මෙ.ටොන් 7,865.02කි. මෙ.ටොන් 24,957.6ක් වන වාර්ෂික කසළ ජනනය හා සසඳන විට, කසළ එකතු කිරීමේ අනුපාතය බර අනුව 31.51% කි.

ගාල්ල මහා නගර සභාව විසින් කසළ එකතු කිරීමේ අනුපාතය, සමස්ත අපද්‍රව්‍ය ජනනයෙන් 31.51%, ක් වන අතර, එය ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන සඳහා ජාතික සාමාන්‍ය ඝන අපද්‍රව්‍ය එකතු කිරීමේ අනුපාතයට සමාන වේ (Kaza et. al., 2018). කාසා සහ අනෙකුත් අය පවසන පරිදි, ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවලට එකතු කිරීමේ හැකියාව ඇත්තේ නාගරික ඝන අපද්‍රව්‍යවලින් තුනෙන් එකක් පමණක් වන අතර එය දිනකට මෙ.ටොන් 21,331ක ජනනයකින් දිනකට මෙ.ටොන් 7,110ක් පමණ වන බවට ඇස්තමේන්තු කර ඇත. ඒ අනුව, කසළ විගණනය සහ අනුලක්ෂණ අධ්‍යයනයේ ප්‍රතිඵලවල නිරවද්‍යතාව සහ පිළිගත හැකි බව සාධාරණීකරණය කළ හැකි ය.

ගාල්ල මහා නගර සභා ප්‍රදේශයේ ජනනය වන ඝන අපද්‍රව්‍යවලින් 68.49%ක් (බර අනුව) ගාල්ල මහා නගර සභාව වෙත භාර නොදෙන බව ද ප්‍රතිඵල මගින් පෙන්වා දේ. කෙසේ වෙතත්, සමීක්ෂණයන්හි නිරීක්ෂණ මගින් පෙන්වා දෙන්නේ ගාල්ල මහා නගර සභාවේ බහුතරයක් වීදි සහ විවෘත ප්‍රදේශ පිරිසිදු අතර නොමනා ලෙස කසළ බැහැර කිරීමේ දෘශ්‍යමාන සලකුණු නොමැති බවයි. ගාල්ල මහා නගර සභාව විසින් සමස්ත ගාල්ල මහා නගර සභා ප්‍රදේශයෙන් 31.51% ක ප්‍රමාණයක් කසළ එකතු කරන්නේ නම්, ඉතිරි කසළ බැහැර කිරීම හෝ කළමනාකරණය කිරීම සිදු කරන්නේ කෙසේ ද යන ප්‍රශ්නය මෙමගින් උද්ගත වේ. මූලික කසළ තක්සේරුවේ ප්‍රතිඵලවලට අනුව, සැලකිය යුතු කසළ ප්‍රමාණයක්, විශේෂයෙන්ම දිරාපත් වන කසළ, වීදුරු, ලෝහ, රෙදි වැනි විශේෂයෙන්ම බර අපද්‍රව්‍ය, පිළිගනු ලබන හා නොපිළිගන්නා භාවිතාවන් ද්විත්වයම විය හැකි, විකල්ප බැහැර කිරීමේ ක්‍රම යොදා ගනිමින් කළමනාකරණය කරනු ලබන බව අනාවරණය වී ඇත. එසේම, ගාල්ල මහා නගර සභා ප්‍රදේශය තුළ නීති විරෝධී ලෙස කසළ බැහැර කිරීම පුරුද්දක් වී ඇත. ඒ අයුරින්, ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවල සාමාන්‍ය කසළ එකතු කිරීමේ අනුපාතයට ආසන්න වන ගාල්ල මහා නගර සභාවේ කසළ එකතු කිරීමේ අනුපාතය සාධාරණීකරණය කළ හැකි ය.

## ඇ. කසළ ප්‍රක්ෂේපණය

පහත 6 වගුව මගින් 2023 සිට 2030 දක්වා කසළ වර්ගය අනුව වාර්ෂික ඇස්තමේන්තුගත කසළ ජනන ප්‍රමාණය නිරූපණය කෙරේ.

*6 වගුව: 2023 සිට 2030 දක්වා කසළ වර්ගය අනුව ඇස්තමේන්තුගත කසළ ජනන ප්‍රමාණය (මූලාශ්‍රය: WACS ප්‍රතිඵල)*

| කසළ වර්ගය | % | ඇස්තමේන්තුගත කසළ ජනනය (මෙ.ටොන්) | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 |
| ජෛවහායනීය | 54 | 13,777 | 13,880 | 13,984 | 14,089 | 14,194 | 14,301 | 14,408 | 14,516 |
| ප්‍රතිචක්‍රීකරණය කළ හැකි | 27 | 6,339 | 6,387 | 6,434 | 6,483 | 6,531 | 6,580 | 6,629 | 6,679 |
| අවශේෂ | 17 | 4,243 | 4,275 | 4,307 | 4,339 | 4,372 | 4,404 | 4,438 | 4,471 |
| විශේෂ අපද්‍රව්‍ය | 2 | 499 | 503 | 507 | 510 | 514 | 518 | 522 | 526 |
| මුළු ප්‍රමාණය | 100 | 24,858 | 25,045 | 25,232 | 25,421 | 25,611 | 25,803 | 25,997 | 26,192 |

# 7. වත්මන් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය


මූලික කසළ තක්සේරු සමීක්ෂණයෙහි මෙන්ම කසළ විගණනය සහ අනුලක්ෂණ අධ්‍යයනයෙහි ඉහත අනාවරණයන්ට අමතරව, ගාල්ල මහා නගර සභා ප්‍රදේශයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සේවා සැපයීමේ සහ එහි වත්මන් ක්‍රියාකාරිත්වයේ ප්‍රධාන ලක්ෂණයන්හි සාරාංශයක් පහත දැක්වේ.

<u>කසළ එකතු කිරීම</u>

- 2010 වසරේ සිට ගාල්ල මහා නගර සභාව විසින් එකතු කරනු ලබන්නේ දිරාපත් වන (තෙත්) සහ දිරාපත් නොවන (වියළි) ලෙස වෙන් කරන ලද කසළ පමණි. ගාල්ල මහා නගර සභාව විසින් මේ සම්බන්ධයෙන් සියලුම කසළ ජනනය කරන්නන් දැනුවත් කර ඇති අතර වෙන් නොකළ අපද්‍රව්‍ය එකතු කිරීම නවතා දමා ඇත.
- ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සේවා සැපයීම පෙරාතුව ඡන්ද කොට්ඨාස 15ක් මත පදනම්ව සැලසුම් කර තිබූ අතර වත්මන එය CCBO වැඩසටහනෙහි සහාය ඇතිව කසළ කළමනාකරණ කලාප 05 දක්වා අඩු කර ඇත.
- පිළිවෙළින් අස්ථිත්ව 81%, 85%, 64% සහ 78%ක් ආවරණය වන පරිදි ගෘහස්ථ, වාණිජ, කර්මාන්ත සහ සේවා අංශ සඳහා දොරින් දොරට ළඟා වී කසළ එකතු කිරීම සිදු කෙරේ. කසළ බැහැර කිරීමේ පොදු පහසුකම් ද නියමිත ස්ථානවල ඇත (උදා: බස් පර්යන්ත, ගාලු කොටුව).
- ගාල්ල මහා නගර සභාව ඇතැම් තොග වශයෙන් කසළ ජනනය කරන්නන්ගෙන් (උදා: ධීවර වරාය, හමුදා කඳවුර, නාවික හමුදා කඳවුර, ගාලු වරාය) කසළ එකතු නොකරයි. හීන්පැන්දල පිහිටි ගාල්ල මහා නගර සභා කසළ එකතු කිරීමේ පහසුකම වෙත එකී කසළ ජනනය කරන්නන් විසින්ම කසළ ප්‍රවාහනය කර භාරදෙනු ලැබේ.
- කසළ එකතු කිරීමේ කාලසටහන සෑම කසළ ජනනය කරන්නෙකුටම, ගෘහයකටම හෝ ආයතනයකටම බෙදා හැර ඇත. දිරාපත් වන, දිරාපත් නොවන සහ විශේෂ කසළ (උදා-සනීපාරක්ෂක අපද්‍රව්‍ය, විද්‍යුත් අපද්‍රව්‍ය ආදිය) එක් එක් ගමන් මාර්ගය ඔස්සේ එකතු කිරීම සඳහා සතියේ නිශ්චිත දිනයන් කාලසටහන මගින් දක්වනු ලැබේ.
- ගාල්ල මහා නගර සභා කාර්ය මණ්ඩලය වියළි කසළවලින් වටිනා ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය වර්ග තෝරා ඉවත් කරනු ලැබේ. ඔවුන් විසින් මෙම ද්‍රව්‍ය තබා ගනිමින් තම පාඩු ප්‍රතිපූරණයේ කොටසක් ලෙස ඒවා විකුණනු ලැබේ.
- ගාල්ල මහා නගර සභාවෙහි ක්‍රියාත්මක කසළ එකතු කිරීමේ නිත්‍ය ක්‍රමය යටතේ ගොඩනැගිලි අපද්‍රව්‍ය (ඉදිකිරීම් හා බිඳ හෙළීම් ද්‍රව්‍ය) එකතු නොකෙරේ. උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට දඩල්ල COWAM මධ්‍යස්ථානයේ පිහිටි ගාල්ල මහා නගර සභාව සතු, ගොඩනැගිලි-අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ පහසුකම වෙත ඒවා පිරියම් කර නැවත භාවිත කිරීම සඳහා ගොඩනැගිලි අපද්‍රව්‍ය ප්‍රවාහනය කර, ගෙවීම් සිදු කර භාර දීමට හැකි ය.

<u>කසළ පහසුකම් (Waste Facilities)</u>

- හීන්පැන්දල කසළ එකතු කිරීමේ පරිශ්‍රය





*10 රූප සටහන: 2022 දී ගුවන් මගින් ලබාගත් පරිශ්‍ර දර්ශන (මූලාශ්‍රය: Google Maps)*

- හීන්පැන්දල යනු ගාල්ල මහා නගර සභාව සතු දළ වශයෙන් හෙක්ටයාර 1.72ක ප්‍රමාණයක ඉඩමකි. එය කසළ හුවමාරු සහ බැහැර කිරීමේ පරිශ්‍රයක් ලෙස වත්මන භාවිත කෙරේ.
- වෙන් වෙන් වශයෙන් එකතු කරන ලද කසළ (තෙත්, වියළි, විශේෂ සනීපාරක්ෂක අපද්‍රව්‍ය හා විද්‍යුත් අපද්‍රව්‍ය සහ වෙන් නොකළ කවර හෝ අපද්‍රව්‍ය) සහ විශාල වශයෙන් කසළ ජනනය කරන්නන් (උදා: ධීවර වරාය, යුද හමුදා කඳවුර, නාවික හමුදා කඳවුර, ගාලු වරාය) විසින් ප්‍රවාහනය කරනු ලබන කසළ හැසිරවීම මෙම පරිශ්‍රයේ දී සිදු කෙරේ.
- කවාෂිමා (KAWASHIMA) තාක්ෂණය භාවිතයෙන් සහ ජපාන ජා;යන්;ර සහයෝ.;ා නියෝජිතායතනය (JICA) විසින් පරිත්‍යාග කරන ලද යන්ත්‍රෝපකරණ භාවිතයෙන් පරිශ්‍රයෙහි ගොඩනැගිල්ලක තෙත් කසළ කොම්පෝස්ට් කරනු ලැබේ. එහි මෙහෙයුම් 2023 මැයි මාසයේ දී ආරම්භ විය.
- ඇලුමිනියම් කෑන්, PET ප්ලාස්ටික් බෝතල් ප්‍රතිසාධනය කිරීම සඳහා, දිරාපත් නොවන වියළි කසළ වර්ග කෙරේ. මෙම වෙන් කරන ලද ද්‍රව්‍ය ඒවා සම්පීඩනය/බේල් කිරීමකින් තොරව තොග වශයෙන් තුන්වන පාර්ශ්ව ප්‍රතිචක්‍රීකරණය කරන්නන් වෙත විකුණනු ලැබීම හෝ ඒවා විකුණන තෙක් බේල් කිරීම සහ ගබඩා කිරීම සඳහා COWAN වෙත ප්‍රවාහනය කෙරේ. අවශේෂ කසළ, ඉන්ධන ලෙස සිමෙන්ති කම්හලට ප්‍රවාහනය කිරීම හෝ බිම් පිරවුම් සඳහා යොදා ගැනීම සිදු කෙරේ.
- එකතු කරනු ලබන බහුතර කසළ ප්‍රමාණයක් මෙම පරිශ්‍රයෙහි දී හසුරවනු ලබන අතර එකතු කෙරෙන දිරාපත් වන කසළ උපරිම මෙ.ටොන් 23ක් "මොන්රෝවියා වත්ත (Monrovia Estate)" වෙත ගාල්ල මහා නගර සභාවේ වාහන මගින් ප්‍රවාහනය කෙරේ. මොන්රෝවියා වත්ත යනු දකුණු පළාතේ පළාත් පාලන කොමසාරිස් කාර්යාලය (CLG) විසින් කළමනාකරණය කරනු ලබන ආසන්න වශයෙන් කිලෝමීටර 20ක දුරින් පිහිටි පොදු කසළ එකතු කිරීමේ පහසුකමකි. මෙ.ටොන් 23ක උපරිම සීමාව අධිකරණ නියෝගයකින් ලබා දී ඇත.

- ○ කොම්පෝස්ට් හෝ විකිණීම සඳහා ප්‍රතිසාධනය කළ නොහැකි කවර හෝ ද්‍රව්‍ය, භූමියේ බැහැර කිරීම සඳහා නම් කරන ලද කොටස්වල ස්ථිරවම ගබඩා කෙරේ.


- දඩැල්ල COWAM මධ්‍යස්ථානය




*11 රූප සටහන: ගුවන් මගින් ලබාගත් COWAM පරිශ්‍ර දර්ශන*
*(මූලාශ්‍රය: COSA වාර්තාව, 2023)*

- ○ වියළි ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය (PET ප්ලාස්ටික් බෝතල්, ඇලුමිනියම් කෑන්, ආදිය) මෙම පරිශ්‍රයෙහි බේල් කර පසුව පෞද්ගලික ගැනුම්කරුවන්ට අලෙවි කෙරේ.
- ○ එකතු කරනු ලබන වීදුරු අපද්‍රව්‍ය දඩල්ල COWAM මධ්‍යස්ථානයේ තාවකාලිකව ගබඩා කර වීදුරු ප්‍රතිචක්‍රීකරණ සමාගමක් වන "සී/ස Random Global Trading (පුද්) සමාගම" (කොළඹ) වෙත භාර දෙනු ලැබේ. වීදුරු අපද්‍රව්‍ය විකිණීම සඳහා කොළඹ මහා නගර සභාව මෙම සමාගම සමග ගිවිසුමකට එළඹ ඇත. මෙම පද්ධතිය සැලසුම් කළ ධාරිතාවට වඩා අඩු මට්ටමකින් ක්‍රියාත්මක වන බව ක්ෂේත්‍ර නිරීක්ෂණවලින් පෙන්වා දේ.

2022-2023 මූලික කසළ තක්සේරු සමීක්ෂණය (BWAS) සහ කසළ විගණනය සහ අනුලක්ෂණ අධ්‍යයනය (WACS) මගින් එක්රැස් කරන ලද දත්ත මත පදනම්ව, එක් එක් ක්‍රම මාර්ගයෙන් හසුරුවනු ලබන ප්‍රතිශත දක්වමින් ගාල්ල මහා නගර සභාවෙහි සමස්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ක්‍රියාවලි ප්‍රවාහ රූප සටහන පහත 12 රූප සටහනෙහි ඉදිරිපත් කර ඇත.




*12 රූප සටහන: ගාල්ල මහා නගර සභාවේ සමස්ත කසළ ප්‍රවාහ රූප සටහන*
*(මූලාශ්‍රය: COSA වාර්තාව, 2023)*

## අ. කසළ එකතු කිරීම සහ මෙහෙයුම්

සියලුම අසල්වැසි කලාපවල වෙන් කරන ලද කසළ නිවාස, ව්‍යාපාර, ආයතන සහ කුඩා කර්මාන්තවලින්, පෙර පැවති හා වර්තමාන ක්‍රම මගින් සන්නිවේදිත සතිපතා කාලසටහනකට අනුව එකතු කරනු ලැබේ. සාමාන්‍ය ක්‍රියා පටිපාටිය වන්නේ, වෙන් කරන ලද කසළ ගාල්ල මහා නගර සභා සේවකයන් විසින් කෙලින්ම කසළ ප්‍රවාහනය කරන ට්‍රක් රථවලට පටවා හීන්පැන්දල බිම් පිරවුම වෙත ප්‍රවාහනය කිරීමයි. කෙසේ වෙතත්, පටු හෝ ගමන් කළ නොහැකි මාර්ග සහ වීදි පිරිසිදු කිරීම් වෙතොත් ගාල්ල මහා නගර සභා සේවකයන් විසින් සාමාන්‍ය ස්ථානවලින් කසළ එකතු කර, කසළ එකතු කිරීමේ වාහනයට පටවනු ලැබේ. ගාල්ල මහා නගර සභාව විසින් 2021 සහ 2022 දී කසළ එකතු කිරීම සඳහා පහත සඳහන් සම්පත් භාවිතා කරන ලදී.

7 වගුව : 3R ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සේවා සැපයීම සඳහා භාවිත කරන වාහන හා යන්ත්‍ර ඇණිය (මූලාශ්‍රය: COSA වාර්තාව, 2023)

| අනු අංකය | වාහන/ යන්ත්‍ර වර්ගය | 2021 වර්ෂයේ දී යොදා ගත් ප්‍රමාණය | 2021 වර්ෂයේ දී යොදා ගත් ප්‍රමාණය | ප්‍රතිශතයක් වශයෙන් ප්‍රමාණය |
|---|---|---|---|---|
| 1 | ට්‍රැක්ටර් | 28 | 28 | 100 |
| 2 | කම්පැක්ටර් | 6 | 6 | 80 |
| 3 | ටේලර් | 26 | 28 | 100 |

8 වගුව: 3R ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සේවා සැපයීම් ක්‍රියාවලියෙහි යොදාගත් සේවක සංඛ්‍යාව (මූලාශ්‍රය: COSA වාර්තාව, 2023)

| අංකය | සේවක ප්‍රවර්ගය | 2021 වර්ෂයේ දී යොදා ගත් ප්‍රමාණය | 2021 වර්ෂයේ දී යොදා ගත් ප්‍රමාණය | ප්‍රතිශතයක් වශයෙන් ප්‍රමාණය |
|---|---|---|---|---|
| 1 | තාක්ෂණ නිලධාරී | 2 | 2 | 80 |
| 2 | ක්ෂේත්‍ර අධීක්ෂක | 8 | 8 | 100 |
| 3 | ක්ෂේත්‍ර වැඩ නිරීක්ෂක | 6 | 6 | 100 |
| 4 | ක්ෂේත්‍ර මට්ටමෙන් කසළ එකතු කරන සේවකයන් | 69 | 69 | 100 |
| 5 | රියදුරන් | - | 6 | 80 |
| 6 | රියදුරන් | - | 14 | 100 |
| 7 | ක්ෂේත්‍ර මට්ටමෙන් කසළ එකතු කරන සේවකයන් | 18 | 18 | 80 |
| 8 | කසළ එකතු කරන අනියම් සේවකයන් | 23 | 23 | 100 |

කම්පැක්ටර් 7න් 80%ක මෙහෙයුම් කාලයක් කසළ එකතු කිරීමේ මෙහෙයුම් සඳහා වෙන් කරන ලදී. එසේම රියදුරන් 6 දෙනෙකුගේ, අධීක්ෂණ කටයුතුවල නිරත තාක්ෂණික නිලධාරීන් දෙදෙනෙකුගේ හා සේවකයන් 18 දෙනෙකුගේ සේවා කාලයෙන් 80%ක් කසළ එකතු කිරීමේ මෙහෙයුම සඳහා වෙන් කරන ලදී.

### කසළ එකතු කිරීමේ ගමන්මාර්ග පද්ධතිය

ගාල්ල මහා නගර සභා ප්‍රදේශයේ කසළ එකතු කිරීමේ ගමන් මාර්ග පද්ධතිය සැලසුම් කර ඇත්තේ මහා නගර සභා බල ප්‍රදේශය තුළ වෙන් කරන ලද එකතු කිරීමේ කලාප 14ක් ආවරණය වන පරිදිය (සිතියම 2). මෙම කලාප නේවාසික ප්‍රදේශ, වාණිජ ආයතන, ආයතන සහ කුඩා කර්මාන්තවලින් සමන්විත වේ. මෙහි මූලික අරමුණ වන්නේ ආහාර අපද්‍රව්‍ය, ප්ලාස්ටික් සහ පොලිතින්, විද්‍යුත් කසළ සහ වීදුරු වැනි විශේෂිත කාණ්ඩවලට තම කසළ වර්ග කිරීමට මහජනතාව උනන්දු කරවමින් වෙන් කරන ලද කසළ ප්‍රභවස්ථානයේදීම සෘජුවම එකතු කිරීම ය.


### කසළ එකතු කිරීමේ ගමන් මාර්ග ප්‍රශස්තකරණ පද්ධතියෙහි වර්තමාන සංවර්ධනයන්

CCBO වැඩසටහනේ තාක්ෂණික සහාය ලබා ගනිමින් ප්‍රදේශයේ ඝන කසළ කළමනාකරණය වැඩිදියුණු කිරීමට ගාල්ල මහා නගර සභාව ප්‍රගාමී පියවර ගෙන ඇත. කසළ එකතු කිරීමේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ අරමුණින් එකතු කිරීමේ කලාප 14ක් පරිපාලන කලාප පහක් බවට පරිවර්තනය කිරීම මූලික අරමුණ විය.

GIS ඒකක කාර්ය මණ්ඩලය, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ඒකක කාර්ය මණ්ඩලය, තාක්ෂණික නිලධාරීන්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්, අධීක්ෂකවරුන් සහ රියදුරන් යනාදී වශයෙන් නගර සභාවේ විවිධ නිලධාරීන් සම්බන්ධ කර ගනිමින් 2022 වර්ෂය තුළ තාක්ෂණික පුහුණු වැඩමුළු පැවැත්වීමට CCBO හි මුලපිරීම, ධාරිතා ගොඩනැගීම සඳහා පරිපූර්ණ ප්‍රවේශයක් පෙන්නුම් කරයි. කසළ කළමනාකරණයට සම්බන්ධ සියලු දෙනාම අවශ්‍ය කුසලතාවලින් සහ දැනුමින් සන්නද්ධ බව මෙමගින් සහතික කෙරේ.

CCBO විසින් සපයනු ලබන තාක්ෂණික පුහුණුව මත පදනම්ව කසළ එකතු කිරීමේ නව මාර්ග සහිතව කසළ එකතු කිරීමේ කලාප පහක් සාර්ථකව සීමා නිර්ණය කිරීම ධනාත්මක ප්‍රතිඵලයකි. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වැඩිදියුණු කිරීමට දරන ප්‍රයත්නයන් බිම් මට්ටමේදී ප්‍රත්‍යක්ෂ ප්‍රතිඵල බවට පරිවර්තනය වෙමින් පවතින බව එයින් ගම්‍ය වේ.

සමස්තයක් වශයෙන්, මෙම මූලාරම්භය, කාර්යක්ෂම සැලසුම්කරණය සහ ක්‍රියාත්මක කිරීම සඳහා බහු පාර්ශ්වකරුවන් හා තාක්ෂණය යොදා ගනිමින් කසළ කළමනාකරණයේ අභියෝගවලට මුහුණ දීම සඳහා වන පුළුල් සහ මනාව සිතා බලා ඇති ප්‍රවේශයක් ලෙස පෙනී යයි.




3 සිතියම: ගාල්ල මහා නගර සභාවේ කලාප සිතියම
(මූලාශ්‍රය: COSA වාර්තාව, 2023)

ගාල්ල මහා නගර සභාව විසින් නිශ්චිත කලාප පහක කසළ එකතු කිරීමේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා CCBO තාක්ෂණික විශේෂඥයන්ගෙන් තාක්ෂණික සහාය ඉල්ලා සිටින ලදි. CCBO විසින් මහජනතාව දැනුවත් කිරීමේ ද්‍රව්‍ය සැපයූ අතර අධීක්ෂකවරුන් සඳහා කසළ එකතු කිරීමේ වාහන නිරීක්ෂණ පද්ධතියක් (හස්තීය- manual) හඳුන්වා දෙන ලදි. කසළ එකතු කිරීමේ වාහන නිරීක්ෂණ පද්ධතිය දැනට හස්තීයව ක්‍රියාත්මක වේ, වඩා හොඳ කාර්යක්ෂමතාවයක් සඳහා එය ස්වයංක්‍රීය කිරීම සලකා බැලිය යුතු ය. ඩිජිටල් නිරීක්ෂණ පද්ධතියක් (tracking system) ක්‍රියාත්මක කිරීමෙන් තත්‍ය කාලීන දත්ත සැපයිය හැකි අතර, අධීක්ෂකවරුන්ට මාර්ග කළමනාකරණ සහ ප්‍රශස්තකරණය පහසු කරයි. නව අධීක්ෂණ පද්ධතිය භාවිත කිරීමට අධීක්ෂකවරුන් සහ කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් ලෙස පුහුණු කර ඇති බවට සහතික විය යුතු ය. කවර හෝ තාක්ෂණික ගැටලු විසඳීමට සහ සුමට සංක්‍රාන්තියක් සහතික කිරීමට අඛණ්ඩ සහාය ලබා දීම අවශ්‍ය වේ.

තවද, ගාල්ල මහා නගර සභාව විසින් එහි බල සීමාව තුළ 3R/ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සේවා සැපයීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා යම් උපකරණ ඉල්ලා සිටින ලදි. 3R/ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට අදාළව කසළ වෙන් කිරීම, එකතු කිරීම, ප්‍රවාහනය සහ පිරියම් කිරීම කාර්යක්ෂම හා ඵලදායී ලෙස වැඩිදියුණු කිරීම සඳහා, CCBO විසින් In-Kind Grant සහාය යටතේ ද්‍රව්‍යමය සහාය ලබා දෙන ලදි.

- පොදු පොදු ස්ථානවල තැබීම සඳහා රෝද සහිත කසළ බඳුන් (ලීටර් 240 ධාරිතාවක් සහිත) 50ක්
- වෙන් කළ කසළ පහසුවෙන් එකතු කිරීම සඳහා වර්ණ බඳුන් 40ක් සහිත මධ්‍යම ප්‍රමාණයේ අත් කරත්ත 20ක්
- පටු පළාත්බද මාර්ගවල කසළ එකතු කිරීම සඳහා කුඩා ට්‍රක් රථ පහක්

- විශේෂයෙන් සාදන ලද ට්‍රැක්ටර් ටේලර් පහක් (විඛාදන නොවන තහඩු (non-corrosive checker plate) සහිත)
- යෝජිත හීන්පැන්දල ද්‍රව්‍ය ප්‍රතිසාධන පහසුකම් (MRF) මධ්‍යස්ථානයේ කොම්පෝස්ට් සහ උපකරණ ගබඩා කිරීම සඳහා බහාලුම් (containers) දෙකක්
- තෙතමනය පාලනය කිරීමට සහ C-N අනුපාතය පවත්වා ගැනීමට කාබනික කසළ මිශ්‍ර කිරීම සඳහා ලී කැබලි සෑදීම සඳහා දැව කපන යන්ත්‍රය
- යෝජිත හීන්පැන්දල MRF මධ්‍යස්ථානයේ ඝන ප්ලාස්ටික්, අඩු වටිනාකමින් යුත් ප්ලාස්ටික්, කාඩ්බෝඩ් සහ ඇලුමිනියම් කෑන් බේල් කිරීම සඳහා බේලර් යන්ත්‍රය
- මාර්ග දෙපස ගස් අතු කපා ඉවත් කිරීම සහ මාර්ග එළිපෙහෙළි කිරීම සඳහා කුඩා දම්වැල් කියතක් (chainsaw)

කසළ එකතු කිරීමේ කාර්යක්ෂමතාව සහ සම්පත් උපයෝජනය වැඩිදියුණු කිරීම සඳහා නව ක්‍රමය ඇතුළත් කසළ එකතු කිරීම 2023 අප්‍රේල් මාසයේ දී මහමෝදර එකතු කිරීමේ කලාපයෙන් ආරම්භ කරන ලද අතර 2023 අගෝස්තු වන විට ක්‍රමානුකූලව කලාප 5ටම ව්‍යාප්ත කරන ලදි. ක්ෂේත්‍ර මට්ටමින් මතු වූ ඇතැම් ගැටලු ඉවත් කිරීමට නිරවද්‍යකරණ ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදි. සැලසුම් කිරීමේ දී සහ ක්ෂේත්‍ර වැඩ කිරීමේ දී ගාල්ල මහා නගර සභා කාර්ය මණ්ඩලයට CCBO තාක්ෂණික කණ්ඩායමෙන් නිතිපතා සහාය ලැබුණි. නව කසළ එකතු කිරීමේ සහ ප්‍රවාහන පද්ධතිය පහත සඳහන් විභවයන් සහ ප්‍රත්‍යක්ෂ බලපෑම් ඇති බවට හඳුනාගෙන ඇත. මෙම බලපෑම් ප්‍රශස්තකරණයේ සාර්ථකත්වය පෙන්නුම් කිරීම පමණක් නොව කසළ කළමනාකරණයේ විවිධ අංගවල ඇති කරන ලද ධනාත්මක වෙනස්කම් ද අවධාරණය කරයි.

**I. ඉන්ධන පරිභෝජනය සහ මෙහෙයුම් පිරිවැය අඩු කිරීම:**

කසළ එකතු කිරීමේ කලාප නැවත සැලසුම් කිරීම සහ ගමන් කරන දුර ප්‍රමාණය අඩු කිරීම මගින් ඉන්ධන පරිභෝජනය සහ මෙහෙයුම් පිරිවැය අඩු කිරීම අපේක්ෂා කරන ලදි. ප්‍රශස්තකරණය මගින් මෙම අපේක්ෂාව සාර්ථකව සාක්ෂාත් කර ගෙන ඇති අතර, එමගින් වඩාත් කාර්යක්ෂම සම්පත් උපයෝජනයක් සිදු වේ.

**II. කසළ එකතු කිරීමේ වර්ධනය:**

ප්‍රශස්තකරණ ප්‍රයත්නයන් මගින් දෛනික තෙත් සහ වියළි කසළ එකතු කිරීමේ කැපී පෙනෙන වර්ධනයක් ඇති වී ඇති අතර එය දිනකට මෙ.ටොන් **22 - 38** දක්වා ඉහළ ගොස් ඇත. මෙය 22% සිට 55% දක්වා සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරන අතර, එමගින් ප්‍රශස්ත කළ ගමන් මාර්ගවල වැඩි දියුණු වූ කාර්යක්ෂමතාවක් පිළිබිඹු කෙරේ.

**III. පාරිසරික බලපෑම අඩු කිරීම**

ප්‍රශස්තකරණය මගින් පරිසරයට කුණුකසළ කාන්දු වීම අවම කිරීම අරමුණු කෙරෙන අතර, ප්‍රත්‍යක්ෂ බලපෑම පැහැදිලිය. 2024 අවසානය වන විට දෛනික තෙත් සහ වියළි කසළ එකතු කිරීමේ අනුපාතය 55% සිට 73% දක්වා වැඩි කිරීමට (දිනකට මෙ.ටොන් 38 - 50) අපේක්ෂිතය. එමගින් පරිසරයට කුණුකසළ කාන්දු වීමේ අඩුවීමක් හැඟවේ.

**IV. කසළ වෙන් කිරීම සඳහා මහජනයාගේ නියැලීම:**

ප්‍රභවස්ථානයේ දී කසළ වෙන් කිරීම සඳහා මහජන නියැලීම කෙරෙහි ප්‍රශස්තකරණය ධනාත්මක ලෙස බලපා ඇත. අපේක්ෂා කළ පරිදි, ප්‍රජාව කසළ කළමනාකරණ වැඩසටහනේ තිරසාර ඉලක්ක සමඟ පෙළගැසෙමින් නිසි කසළ බැහැර කිරීමේ භාවිතාවන්හි වැඩි වැඩියෙන් නියැලෙමින් සිටිති.

**V. නීති විරෝධී ලෙස කසළ බැහැර කෙරෙන ස්ථාන තුරන් කිරීම:**

කසළ එකතු නොකෙරෙන ගමන්මාර්ග ඇතුළත් කිරීමෙන්, ප්‍රශස්තකරණය මගින් නීති විරෝධී ලෙස කසළ බැහැරලන ස්ථාන තුරන් කිරීම අරමුණු කෙරේ. මෙම උපායමාර්ගික පියවර මගින් පාරිසරික උත්සුකතා කෙරෙහි අවධානය යොමු කෙරෙන අතර නගර සභාවේ සමස්ත සනීපාරක්ෂාව සඳහා දායක වෙමින් කසළ විධිමත්ව බැහැර කරනු ලැබීම සහතික කරයි.

**VI. කාර්යක්ෂම සම්පත් යෙදවීම:**

ප්‍රශස්තකරණය මගින් සම්පත් වඩාත් ඵලදායී ලෙස සාර්ථකව යෙදවීමට හැකි වී ඇති අතර, කසළ එකතු කිරීමේ වාහන සහ සේවක පිරිස් කාර්යක්ෂමව උපයෝජනය කරනු ලබන බව සහතික කෙරේ. කසළ කළමනාකරණ ක්‍රියාවලිය වඩාත් ප්‍රතිසංවිධානය කරමින් හස්තීය අධීක්ෂණ පද්ධතියක් ස්ථාපනය කිරීම මෙම කාර්යක්ෂමතාවට දායක වී ඇත.

**VII. විස්තීර්ණ කළ මෙහෙයුම් ආයු කාලය:**

ප්‍රශස්තකරණය මගින් සියලුම කසළ එකතු කිරීමේ වාහන සඳහා සතිපතා නඩත්තු සැලැස්මක් හඳුන්වා දී ඇති අතර, ඒවායේ කල්පැවැත්ම සහ අඛණ්ඩ ක්‍රියාකාරී කාර්යක්ෂමතාව සහතික කෙරේ. මෙම ක්‍රියාශීලී ප්‍රවේශය මගින් කසළ කළමනාකරණ යටිතල ව්‍යුහය දිගු කාලීනව පවත්වාගෙන යාමට ඇති කැපවීම පිළිබිඹු කෙරේ.

**VIII. වර්ධිත මහජන තෘප්තිය:**

ප්‍රශස්තකරණයේ සමස්ත බලපෑම ඉහළ නැංවුණු මහජන තෘප්තියෙන් පිළිබිඹු වේ. විධිමත් 3R (අඩු කිරීම, නැවත භාවිත කිරීම, ප්‍රතිචක්‍රීකරණය කිරීම) සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සේවා සැපයීම ප්‍රජාව හා සමග ධනාත්මකව වර්ධනය වී ඇති අතර, එය නාගරික කසළ කළමනාකරණ වැඩසටහන කෙරෙහි සමස්ත තෘප්තියට සහ සහායට හේතු වේ.

ගාල්ල මහා නගර සභාවෙහි මාර්ග ප්‍රශස්තකරණ මූලාරම්භයන් මගින් ප්‍රත්‍යක්ෂ කරගත් සමස්ත බලපෑම්, සාර්ථක මෙහෙයුම් වැඩිදියුණු කිරීම් පමණක් නොව පරිසරයට සහ ප්‍රජාවට ප්‍රතිලාභ ලබා දෙන තිරසාර කසළ කළමනාකරණ භාවිතාවන් සඳහා කැපවීමක් ද පෙන්නුම් කරයි.

*වගුව 9 : කසළ එකතු කිරීම් ප්‍රවර්ධනයේ ප්‍රතිඵල*

| අනු අංකය | නිර්ණායක | පෙර | පසු |
|---|---|---|---|
| 1 | කසළ එකතු කිරීමේ කලාපවල මුළු එකතුව | කලාප 14 | කලාප 05 |
| 2 | මුළු සංක්‍රාන්ති දුර ප්‍රමාණය | දිනකට කි.මී 295 | දිනකට කි.මී 237 |
| 3 | දෛනික කසළ එකතුවේ සම්පූර්ණ ප්‍රමාණය | දිනකට මෙ.ටොන් 21.5 | දිනකට මෙ.ටොන් 38.5 |
| 4 | දෛනික කසළ එකතු කිරීමේ මුළු ගමන්මාර්ග ප්‍රමාණය | දිනකට මෙ.ටොන් 21 | දිනකට මෙ.ටොන් 30 |
| 5 | තෙත කසළ එකතු කිරීම් ප්‍රමාණය | දිනකට මෙ.ටොන් 15.5 | දිනකට මෙ.ටොන් 22.3 |
| 6 | වියළි කසළ එකතු කිරීම් ප්‍රමාණය | දිනකට මෙ.ටොන් 4 | දිනකට මෙ.ටොන් 7.8 |
| 7 | මිශ්‍ර කසළ ප්‍රමාණය | දිනකට මෙ.ටොන් 2 | දිනකට මෙ.ටොන් 2 |
| 8 | PET ප්ලාස්ටික් ප්‍රමාණය | මසකට කි.ග්‍රෑ 200 | මසකට කි.ග්‍රෑ 700 |
| 9 | **WtE** වෙත යොමු කරන ලද අවම වටිනාකමක් සහිත ප්ලාස්ටික් ප්‍රමාණය | දිනකට මෙ.ටොන් 2.3 | දිනකට මෙ.ටොන් 3.1 |
| 10 | මුළු ට්‍රැක්ටර් ප්‍රමාණය | 9 | 9 |
| 11 | මුළු කම්පැක්ටර් ප්‍රමාණය | 5 | 4 |
| 12 | පටු පාරවල්වල කසළ එකතු කිරීම සඳහා යොදා ගත් කුඩා ට්‍රක් රථ ප්‍රමාණය | 0 | 5 |

## ආ. ප්‍රවාහනය

ගාල්ල මහා නගර සභා කසළ ප්‍රවාහනය පහත පරිදි ප්‍රධාන පියවර දෙකකින් සමන්විත වේ.

<u>**පියවර 1:**</u> සියලුම ගමන්මාර්ගවලින් එකතු කරන ලද කසළ හීන්පැන්දල පරිශ්‍රයේ පිහිටි මධ්‍යගත ගාල්ල මහා නගර සභා කසළ එකතු කිරීමේ සහ හැසිරවීමේ පහසුකම වෙත ප්‍රවාහනය කිරීම.

ඉහත විස්තර කර ඇති පරිදි, කසළ එකතු කිරීමේ කොට්ඨාස 15න් එක්රැස් කරන ලද කසළ, හීන්පැන්දල දක්වා දිනකට කි.මී. 294.62ක් වූ සමුච්චිත දුරක් 2023 අප්‍රේල් වන තෙක් ප්‍රවාහනය කරන ලදි. එතැන් සිට, මාර්ග ප්‍රශස්තිකරණය සහිත පරිපාලන කලාප 05 පදනම් කරගත් නව කසළ එකතු කිරීමේ ක්‍රමය හඳුන්වා දෙන ලද අතර සමුච්චිත ගමන් දුර දිනකට කි.මී. 237 දක්වා අඩු විය.

<u>**පියවර 2:**</u> හීන්පැන්දල පරිශ්‍රයේ දෛනික බැහැර කිරීමේ ධාරිතාවට වඩා වැඩි වියළි සහ තෙත් කසළ දකුණු පළාතෙහි පළාත් පාලන දෙපාර්තමේන්තුව (SPLGD) මගින් ක්‍රියාත්මක වන මොන්රෝවියා වත්ත මධ්‍යගත කොම්පෝස්ට් සහ වියළි කසළ පිරියම් කිරීමේ මධ්‍යස්ථානය වෙත ප්‍රවාහනය කිරීම.) ප්‍රවාහනය කරන ලද මුළු කසළ ප්‍රමාණය වසරකට මෙ.ටොන් 6,195කි. මෙය දකුණු පළාත් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙහි කසළ විගණන ප්‍රතිඵල සහ කසළ හැසිරවීම් පිළිබඳ වාර්තා මත පදනම් වූ ඇස්තමේන්තු අනුව වසරකට තෙත් කසළ මෙ.ටොන් 5,475කින් සහ වියළි කසළ මෙ.ටොන් 720කින් සමන්විත වේ.

මෙම මෙහෙයුමට පහත සඳහන් ප්‍රධාන උප ක්‍රියාකාරකම් 03ක් ඇතුළත් වේ.

- ❖ එකතු කිරීමේ වාහන ඇණිය මගින් හීන්පැන්දල වෙත රැගෙන එන කසළ ගොඩබෑම සහ කම්පැක්ටරයට, ට්‍රක් රථයට හෝ ලොරියට නැවත පැටවීම
- ❖ මොන්රෝවියා වත්තට වාහන මගින් ප්‍රවාහනය කිරීම
- ❖ මොන්රෝවියා වත්ත කොම්පෝස්ට් සහ කසළ පිරියම් කිරීමේ පහසුකමට ගොඩබෑම සහ කසළ හැසිරවීමේ ගාස්තුව (tipping fee) ගණනය කිරීම සඳහා, ගමන් කළ වාර ගණන වාර්තා කිරීම
- ❖ දිගුකාලීන දිරාපත් වන කාබනික කසළ (ගස් අතු), වියළි කසළ හීන්පැන්දල පරිශ්‍රයෙහි 2023 මැයි දක්වා බැහැර කරන ලදි.

10 සහ 11 වගුවල දක්වා ඇති සම්පත් ගාල්ල මහා නගර සභාව විසින් 2021 සහ 2022 දී මෙම මෙහෙයුම සඳහා ඒකරාශි කර ගන්නා ලදි .

*10 වගුව: හීන්පැන්දල සිට මොන්රොවියා වත්ත දක්වා කසළ ප්‍රවාහනය සඳහා වෙන් කරන ලද වාහන හා යන්ත්‍ර ප්‍රමාණය*

*(මූලාශ්‍රය: COSA වාර්තාව, 2023)*

| අනු අංකය | වාහන/යන්ත්‍රෝපකරණ වර්ගය | 2021 | 2022 | ප්‍රතිශතයක් වශයෙන් |
|---|---|---|---|---|
| 1 | විශාල පරිමාණයේ කම්පැක්ටර් | 2 | 2 | 20% |
| 2 | කුඩා පරිමාණයේ කම්පැක්ටර් | 4 | 4 | 20% |
| 3 | ට්‍රක් රථ | 2 | 2 | 100% |
| 4 | ලොරි රථ | 1 | 1 | 100% |
| 4 | කැණීම් යන්ත්‍ර (Excavator) | 1 | 1 | 80% |

11 වගුව: හීන්පන්දල සිට මොන්රෝවියා වත්ත දක්වා කසළ ප්‍රවාහනය සඳහා යොදවන ලද සේවක සංඛ්‍යාව *(මූලාශ්‍රය: COSA වාර්තාව, 2023)*

| අනු අංකය | සේවක ප්‍රවර්ගය | 2021 වර්ෂයේ දී සේවක සංඛ්‍යාව | 2022 වර්ෂයේ දී සේවක සංඛ්‍යාව | ප්‍රතිශතයක් වශයෙන් |
|---|---|---|---|---|
| 1 | තාක්ෂණ නිලධාරීන් (TO) | 1 | 1 | 10% |
| 2 | මහජන සෞඛ්‍ය පරීක්ෂක (PHI) | 1 | 1 | 5% |
| 3 | හීන්පැන්දල පරිශ්‍ර අධීක්ෂක | 1 | 1 | 50% |
| 4 | රියදුරන් | 9 | 9 | 20% |
| 5 | ක්ෂේත්‍ර මට්ටමෙන් කසළ එකතු කරනු ලබන සේවකයන් | 18 | 18 | 20% |
| 6 | හීන්පන්දල පරිශ්‍රයේ ක්ෂේත්‍ර නිලධාරීන් | 4 | 4 | 80% |

ප්‍රවාහනය සඳහා, ට්‍රක් රථ සහ ලොරි සම්පූර්ණයෙන්ම වෙන් කරන ලද අතර, කම්පැක්ටර්වල මෙහෙයුම් කාලයෙන් 20%ක් වෙන් කරන ලදි. එක්ස්කැවේටර් යන්ත්‍රය මෙහෙයුම් කාලයෙන් 80%කට වැඩි ප්‍රධාන කාර්යයක් ලෙස කසළ පැටවීම සඳහා ද ඉතිරි කාලය පරිශ්‍රය තුළ සාමාන්‍ය කසළ මෙහෙයුම සඳහා ද වෙන් කරන ලදි.

ඒ හා සමානව, 8 වන වගුවේ දක්වා ඇති වැඩ කරන පැයවලින් කොටසක්, පැටවීමේ සහ ප්‍රවාහන මෙහෙයුම් අධීක්ෂණය සඳහා අදාළ ගාල්ල මහා නගර සභාව කම්කරුවන් විසින් භාවිත කරන ලදි. 2023 අප්‍රේල් මස හීන්පැන්දල කවාෂිමා කොම්පෝස්ට් කිරීමේ පහසුකම ආරම්භ කිරීමත් සමඟ මෙම මෙහෙයුම 2023 මාර්තු මාසයේ දී අවසන් විය.


## අ. ප්‍රභවස්ථානයේ දී කසළ අඩු කිරීම සහ නැවත භාවිතය

කසළ විගණනය සහ අනුලක්ෂණ අධ්‍යයනය අනුව, කසළ එකතු කිරීම කසළ ජනනයෙහි ප්‍රතිශතයක් ලෙස 31.43%කි. ගාල්ල මහා නගර සභා  ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පද්ධතියේ වත්මන් ධාරිතා හා සම්පත් පරතර, අඩු මට්ටමෙන් කසළ එකතු කිරීමට එක් හේතුවක් බව අනාවරණය විය. එබැවින් ප්‍රභවස්ථානයේ දී කසළ ජනනය අවම කිරීම සහ කසළ නැවත භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා විශාල ඉල්ලුමක් පවතී. කෙසේ වෙතත්, ගාල්ල මහා නගර සභාවෙහි ප්‍රජා සංවර්ධන ඒකකය විසින් පවත්වනු ලබන අක්‍රමවත් දැනුවත් කිරීමේ වැඩසටහන් සහ රාජ්‍ය නොවන සංවිධානවල සහාය ඇතිව ක්‍රියාත්මක වන දුර්ලභ සහයෝගිතා ව්‍යාපෘති හැරුණු විට, ප්‍රභවස්ථානයේ දී කසළ අඩු කිරීම සහ නැවත භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා ගාල්ල මහා නගර සභා පාර්ශ්වයෙන් උපායමාර්ගික මැදිහත්වීමක් නොමැති බව පෙනේ.

## අ. ඝන අපද්‍රව්‍ය යටිතල පහසුකම්/පිරියම් කිරීම සහ වෙළඳපොළ

GMC කසළ පිරියම් කිරීමෙහි ඝන අපද්‍රව්‍ය යටිතල පහසුකම් සඳහා පහත සිතියමේ පෙන්වා ඇති පහත දැක්වෙන ප්‍රධාන යටිතල පහසුකම් මගින් සිදු කෙරෙන මෙහෙයුම් මාලාවක් ඇතුළත් වේ.

1. හීන්පැන්දල කසළ වෙන් කිරීම සහ කොම්පෝස්ට් සෑදීමේ පහසුකම.
2. දඩැල්ල COWAM මධ්‍යස්ථානයේ ගොඩනැගිලි අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ/ වීදුරු අපද්‍රව්‍ය සහ PET බෝතල් එකතු කිරීමේ පහසුකම.
3. උපකාරක සේවා
    - ගාල්ල මහා නගර සභා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය
    - ගාල්ල මහා නගර සභාවෙහි වාහන නවතා තැබීමේ පහසුකම්, ගාලු නගරය
    - හීන්පැන්දල වාහන සේවාකරණ පහසුකම.




*4 සිතියම : කසළ පිරියම් කිරීම සඳහා GMCහි ප්‍රධාන යටිතල පහසුකම්*

(මූලාශ්‍රය : COSA වාර්තාව, 2023)

## හීන්පැන්දල පරිශ්‍රයේ කසළ හැසිරවීම

ගාල්ල මහා නගර සභාව විසින් සියලුම ගමන්මාර්ගවලින් එකතු කරනු ලබන කසළ හීන්පැන්දල කසළ හැසිරවීමේ පරිශ්‍රය වෙත ප්‍රවාහනය කර එහිදී ගොඩබානු ලැබේ. මෙම ස්ථානය 2005 මුල් භාගයේ දී සුනාමි ව්‍යසනය හේතුවෙන් ඉවත දමන ලද කසළ වළදැමීමට සඳහා භාවිත කරන ලද අතර පසුව නාගරික ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සහ හැසිරවීම එහිදී අඛණ්ඩව සිදු කෙරිණි. හෙක්ටයාර 1.65ක මෙම ඉඩම හීන්පැන්දල වැව නම් වූ ගිංගඟ මෝයට මායිම්ව පහත් බිම් නේවාසික ප්‍රදේශයක පිහිටා ඇත. ඝන අපද්‍රව්‍ය හැසිරවීමේ පහසුකමක් ආශ්‍රිත සාමාන්‍ය සමාජ-පාරිසරික බලපෑම් වැළැක්වීම සඳහා නිසි ඉංජිනේරු පාලන ක්‍රම නොමැතිව මෙම පහසුකම ක්‍රියාත්මක වී ඇත.

### I. හීන්පැන්දල දී තෙත් කසළ පිරියම් කිරීම/බැහැර කිරීම

2022 වර්ෂයේ දී "කවාෂිමා" කොම්පෝස්ට් කම්හලෙහි ඉදිකිරීම් පැවති බැවින් ගාල්ල මහා නගර සභා දෛනික එකතුවෙන් සහ තොග වශයෙන් කසළ ජනනය කරන්නන් විසින් හීන්පැන්දලට රැගෙන ගොස් භාර දෙන, ප්‍රභවස්ථානයේ දී වෙන් කළ තෙත් කසළ (දිරාපත් වන), හීන්පැන්දල පරිශ්‍රයේ පූර්ව නිශ්චිත ස්ථානයකට ගොඩබාන ලදි. 2023 වසරේ කසළ විගණන ප්‍රතිඵලවලට අනුව ගාල්ල මහා නගර සභා එකතුවෙන් වසරකට මෙ.ටොන් 5,475ක් සහ තොග වශයෙන් කසළ ජනනය කරන්නන්ගෙන් වසරකට මෙ.ටොන් 240ක් පමණ තෙත් කසළ ප්‍රමාණයක් එකතු වේ. වසරකට මෙ.ටොන් 5,715ක් වන මෙම මුළු කසළ එකතුව හීන්පැන්දල සිට මොන්රෝවියා වත්තට ට්‍රක් රථ ප්‍රවාහනයෙන් මාරු කෙරේ. 2023 අප්‍රේල් මාසයේ දී කොම්පෝස්ට් පහසුකම් මෙහෙයුම් ආරම්භ කිරීමෙන් පසු මෙම මෙහෙයුම අවසන් කරන ලදි.

**2.** වෙන් නොකළ (මිශ්‍ර) කසළ හීන්පැන්දල දී පිරියම් කිරීම/බැහැර කිරීම

2023 වසරේ කසළ විගණන ප්‍රතිඵලවලට අනුව, හීන්පැන්දල පරිශ්‍රයට රැගෙන යන වසරකට මෙ.ටොන් 720ක පමණ කසළ වෙන් නොකළ කසළ (එනම් තෙත් සහ වියළි මිශ්‍ර) බවට වාර්තා වී ඇත. මෙය ප්‍රධාන වශයෙන් ගාල්ල මහා නගර සභා එකතුවෙහි පවතින වීදි දෙපස බැහැර කිරීම්වලින් හා වීදි පිරිසිදු කිරීමෙන් එක්රැස් වන කසළ ය. මේ දක්වා, සම්පූර්ණ කසළ බැහැර කරනු ලැබුවේ පරිශ්‍රයේ කලින් තීරණය කළ මිශ්‍ර කසළ බැහැර කිරීමේ ස්ථානයේ ය. කෙසේ වෙතත්, ගාල්ල මහා නගර සභා සේවකයන් විසින් කසළ ප්‍රවාහනය කරන වාහනය තුළම හෝ හීන්පැන්දල පරිශ්‍රයෙන්, ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ලෝහ, කඩදාසි සහ කාඩ්බෝඩ්, ඉහළ සහ අඩු වටිනාකමින් යුත් පොලිතීන් සහ ප්ලාස්ටික් වැනි ද්‍රව්‍ය නැවත ගනු ලබයි. පවතින තොරතුරු අනුව මෙම ප්‍රමාණය සැලකිය යුතු මට්ටමක නොපවතී. මෑතකදී, USAID-CCBO විසින් හීන්පැන්දල ප්‍රදේශයේ කසළ හැසිරවීම වැඩිදියුණු කිරීම සඳහා නව බේලර් යන්ත්‍රයක් සහ චේන්සෝ එකක් ලබා දී ඇත.

**3.** හීන්පැන්දල දී වියළි කසළ පිරියම් කිරීම/ප්‍රතිචක්‍රීකරණය

පරිශ්‍රය වෙත යොමු කරන ලද ප්‍රතිචක්‍රීකරණය කළ හැකි, වෙන් කළ වියළි කසළ ප්‍රමාණය ගාල්ල මහා නගර සභා නිත්‍ය එකතුවෙන් වසරකට මෙ.ටොන් 1,440ක් සහ තොග වශයෙන් කසළ ජනනය කරන්නන්ගෙන් වසරකට මෙ.ටොන් 96ක් පමණ විය. වසරකට මෙ.ටොන් 1,536ක් වන මෙම කසළ ප්‍රමාණය පරිශ්‍රයේ නම් කරන ලද ස්ථාන වෙත කෙලින්ම බැහැර කරන ලදි. ගාල්ල මහා නගර සභා සේවකයන් දෙදෙනෙකු තොගයෙන් ඉහළ වටිනාකමක් ඇති ප්ලාස්ටික්, පොලිතින්, ලෝහ, කඩදාසි-කාඩ්බෝඩ් සහ අනෙකුත් ඒවා නැවත ලබා ගැනීමට යොදවන ලදි. නිස්සාරණය කරන ලද ප්‍රමාණය සැලකිය යුතු මට්ටමක් නොමැති බවට සලකන ලදි.

**4.** තොග වශයෙන් කසළ ජනනය කරන්නන් විසින් පරිශ්‍රයට රැගෙන එනු ලබන කසළ:

ගාල්ල මහා නගර සභාව විසින් තොග වශයෙන් කසළ ජනනය කරන්නන් (උදා: නාවික හමුදා කඳවුර, කරාපිටිය ශික්ෂණ රෝහල, ගාලු කොටුව හමුදා කඳවුර, ධීවර වරාය, වාණිජ වරාය, ගාල්ල නාවික හමුදා කඳවුර) හීන්පැන්දල පරිශ්‍රයට බෙදා හරින වෙන් කරන ලද කසළ බාරගනු ලබයි. කසළ ප්‍රමාණය මත පදනම් වූ ගාස්තුවක් අය කර ඇති අතර මෙය කසළ ප්‍රමාණය මත පදනම්ව ගාල්ල මහා නගර සභා සේවක පිරිස් (අධීක්ෂක) විසින් තීරණය කරන ලදි. 2022 දී යොමු කළ කසළ ප්‍රමාණය දළ වශයෙන් මෙ.ටොන් 336ක් වූ අතර ඉන් මෙ.ටොන් 240ක් තෙත් කසළ වූ අතර ඉතිරිය නිල නොවන ලෙස පරිශ්‍රයට යොමු කළ වෙන් නොකළ කසළ වේ. මෙම ක්‍රියාවලිය සඳහා සම්පත් වෙන් කිරීම හඳුනා ගැනීමට නොහැකි වූ අතර එය සමස්ත පරිශ්‍ර කළමනාකරණ පිරිවැයේ කොටසක් ලෙස සලකන ලදි.

**5.** හීන්පැන්දල සිට මොන්රෝවියා වත්ත MRF වෙත කසළ මාරු කිරීම

2022 වසරේ මුළු තෙත් කසළ මෙට්‍රික් ටොන් 5,475ක් සහ වියළි කසළ මෙට්‍රික් ටොන් 720ක් හීන්පැන්දල පරිශ්‍රයේ සිට මොන්රෝවියා වත්ත කොම්පෝස්ට් සහ වියළි කසළ මධ්‍යස්ථානය වෙත මාරු කරන ලදි. ගාල්ල මහා නගර සභාව විසින් SPLGD වෙත එක් පැටවූ බර ප්‍රමාණයක් සඳහා රු.1,500ක (2022 දී රු 4,694,250.00ක මුළු මුදලක් ගෙවා ඇත) කසළ හැසිරවීමේ ගාස්තුවක් ගෙවා ඇත. 2023ජූලි මාසයේ කවාෂිමා කොම්පෝස්ට් කිරීමේ පහසුකම ආරම්භ කිරීමත් සමග මෙම මෙහෙයුම නතර විය.



13 රූප සටහන : මොන්රෝවියා වත්ත පරිශ්‍රයේදී කසළ බෑම
(මූලාශ්‍රය : COSA වාර්තාව, 2023)

ගාල්ල මහා නගර සභාව වෙතින් වන නිරන්තර ඉල්ලීම සහ එවැනි පහසුකම් තිබීමේ වැදගත්කම අගය කරමින්, CCBO වැඩසටහන හීන්පැන්දල පහසුකම සඳහා ගාල්ල මහා නගර සභාව වෙත මුලින් සැලසුම් කර ඇති ආධාරවලින් පහත සඳහන් අමතර පහසුකම් යෙදවීමේ ක්‍රියාවලියක නිරතව සිටී.

- උපකරණ සහ කොම්පෝස්ට් ගබඩා කිරීම සඳහා බහාලුම් දෙකක් යෙදවීම
- කොම්පෝස්ට් පහසුකමට යෙදීමට ගස් අතු සකස් කිරීම සඳහා ලී කපන යන්ත්‍රය සහ චේන්සෝ යන්ත්‍රය
- සම්පූර්ණ ද්‍රව්‍ය ප්‍රතිසාධන පහසුකම ස්ථාපනය සඳහා සැලැස්මක් සකස් කිරීමට සහාය වීම
- ගාල්ල මහා නගර සභාව සඳහා සකස් කරමින් පවතින ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්මෙහි කොටසක් ලෙස හීන්පැන්දල සමස්ත පරිශ්‍රය වැඩිදියුණු කිරීම සඳහා සංකල්ප සැලැස්ම ඇතුළත් කිරීම

## දඩැල්ල COWAM මධ්‍යස්ථානයේ දී C&D අපද්‍රව්‍ය / PET බෝතල් පිරියම් කිරීම සහ වීදුරු අපද්‍රව්‍ය එකතු කිරීම

COWAM (ඉදිකිරීම් අපද්‍රව්‍ය කළමනාකරණ) මධ්‍යස්ථානය යනු ගොඩනැගිලි අපද්‍රව්‍ය, වීදුරු සහ PET බෝතල් ප්‍රතිචක්‍රීකරණ යටිතල පහසුකම් සහිත අක්කර 0.5ක භූමි ප්‍රමාණයක පිහිටා ඇති බහුකාර්ය පහසුකමකි.

### I. PET බෝතල් එකතු කිරීමේ පහසුකම

ගාල්ල මහා නගර සභාව විසින් දඩැල්ල COWAM මධ්‍යස්ථානයේ දී PET බෝතල් එකතු කරනු ලබන අතර එය සී/ස Coca Cola (පුද්.) සමාගමෙහි සහායෙන් 2021 සිට බේලර් යන්ත්‍රයකින් සමන්විත වේ. ගාල්ල මහා නගර සභාව විසින් 2011 දී එකතු කරන ලද සහ සංයුක්ත කරන ලද ෆෑඹ බෝතල් විකිණීම සඳහා ප්‍රතිචක්‍රීකරණයෙහි නියැලෙන්නෙකු සමඟ ගිවිසුමකට එළැඹ ඇත. කෙසේ වෙතත්, විධිමත් එකතු කිරීමක් සහ තරගකාරී මිලකරණ ව්‍යුහයක් නොපැවතීම හේතුවෙන් මෙම පහසුකම 2021 සහ 2022 වර්ෂවල දී එහි ධාරිතාවට (දිනකට මෙ.ටොන් 1ක) වඩාත් අඩුවෙන් ක්‍රියාත්මක විය.

ගාල්ල මහා නගර සභාව විසින් CCBO (පාසල් ශූර වැඩසටහන), HELP-O සහ තවත් යම් පාර්ශ්වයන්ගේ සහාය ඇතිව 2023 දී ගාල්ල මහා නගර සභා ප්‍රදේශයේ ආසන්න වශයෙන් රජයේ පාසල් 33ක් සමග ප්‍රතිඵල ඉහළ නැංවීමේ අරමුණින් කටයුතු කර ඇත. මෙම පාසල්වලින් එකතු කෙරෙන කසළ ගාල්ල මහා නගර සභාව විසින් PET එකතු කිරීමේ පහසුකම වෙත ප්‍රවාහනය කරනු ලබයි. දඩැල්ල COWAM මධ්‍යස්ථානයේ PET බෝතල් එකතු කිරීමේ ප්‍රමාණය පහත වගුවෙන් දැක්වේ.

*12 වගුව: 2023 දී දඩැල්ල COWAM මධ්‍යස්ථානයේ දී PET බෝතල් එකතු කිරීම*

| අංකය | මාසය | සමස්ත PET බෝතල් එකතු කිරීම මසකට මෙ.ටොන් |
|---|---|---|
| 1 | මැයි | 0.346 |
| 2 | ජූනි | 0.369 |
| 3 | ජූලි | 0.369 |
| 4 | අගෝස්තු | 0.738 |
| 5 | සැප්තැම්බර් | 0.121 |
| 6 | ඔක්තෝබර් | 0.163 |

2. ඉදිකිරීම් හා බිඳ හෙළීම් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය

2009 දී යුරෝපා සංගමයේ අරමුදල් යටතේ COWAM ව්‍යාපෘතිය මගින් ආරම්භ කරන ලද දඩැල්ල COWAM මධ්‍යස්ථානයේ පිහිටි ගොඩනැගිලි අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය ශ්‍රී ලංකාවේ ගොඩනැගිලි අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය සඳහා රජය සතු පළමු සහ එකම පහසුකම වේ. ප්‍රතිචක්‍රීකරණයට ගොඩනැගිලි අපද්‍රව්‍ය සැකසීම සඳහා මැඩුම් සහ පිරික්සුම් (crushing and screening) ඒකක කට්ටලයකින් මෙම පහසුකම සමන්විත වේ. මේ අනුව, මෙය ගොඩනැගිලි අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා පරිසර හිතකාමී සහ සකසුරුවම් විසඳුමකි. මෙම පහසුකම, පූර්ණ ධාරිතාවයෙන් ක්‍රියාත්මක වන විට, ගාල්ල මහා නගර සභාව විසින් කරනු ලබන පස් වැඩ, පදික වේදිකා සහ මාර්ග ප්‍රතිසංස්කරණ සඳහා ප්‍රධාන අමුද්‍රව්‍ය ප්‍රභවය වී ඇත.

කෙසේ වෙතත්, මෙම පහසුකම ප්‍රධාන වශයෙන් ලබා දී ඇති දුර්වල ප්‍රචාරණය, නීතිය බලාත්මක වීම මගින් විධිමත් එකතු කිරීමේ ක්‍රමයක් නොමැතිකම සහ වෙළඳපල මිල ගණන් පදනම් කරගත් තරගකාරී මිල ක්‍රමයක් නොමැතිකම හේතුවෙන් එහි ධාරිතාවට වඩා අඩුවෙන් ක්‍රියාත්මක වී ඇති අතර, දඩැල්ල COWAM මධ්‍යස්ථානයේ C&D කසළ එකතු කිරීමේ ප්‍රමාණය පහත වගුවෙන් දැක්වේ.

*13 වගුව: 2023 දී දඩැල්ල COWAM මධ්‍යස්ථානයේ දී C&D කසළ එකතු කිරීම*

| අංකය | මාසය | සමස්ත C&D කසළ එකතු කිරීම මසකට මෙ.ටොන් |
|---|---|---|
| 1 | මැයි | - |
| 2 | ජූනි | 12 |
| 3 | ජූලි | 12 |
| 4 | අගෝස්තු | 14 |
| 5 | සැප්තැම්බර් | 14 |

| | | |
|---|---|---|
| 6 | ඔක්තෝබර් | 4.9 |

3. වීදුරු කසළ එකතු කිරීම

වර්ග මීටර් 100ක ගබඩා ගොඩනැගිල්ලකින් සමන්විත වීදුරු අපද්‍රව්‍ය එකතු කිරීමේ පහසුකම 2009 වර්ෂයේ දී ආරම්භ කරන ලදි. පරිශ්‍රයෙහි එකතු කරනු ලබන වීදුරු අපද්‍රව්‍ය විකිණීම සඳහා ගාල්ල මහා නගර සභාව CityNet Yokohoma සභාය ඇතිව සෑම වසරකම තෙවන පාර්ශ්වීය නියෝජිතායතන සමඟ ගිවිසුමකට එළැඹේ. ආරම්භයේ දී හොඳින් ක්‍රියාත්මක වුව ද, PET එකතු කිරීමේ පහසුකමට සමාන හේතු නිසා මෙය ද ධාරිතාවට වඩා අඩුවෙන් ක්‍රියාත්මක වේ. විකිණිය නොහැකි අවශේෂ වීදුරු අපද්‍රව්‍ය නිසි විසඳුමක් ලැබෙන තුරු එම ගොඩනැගිල්ලෙහි ම ගබඩා කර ඇත.

## ඉ. ප්‍රජාව වෙත ළඟා වීම සහ අධ්‍යාපනය

ගාල්ල මහා නගර සභාවෙහි ප්‍රජා සංවර්ධන අංශය සහ මහජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් ප්‍රජාව වෙත ළඟා වීමේ සහ අධ්‍යාපනය ලබා දීමේ වගකීම දරයි. වර්තමාන නියැලීමේ විෂය පථයට ඩෙංගු වැළැක්වීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, කසළ එකතු කිරීමේ ගමන්මාර්ග සහ කාලසටහන් පිළිබඳ ජනතාව දැනුවත් කිරීම යනාදිය ඇතුළත් වේ. කෙසේ වෙතත්, දැනුවත් කිරීම සහ ක්‍රියාකාරී ප්‍රජා සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීමේ උත්සාහයන් පැවතිය ද, තවදුරටත් අවධානය යොමු කළ යුතු ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පද්ධතියේ සැලකිය යුතු පරතරයක් පවතී. නිදසුනක් වශයෙන්, එකතු කරනු ලබන කසළවලින් සැලකිය යුතු කොටසක් මිශ්‍ර කසළ ලෙස පවතින බැවින් කසළ වෙන් කිරීමේ දී සැලකිය යුතු අභියෝගයක් පවතී. මෙය මහජන දැනුවත්භාවය මදකම, අනුකූලතා ගැටලු, හෝ කසළ වෙන් කිරීමේ භාවිතාවන් බලාත්මක කිරීමේ දුෂ්කරතා වැනි සාධක මීට හේතු විය හැකි ය.

# 8. ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා විකල්ප

කසළ ජනනය හා එකතු කිරීමේ වර්තමාන සන්දර්භය සහ ගාල්ල මහා නගර සභා ප්‍රදේශයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා පහසුකම් සැලසීම සඳහා එහි ඇති ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය ගවේෂණය ඉහත 6 සහ 7 පරිච්ඡේද මගින් කෙරේ. නගරය තුළ තිරසර ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ගමන් කිරීමේ දී ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්මෙහි අවධානය යොමු කළ යුතු කරුණු කිහිපයක් සාකච්ඡාවේ දී ඉස්මතු කර ඇත. මෙම පරිච්ඡේදය මගින් විශේෂයෙන්ම කසළ එකතු කිරීම, ප්‍රවාහනය/මාරු කිරීම, පිරියම් කිරීම, බැහැර කිරීම සහ ප්‍රතිචක්‍රීකරණ වෙළඳපළ වැනි මාතෘකා කෙරෙහි අවධානය යොමු කරමින් වර්තමාන ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පද්ධතියට අවශ්‍ය වැඩිදියුණු කිරීම් සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා විකල්ප ඉදිරිපත් කෙරේ.

## අ. වත්මන් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියට අවශ්‍ය වන්නා වූ වැඩිදියුණු කිරීම්

වත්මන් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියේ වැඩිදියුණු කිරීම් මාතෘකා, එකතු කිරීම, ප්‍රවාහනය/ මාරු කිරීම, සැකසීම, බැහැර කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය වෙළඳපළ යටතේ හඳුනාගෙන ඇත.

### කසළ එකතු කිරීම

ප්‍රභවස්ථානයන්ගෙන් කසළ එකතු කිරීම ගාල්ල මහා නගර සභාවෙහි ප්‍රධාන කාර්යයක් වී ඇත. දැනට ගාල්ල මහා නගර සභාවේ කසළ එකතු කිරීම ආශ්‍රිත අභියෝග රැසකට මුහුණ දී සිටින අතර ඉදිරියට යාමේ දී එම අභියෝගවලට පිළියම් යෙදිය යුතුය. මෙම අභියෝග ඉහත පරිච්ඡේදවල ඉස්මතු කර ඇත. කසළ එකතු කිරීම ආශ්‍රිත එම අභියෝගවලට මුහුණ දීම සඳහා අවශ්‍ය වැඩිදියුණු කිරීම්වල සාරාංශයක් පහත දැක්වේ.

- දැනට ගාල්ල මහා නගර සභාව විසින් භාරගනු ලබන්නේ තෙත් සහ වියළි වශයෙන් වෙන් කරන ලද කසළ පමණි. කෙසේ වෙතත්, ගාල්ල මහා නගර සභාව වෙත තවමත් සැලකිය යුතු මිශ්‍ර කසළ ප්‍රමාණයක් ලැබෙන බව අනාවරණය වී ඇති අතර එම කසළ පිරියම් කිරීමට අපහසු වේ. මේ සඳහා විසඳුම වන්නේ කසළ නිසි ලෙස තෙත් සහ වියළි ප්‍රවර්ගයන්ට වර්ග කර ඇති බව සහතික කිරීම සඳහා ප්‍රභව වෙන් කිරීම වැඩිදියුණු කිරීමයි.

- කසළ එක්රැස් කරන වාහන බොහොමයක් පැරණි හෝ භාවිත කළ නොහැකි තත්ත්වයේ පවතින බැවින් ඒවා ගර්හිත වාහන ලෙස හෝ අලුත්වැඩියා කළ යුතු ය. මෙයට විසඳුම වන්නේ පවතින වාහන ගර්හිත වාහන ලෙස අපහරණය කිරීම හෝ අලුත්වැඩියා කිරීම සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා කසළ එකතු කිරීමේ වාහන ඇණිය වැඩිදියුණු කිරීමයි.

- කසළ එකතු කිරීමේ ශ්‍රම බලකායට (උදා: කම්කරුවන් සහ අධීක්ෂකවරුන්) පිළිගැනීමක් සහ දිරිගැන්වීම් නොමැත. විසඳුම වන්නේ ශ්‍රම බලකායට (කම්කරුවන් සහ අධීක්ෂකවරුන් ඇතුළුව) ඔවුන්ගේ ප්‍රයත්නයන් අභිප්‍රේරණය කිරීමට සහ අගය කිරීමට පිළිගැනීම සහ දිරිගැන්වීම් ලබා දීමයි.

- නිවැසියන් සහ නාගරික කසළ එකතු කිරීමේ ශ්‍රම බලකාය අතර සබඳතාව වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ. වඩා හොඳ සහයෝගිතාවක් සඳහා නිවැසියන් සහ කසළ එකතු කිරීමේ ශ්‍රම බලකාය අතර සන්නිවේදනය සහ සහයෝගය වැඩිදියුණු කිරීම සඳහා විසඳුම කටයුතු කිරීමයි.

- USAID-CCBO විසින්, එකතු කිරීම සහ ප්‍රවාහනය සඳහා දැරීමට සිදුවන පිරිවැය අවම කරනු පිණිස කසළ එකතු කිරීමේ ගමන්මාර්ග ප්‍රශස්තකරණය සඳහා දැවැන්ත ක්‍රියාමාර්ගයක් ගෙන ඇත. ඒ හා සමාන ක්‍රියාවලියක් යොදා ගනිමින්, සම්පත් ඉතිරි කර ගැනීමට සහ පුරවැසියන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා කසළ එකතු කිරීමේ ගමන්මාර්ග නිතිපතා නිරීක්ෂණය කර වැඩිදියුණු කළ යුතු ය.

- නීති විරෝධී ලෙස බැහැර කෙරෙන කසළ එකතු කිරීමට සහ එසේ බැහැර කිරීම් නැවත සිදු වීම නතර කිරීම සඳහා නවීන යාන්ත්‍රණයක් තිබිය යුතු ය.

## ප්‍රවාහනය / මාරු කිරීම

කසළ ප්‍රවාහනය/මාරු කිරීම ගාල්ල මහා නගර සභාව විසින් එහි ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ක්‍රියාවලියේ දී නිතිපතා සිදු කරන තවත් ප්‍රධාන කාර්යයකි. සාමාන්‍යයෙන් ප්‍රභවස්ථානවලින් එකතු කෙරෙන කසළ හීන්පැන්දල කසළ පිරියම් කිරීමේ ස්ථානයට ප්‍රවාහනය කරනු ලබන අතර ඉන් කොටසක් නැවත මොන්රෝවියා වත්ත කොම්පෝස්ට් සහ වියළි කසළ පිරියම් කිරීමේ මධ්‍යස්ථානය වෙත මාරු කරනු ලැබේ. මෙම ක්‍රියාවලියේ දී, වැඩිදියුණු කිරීම් අවශ්‍ය අභියෝග කිහිපයක් අවධානයට ලක්ව ඇත.

- කසළ ප්‍රවාහනය/මාරු කරන වාහනවලින් බහුතරයක් පැරණි හෝ භාවිත කළ නොහැකි තත්ත්වයේ පවතින බැවින් ඒවා ගර්හිත වාහන ලෙස අපහරණය කිරීම හෝ අලුත්වැඩියා කිරීම කළ යුතු ය. එබැවින්, කසළ ප්‍රවාහනය/මාරු කරන වාහන ඇණිය වැඩි දියුණු කළ යුතු ය.
- ප්‍රභවස්ථානයන්හි සිට හීන්පැන්දලට සහ හීන්පැන්දල සිට මොන්රෝවියා වතුයාය වෙත ප්‍රවාහනය/මාරු කරනු ලබන කසළ ප්‍රමාණය සටහන් කිරීමට පුළුල් යාන්ත්‍රණයක් අවශ්‍ය වේ. අනාගතය සඳහා කසළ දත්ත ප්‍රක්ෂේපණය කිරීමේ දී, කසළ හැසිරවීමේ ගාස්තු (tipping fee) ගණනය කිරීමේ දී මෙය වැදගත් වේ.

## කසළ පිරියම් කිරීම

ගාල්ල මහා නගර සභා විෂය පථය යටතේ ක්‍රියාත්මක වන ප්‍රධාන කසළ පිරියම් කිරීමේ පහසුකම වන්නේ; හීන්පැන්දල කසළ වෙන් කිරීමේ සහ කොම්පෝස්ට් කිරීමේ පහසුකම දඬැල්ල COWAM මධ්‍යස්ථානයේ, ගොඩනැගිලි අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය වීදුරු අපද්‍රව්‍ය සහ PET බෝතල් එකතු කිරීමේ පහසුකම, ගාල්ල මහා නගර සභාවේ වාහන ගාල් කිරීමේ පහසුකම සහ හීන්පැන්දල වාහන සේවාකරණ පහසුකමයි.

මෙම කසළ පිරියම් කිරීමේ පහසුකම් සහ කසළ පිරියම් කිරීමේ ක්‍රියාවලිය සඳහා අවශ්‍ය වන්නා වූ වැඩිදියුණු කිරීම් පහත දැක්වේ.

- ගාල්ල මහා නගර සභාව සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සමග පවත්වන ලද BWAS සහ උපදේශන සැසිවල දී හඳුනාගෙන ඇති පරිදි, ද්‍රව්‍ය පිරියම් කිරීමේ පහසුකම්වලට අවශ්‍ය ප්‍රධාන වැඩිදියුණු කිරීම්වලින් එකක් වන්නේ ඒවා සම්පූර්ණ ධාරිතාවයෙන් ක්‍රියාත්මක කිරීමට පියවර ගැනීමයි. දැනට, මෙම පහසුකම් එක්කෝ ක්‍රියාත්මක නොවේ නැතහොත් අර්ධ වශයෙන් ක්‍රියාත්මක වේ. මෙම පහසුකම ප්‍රධාන වශයෙන් ලබා දී ඇති දුර්වල ප්‍රචාරණය, නීතිය බලාත්මක වීම මගින් විධිමත් එකතු කිරීමේ ක්‍රමයක් නොමැතිකම සහ වෙළඳපළ මිල ගණන් පදනම් කරගත් තරගකාරී මිල ක්‍රමයක් නොමැතිකම හේතුවෙන් එහි ධාරිතාවට වඩා අඩුවෙන් ක්‍රියාත්මක වී ඇත. එබැවින් එම අංග වැඩිදියුණු කිරීම අත්‍යවශ්‍ය වේ.
- ගාල්ල මහා නගර සභාව විසින් අනාගතයේ දී කාන්තා ශ්‍රමිකයන් බඳවා ගැනීමට යන්නේ නම්, එහි සේවය කරන කම්කරුවන්ට අවශ්‍ය විශේෂයෙන් කාන්තා ශ්‍රමිකයන් සඳහා ප්‍රමාණවත් සනීපාරක්ෂක සහ අනෙකුත් පහසුකම් කසළ පිරියම් කිරීමේ පහසුකම් සතුව නොමැත. එබැවින්, ද්‍රව්‍ය පිරියම් කිරීමේ පහසුකම් තුළ හා අවට භෞතික වැඩිදියුණු කිරීම් වැදගත් වේ.

## බැහැර කිරීම

වර්තමානයේ දී, ගාල්ල මහා නගර සභා ප්‍රදේශය තුළ එකතු කරනු ලබන කසළ බැහැර කිරීම ප්‍රධාන වශයෙන් ස්ථාන දෙකක දී සිදු වේ. එක් ස්ථානයක් ගාල්ල මහා නගර සභා බල ප්‍රදේශයේ හීන්පැන්දල වන අතර අනෙක් ස්ථානය ගාල්ල මහා නගර සභා බල ප්‍රදේශයෙන් පිටත පිහිටි මොන්රෝවියා වත්ත වේ. බැහැර කිරීමේ ක්‍රියාවලිය සඳහා අවශ්‍ය වැඩිදියුණු කිරීම් කෙරෙහි අවධානය යොමු කිරීමේ දී, ප්‍රධාන යෝජනා පහත දැක්වේ.

- සමාජීය හා පාරිසරික හානිය අවම කිරීම සඳහා එය වඩාත් සනීපාරක්ෂක සහ පරිසර හිතකාමී බවට පත් කිරීම සඳහා බැහැර කිරීමේ ක්‍රියාවලිය තවදුරටත් වැඩිදියුණු කළ යුතු ය.
- මෙම ස්ථාන දෙකෙහි බැහැර කරනු ලබන කසළ දැනට මිශ්‍ර කසළ වන අතර පරිසර දූෂණය සම්බන්ධයෙන් මහජන විරෝධතා සහ උත්සුකතා පවතී. එබැවින්, වෙනත් කාර්යයක් සඳහා භාවිත කළ නොහැකි අවශේෂ කසළ  බැහැර කිරීම වැදගත් වේ. එබැවින්, පරිසරයට බැහැර කෙරෙන  කසළ ප්‍රමාණය අවම කිරීම සඳහා කසළ වෙන් කිරීමේ, එකතු කිරීමේ සහ පිරියම් කිරීමේ ක්‍රියාවලිය බෙහෙවින් වැඩි දියුණු කළ යුතු ය.
- ගාල්ල මහා නගර සභාව  මැදිහත්වීමෙන් සිදු කරන කසළ බැහැර කිරීම් සම්බන්ධයෙන් ප්‍රජා දුක්ගැනවිලි විමසීමට යාන්ත්‍රණයක් තිබිය යුතු ය.
- මහා පරිමාණ කසළ ජනනය කරන්නන් තම කසළ බැහැර කිරීමේ වගකීම භාර ගැනීමට දිරිමත් කිරීම. බැහැර කිරීම ඇතුළුව ඔවුන්ගේ කසළවල සම්පූර්ණ ජීවන චක්‍රය සඳහා කසළ ජනනය කරන්නන් වගකියන විස්තීරණ නිෂ්පාදකයාගේ විස්තීරණ වූ වගකීම (EPR) වැඩසටහන් ක්‍රියාත්මක කරන්න.
- කසළ කළමනාකරණ තීරණ සඳහා ප්‍රජාව සම්බන්ධ කර ගැනීම. ප්‍රජා යෙදවුම්, ප්‍රතිපෝෂණ සඳහා සහ කසළ බැහැර කිරීමේ වැඩසටහන් සහ ප්‍රතිපත්තිවලට සම්බන්ධ වීම සඳහා වේදිකා ගොඩ නැගීම.
- කසළ බැහැර කිරීමේ රෙගුලාසි බලාත්මක කිරීම සහ ශක්තිමත් කිරීම. නීති විරෝධී ලෙස කසළ බැහැරලීම සම්බන්ධයෙන් දඩ මුදල් ක්‍රියාත්මක කිරීම සහ වගකීම් සහගත ලෙස කසළ කළමනාකරණය භාවිතාවේ යොදවන ව්‍යාපාර සහ පුද්ගලයන් සඳහා දිරිගැන්වීම් ලබා දීම.
- වඩාත් තිරසර කසළ බැහැර කිරීමේ තාක්ෂණයන් උදෙසා පර්යේෂණ හා නවෝත්පාදන සඳහා ආයෝජනය කිරීම. කසළ අඩු කිරීම, ප්‍රතිචක්‍රීකරණය කිරීම සහ බැහැර කිරීම සඳහා පරිසර හිතකාමී නව ක්‍රම ගවේෂණය කිරීම.

## ප්‍රතිචක්‍රීකරණ වෙළඳපොළ (විධිමත් හා අවිධිමත්)

වත්මන, ගාල්ල මහා නගර සභාව විසින් හීන්පැන්දල පරිශ්‍රයේ පිහිටි කවාෂිමා කොම්පෝස්ට් කම්හල මගින් කොම්පෝස්ට් නිෂ්පාදනය කරනු ලබයි. තවද, ගාල්ල මහා නගර සභාව  විසින්, ප්‍රතිචක්‍රීකරණය කළ හැකි කසළ දෛනික එකතු කිරීම මගින් සැලකිය යුතු ද්‍රව්‍ය ප්‍රමාණයක් එකතු කරනු ලබයි. එබැවින්, ප්‍රතිසාධනය කරන ලද ද්‍රව්‍ය සඳහා තිරසර විසඳුමක් ලෙස ප්‍රතිචක්‍රීකරණ වෙළෙඳපොළ හඳුනා ගැනීම ප්‍රමුඛතාවක් විය යුතු ය. ප්‍රතිචක්‍රීකරණ වෙළඳපොළ වෙත ළඟාවීම සම්බන්ධයෙන් යෝජනා කිහිපයක් පහත දැක්වේ.

- හීන්පැන්දල නිෂ්පාදනය කරන ලද කොම්පෝස්ට්වල ගුණාත්මක භාවය ඉහළ ප්‍රමිතියකින් තබා ගත යුතු අතර එවිට කොම්පෝස්ට් සඳහා ඇති ඉල්ලුම වැඩි වේ. එපමණක් නොව, ගාල්ල මහා නගර සභාව  දිනපතා කොම්පෝස්ට් මිලදී ගැනීමට ප්‍රමාණවත් ගැනුම්කරුවන්

වෙත ළඟා වීමට හැකි වනු පිණිස ප්‍රචාරණය වැදගත් වේ.

- ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය සඳහා කාර්යක්ෂම සහ පුළුල් එකතු කිරීමේ පද්ධති ක්‍රියාත්මක කිරීම. මෙයට 'curbside' ප්‍රතිචක්‍රීකරණ වැඩසටහන්, තාවකාලික කසළ ගබඩා කිරීමේ මධ්‍යස්ථාන (drop-off centers) සහ ද්‍රව්‍ය එකතු කිරීම සඳහා ව්‍යාපාර සමඟ හවුල්කාරිත්ව ඇතුළත් විය හැකි ය.

- හීන්පැන්දල පරිශ්‍රයෙහි ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය කාර්යක්ෂමව වෙන් කිරීම සඳහා වර්ග කිරීමේ සහ පිරියම් කිරීමේ පහසුකම් සංවර්ධනය කිරීම හෝ වැඩි දියුණු කිරීම.

- ප්‍රතිචක්‍රීකරණ පහසුකම්, ප්‍රතිචක්‍රීකරණය කරන ලද ද්‍රව්‍ය භාවිත කරන නිෂ්පාදකයන් සහ කසළ කළමනාකරණ සමාගම් ඇතුළු ප්‍රතිචක්‍රීකරණ කර්මාන්තයෙහි නියැලෙන්නන් සමඟ ශක්තිමත් සහයෝගිත්ව ඇති කර ගැනීම. මෙම සහයෝගිත්වය මගින් එකතු කිරීමේ ස්ථාන සහ ප්‍රතිචක්‍රීකරණ වෙළඳපොළ අතර වඩාත් නිර්බාධිත සම්බන්ධයක් ඇති කළ හැකි ය.

- ප්‍රතිචක්‍රීකරණය කිරීමේ වැදගත්කම සහ ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය වර්ග පිළිබඳව ජනතාව දැනුවත් කිරීම. ප්‍රභවස්ථානයේ දී කසළ වෙන් කිරීම වඩා යෝග්‍ය අයුරින් සිදු වීමටත්, උසස් ගුණාත්මකබවින් යුතු ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය වෙළඳපොළට ළඟා වීමටත්, මෙම වර්ධිත දැනුවත්භාවය හේතු විය හැකි ය.

## ආ. ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා විකල්ප

ගාල්ල මහා නගර සභාවෙහි ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලිය සඳහා අවශ්‍ය ඉහත වැඩිදියුණු කිරීම් කෙරෙහි අවධානය යොමු කරමින්, සමස්ත ක්‍රියාවලිය සඳහා පහත විකල්ප ඉදිරිපත් කර ඇත. විකල්ප හඳුනා ගැනීම සිදු කරන ලද්දේ අවම අභිමත විකල්පය හා වඩාත් අභිමත විකල්පය සංසන්දනය කිරීමෙනි.

- ගාල්ල මහා නගර සභාවෙහි ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පද්ධතිය කළමනාකරණය කිරීම සඳහා දැනට පවතින ආයතනික රාමුව හා සසඳන විට, ගාල්ල මහා නගර සභාවෙහි විවිධ දෙපාර්තමේන්තු සහ අංශයන්හි අවශ්‍ය බලතල සහිත සභාය ඇති නව මධ්‍යගත අස්ථිත්වයක් වඩාත් කාර්යක්ෂමව සහ සාර්ථක ලෙස ක්‍රියා කරනු ඇත. ඝන අපද්‍රව්‍ය කළමනාකරණයෙහි සමස්ත ක්‍රියාවලිය අධීක්ෂණය සඳහා වගකිව යුතු ප්‍රධාන පුද්ගලයෙකු සිටිය යුතු ය.

- කසළ වෙන් කිරීම සහ එකතු කිරීම (උදා: නීති විරෝධී ලෙස කසළ බැහැරලීම සීමා කිරීම) ගාල්ල මහා නගර සභාව සතුව දැනටමත් පවතින නීතිමය ප්‍රතිපාදන යටතේ හෝ සම්මත කරනු ලබන විශේෂිත අතුරු ව්‍යවස්ථා මගින් අවශ්‍ය නීතිමය බලගැන්වීම් සහිතව මූලප්‍රවාහගත කළ යුතු ය.

- සමාජ හැසිරීම් වෙනස් කිරීම තුළින් පුරවැසියන් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් අතර කසළ අඩු කිරීම, නැවත භාවිතය සහ ප්‍රතිචක්‍රීකරණය වැඩිදියුණු කිරීම සඳහා පුළුල් යාන්ත්‍රණයක් තිබිය යුතුය.

- නාගරික ශ්‍රම බලකායේ වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද සහ සමාජ කුසලතා වැඩිදියුණු කිරීම මගින් සේවා සැපයීම සහ නාගරික කම්කරුවන් සඳහා පිළිගැනීම වැඩි දියුණු කිරීම.

- යටිතල පහසුකම්වල සහ වාහන ඇණියේ ගුණාත්මකභාවය වැඩි දියුණු කරනු පිණිස ප්‍රවේශ විය හැකි අරමුදල් විකල්ප උපයෝජනය කිරීම.

- ශ්‍රම බලකායෙහි, භෞතික යටිතල පහසුකම්වල සහ උපකරණවල අනාගත අවශ්‍යතා පුරෝකථනය කරමින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පද්ධතිය සැලසුම් කිරීම පිණිස ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ක්‍රියාවලිය පුරා කසළ දත්ත වාර්තා කිරීමට ගාල්ල මහා නගර සභාව සතුව පුළුල් යාන්ත්‍රණයක් තිබිය යුතු ය.

- ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලියෙහි කාන්තා හා තරුණ සහභාගිත්වය ගත් කල, ගාල්ල මහා නගර සභාව විසින් එම කාණ්ඩ සඳහා හුදු රැකියා අවස්ථා ලබා දීමට පමණක් නොව, වෘත්තිය සඳහා වන පිළිගැනීම වැඩි දියුණු කරනු පිණිස සහ සමාජ හැසිරීම් වෙනස් කිරීම හරහා ගාල්ල මහා නගර සභා කම්කරුවන් සහ පුරවැසියන් අතර සම්බන්ධතාව වැඩි දියුණු කරනු පිණිස ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ක්‍රියාවලියෙහි කාන්තා සහ තරුණ සහභාගිත්වය දිරිමත් කළ යුතු ය.

- පවතින සම්පත්වලින් උපරිම නිමැවුමක් ලබා ගැනීම සඳහා පුළුල් සැලැස්මක් තිබීම අත්‍යවශ්‍ය වේ. මෙය පිරිවැය අඩු කිරීමට සහ ආදායම වැඩි කිරීමට හේතු විය හැකි ය.

- බැහැර කිරීම අවම කරනු පිණිස ස්වකීය එකතුවෙන් ලබාගත් විවිධ කසළ වර්ග නැවත භාවිත කිරීමට හෝ ප්‍රතිචක්‍රීකරණය කිරීමට විකල්ප ක්‍රම ගාල්ල මහා නගර සභාව විසින් සෑම විටම සොයා බැලිය යුතුය. ඔවුන්ට අවශ්‍ය තාක්ෂණික සහාය සඳහා විශ්වවිද්‍යාල සහ ඉහළ රාජ්‍ය ආයතන (CEA) සම්බන්ධ කර ගත හැකි ය.

- ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ක්‍රියාවලිය සුමටව ක්‍රියාත්මක වීමට නම් එහිලා ප්‍රජා සහයෝගය වැදගත් වේ. එබැවින් ප්‍රජා දුක්ගැනවිලි සලකා බැලෙන සන්නිවේදන වේදිකාවක් ගොඩනැගීම පිළිබඳව ගාල්ල මහා නගර සභාව විසින් සලකා බැලිය යුතු ය.

- ගාල්ල මහා නගර සභාව සෑම විටම වියදම් කළමණාකරණ මාර්ග විශේෂයෙන්ම වියදම් අඩු කිරීම සහ ආදායම් වැඩි කිරීම මගින් සොයා බැලිය යුතුය. කොම්පෝස්ට් සහ අනෙකුත් ද්‍රව්‍ය එකතු කිරීමෙන් ප්‍රතිසාධනය කරනු ලබන ද්‍රව්‍ය විකිණීම ආදායම් වැඩිකර ගැනීමේ එක් මාර්ගයකි. කෙසේ වෙතත්, ගැනුම්කරුවන් හඳුනා ගැනීම, ඔවුන් නිතිපතා සම්බන්ධ කර ගැනීම සහ එය වඩාත් වෘත්තීය ව්‍යාපාරික ආකෘතියක් බවට පත් කිරීම සඳහා පුළුල් යාන්ත්‍රණයක් තිබිය යුතු ය.

- වර්ධිත ආවේක්ෂණය, මහජන දැනුවත් කිරීම සහ වැරදිකරුවන්ට දැඩි දඬුවම් පැමිණවීම මගින් නීති විරෝධී ලෙස කසළ බැහැර ලීම වැළැක්වීමට ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීම.

- ද්‍රව්‍ය නැවත භාවිත කිරීම, ප්‍රතිචක්‍රීකරණය සඳහා නිෂ්පාදන සැලසුම් සහ ප්‍රතිචක්‍රීකරණය කරන ලද නිෂ්පාදන සඳහා වෙළඳපළ සංවර්ධන යනාදිය දිරිමත් කිරීම මගින් චක්‍රීය ආර්ථිකයක් ප්‍රවර්ධනය කිරීම

- කසළ එකතු කිරීම කාලසටහන්ගත කිරීම සඳහා ජංගම යෙදුම්, කසළ බඳුන් සොයා ගැනීම සඳහා RFID (රේඩියෝ-සංඛ්‍යාත හඳුනාගැනීම) සහ එකතු කිරීමේ ගමන්මාර්ග ප්‍රශස්ත කිරීම සඳහා GIS (භූගෝලීය තොරතුරු පද්ධතිය) වැනි තාක්ෂණික විසඳුම් භාවිත කිරීම

ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්මෙහි ඉලක්ක, අරමුණු සහ උපායමාර්ග ගොඩනැගීමේ දී ඉහත යෝජනා කර ඇති මෙම විකල්ප මීළඟ පරිච්ඡේදයේ සඳහන් පරිදි සලකා බලා ඇත.

# 9. දැක්ම, ඉලක්ක, අරමුණු සහ උපායමාර්ග

දැක්ම, ඉලක්ක, අරමුණු සහ උපායමාර්ග ගොඩනැගීමේදී, HELP-O විසින් ගාල්ල මහා නගර සභාවේ හා CCBO සහයෝගිත්වය ඇතිව මෙම ප්‍රයත්නය සඳහා ගත යුතු දිශානතිය හඳුනා ගැනීමට සහ ගාල්ල මහා නගර සභා ප්‍රදේශයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් දැනට පවතින සහ අපේක්ෂිත ගැටලුවලට විසඳුම් හඳුනාගැනීම සඳහා නගර ව්‍යාප්ත පාර්ශවකරුවන්, ප්‍රජා නියෝජිතයන් සහ ගාල්ල මහා නගර සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කාර්ය මණ්ඩලය සමඟ උපදේශන සැසි කිහිපයක් පවත්වන ලදි. මෙම ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්ම සැකසීමට පෙර පවත්වන ලද එම උපදේශන සැසිවල රූපරාමු කිහිපයක් පහත දැක්වේ.



14 රූප සටහනː ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්ම සැකසීම - ප්‍රජා උපදේශන සැසිය (මූලාශ්‍රයː HELP-O)



15 රූප සටහන ː ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්ම සැකසීම - පාර්ශ්වකාර උපදේශන සැසිය (මූලාශ්‍රයː HELP-O )



16 රූප සටහන: ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්ම සැකසීම - ගාල්ල මහා නගර සභා කාර්ය මණ්ඩල උපදේශන සැසිය (මූලාශ්‍රය: HELP-O)

ව්‍යාපෘති කණ්ඩායම විසින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් ලොව පුරා වත්මන් ප්‍රවණතා සහ තිරසර ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා විවිධ ප්‍රවේශයන් සහ සංකල්ප විමර්ශනය කරන ලදි. ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්මෙහි දැක්ම, ඉලක්ක, අරමුණු සහ උපාය මාර්ගවලට ඇතුළත් කර ඇති ඉහත ප්‍රවණතා, ප්‍රවේශයන් සහ සංකල්ප පිළිබිඹු කෙරෙන ප්‍රධාන මූලධර්ම කිහිපයක් පහත දැක්වේ.

## චක්‍රීය ආර්ථිකය (Circular Economy)

දැනට පවතින ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පද්ධතිය තුළ රේඛීය ආර්ථික ප්‍රවේශය යටතේ නිෂ්පාදන නිපදවීම, භාවිත කිරීම සහ ඉවත දැමීම වෙනුවට, චක්‍රීය ආර්ථිකයෙහි අවධානය යොමු වන්නේ කසළ ජනනය අඩු කිරීම සහ ප්‍රතිනිර්මාණය කිරීම මෙන්ම ද්‍රව්‍ය ප්‍රතිසාධනය තුළින් සම්පත් උපයෝජනය උපරිම කිරීම කෙරෙහි ය. ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේ දී චක්‍රීය ආර්ථික මූලධර්ම අනුගමනය කිරීම මගින් ආර්ථික, පාරිසරික සහ සමාජීය ප්‍රතිලාභ ප්‍රවර්ධනය කරමින් වඩාත් තිරසර සහ ප්‍රත්‍යාස්ථ (resilient) පද්ධතියකට දායක විය හැකි ය. සම්පත් කාර්යක්ෂමතාව සහ කසළ අඩු කිරීම සඳහා ප්‍රමුඛත්වය දෙන නව්‍ය විසඳුම් ක්‍රියාවට නැංවීම සඳහා විවිධ පාර්ශ්වකරුවන්ගේ සහයෝගී උත්සාහයක් අවශ්‍ය වේ.

## ජීවන චක්‍ර සලකා බැලීම (Life Cycle Consideration)

කසළ ජනනය, එකතු කිරීම, වෙන් කිරීම, හැසිරවීම, ගබඩා කිරීම, ප්‍රවාහනය, වර්ග කිරීම, පිරියම් කිරීම, ප්‍රතිසාධනය සහ අවසන් බැහැර කිරීම ඇතුළුව යම් කසළ ප්‍රවාහයක ජීවන චක්‍රයේ ප්‍රධාන අදියර සම්පත් පරිහරණ කාර්යක්ෂමතාව උපරිම කිරීම අරමුණු කර ගනිමින් සහ සමාජ-ආර්ථික මෙන්ම පාරිසරික අංශයන් සැලකිල්ලට ගනිමින් සමෝධානිත ආකාරයකින් සලකා බලනු ලැබේ. කසළ ප්‍රවාහයක සමස්ත ජීවන චක්‍රයම සමෝධානිත ලෙස සලකා බැලීම මගින් කසළ කළමනාකරණ පද්ධති, සමාජ-ආර්ථික හා පාරිසරික යන දෙඅංශයෙන්ම සලකා බැලීම් සිදු කරමින් පාරිසරික බලපෑම අවම කිරීමටත්, සම්පත් ප්‍රයෝජනය ප්‍රශස්ත කිරීමටත්, තිරසාර සංවර්ධනයට දායක වීමටත් හැකි අයුරින් නිර්මාණය කළ හැකිය.

## 3R සංකල්පය (The 3R Concept)

3R සංකල්පය කසළ කළමනාකරණ සන්දර්භය තුළ අඩු කිරීම, නැවත භාවිත කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය කිරීම කෙරෙහි කේන්ද්‍රගත වන අතර බිම්පිරවුම්වලින් අවසන් වන ද්‍රව්‍ය සංඛ්‍යාව අඩු කිරීමේ අවශ්‍යතාව අවධාරණය කරයි. මෙහි "අඩු කිරීම (Reduce)" යන්නෙන් අදහස් වන්නේ 'ජනනය වන කසළ ප්‍රමාණය අඩු කිරීම ය'. "නැවත භාවිත කිරීම (Reuse)" යන්නෙන් අදහස් වන්නේ 'ඉවත දැමීමට ඉඩ තිබූ භාණ්ඩ නැවත භාවිත කිරීමට නව ක්‍රම සොයා ගැනීම ය'. "ප්‍රතිචක්‍රීකරණය (Recycle)"යන්නෙන් අදහස් වන්නේ 'ඉවතලන භාණ්ඩ නව සහ වටිනා ආකෘතියකට පරිවර්තනය කිරීම' යන්නයි. 5R (Refuse -නොපිළිගැනීම, Reduce -අඩු කිරීම, Reuse -නැවත භාවිත කිරීම, Repurpose-ප්‍රතිඅරමුණුගත කිරීම, Recycle-ප්‍රතිචක්‍රීකරණය) සහ 7R (Rethink -නැවත සිතීම, Refuse-ප්‍රතික්ෂේප කිරීම, Reduce-අඩු කිරීම, Reuse-නැවත භාවිත කිරීම, Repair-අලුත්වැඩියා කිරීම, Re-gift-නැවත දායාද කිරීම, Recycle-ප්‍රතිචක්‍රීකරණය) වැනි 3R සංකල්පයේ විස්තීරණ අනුවාද ඇත. මේවා 3ඍ සංකල්පයේ තාර්කික දිගුවන් ලෙස ජාතික පාරිසරික ක්‍රියාකාරී සැලැස්මේ හඳුනාගෙන ඇති අතර ජීවන චක්‍ර මූලධර්මයට සහ චක්‍රීය ආර්ථිකයට අනුපූරක වේ.

## දූෂකයා විසින් ගෙවනු ලැබීම, ප්‍රතිලාභියා විසින් ගෙවනු ලැබීම සහ හානිපූර්ණය (Polluter Pay, Beneficiary Pay and the Compensation)

දූෂකයා විසින් ගෙවනු ලැබීමේ මූලධර්මය මගින් වගකීම පැවරේ. එවිට දූෂණයට වගකිව යුතු අය විසින් නිෂ්පාදකයාගේ විස්තීරණ වූ වගකීම (EPR) යෙදීම හා සමානව ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සන්දර්භය තුළ කසළ කළමනාකරණය ආශ්‍රිත බාහිර පිරිවැය දැරිය යුතු ය. දූෂකයා විසින් ගෙවනු ලැබීමේ මූලධර්මය මූලික පාරිසරික මූලධර්මයක් වන අතර එමගින් දූෂණයෙහි සහ කසළ කළමනාකරණයෙහි පිරිවැය පිළිබඳව වගකීම දූෂණය සිදු කරන හෝ කසළ ජනනය කරන අයට පවරනු ලබයි. මෙම මූලධර්මය සැලසුම් කර ඇත්තේ බාහිර පිරිවැය අභ්‍යන්තරීකරණය කිරීම සහ දූෂකයන් අතර වගවීම ප්‍රවර්ධනය කිරීම සඳහා ය. ඝන අපද්‍රව්‍ය කළමනාකරණ (SWM) සන්දර්භය තුළ, තිරසර හා සාධාරණ කසළ කළමනාකරණ භාවිතාවන්ට මග පෙන්වීම සඳහා ප්‍රතිලාභියා විසින් ගෙවනු ලැබීම සහ හානිපූර්ණය යන සංකල්ප සමග, දූෂකයා විසින් ගෙවනු ලැබීමේ මූලධර්මය යෙදිය හැකි ය.

## පොදු නමුදු වෙනස් වූ වගකීම් (Common but Differentiated Responsibilities)

නගරයේ සෑම ආයතනයක්ම සහ පුද්ගලයෙකුම පොදු නමුදු වෙනස් වූ වගකීමකට අනුගත වීම සහ කසළ කළමනාකරණයේ සියලු අංශවලට සම්බන්ධ වීම, සියලුම නගර ප්‍රජාවන් සඳහා සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් උදෙසා කසළ කළමනාකරණයෙහිලා මූලික පූර්වාවශ්‍යතාවක් ලෙස සැලකේ.

## මහජන භාරකාර මූලධර්මය (Public Trust Doctrine)

මෙය පළාත් පාලන ආයතනයක් වන ගාල්ල මහා නගර සභාව පරම අයිතිකරුවකු නොව පරිසරයේ භාරකරු බැවින් මහා නගර සභාව මහජන සුබසිද්ධිය පෙරදැරි කර ගනිමින් සිය කළමනාකරණය සිදු කළ යුතුය යන පදනම මත පුරවැසියන්ට යහපත් පරිසරයක් සඳහා ඇති ස්වකීය අයිතිය සාක්ෂාත් කර ගැනීමට විශ්වාසය තැබිය හැකි නීතිමය සම්මතයකි.ඝන අපද්‍රව්‍ය කළමනාකරණය තීරණ ගැනීමේ දී පුළුල් ප්‍රජා සහභාගිත්වය සහ පාර්ශ්වකරුවන් සමග සහයෝගයෙන් කටයුතු කිරීම වූ කලී මෙම පදනම මත නව 3R/ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියේ අත්‍යවශ්‍ය අංගයක් ලෙස සැලකේ.

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය හා සම්බන්ධ ඉහත සඳහන් මූලධර්මවලට අනුකූලව සහ ශ්‍රී ලංකාවේ සැලකිය යුතු උරුම වටිනාකම් සහිත ප්‍රධාන සංචාරක ගමනාන්තයක් (උදා: ගාලු කොටුව) බවට පත්ව ඇති ගාලු නගරයේ අනාගත සංවර්ධන අභිලාෂයන් සැලකිල්ලට ගනිමින්, ගාල්ල මහා නගර සභා ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්මෙහි දැක්ම පහත පරිදි නිර්මාණය කර ඇත.

# "Galle: The **Cleanest Destination** of Sri Lanka"

# "ගාල්ල : ශ්‍රී ලංකාවේ **පිවිතුරුම ගමනාන්තය**"

ඉහත දැක්ම පෙරදැරි කර ගනිමින්, සවිස්තරාත්මක SWOT විශ්ලේෂණයක් (ශක්තීන්, දුර්වලතා, අවස්ථා සහ තර්ජන) පවත්වන ලද අතර, ඉහත දැක්ම හා සම්බන්ධ ප්‍රධාන ශක්තීන්, දුර්වලතා, අවස්ථා සහ තර්ජන ඇමුණුම 1හි වගුවේ දැක්වේ.

ගාල්ල මහා නගර සභා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියට (උදා: කසළ එකතු කිරීම, ප්‍රවාහනය/මාරු කිරීම, පිරියම් කිරීම, බැහැර කිරීම සහ ප්‍රතිචක්‍රීකරණ වෙළඳපළ) අදාළ දැක්ම, දැක්ම පදනම් කරගත SWOT විශ්ලේෂණය සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ආශ්‍රිතව හඳුනාගත් වැඩිදියුණු කිරීමේ අවශ්‍යතා සහ විකල්ප කෙරෙහි අවධානය යොමු කරමින්, නගරයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියේ අවශ්‍යතා සපුරාලීමට ඉලක්ක පහක් (05) සකස් කරන ලදි. දැක්මෙහි මූලධර්ම සහ නගරයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියේ සමස්ත තිරසරබව කෙරෙහි මෙම ඉලක්ක මගින් අවධානය යොමු කෙරේ.

ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්මෙහි අරමුණු ගාල්ල මහා නගර සභා ප්‍රදේශය තුළ ජනනය වන සෑම කසළ වර්ගයකටම විසඳුම් සැපයීම, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ආශ්‍රිත ගැටලු විසඳීමට ගාල්ල මහා නගර සභාවෙහි ධාරිතාව වැඩි දියුණු කිරීම සහ විවිධ පාර්ශ්වකරුවන් ඔවුන්ගේ ධාරිතාව වැඩි දියුණු කරන අතරම ඝන අපද්‍රව්‍ය ක්‍රියාවලියේ නිරත කරවීම සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ගැටලු විසඳීමේ දී නිර්මාණාත්මක සහ නව්‍ය මෙවලම් භාවිත කිරීම කෙරෙහි කේන්ද්‍රගත විය යුතු බව ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමෙහි සක්‍රියව යෙදී සිටි ක්‍රියාකාරී කණ්ඩායම විසින් හඳුනාගෙන ඇත. ඒ අනුව ගාල්ල මහා නගර සභා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ගොඩනගා ඇති ඉලක්ක පහ පහත පරිදි වේ.

| | |
|---|---|
| **ඉලක්කය 1:** | **මූලික වශයෙන් 3R පදනම් කරගත් සහයෝගී ප්‍රවේශයක් මගින් නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම** |
| **ඉලක්කය 2:** | **ඵලදායී 3R පාදක ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා හැකියාව සහ දැනුමැති මහා නගර සභාවක්** |
| **ඉලක්කය 3:** | **ඵලදායී 3R පාදක ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා දැනුමැති හා කැප වූ පාර්ශ්වකරුවන්** |
| **ඉලක්කය 4:** | **3R/ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාමාර්ග සඳහා කැප වූ පාර්ශ්වකරුවන්ගේ සහයෝගී ජාලය** |
| **ඉලක්කය 5:** | **අනුවර්තතනය කළ හැකි, නිර්මාණාත්මක හා නව්‍ය ඝන අපද්‍රව්‍ය කළමනාකරණ විසඳුම් සහිත ආදර්ශ නගරයක්** |

සෑම ඉලක්කයක් යටතේම අරමුණු කිහිපයක් හඳුනා ගන්නා ලද අතර එක් එක් අරමුණ යටතේ උපායමාර්ග කිහිපයක් හඳුනා ගන්නා ලදි. මෙම උපායමාර්ග සහ ක්‍රියාමාර්ග කාලෝචිත ලෙස ක්‍රියාත්මක කිරීම මගින්, දැක්මෙහි අවධාරණය කර ඇති පරිදි, ගාල්ල නගරය ශ්‍රී ලංකාවේ පිවිතුරුම ගමනාන්තය බවට පත් කළ හැකි වනු ඇත.

එක් එක් ඉලක්ක යටතෙහි වන අරමුණු සහ උපායමාර්ග පහත වගුවෙන් ඉදිරිපත් කෙරේ.

*14 වගුව : ඉලක්ක, අරමුණු සහ උපායමාර්ග*

| **අරමුණ** | **උපායමාර්ග** |
|---|---|
| **ඉලක්කය 1: මූලික වශයෙන් 3R පදනම් කරගත් සහයෝගී ප්‍රවේශයක් මගින් නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම** | |
| **අරමුණ 1: 2030 වනවිට පූර්ණ ධාරිතාවයෙන් ගාල්ල මහා නගර සභාවෙහි දැනට පවතින ඝන අපද්‍රව්‍ය  කළමනාකරණ පහසුකම් වැඩිදියුණු කිරීම සහ ක්‍රියාත්මක කිරීම (උදා: හීන්පැන්දල දඩැල්ලෙහි පිහිටි PET බෝතල් එකතු කිරීමේ මධ්‍යස්ථානය සහ COWAM මධ්‍යස්ථානය)** | 1. මෙම පහසුකම්වල වත්මන් තත්ත්වය තක්සේරු කිරීම සඳහා තාක්ෂණික, මූල්‍ය, සමාජීය හා කළමනාකරණ අංශවල නිලධාරීන් සහ එම අංශවලම බාහිර විශේෂඥයන්ගෙන් සමන්විත කණ්ඩායමක් පත් කිරීම.<br>2. හීන්පැන්දල, දඩැල්ල COWAM මධ්‍යස්ථානය සහ PET බෝතල් මධ්‍යස්ථානය සඳහා සම්පූර්ණ ධාරිතාවට ළඟා වීමට  පහත විශේෂාංග සහිත ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම;<br>I. පහසුකම් සඳහා අවශ්‍ය භෞතික වැඩිදියුණු කිරීම් (උදා:  කාන්තා සේවකයන් සඳහා සනීපාරක්ෂක සහ වෙනත් පහසුකම්)<br>II. ස්වයං මූල්‍යකරණය සහ දිගුකාලීන පැවැත්මක් සහිත කළමනාකරණ ප්‍රවේශය<br>III. හඳුනාගත් සංධිස්ථාන සමග ළඟා කරගත හැකි කාල සැලැස්ම<br>IV. පාර්ශ්වකරුවන්ගේ කාර්යභාරය වගකීම් නිශ්චිතව අර්ථකථනය<br>V. අදාළ පාර්ශ්වකරුවන් සමග ඵලදායී සහයෝගීතාව (එනම් රජය, පෞද්ගලික හෝ අරමුදල් නියෝජිතායතන සමග)<br>VI. ගාල්ල මහා නගර සභාව වෙත ඍජු වගවීම<br><br>3. මෙම පහසුකම් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පහසුකම් සහිත පාසල්/ විශ්වවිද්‍යාල/ වෙනත් අධ්‍යයන ආයතන සමග අධ්‍යාපන හා සංවරධන R&D/ පුළුල් කිරීමේ අරමුණු හා සම්බන්ධ කිරීම |
| **ඉලක්කය 2 : 2030 වනවිට ඒකපුද්ගල අපද්‍රව්‍ය ජනනය දිනකට කිලෝග්‍රෑම් 0.66 සිට දිනකට කිලෝග්‍රෑම් 0.5 දක්වා අඩු කිරීම** | 1. අපද්‍රව්‍ය අවම කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා දිරිගැන්වීම් මත පදනම් වූ උපකරණ හඳුන්වා දීම<br>I. කසළ ජනනය කරන්නන් සඳහා සුදුසු ප්‍රමිතීන් සහිත ශ්‍රේණිගත කිරීමේ ක්‍රමයක් (A,B,C) / වාර්ෂිකව ප්‍රදාන ක්‍රමයක් හඳුන්වා දීම<br>II. ප්ලාස්ටික් භාවිතයෙන් තොර ආයතන ප්‍රවර්ධනය කිරීම (උදා: සංචාරකයන් සඳහා හෝටල් ශ්‍රේණිගත කිරීම)<br>III. සාමාන්‍ය ගෘහස්ථ ඝන අපද්‍රව්‍ය හැර ගාල්ල මහා නගර සභාව විසින් අපද්‍රව්‍ය  කළමනාකරණ සේවා සැපයීම සඳහා ප්‍රමාණ පාදක අය පද්ධතියක් හඳුන්වා දීම<br>2. අපද්‍රව්‍ය  වශයෙන් ක්ෂණිකව ඉවත් කරනු ලබන ද්‍රව්‍ය සඳහා අඩු වියදම් සහිත විකල්ප, විසඳුම් වශයෙන් හඳුනා ගැනීම, තක්සේරු කිරීම සහ හඳුන්වා දීම (උදා:  ප්ලාස්ටික් සාප්පු බෑගය)/ ඒවා ප්‍රවර්ධනය කිරීම සඳහා ගාල්ල මහා නගර සභාවෙහි එවැනි විකල්ප නිෂ්පාදකයන් ලියාපදිංචි කිරීම<br>3. කසළ අවම කිරීම ප්‍රවර්ධනය සඳහා සමාජ හැසිරීම් වෙනස් කිරීම<br>I. කාන්තාවන්, යෞවනයන් සහ ළමුන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වයෙන් දැනුවත් කිරීම්/ප්‍රචාරණ ව්‍යාපාර කටයුතු සිදු කිරීම<br>II. ගාල්ල මහා නගර සභාව විසින් මෙහෙයවනු ලබන ඩිජිටල් දැන්වීම් පුවරු සැකසීම |

| | |
|---|---|
| | 4. හරිත නිෂ්පාදන සඳහා නිෂ්පාදකයන් වැඩිදියුණු කිරීම (උදා: කාන්තා අවශ්‍යතා සඳහා විකල්ප නිෂ්පාදන වැඩිදියුණු කරන්නන් හරහා)<br>5. කර්මාන්ත/ වාණිජ ආයතන අතර හරිත නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම |
| **අරමුණ 3 : 2025 වනවිට සියලු වර්ගවල කසළ ජනනය කරන්නන් අතර නිසි කසළ වෙන් කිරීමේ සහ ගබඩා කිරීමේ භාවිතාවන් සහතික කිරීම** | 1. එක් එක් ගෘහස්ථ, වාණිජ, කර්මාන්ත හා හා සේවා අංශ සඳහා විද්‍යාත්මක හා වඩාත් ප්‍රායෝගික කසළ වෙන් කිරීමේ ප්‍රතිපත්තියක් හඳුන්වා දීම<br>2. එවැනි ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා නියාමන හා දිරිගැන්වීම් පදනම් කරගත් උපකරණ සංස්ථාගත කිරීම<br>3. තොග වශයෙන් කසළ ජනනය කරන්නන්ට (කසළ ඒකරාශි කරන්නන් (aggregators) ඇතුළුව) ඔවුන්ගේ මෙහෙයුම් සම්බන්ධයෙන් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මක් සකස්කර ගාල්ල මහා නගර සභාව වෙත ඉදිරිපත් කිරීම අනිවාර්ය කිරීම<br>4. තොග වශයෙන් කසළ ජනනය කරන්නන්ගෙන් MSW දත්ත ලබාගැනීමේ යාන්ත්‍රණයක් හඳුන්වා දීම<br>5. ගොඩනැගිලි සැලැස්ම අනුමත කිරීම සඳහා අයදුම් කිරීමේ දී සැලැස්මේ ඇස්තමේන්තුගත කසළ ප්‍රමාණය, කසළ එකතු කිරීම සහ තාවකාලික ගබඩා ස්ථාන දැක්වීම අනිවාර්ය කිරීම<br>6. කසළ එකතු කිරීම/ ගබඩා කිරීම සඳහා සම්මත කසළ බඳුන් හඳුන්වා දීම<br>7. ගාල්ල මහා නගර සභා ප්‍රදේශය තුළ කසළ එකතු කිරීමේ මධ්‍යස්ථාන (සියලු කසළ ප්‍රවර්ග සඳහා) පිහිටුවීම |
| **අරමුණ 4:2030 වනවිට ගාල්ල මහා නගර සභා ප්‍රදේශයේ පුළුල් ද්‍රව්‍ය ප්‍රතිසාධන පහසුකමක් (එම්.ආර්.එෆ්) ස්ථාපිත කිරීම** | 1. PPP ආකෘතියක් ලෙස MRF ක්‍රියාත්මක කිරීමට අවස්ථා ගවේෂණය කිරීම<br>2. ගාල්ල මහා නගර සභා ප්‍රදේශය තුළ තෝරා ගත් ස්ථානවල ද්‍රව්‍ය එකතු කිරීමේ සහ බෙදා ගැනීමේ මධ්‍යස්ථාන පිහිටු වීම |
| **අරමුණ 5: ප්‍රතිචක්‍රීකරණය කළ හැකි අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා විශේෂිත ආයතන හඳුනා ගැනීම සහ 2026 වන විට විධිමත් ප්‍රතිචක්‍රීය කසළ කළමනාකරණයක් සඳහා සබැඳි සංවර්ධනය කිරීම** | 1. ගාල්ල මහා නගර සභාව ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියට සම්බන්ධ කළ හැකි සියලුම කසළ ප්‍රතිචක්‍රීකරණය කරන්නන්, එකතු කරන්නන්, ප්‍රවාහකයන් සහ ඒකරාශි කරන්නන් (ගාල්ල මහා නගර සභා ප්‍රදේශය තුළ සහ ඉන් පිටත) ලියාපදිංචි කිරීම |
| **අරමුණ 6: 2026 වනවිට පිළිගත හැකි බැහැර කිරීමේ ක්‍රම නොමැති කසළ වර්ග සඳහා සනීපාරක්ෂක ගබඩා සහ බැහැර කිරීමේ ක්‍රම හඳුනා ගෙන ක්‍රියාත්මක කිරීම (උදා: අන්තරායකර [උදා: ඩයපර්, සනීපාරක්ෂක පෑඩ්, ඉවත දැමිය හැකි බැටරි], අන්තරායකර නොවන, භාවිත කළ නොහැකි මිශ්‍ර අපද්‍රව්‍ය, ෆයිබර්, සෙරමික් අපද්‍රව්‍ය, මැටි අපද්‍රව්‍ය ආදිය)** | 1. නිසි/ පිළිගත හැකි බැහැර කිරීමේ ක්‍රමයක් නොමැති අපද්‍රව්‍ය වර්ග සඳහා එකතු කිරීමේ සහ ගබඩා කිරීමේ පද්ධතියක් සැලසුම් කිරීම<br>2. එවැනි අපද්‍රව්‍ය සඳහා නිෂ්පාදකගේ විස්තීර්ණ වූ වගකීම (EPR) ප්‍රතිපත්තිය/ රෙගුලාසි යෙදීමේ හැකියාව ගවේෂණය කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය, පරිසර අමාත්‍යාංශය සහ පළාත් පාලන අමාත්‍යාංශය සමග සම්බන්ධ වීම<br>3. මෙම වර්ගයේ අපද්‍රව්‍ය (ගාල්ල මහා නගර සභා ප්‍රදේශය තුළ හෝ ඉන් පිටත) සම්බන්ධයෙන් කටයුතු කරන සංවිධාන සමග සම්බන්ධතා හඳුනාගෙන ස්ථාපිත කර පිළිගත හැකි බැහැර කිරීමේ ක්‍රම භාවිත කිරීම<br>4. මධ්‍යම පරිසර අධිකාරියේ උපදෙස් මත හීන්පැන්දල ප්‍රදේශයේ සුළු අපද්‍රව්‍ය දහන යන්ත්‍රයක් ස්ථාපිත කිරීම. |
| **ඉලක්කය 2: ඵලදායී 3R පාදක ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා හැකියාව සහ දැනුමැති මහා නගර සභාවක්** | |
| **අරමුණ 1: 2030 වනවිට එකතු කිරීමේ අනුපාතය 22%සිට 50% දක්වා වැඩි කිරීම සඳහා ආධාරක ද්‍රව්‍ය සම්පත්, යටිතල පහසුකම් සහ සේවා වැඩිදියුණු කිරීම** | 1. ගාල්ල මහා නගර සභාවෙහි දැනට පවතින ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වාහන ඇණිය 2030 වන විට උත්ශ්‍රේණි කිරීම<br>2. 2025 වන විට (උදා. කාන්තා සේවකයන් සඳහා සනීපාරක්ෂක සහ වෙනත් පහසුකම් සහිතව/ කාන්තා සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා) වැඩිදියුණු කිරීම සහ ගාල්ල මහා නගර සභාව සතුව දැනට පවතින ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ආශ්‍රිත පහසුකම් ක්‍රියාත්මක කිරීම (උදා: ගාල්ල මහා නගර සභාව පරිශ්‍රයේ/කිතුලම්පිටිය නාගරික ගරාජය, හීන්පැන්දල වාහන පිරිසිදු කිරීමේ මධ්‍යස්ථානය)<br>3. වත්මන් කසළ එකතු කිරීමේ යාන්ත්‍රණය ඇගයීම, පරතර හඳුනා ගැනීම සහ 2027 වනවිට වැඩි දියුණු කිරීම |

| | |
|---|---|
| | I. මාර්ග ප්‍රශස්තකරණය (පවතින එකතු කිරීමේ ගමන්මාර්ගය, GPS අධීක්ෂණය යනාදිය වැඩි දියුණු කිරීම)<br>II. කසළ එකතු කිරීම සහ ප්‍රවාහනය අධීක්ෂණය කිරීම සඳහා ජංගම යෙදුම් සහ ඩිජිටල් තාක්ෂණ භාවිත කිරීම<br>III. කසළ මත පදනම් වූ ආදායම් ජනනය මූලප්‍රවාහගත කිරීම<br>4. අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා භාවිතයට නොගත් යන්ත්‍රසූත්‍ර ඵලදායී ලෙස භාවිත කිරීම<br>5. නගර සීමාව තුළ ඇළ මාර්ග හරහා සාගරයට පාවෙන ප්ලාස්ටික් සහ වෙනත් අපද්‍රව්‍ය එකතු කිරීම සඳහා සමුද්‍රීය පෙරනයක් (ocean strainer) ස්ථාපිත කිරීම<br>6. මධ්‍යම පරිසර අධිකාරියේ උපදෙස් මත ආසාදක අපද්‍රව්‍ය පුළුස්සා දැමීම සඳහා කුඩා දහන යන්ත්‍රයක් ස්ථාපිත කිරීම |
| **අරමුණ 2:2026 වනවිට වෘත්තීය නිපුණතා වැඩිදියුණු කිරීම මගින් නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ශ්‍රමබලකාය සඳහා පිළිගැනීම ඉහළ නැංවීම** | 1. ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ශ්‍රමබලකායේ කාන්තාවන් සහ තරුණ සේවකයන්ගේ සංයුතිය වැඩි කිරීම<br>2. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය මත NVQ මට්ටමේ පුහුණුවක් ලබා ගැනීම සඳහා ශ්‍රමබලකායට පහසුකම් සැලසීම<br>3. ශ්‍රමබලකාය සඳහා දිරිගැන්වීම් සහ සුභසාධන පහසුකම් (උදා: සෞඛ්‍ය සේවා) ප්‍රවර්ධනය කිරීම<br>4. ශ්‍රමබලකාය සඳහා අවශ්‍ය උපකරණ සහ පුහුණුව ලබා දීම<br>5. තාවකාලික සේවකයන් සඳහා රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීම |
| **අරමුණ 3: 2026 වනවිට අවශ්‍ය වැඩිදියුණු කිරීම් සහිතව ගාල්ල මහා නගර සභාවෙහි කළමනාකරණ යාන්ත්‍රණ සහ මෙවලම් ශක්තිමත් කිරීම** | 1. නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය ශක්තිමත් කිරීම සහ නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ දත්ත සමුදාය කළමනාකරණය ඇතුළුව ගාල්ල මහා නගර සභාවෙහි ප්‍රධාන නිලධාරීන් සමග සාකච්ඡා කර ISWAMP සම්බන්ධීකරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා කැප වූ ප්‍රධානියෙක් පත් කිරීම<br>2. ගාල්ල මහා නගර සභාවෙහි ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකයට අවශ්‍ය සම්පත් පිරිස් සහ උපකරණ සමග පහසුකම් සැලසීම<br>3. 2027 වන විට ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකයේ පර්යේෂණ හා සංවර්ධන ඒකකයක් පිහිටුවීම (උදා: ප්‍රජා විශේෂිත විසඳුම්, ගමන්මාර්ග වෙනස්කම්, ආරක්ෂාව සහ පාරිසරික වැඩිදියුණු කිරීම් ආදිය කෙරෙහි අවධානය යොමු කිරීම)<br>4. එක් එක් දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකුගේ සහභාගිත්වයෙන් කසළ ජනනය, එකතු කිරීම, වර්ග කිරීම, අවසන් බැහැර කිරීම, එකතු කිරීම යනාදිය සඳහා යාවත්කාලීන දත්ත සමුදායක් පවත්වා ගෙන යාම (පරිගණක පාදක දත්ත සමුදායක් සහ වැඩසටහනක් සංවර්ධනය කිරීමේ අවශ්‍යතාව)<br>5. හදිසි ප්‍රතිචාර යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම (උදා: ජංගම සේවා ඒකකයක් පිහිටුවීම)<br>6. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ආශ්‍රිත කටයුතු සඳහා දුක්ගැනවිලි නිරාකරණ යාන්ත්‍රණ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම (උදා: මේ සඳහා e-Sabha යෙදුම අභිරුචිකරණය (customize) කිරීම)<br>7. වාර්ෂික ලියාපදිංචි ගාස්තුවක් අයකරමින් අවිධිමත් කසළ එකතු කරන්නන් අධීක්ෂණය කිරීම සහ තාක්ෂණික සහාය ලබාදීම |
| **අරමුණ 4: 2026 වනවිට වියදම් කළමනාකරණය සහ ආදායම් ජනනය ශක්තිමත් කිරීම තුළින් මහා නගර සභාවේ මූල්‍ය ධාරිතාව ඉහළ නැංවීම** | 1. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් ගාල්ල මහා නගර සභාව විසින් සපයනු ලබන හඳුනාගත් සේවාවන් සඳහා සේවා ගාස්තු අය කිරීම හඳුන්වා දීම (උදා: සැණකෙළියක් පැවැත්වීම තුළින් ජනනය වන කසළ කළමනාකරණය කිරීම) - අය කිරීමේ යෝජනා ක්‍රමය හොඳින් ව්‍යුහගත සහ ප්‍රමාණ පාදක විය යුතු අතර සේවා ලබන්නාට පැහැදිලිව දැනුම් දිය යුතු ය (කසළ අවම කිරීමට හෝ ස්වයං කළමනාකරණය කිරීමට බලපෑම් කිරීම).<br>2. හීන්පැන්දල, දඩැල්ල සහ PET බෝතල් එකතු කිරීමේ මධස්ථානයේ කසළ පිරියම් කිරීමේ මධ්‍යස්ථාන සඳහා සූර්ය පැනල පද්ධතියක් ස්ථාපිත කිරීම |
| **අරමුණ 5: 2026 වනවිට වර්තමාන නෛතික හා නියාමන මෙවලම්වල අවශ්‍යතාව වැඩිදියුණු කිරීම් තුළින් ගාල්ල මහා නගර සභාවෙහි බලතල ඉහළ නැංවීම** | 1. ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය නිසි ලෙස කළමනාකරණය කිරීම සහ ISWMAP ක්‍රියාත්මක කිරීම සඳහා නව අතුරු ව්‍යවස්ථා හෝ රෙගුලාසිවලින් පියවිය යුතු වත්මන් නීතිමය උපකරණවල පරතර හඳුනා ගැනීම.<br>2. ඉහත පරතර සම්බන්ධයෙන් කෙටුම්පත් කර ඇති අතුරු ව්‍යවස්ථා සඳහා අනුමැතිය ලබාගැනීම/ ISWMAP ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම |
| **අරමුණ 6: 2024 වන විට ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලියේ එක් එක් පියවර සඳහා පුළුල් අධීක්ෂණ හා ඇගයීම් යාන්ත්‍රණයක්** | 1. ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සහ ඇගයීම සඳහා ළඟා විය හැකි කාලරාමුවක් සහිත පුළුල් අධීක්ෂණ හා ඇගයීම් යාන්ත්‍රණයක් සංවර්ධනය කිරීම. KPIs එරෙහිව කාර්තුමය (මාසික 3) ඇගයීමක් සහ WACS, COSA, පාලන පරතර විශ්ලේෂණය සහ අරමුදල් විකල්ප නිතිපතා අනුගමනය කිරීම/ අඛණ්ඩව සිදු කිරීම (උදා: සෑම වසර 3කට වරක්) |

| | |
|---|---|
| **සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම (උදා: කසළ ජනනය, වෙන් කිරීම, කසළ ජනනය කරන්නන් සහ හසුරුවන්නන් අධීක්ෂණය කිරීම)** | 2. දත්ත සහ වලංගුකරණය සංසන්දනය කිරීමෙන් ගාල්ල මහා නගර සභාවෙහි නිත්‍ය එකතු කිරීමේ කාර්යක්ෂමතාව අධීක්ෂණය කිරීම<br>3. දැනුවත්භාව වැඩිකිරීම සහ නෛතික ක්‍රියාමාර්ග තුළින් නීති විරෝධී කසළ බැහැර කිරීම 80% ක් අඩු කිරීම. |
| **ඉලක්කය 3: ඵලදායී 3R පාදක ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා දැනුමැති හා කැප වූ පාර්ශ්වකරුවන්** | |
| **අරමුණ 1: 2025 වනවිට ගාල්ල මහා නගර සභාව සහ පාර්ශ්වකරුවන් අතර වේගවත් හා ඵලදායී ද්වි-මාර්ග සන්නිවේදනයක් සඳහා පුළුල් හා නව වේදිකාවක් වැඩිදියුණු කිරීම සහ ක්‍රියාත්මක කිරීම** | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ආශ්‍රිත කටයුතු සඳහා කැප වූ ගාල්ල මහා නගර සභා වෙබ් අඩවිය හා සම්බන්ධ වෙබ් අඩවියක්/වෙබ් පිටුවක් නිර්මාණය කිරීම<br>1. වේගවත් හා ඵලදායී ද්වි-මාර්ග සන්නිවේදනයක් සඳහා e-Sabha යෙදුම ප්‍රවර්ධනය කිරීම<br>2. වේගවත් හා ඵලදායී ද්වි-මාර්ගසන්නිවේදනයක් සඳහා WhatsApp කණ්ඩායම්/ වෙබ්පිටුව/ ෆේස්බුක් පිටු භාවිතය ප්‍රවර්ධනය කිරීම<br>3. සන්නිවේදන කටයුතු සඳහා ගාල්ල මහා නගර සභාව හා දුරකථනයෙන් සම්බන්ධ විය හැකි අංකයක් එකතු කිරීම |
| **අරමුණ 2: මහා පරිමාණ හා බලපෑම් සහිත කසළ ජනනය කරන්නන්/ ක්‍රියාකාරකම් සංවිධායකයන් සතුව ගාල්ල මහා නගර සභාවේ ISWMAP අනුකූලව සකස් කරන ලද පුළුල් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලසුම් විසින් සහතික කිරීම** | 1. තොග වශයෙන් කසළ ජනනය කරන්නන්/ ක්‍රියාකාරකම් සංවිධායකයන් හඳුනා ගැනීම සඳහා නිර්ණායක ලැයිස්තුවක් සකස් කිරීම<br>2. කසළ ජනනය අඩු කිරීම (විශේෂයෙන් ප්ලාස්ටික් අපද්‍රව්‍ය), කසළ ප්‍රතිචක්‍රීකරණය, කසළ වෙන් කිරීම සහ ගබඩා පහසුකම් සැපයීම සහ කළමනාකරණය කිරීම සහ විවිධ වර්ගයේ කසළ නිසි ලෙස බැහැර කිරීම සඳහා ක්‍රියාමාර්ග නියම කිරීම මගින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම නෛතික අවශ්‍යතාවයක් බවට පත් කිරීම.<br>3. අදාළ සංවිධානවල 3R/ඝන අපද්‍රව්‍ය කළමනාකරණය හැසිර වීමට සුදුසුකම් ලත් ( උදා: NVQ) 3R/ඝන අපද්‍රව්‍ය කළමනාකරණ නිලධාරියෙකු සිටීම සඳහා ඵලදායී කසළ ජනනය කරන්නන්/ ක්‍රියාකාරකම් සංවිධායකයන් (විශාල හා අන්තරායකර අපද්‍රව්‍ය ජනනය කරන්නන්) සඳහා අවශ්‍යතාවයක් බවට පත් කිරීම. |
| **අරමුණ 3: 2030 වනවිට දැනුම බෙදා හදා ගැනීම සහ ආකල්පමය වෙනසක් සඳහා පුළුල් වැඩසටහනක් හරහා පාර්ශ්වකරුවන් අතර ධනාත්මක සමාජ හැසිරීම් වෙනසක් සහතික කිරීම** | 1. නව ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ආශ්‍රිත භාවිතාවන් පිළිබඳ විශ්වවිද්‍යාල, පෞද්ගලික අංශයේ ආයතන සහ අනෙකුත් අදාළ පාර්ශවයන් තුළ නිර්මාණය කරන ලද නව දැනුම අවශෝෂණය කර බෙදා ගැනීම සඳහා වේදිකාවක් නිර්මාණය කිරීම (ගාල්ල මහා නගර සභාවෙහි යෝජිත පර්යේෂණ හා සංවර්ධන අංශයට අනුබද්ධ)<br>2.අවශ්‍යතා තක්සේරුවක් මත පදනම්ව විවිධ පාර්ශ්වකරුවන් සඳහා අඛණ්ඩ දැනුම වැඩිදියුණු කිරීම සහ පුහුණුව ලබා දීම<br>3. රජයේ නිලධාරීන්/ හෝටල්/ කර්මාන්ත ප්‍රජාව/ සංචාරකයන් ආදිය.<br>3. දිගු කාලීන සමාජ හැසිරීම් වෙනස් කිරීම අරමුණු කරගත් විශේෂිත කණ්ඩායම් (උදා: කාන්තාවන්, තරුණයන්, පාසල්, දහම්පාසල්, තරුණයන්, උපකාරක පන්ති ආදිය) සඳහා 3R/ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ පුහුණුව සහ දැනුවත්භාවය ලබාදීම.<br>4. පාසල් මට්ටමින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ භාවිතාවන් ප්‍රවර්ධනය කිරීමට සහ පාසල් විෂයමාලාව තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ආශ්‍රිත දැනුම ඇතුළත් කිරීමේ හැකියාව සොයා බැලීමට අදාළ රජයේ ආයතනවලින් ඉල්ලා සිටීම.<br>5. නව්‍ය සන්නිවේදන මෙවලම් (උදා: ඩිජිටල් පුවරු සහ වීදි නාට්‍ය) හරහා විශේෂිත කණ්ඩායම් සඳහා 3R/ ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේ මනා පරිචයන් පිළිබඳව දැනුවත්කිරීම<br>6. අනන්‍ය හා සැලකිය යුතු කසළ ගැටලු ඇති කණ්ඩායම් සඳහා විශේෂිත දැනුවත් කිරීමේ සැසි සංවිධානය කිරීම (උදා: ආගමික ස්ථාන) |

| | |
|---|---|
| **අරමුණ 4: 2026 වන විට දැනට සිටින ක්‍රියාකාරීන්, ස්වේච්ඡා කණ්ඩායම් සහ සංචාරකයන් ගාල්ල මහා නගර සභා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියට 3R/ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ආදර්ශ ලෙස (උදා: ඝන අපද්‍රව්‍ය කළමනාකරණ හදිසි අවස්ථාවල දී ක්‍රියා කිරීම, වැරදි ක්‍රියා හඳුනා ගැනීම සහ ක්‍රියා කිරීම යනාදිය) අවශෝෂණය කර ගැනීම** | 1. මනා පරිචයන් හඳුනා ගැනීම හා ඒ සඳහා පහසුකම් සැලසීම, සහ පිළිබඳ දැනුම හුවමාරු කරගැනීම සහ සමාජ හැසිරීම් වෙනස් කිරීම සඳහා එම භාවිතාවන් යොදා ගැනීම (උදා: දිරිගැන්වීම්, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය හරහා පාරිසරික සංචාරක ව්‍යාපාරය සහ සෞඛ්‍ය සංචාරක ව්‍යාපාර)<br>2. ස්වේච්ඡා ක්‍රියාකාරකම් සඳහා ගාල්ල මහා නගර සභාවෙහි අනුමැතිය ලබාදීමේ ක්‍රියාවලියක් ස්ථාපිත කිරීම<br>3. ගාල්ල මහා නගර සභා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියේ ක්‍රියාකාරීන්, ස්වේච්ඡා සේවකයන් (උදා: කාන්තා/ තරුණ නායකයන්) සහ සංචාරකයන් සම්බන්ධ කරගැනීම<br>4. වැරදි හඳුනා ගෙන ක්‍රියා කිරීමට ස්වේච්ඡා සුපරීක්ෂක කණ්ඩායම් ප්‍රවර්ධනය කිරීම.<br>5. ශිෂ්‍ය කණ්ඩායම් ප්‍රවර්ධනය (පාසල් මට්ටමින්) ස්වේච්ඡා හා සුපරීක්ෂක කණ්ඩායම් ලෙස.<br>6. පාසැල් මට්ටමින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ තරග, විවාද සහ ප්‍රදර්ශන සංවිධානය කිරීම<br>7. පිරිසිදු නගරයක් සඳහා යහපත් භාවිතයන් සහ කැපවීම අගය කිරීම සඳහා ජනාවාස අතර තරග සංවිධානය කිරීම<br>8. ඝන අපද්‍රව්‍ය කළමනාකරණයෙහි සේවය කරන ස්වේච්ඡා පාරිසරික කණ්ඩායම් සහ සමිති සඳහා දිරිගැන්වීම්/ පිළිගැනීම් ලබාදීම |
| **ඉලක්කය 4: 3R/ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාමාර්ග සඳහා කැප වූ පාර්ශ්වකරුවන්ගේ සහයෝගී ජාලය** | |
| **අරමුණ 1: 2024 වන විට ඒකපුද්ගල පාර්ශ්වකරුවන්ට සහ නගරයට බලපාන 3R/ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ කාරණා සාකච්ඡා කිරීම සඳහා නිතිපතා රැස්වන, ගාල්ල මහා නගර සභාව පිළිගත් පාර්ශ්වකරුවන්ගේ සංසදයක් පැවැත්වීම** | 1. CACG ව්‍යාපෘතිය යටතේ ස්ථාපිත වත්මන් පාර්ශ්වකරුවන්ගේ සංසදය ගාල්ල මහා නගර සභා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ආයතනික සැකැස්ම බවට පත්කිරීම සහ නීතියෙන් ගාල්ල මහා නගර සභාව හරහා එයට නීත්‍යානුකූල පිළිගැනීමක් ලබාදීම<br>2. SHFහි සංයුතිය, තීරණ ගැනීමේ ප්‍රොටෝකෝලය, රැස්වීම් වාර ගණන සහ කාර්යභාරය නිර්වචනය කිරීම (කාන්තාවන් සහ තරුණ සහභාගීත්වය දිරිමත් කළ යුතු ය)<br>3. ගාල්ල මහා නගර සභාවහි 3R/ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය අධීක්ෂණය කිරීම, ඇගයීම සහ නඩත්තු කිරීම සම්බන්ධයෙන් තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහභාගී වීමට SHFහි හඳුනාගත් සාමාජිකත්වයට පහසුකම් සැලසීම |
| **අරමුණ 2: 2025 වන විට ගාල්ල මහා නගර සභා ප්‍රදේශය තුළ SWM කළමනාකරණයට අදාළව ක්‍රියා කරන පුද්ගලයන්/ ආයතන ලියාපදිංචි කිරීම සහ කළමනාකරණය කිරීමේ ක්‍රියාවලියක් ස්ථාපිත කිරීම** | 1. MSW එකතු කිරීම, ප්‍රවාහනය, ප්‍රතිචක්‍රීකරණය සඳහා සූදානම් කිරීම සහ බාහිර අරමුදල් සහිතව රාජ්‍ය නොවන සංවිධානයේ ව්‍යාපාර/ ජීවන/ ස්වේච්ඡා ක්‍රියා මාර්ගයක්/ ක්‍රියාමාර්ගයක් ලෙස අවසන් බැහැර කිරීම සඳහා ගාල්ල මහා නගර සභාවේ ලියාපදිංචිය ලබාගැනීම සහ සරල ලියාපදිංචි කිරීමේ ක්‍රියාපටිපාටියක් හඳුන්වාදීම අනිවාර්ය කිරීම<br>2. එක් එක් පුද්ගලයා/ආයතනය විසින් මෙහෙයවනු ලබන MSW ප්‍රවර්ග/ ප්‍රමාණ සමඟ එය එකතු කර යාවත්කාලීන කිරීම සඳහා යාන්ත්‍රණයක් සහිත දත්ත සමුදායක් පිහිටුවීම<br>3. ගාල්ල මහා නගර සභාව තුළ ඵලදායී අපද්‍රව්‍ය හැසිරවීම සඳහා අවශ්‍ය පරිදි ආයතන/ පුද්ගලයන් අතර තොරතුරු හුවමාරු කර ගැනීමට සහ සම්බන්ධ කිරීමට පහසුකම් සැලසීම |

| | |
|---|---|
| **අරමුණ 3: 2024 වන විට විකල්ප නිෂ්පාදන සංවර්ධකයන් දිරිමත් කිරීම සහ ඵලදායී 3R/ සන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා නගර පාර්ශ්වකරුවන් සමග සම්බන්ධ කිරීමට පහසුකම් සැලසීම** | 1. අපද්‍රව්‍ය අඩු කිරීම (උදා: කාන්තා විකල්ප නිෂ්පාදන වැඩිදියුණු කරන්නන්/නිෂ්පාදකයන්) ප්ලාස්ටික්/පොලිතින්උපකරණ ප්‍රතිස්ථාපනය කිරීම සඳහා විකල්ප නිෂ්පාදන සංවර්ධකයන් සොයාගැනීම සහ අනාගත ගැනුම්කරුවන් (එනම් හෝටල්, කර්මාන්ත සහ කාර්යාල වැනි පරිශීලකයන්) සමග සම්බන්ධ කිරීම පහසු කිරීම.<br>2. විකල්ප නිෂ්පාදන සංවර්ධකයන් (විශේෂයෙන් කාන්තාවන් පදනම් කරගත් සංවිධාන හරහා) අපද්‍රව්‍ය ඉහළ නැංවීමේ විකල්පයක් ලෙස භාවිත කිරීම සහ විභව අමුද්‍රව්‍ය සැපයුම්කරුවන් (කසළ ජනනය කරන්නන්/එකතු කරන්නන්) සහ ගැනුම්කරුවන්/ වෙළඳ පොළ ස්ථාන සමග සම්බන්ධ කිරීමට පහසුකම් සැලසීම<br>3. සන අපද්‍රව්‍ය කළමනාකරණයේ ව්‍යවසායකයන් (විශේෂයෙන් කාන්තාවන් සහ තරුණයන්) ශක්තිමත් කිරීම සහ ගාල්ල මහා නගර සභාව සහ නව ව්‍යවසායකයන් අතර සම්බන්ධතාවයක් ගොඩ නගා ගැනීම |
| **අරමුණ 4: 2025 වනවිට ගාල්ල මහා නගර සභාවෙහි ඵලදායී 3R/සන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාමාර්ග සඳහා පහසුකම් සැලසීම සඳහා ජාත්‍යන්තර/ ජාතික/ප්‍රාදේශීය ආයතන සමග පවත්නා සහයෝගී සබඳතා ස්ථාපිත කිරීම/වැඩිදියුණු කිරීම** | 1. වෙනත් හවුල්කරුවන් සමග සහයෝගී සබඳතා ගොඩ නගාගැනීමට සහ 3R/සන අපද්‍රව්‍ය කළමනාකරණයේ මනා පරිචයන් සඳහා ගෝලීය හා ජාතික පිළිගැනීමක් ලබාගැනීම සඳහා මෙම විශේෂිත විෂයය සඳහා කටයුතු කිරීමට ගාල්ල මහා නගර සභා සන අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය තුළ වගකිව යුතු නිලධාරියෙකු නම් කිරීම<br>2. ප්‍රයෝජනවත් ආයතන හඳුනාගෙන ගාල්ල මහා නගර සභාවහි 3R/සන අපද්‍රව්‍ය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා සහයෝගී ක්‍රියාකාරකම්/යාන්ත්‍රණ ගොඩ නගාගැනීම (උදා: CityNet අත්දැකීම් හුවමාරුව, ජාතික සන අපද්‍රව්‍ය ආධාරක මධ්‍යස්ථානය-තාක්ෂණික සහ මූල්‍ය ආධාරක සැපයුම්කරු, සහ තාක්ෂණික යෙදවුම් සඳහා විශ්වවිද්‍යාල)<br>3. ගාල්ල මහා නගර සභාවහි 3R/ සන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා සුදුසු ව්‍යාපාරික ආකෘති හඳුනා ගැනීම (උදා: PPP)<br>4. කසළ එකතු කරන්නන් ලියාපදිංචි කර සන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියේ නිශ්චිත කොටස් ඔවුන් වෙත භාර දීමට අවස්ථාවක් සොයා ගැනීම.<br>5. ගාලුකොටුව ලෝක උරුමයක් ලෙස කීර්තිමත් කිරීම සඳහා විශේෂිත සන අපද්‍රව්‍ය කළමනාකරණ යාන්ත්‍රණයක් හඳුන්වා දීම සඳහා යුනෙස්කෝවේ මාර්ගෝපදේශ අනුගමනය කරන්න<br>6. 2025 වනවිට වත්මන් නව්‍ය 3R/ සන අපද්‍රව්‍ය කළමනාකරණ භාවිත සහ නියමු නව භාවිත පෝෂණය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා ශාස්ත්‍රීය අංශය සමග සම්බන්ධතා ඇති කර ගැනීම. |
| **ඉලක්කය 5: අනුවර්තතනය කළ හැකි, නිර්මාණාත්මක හා නව්‍ය සන අපද්‍රව්‍ය කළමනාකරණ විසඳුම් සහිත ආදර්ශ නගරයක්** | |
| **අරමුණ 1: ගාලු නගරය 3R/සන අපද්‍රව්‍ය කළමනාකරණයෙහි ආදර්ශ නගරයක් බවට පරිවර්තනය කිරීම පිළිබඳව විස්තීර්ණ හා පරිශීලක හිතකාමී දත්ත සමුදායක්/ද්‍රව්‍ය එකතුවක් 2025 වනවිට පවත්වා ගැනීම.** | 1. 2030 වන විට 3R/ සන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමත් සමග නගරයේ පරිවර්තනය වාර්තා කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම<br>2. 2025 වන විට ශ්‍රී ලංකාවේ පිරිසිදුම නගරය බවට පත් කිරීම සඳහා ගාල්ල මහා නගර සභාව විසින් අනුගමනය කරන ලද සමස්ත ක්‍රියාවලිය වාර්තාකර ප්‍රකාශයට පත් කිරීම.<br>3. සන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා භාවිත කරන නව දැනුම, මෙවලම්, ක්‍රියාපටිපාටි සහ තාක්ෂණය වාර්තා කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම<br>I. සහයෝගී ප්‍රවේශ, අරමුදල් විකල්ප, පාලනය සහ ක්‍රියාවලියේ 3R සහ ආරක්ෂිත බැහැර කිරීම් වැනි අංශවල භූමිකා ආකෘති වාර්තා කිරීම සහ ප්‍රකාශයට පත්කිරීම<br>4. ගාල්ල මහනගර සභාවේ ප්‍රසිද්ධ ස්ථාන/ සංචාරක ස්ථාන සහ විශේෂ ප්‍රදේශ පිළිබඳ වාර්තාගත අපද්‍රව්‍ය කළමනාකරණ දත්ත සහ තොරතුරු<br>5. දත්ත සහ තොරතුරු පටිගත කිරීම සඳහා අධීක්ෂණ හා ඇගයීම් පද්ධතියක් හඳුන්වා දීම |

| | |
|---|---|
| **අරමුණ 2:2024 වනවිට ගාල්ල මහා නගර සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකයේ කැප වූ කණ්ඩායමක් පිහිටුවීම, 3R/ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේ දී උගත් ප්‍රධාන ආකෘති/ පාඩම් ප්‍රතිනිර්මාණය කිරීම සඳහා දැනුම බෙදාගැනීම ප්‍රවර්ධනය කිරීම සහපහසුකම් සැපයීම තුළින් තිරසරභාවය සහතික කිරීම** | 1. ගාල්ල මහා නගර සභාවහි 3R/ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ නවෝත්පාදනවල ප්‍රධාන නිලධාරීන්, අදාළ පාර්ශ්වකරුවන්ගේ නියෝජිතයන්, සමාජ කණ්ඩායම්, ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සහ තාක්ෂණික, කළමනාකරණ සහ සමාජීය අංශවල ස්වේච්ඡා කණ්ඩායම් විශේෂ අවශ්‍යතාව හඳුනාගෙන ඔවුන් ප්‍රවර්ධන/ තානාපතිවරුන් ලෙස පුහුණු කිරීම.<br>2. 3R/ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ නවෝත්පාදන අවශෝෂණය කරගැනීම සඳහා සංචාරක, පරිසර කළමනාකරණය සහ යහපාලන අංශවල ප්‍රධාන පාර්ශ්වකරුවන් සමග සම්බන්ධතා ඇති කරගැනීම සහ ගාල්ල තුළින් උගත් 3R/ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ආශ්‍රිත ප්‍රධාන ආකෘති/ පාඩම් ප්‍රවර්ධනය කිරීම.<br>3. යෝජිත ඝන අපද්‍රව්‍ය  කළමනාකරණ ඒකකය සඳහා පුහුණු කාර්ය මණ්ඩලයක් පත් කිරීම සහ රජයේ කාර්ය මණ්ඩල ස්ථාන මාරු ක්‍රියාවලිය සඳහා පද්ධතියක් සංවර්ධනය කිරීම |
| **අරමුණ 3: 2030වනවිට 3R/ ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේ නව්‍ය භාවිත/ ලෝක උරුම අඩවි කළමනාකරණය සඳහා ජාතික හා ජාත්‍යන්තර  "තත්ත්ව ප්‍රමිතී" සහ "සම්මාන" ලබා ගැනීම** | 1. ගාල්ල මහා නගර සභාවෙහි ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය විසින් ඉලක්ක ගත ප්‍රදේශවල පවතින "තත්ත්ව ප්‍රමිති" සහ "සම්මාන" හඳුනා ගෙන, හඳුනාගත් තත්ත්ව ප්‍රමිති සහ සම්මාන ලබා ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම. |

# 10. මූල්‍ය විශ්ලේෂණය

මෙම පරිච්ඡේදයෙන් ඉදිරිපත් කර ඇති මූල්‍ය විශ්ලේෂණයට සමස්ත ඝන අපද්‍රව්‍ය එකතු කිරීම හැසිරවීම; සහ බැහැර කිරීමේ යාන්ත්‍රණය සඳහා සේවා පිරිවැය විශ්ලේෂණය, ඝන අපද්‍රව්‍ය පද්ධති පිරිවැය විශ්ලේෂණය සහ ගාල්ල මහා නගර සභාවෙහි ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පද්ධතිය හරහා උත්පාදනය කෙරෙන ආදායම් විශ්ලේෂණය ඇතුළත් වේ. ගාල්ල මහා නගර සභාවේ පවතින දත්ත කළමනාකරණ පද්ධතිය යටතේ ක්‍රියාකාරීත්වයේ ස්වභාවය සහ අදාළ දත්ත ලබා ගැනීමේ හැකියාව/ ප්‍රවේශ්‍යතාව මත ඉහත සඳහන් අංගයන් පිළිබඳ අර්ථ නිරූපණ පදනම් වී ඇත.

## අ. සේවා පිරිවැය විශ්ලේෂණය

USAID-CCBO විසින් සකස් කරන ලද මාර්ගෝපදේශවලට අනුව, පිරිවැය දත්ත විශ්ලේෂණය කිරීමේදී COSA මෙවලමක් (2022) භාවිත කරන ලද අතර ප්‍රතිඵලයන්හි සමස්ත සාරාංශ වගුව පහත දැක්වේ.

*15 වගුව : 2022 වර්ෂය සඳහා GMCහි 3R/SWM ප්‍රතිඵලයන්හි සමස්ත සාරාංශය*
*(මූලාශ්‍රය: COSA වාර්තාව, 2023)*

| අනු අංකය | ක්‍රියාවලි විස්තරය | මුළු වාර්ෂික පිරිවැය (රුපියල්) | මුළු වාර්ෂික පිරිවැයෙන් ප්‍රතිශතයක් ලෙස | ඒකක ප්‍රමාණය (මෙ.ටො) | එක් ඒකකයක් සඳහා පිරිවැය (රුපියල්) | ඇ.ඩො 1=315 |
|---|---|---|---|---|---|---|
| 3R ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සේවා සැපයුම් පිරිවැය | | | % | | | |
| 1 | එකතු කිරීම | 102,430,113.72 | 59 | 8,030 | 12,756 | 40.50 |
| 2 | මාරු කිරීම්/ප්‍රවාහනය | 17,906,427.00 | 10 | 8,030 | 2,230 | 7.08 |
| 3 | වෙන් කළ කසළ පිරියම් කිරීම (COWAM) | 6,526,712.19 | 4 | 1260 | 5,180 | 16.44 |
| 4 | ජෛවහායනීය අපද්‍රව්‍ය පිරියම් කිරීම | 2,194,456.33 | 1 | 5760 | 381 | 1.21 |
| | බිම්පිරවුම් බැහැර කිරීම (හීන්පැන්දල ) | | | | | |
| 5 | කසළ බැහැර කිරීම (හීන්පන්දල) | 4,694,250.00 | 3 | 684 | 6,863 | 21.79 |
| 6 | වීදි පිරිසිදු කිරීම | 658,809.68 | 0 | 180 | 3,660 | 11.62 |
| 7 | ජලමාර්ග හා නීති විරෝධි ලෙස බැහැර කරන ලද කසළ පිරිසිදු කිරීම | 30,658,700.24 | 18 | 360 | 85,163 | 270.36 |
| 3R ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේ පරිපාලන පිරිවැය | | | | | - | - |
| 8 | ප්‍රජාව වෙත ළඟා වීම | 952,800.00 | 4 | 8,030 | 119 | 0.38 |
| 9 | බලාත්මක කිරීම | දත්ත ලබා ගැනීමට නොහැකි | | | - | - |
| 10 | මූල්‍ය කළමනාකරණය | 6,665,992.00 | 4 | 8,030 | 830 | 2.64 |
| 11 | මානව සම්පත් | දත්ත ලබා ගැනීමට නොහැකි | | | - | - |

| | | | | | |
|---|---|---|---|---|---|
| 12 | සැලසුම් | දත්ත ලබා ගැනීමට නොහැකි | | - | - |
| 13 | ප්‍රතිපත්ති සම්පාදනය | දත්ත ලබා ගැනීමට නොහැකි | | - | - |
| මුළු පද්ධති පිරිවැය | | **172,688,261.16** | **8,030** | **21,359** | **67.81** |

වගුවේ ඉදිරිපත් කර ඇති පරිදි, 3R/ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සේවා සැපයුම් පිරිවැය සහ 3R/ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පරිපාලන පිරිවැය ලෙස ගාල්ල මහා නගර සභාවෙහි 3R/ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ප්‍රධාන අංශ දෙකක් යටතේ ප්‍රතිඵල දක්වා ඇත. කෙසේ වෙතත්, ගණනය කිරීම් සඳහා අවශ්‍ය දත්ත සොයා ගැනීමේ දුෂ්කරතා හේතුවෙන් සමහර පිරිවැය රේඛා ව්‍යුත්පන්න කිරීමට නොහැකි විය. උදාහරණයක් වශයෙන්, ගාල්ල මහා නගර සභාවෙහි 3R/ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ක්‍රියාවලිය තුළ බලාත්මක කිරීම, මානව සම්පත් සහ සැලසුම් කිරීම සිදු කරන ලදී. එනමුත් සම්පත් වෙන් කිරීම සහ ඒ අනුව අදාළ පිරිවැය වත්මන් ගාල්ල මහා නගර සභාවේ පිරිවැය මධ්‍යස්ථානවලින් හඳුනා ගැනීමට නොහැකි විය.

පිරිවැය මාර්ග මත පදනම් වූ ප්‍රතිඵල ඇමුණුම 2 යටතේ සහ COSA වාර්තාවේ විස්තරාත්මකව ඉදිරිපත් කර ඇත.

## ආ. ආදායම් විශ්ලේෂණය

2022 දී 3R/ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සේවා සැපයීම මගින් හරහා ගාල්ල මහා නගර සභාව ලබා ගත් ආදායම ප්‍රධාන වශයෙන් කසළ එකතු කිරීමේ ගාස්තුව, වෙළඳ බලපත්‍ර ගාස්තුව, පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තුව සහ කසළ ප්‍රතිචක්‍රීකරණයෙන් ලැබූ ආදායම යි.

විශ්ලේෂණයට අනුව, සමස්ත ආදායම රු.10,644,942.00ක් වූ අතර, එය 81%ක් කසළ එකතු කිරීමේ ගාස්තුවෙන් ද, කසළ ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ආදායමෙන් ද, 16%ක්, 3%ක් වෙළෙඳ හා පරිසර බලපත්‍ර ගාස්තුවේ කසළ කළමනාකරණ කොටසින් ද සමන්විත වේ.

### කසළ එකතු කිරීමේ ගාස්තුව

තොග වශයෙන් කසළ ජනනය කරන්නන්ගෙන් (විශාල ප්‍රමාණයෙන් කසළ ජනනය කරන්නන්ගෙන්) එකතු කිරීමේ ගාස්තුවක් අය කර ඇත. ගාස්තු ප්‍රමාණය කසළ පැටවූ ප්‍රමාණයට සමානුපාතික වන අතර එය දෘශ්‍ය නිරීක්ෂණ මත පදනම්ව අදාළ අධීක්ෂක විසින් විනිශ්චය කරනු ලැබේ. කලාප අනුව වාර්ෂික එකතු කිරීමේ ගාස්තුව පහත වගුවෙහි දැක්වේ.

*වගුව 16 : තොග වශයෙන් කසළ ජනනය කරන්නන්ගෙන් කලාපීය වශයෙන් එකතු කර ගන්නා ලද කසළ එකතු කිරීමේ ගාස්තු (මූලාශ්‍රය: COSA වාර්තාව, 2023)*

| අනු අංකය | කලාපය | වාර්ෂික ආදායම/ රුපියල් | ප්‍රතිශතය |
|---|---|---|---|
| 1 | චීනකොරටුව | 2,436,250.00 | 28 |
| 2 | ගාලු කොටුව | 776,250.00 | 9 |
| 3 | කනම්පිටිය | 195,000.00 | 2 |
| 4 | හිරිඹුර 1 | 936,225.00 | 11 |
| 5 | හිරිඹුර 2 | 480,129.00 | 6 |
| 6 | මාගල්ල | 300,000.00 | 3 |
| 7 | කටුගොඩ | 300,001.00 | 3 |
| 8 | තලපිටිය | 248,750.00 | 3 |
| 9 | රිච්මන්ඩ් හිල් | 178,750.00 | 2 |
| 10 | එලයිට් මාවත | 107,500.00 | 1 |
| 11 | පෙට්ටිගලවත්ත | 919,109.00 | 11 |
| 12 | කඩවීදිය | 484,486.00 | 6 |
| 13 | ගිංතොට | 230,000.00 | 3 |
| 14 | කළුවැල්ල | 1,030,000.00 | 12 |
| | **එකතුව** | **8,622,450.00** | **100** |

### වෙළඳ බලපත්‍ර ගාස්තුව

වෙළඳ බලපත්‍ර ගාස්තුව ගාල්ල මහා නගර සභා ප්‍රදේශය තුළ ව්‍යාපාරික ආයතනවලින් අය කෙරෙන වාර්ෂික ගාස්තුවකි. වෙළඳ බලපත්‍ර ගාස්තුවෙන් 20%ක කොටසක් 3R/ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අංශයෙන් ලැබෙන ආදායම ලෙස සලකනු ලැබේ. මන්දයත් මෙය වෙළඳ බලපත්‍ර හිමි ආයතනයට මාර්ගෝපදේශ සැපයීම සහ එහි 3R/ඝන අපද්‍රව්‍ය කළමනාකරණය භාවිතාවන් නිරීක්ෂණය කිරීමට සම්බන්ධ වන බැවිනි. ඒ අනුව, 2022 දී වෙළඳ බලපත්‍ර ගාස්තුවෙන් 3R/ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධ ගාස්තුව රුපියල් 215,192.00කි.

### පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තුව

ජාතික පාරිසරික පනතෙහි විධිවිධාන යටතේ මධ්‍යම පරිසර අධිකාරිය විසින් නියම කර ඇති, පාරිසරික දූෂණය අඩු කර්මාන්ත සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රය (EPL) නිකුත් කිරීමට ගාල්ල මහා නගර සභාව වෙත මධ්‍යම පරිසර අධිකාරිය (CEA) විසින් බලය පවරා ඇත. ගාල්ල මහා නගර සභාව විසින්, ග්‍රන්ථපාදක අධ්‍යයනය (desk study) සහ ස්ථානීය පරීක්ෂාව පදනම් කරගත් කාර්මික දූෂණ තක්සේරු සහ අධීක්ෂණ ක්‍රියාවලියට අදාළ පරිපාලන වියදම් ආවරණය කර ගැනීම සඳහා මෙම ගාස්තුව අය කෙරේ. එබැවින් බලපත්‍ර ගාස්තුවෙන් 80%ක් 3R/ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ආදායම ලෙස ගන්නා අතර එය 2022 දී රුපියල් 100,800.00ක් වේ.

### කසළ ප්‍රතිචක්‍රීකරණය කිරීමෙන් ලැබෙන ආදායම

දඩැල්ල ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයෙන් පමණක් උත්පාදිත කරන ලද කසළ ප්‍රතිචක්‍රීකරණ ආදායම, 2022 දී මුළු මුදල් ප්‍රමාණය රුපියල් 1,706,500.00ක් විය. මෙය ගොඩනැගිලි ද්‍රව්‍ය ප්‍රතිසාධන ඒකකයෙන් 92.3%කින් ද (එනම් ප්‍රතිසාධනය කළ ද්‍රව්‍යවලින් නිපද වූ ඉදිකිරීම් අමුද්‍රව්‍ය මත පිරිවැය ඉතුරුම්) වීදුරු අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණයෙන් 7.3%කින් ද 0.4%ක ඉතිරි ප්‍රතිශතය PET එකතු කිරීමේ ඒකකයෙන් ද සමන්විත වේ.

## ඇ. සේවා පිරිවැය විශ්ලේෂණයෙහි ප්‍රමුඛ අනාවරණ

දැනට පවතින 3R/ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සේවා සැපයීම් භාවිතාවන්හි සන්දර්භය තුළ මෙන්ම ගාල්ල මහා නගර සභාවෙහි පරිපාලන හා මූල්‍ය කළමනාකරණ නියමාවලි (protocols) සන්දර්භය තුළ COSA ප්‍රතිඵලයන්හි අර්ථ නිරූපණ මෙම නිගමන මගින් පිළිබිඹු වේ.

### කසළ එකතු කිරීමේ පිරිවැය

කසළ එකතු කිරීමේ වාර්ෂික සාමාන්‍ය පිරිවැය මෙ.ටොන් එකකට රු. 12,645 ක් (මුළු පිරිවැයෙන් 59% වන අතර තෙත්, වියළි සහ මිශ්‍ර කසළ සඳහා පිරිවැය පිළිවෙළින් මෙ.ටොන් එකකට රු. 9,332 මෙ.ටොන් එකකට රු. 24,469, මෙ.ටොන් එකකට රු. 7,397 වේ. සමස්ත වාර්ෂික පිරිවැයෙන් තෙත් සහ වියළි කසළ එකතු කිරීමේ ප්‍රතිශතය පිළිවෙළින් 53% සහ 41%කි.

පිරිවැය ප්‍රභේදනය මගින් පෙන්නුම් කරන්නේ සේවක වියදම් සහ යන්ත්‍ර-වාහන පදනම් පිරිවැය පිළිවෙලින් 63% සහ 35% වන අතර, සමස්ත පිරිවැය 98% වන බවයි .

- ✧ වාර්ෂික සාමාන්‍ය කසළ එකතු කිරීමේ පිරිවැය මහා නගර සභා සඳහා වන සම්මත පිරිවැයට සමාන වීම COSA මෙවලම් යෙදුමේ නිරවද්‍යතාව තහවුරු කරයි.
- ✧ කෙසේ වෙතත්, සේවකයන්ගේ කාර්යක්ෂමතාව සහ යන්ත්‍ර-වාහන යෙදවීම වැඩිදියුණු කිරීම මගින් සාමාන්‍ය කසළ එකතු කිරීමේ පිරිවැය තවදුරටත් අඩු කෙරෙනු ඇති බව පැහැදිලි ය.
  - ✓ සේවකයන් සඳහා කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීම් මගින් පරිශ්‍ර ශ්‍රම බලකාය මෙන්ම අධීක්ෂකවරුන්, රියදුරන් සහ තාක්ෂණික කාර්ය මණ්ඩලය ද ආවරණය කළ යුතු ය.
  - ✓ යන්ත්‍ර-වාහන පිරිවැය පිළිබඳ අවබෝධය (වගුව 17) මගින් පෙන්නුම් කරනුයේ කසළ එකතු කිරීම සඳහා කිලෝමීටරයකට රු.1,863.58ක ඉහළ සමුච්චිත අගයක් (COSA මෙවලමෙන් ව්‍යුත්පන්න වූ) ගන්නා බවය. මෙයින්, වාහන නඩත්තුව සහ ඉන්ධන පිරිවැය සැලකිය යුතු ලෙස ඉහළ ය (4 සහ 5 ප්‍රස්ථාර බලන්න). පහත සඳහන් කරුණු මූල හේතු ලෙස හඳුනාගෙන ඇත;
    - ➢ කසළ එකතු කිරීමේ වාහන-යන්ත්‍රවලින් 34%ක් සම්මත ආයු කාලය පුරා භාවිත කරන ලද ඒවා වේ.
    - ➢ වාහන-යන්ත්‍ර මෙහෙයුම් පිළිබඳ දත්ත වාර්තා කිරීමට හා විශ්ලේෂණය කිරීමට මෙන්ම තීරණ ගැනීම සඳහා ඒවා භාවිත කිරීමට යාන්ත්‍රණයක් නොමැති වීම මෙම අධික පිරිවැය සඳහා ප්‍රධාන හේතු ලෙස හඳුනා ගැනේ.
- ✧ වියළි කසළ එකතු කිරීම සම්බන්ධයෙන් ගත් කළ සමස්ත එකතු කිරීමේ පිරිවැයෙන් ඉහළ කොටසක් සහ ඉහළ ඒකක පිරිවැය වැය වීම, ප්‍රමුඛ අවධානයක් සහිතව වියළි කසළ එකතු කිරීමේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාව පෙන්නුම් කරයි.
- ✧ ගමන්මාර්ග ප්‍රශස්තකරණය මගින් (2023 අගෝස්තු මාසයේ දී නිම කරන ලද) ගාල්ල මහා නගර සභාව කසළ එකතු කිරීමේ කාර්යක්ෂමතාව 2022 දෙසැම්බර් මාසයේදී 32% (දිනකට මෙ.ටොන් 21.5ක එකතු කිරීමක්) සිට 2023 ඔක්තෝම්බර් මාසයේ දී 41% දක්වා (දිනකට මෙ.ටොන් 28ක එකතු කිරීමක්) වැඩි වී ඇති අතර දිනකට කිලෝමීටර් 294 සිට කිලෝමීටර් 240 දක්වා ගමන් දුරක් අඩු කර ගනිමින් දිනකට රු. 100,633.00 ඉතිරි කර ගැනීමට මං පාදමින් සම්පත් උපයෝජ්‍යතාව ඉහළ නංවා ඇත.

### ප්‍රවාහනය / මාරු කිරීම

2022 වසරේ ප්‍රවාහන මෙහෙයුම හීන්පැන්දල සිට ‘Monrovia Estate’ වෙත (3 වන වගුවෙහි සඳහන් යන්ත්‍ර-වාහන භාවිත කරමින්) එකතු කරන ලද කසළ මාරු කිරීමට සීමා විය. 2023 අප්‍රේල් මාසයේ දී හීන්පැන්දල කවාෂිමා කොම්පෝස්ට් පහසුකම ආරම්භ කිරීමෙන් පසු මෙම මෙහෙයුම අවසන් කරන ලද අතර එම නිසා මෙම පිරිවැය (මුළු පිරිවැයෙන් 10%ක් වන) වත්මන් 3R/ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පද්ධතියේ නොපවතී.

කෙසේ වෙතත්, ප්‍රවාහන පිරිවැය ව්‍යුහය පිළිබඳ අවබෝධය 3R/ඝන අපද්‍රව්‍ය කළමනාකරණය තීරණ ගැනීම සහ අනාගත සැලසුම් සඳහා ප්‍රයෝජනවත් වන බව උපකල්පනය කර පහත පරිදි නිගමනය කෙරේ.

- ✧ වාර්ෂික සාමාන්‍ය කසළ ප්‍රවාහන පිරිවැය මෙ.ටොන් එකක් සඳහා රු. 2,890.00ක් වන අතර තෙත් සහ වියළි කසළ සඳහා පිළිවෙළින් මෙ.ටොන් එකක් සඳහා රු. 2,289 සහ මෙ.ටොන් එකක් සඳහා රු. 7,461 වේ. මෙයින් පෙන්නුම් කරන්නේ වියළි කසළ ප්‍රවාහනය සැලකිය යුතු ලෙස මිල අධික බවයි.

- ✧ කිලෝමීටරයකට සමස්ත වාර්ෂික සාමාන්‍ය ප්‍රවාහන පිරිවැය (එනම් මුළු ප්‍රවාහන පිරිවැය/ වාර්ෂික ගමන් කළ දුර) කි.මී එකකට රු. 210ක් වේ.

- ✧ ප්‍රවාහන පිරිවැයෙන් 64%ක් මෙම මෙහෙයුම සඳහා යොදවා ඇති කම්කරුවන්ට අදාළ වැටුප් හා වියදම්වලින් සමන්විත වන අතර ඉතිරි 36% වාහන ඇණියේ මෙහෙයුම් සහ ක්ෂයවීම් පිරිවැය වේ.

### වෙන් කළ කසළ පිරියම් කිරීම

2022 දී, කසළ පිරියම් කිරීම ගාල්ල මහා නගර සභා දඩැල්ල පහසුකමෙහි ගොඩනැගිලි ද්‍රව්‍ය ප්‍රතිසාධනය, වීදුරු කසළ සහ PET බෝතල් එකතු කිරීම සඳහා සීමා විය. ගොඩනැගිලි ද්‍රව්‍ය ප්‍රතිසාධනය සඳහා සම්පත් (මිනිස්බල, ඉඩම් සහ යන්ත්‍ර) වෙන් කිරීම්, භාවිතයේ ප්‍රතිශතය, මෙහෙයුම් පිරිවැය සහ ආදායම සම්බන්ධයෙන්, වීදුරු අපද්‍රව්‍ය සහ PET බෝතල් එකතු කිරීමේ පහසුකම පිළිබඳව 21 වගුවේ දක්වා ඇති අනාවරණ මගින් පහත නිගමනවලට එළඹිය හැකි ය.

- ✧ සියලුම පහසුකම් ඒවායේ මෙහෙයුම් ධාරිතාවට වඩා බෙහෙවින් අඩු මට්ටමකින් භාවිත කර ඇත.
- ✧ ගොඩනැගිලි ද්‍රව්‍ය ප්‍රතිසාධන පහසුකම ගාල්ල මහා නගර සභාව ඉදිකිරීම සඳහා ප්‍රතිසාධන කරන ලද අමුද්‍රව්‍ය හරහා ලාභ ඉපයීමක් (එනම් වියදමට වඩා අරමුදල් ඉතිරි කර ඇත) වාර්තා කර ඇති අතර වීදුරු අපද්‍රව්‍ය සහ PET බෝතල් ප්‍රතිචක්‍රීකරණ පහසුකම් ද්විත්වයම අලාභ වාර්තා කර ඇත.
- ✧ මිලකරණ යාන්ත්‍රණයේ, ආයතනික සැකසුමෙහි සහ නගර ප්‍රජාව අතර මෙය ප්‍රවර්ධනය කිරීමේ උපායමාර්ගයන්හි හිඩැස්, මෙය ඉතා අඩු ධාරිතාවකින් ක්‍රියාත්මක වීමට ප්‍රධාන හේතු වන බව අනාවරණය විය.
- ✧ මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ පිරිවැය ඵලදායිතාව කලින් කලට තක්සේරු කිරීම සඳහා පරිපාලන ක්‍රියා පටිපාටි සහිත නිශ්චිත දත්ත සහ මූල්‍ය තොරතුරු කළමනාකරණ පද්ධතියක් නොමැත.

- ✧ පහසුකමේ මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ පිරිවැය ඵලදායීතාව පවතින Cos මධ්‍යස්ථාන හරහා පහසුවෙන් ලබා ගත නොහැක.
- ✧ කසළ පිරියම් කිරීමේ පිරිවැය, කම්කරුවන්ට අදාළ වැටුප් සහ ගෙවීම්-82%, යන්ත්‍ර ක්ෂයවීම - 15%, බලශක්ති විදුලිය - 2% සහ අනෙකුත් සැපයුම් 1%කින් සමන්විත වේ. ඒ අනුව, මානව සම්පත්, යන්ත්‍ර සහ බලශක්ති පරිභෝජනය ඵලදායි ලෙස කළමනාකරණය කිරීම මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි කිරීමට උපකාරී වනු ඇත.

## අවසන් බැහැර කිරීම

2022 දී අවසන් බැහැර කිරීමේ පරිශ්‍ර දෙකක් පැවැතිණි. හීන්පැන්දල බැහැර කිරීමේ පරිශ්‍රය වියළි කසළවලින් අඩකට සහ වෙන් නොකළ මුළු කසළ එකතුවට සීමා විය. මොන්රෝවියා වත්ත පරිශ්‍රය මගින් මුළු තෙත් කසළ ප්‍රමාණය සහ ගාල්ල මහා නගර සභා වියළි කසළ එකතුවෙන් අඩක් මෙහෙයුම් කරන ලදී.

හීන්පැන්දල පරිශ්‍රයේ වියළි සහ වෙන් නොකළ කසළ සඳහා අවසන් බැහැර කිරීමේ පිරිවැය මෙ.ටොන් එකකට රු. 912කි. මෙය කම්කරුවන් සඳහා වන පිරිවැය සහ යන්ත්‍ර-වාහන ක්‍රියාකාරිත්ව පිරිවැය අතර පිළිවෙළින් 54%ක් සහ 46%ක් ලෙස බෙදී යයි.

මොන්රෝවියා වත්ත බැහැර කිරීමේ පහසුකමෙහි තෙත් කසළ අවසන් බැහැර කිරීමේ පිරිවැය මෙ.ටෙන් එකකට රු. 2,889ක් වන අතර වියළි කසළ බැහැර කිරීමේ පිරිවැය මෙ.ටොන් එකකට රු. 9416ක් වේ. කසළ මාරු කිරීමේ පිරිවැය (හීන්පැන්දල සිට මොන්රෝවියා වත්ත දක්වා) 79% කින් සහ මොන්රෝවියා වත්ත පරිශ්‍රයේ කසළ හැසිරවීමේ ගාස්තුව 21% කින් මෙම පිරිවැය සමන්විත වේ. වසරකට රු. 22,600,678.00ක මුදලක් ඉතිරි කරමින් මෙම මෙහෙයුම 2023 අප්‍රේල් මාසයේ දී අවසන් කරන ලදි.

වර්තමානයේදී, සම්පූර්ණ තෙත් කසළ එකතුව කවාෂිමා බලාගාරය හරහා කොම්පෝස්ට් කිරීම සඳහා යොදා ගන්නා අතර වියළි කසළ වෙන් කිරීමට ලක් කර හීන්පැන්දල දී අවසන් බැහැර කිරීම අවශේෂ හා වෙන් නොකළ කසළවලට සීමා වේ.

## වීදි පිරිසිදු කිරීම සහ ජල මාර්ග/ නීති විරෝධී ලෙස බැහැර කර ඇති කසළ පිරිසිදු කිරීම

වීදි පිරිසිදු කිරීමේ ඒකක පිරිවැය මෙ.ටොන් එකකට රු. 3,660ක් වන අතර එය කම්කරුවන් නියුක්ත කිරීම සඳහා වන වියදම්වලින් සමන්විත වේ.

ජල මාර්ග සහ නීති විරෝධී ලෙස බැහැර කර ඇති කසළ පිරිසිදු කිරීමේ ඒකක පිරිවැය මෙ.ටොන් එකකට රු. 85,163ක් ලෙස ඉතා ඉහළ අගයක් ගනී, එය මුළු පිරිවැයෙන් 18%ක් (2 වැනි ඉහළම පිරිවැය) වේ. මෙය කම්කරුවන් සඳහා 86% කින් ද, අනෙකුත් සැපයුම් සඳහා 14%කින් ද සමන්විත වේ.

නීතිවිරෝධී ලෙස කසළ බැහැර කරනු ලබන ස්ථාන 13ක් පමණ තිබීම, පරිසර පොලිසිය විසින් නීතිවිරෝධී ලෙස කසළ බැහැර කිරීමේ සිද්ධීන් 25ක් වාර්තා කර තිබීම සහ ජල මාර්ගවල නිරීක්ෂණය වන අධික කසළ ප්‍රමාණයෙන් පෙන්නුම් කරනුයේ නීතිවිරෝධී ලෙස කසළ බැහැර කිරීම සාපේක්ෂව අඩු වියදමකින් පාලනය කිරීම සඳහා ගාල්ල මහා නගර සභාව විසින් නගර ප්‍රජාව සහ පාර්ශ්වකරුවන් සමඟ සහභාගීත්ව ප්‍රවේශයක් අනුගමනය කළ හැකි බවයි.

### පරිපාලන පිරිවැය

3R/ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධති මෙහෙයුම්වලට අදාළ පරිපාලන වියදම් දැනට පවතින ගාල්ල මහා නගර සභා පිරිවැය මධ්‍යස්ථානවල පහසුවෙන් සහ නිවැරදිව හඳුනාගත හැකි ආකාරයෙන් සටහන් කර නොමැත. කෙසේ වෙතත්, වත්මන් 3R/ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ දී සැලකිය යුතු පරිපාලන වියදම් ඇති බව CCBO සහ HELPO විසින් සිදු කරන ලද බහුවිධ ක්‍රියාකාරකම් මගින් තහවුරු කෙරේ.

පද්ධතියට අඛණ්ඩ වර්ධනයක් සහ තිරසරබවක් සහතික කරමින් දත්ත පාදක තීරණ ගැනීමේ සංස්කෘතියක් ගොඩනගනු පිණිස 3R/ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියට අදාළ ප්‍රධාන සේවා සැපයීම් සහ පරිපාලන වියදම් ප්‍රවාහයන් පැහැදිලිව දැක්වීමට වත්මන් මූල්‍ය කළමනාකරණ පද්ධතිය වැඩිදියුණු කිරීමේ වැදගත්කම ගාල්ල මහා නගර සභාව ජ්‍යෙෂ්ඨ මට්ටමේ කාර්ය මණ්ඩලය විසින් අනුමත කරන ලදි.

### ආදායම

රු.10,644,942.00ක් වන සමස්ත ආදායමෙන් 97%ක් ඍජු 3R/ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පදනම් වූ මූලාශ්‍රවලින් ලැබෙන කසළ එකතු කිරීමේ ගාස්තුව සහ කසළ ප්‍රතිචක්‍රීකරණයෙන් ලැබෙන ආදායම වන අතර ඉතිරිය වෙළඳ හා පරිසර බලපත්‍ර ගාස්තු ලෙස ලැබෙන ආදායම බව ප්‍රතිඵල මගින් පෙන්වා දෙනු ලබයි. මේ අනුව, වාර්ෂික සාමාන්‍ය ආදායම මෙ.ටොන් එකකට රු.1325.64ක් වේ.

වර්තමාන ආදායම් මූලාශ්‍රයන්හි පහත සඳහන් හිඩැස් මඟහරවා ගැනීමෙන් ආදායම වැඩි කර ගැනීමට විශාල විභවයක් පවතින බව සේවා පිරිවැය විශ්ලේෂණ ක්‍රියාවලිය මගින් පැහැදිලිව පෙන්නුම් කෙරේ.

- ✧ තොග වශයෙන් කසළ ජනනය කරන්නන් තෝරා ගැනීම සඳහා පැහැදිලි නිර්ණායක මත පදනම් වූ තීරණ ගැනීමේ පද්ධතියක් නොමැත.

- ✧ තොග වශයෙන් /විශේෂ කසළ ජනනය කරන්නන්ගෙන් වත්මන් අයකිරීමේ ක්‍රමය පදනම් වන්නේ මිනුම් ප්‍රමාණයක් මත නොව හස්තීය, නිරීක්ෂණ පාදක විනිශ්චය මත ය. මෙම ක්‍රියා පටිපාටියෙහි ද ප්‍රමාණවත් විනිවිදභාවයක් නොමැත.

- ✧ 5.1.3 වගන්තිය වත්මන් "කසළ ප්‍රතිචක්‍රීකරණ පද්ධතියේ" හිඩැස් ඉදිරිපත් කරයි.

- ✧ වෙළඳ බලපත්‍ර ක්‍රියාවලිය කාර්යක්ෂමව ක්‍රියාත්මක කරනු ලැබීම

- ✧ බලපත්‍ර ලබා ගැනීම සපුරා නොමැති අදාළ සියලුම කර්මාන්ත දත්ත සමුදාය මගින් හඳුනා ගනිමින් එම කර්මාන්ත විසින් බලපත්‍ර ලබා ගන්නා පරිදි පරිසර ආරක්ෂණ බලපත්‍ර ක්‍රමය කාර්යක්ෂමව බලාත්මක කිරීම සහ බලපත්‍ර අලුත් කිරීම ඇතුළු නිසි පසු විපරම් ක්‍රියාමාර්ග සහතික කිරීම සඳහා දත්ත සමුදාය නිසි ලෙස අධීක්ෂණය කිරීම සහ පවත්වාගෙන යෑම.

### පිරිවැය සහ ආදායම් සංසන්දනය

2022 දී 3R/ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා මුළු පිරිවැය රු. 172,688,261.16ක් වූ අතර මුළු ආදායම රු. 10,644,942.00ක් විය. මේ අනුව, වාර්ෂික ආදායම වාර්ෂික වියදමෙන් 6% ක් වන අතර, එබැවින් ගාල්ල මහා නගර සභාවට ස්වකීය අනෙකුත් ආදායම් සහ අයවැය අරමුණු සඳහා මධ්‍යම/පළාත් රජය වැනි බාහිර අරමුදල් මූලාශ්‍ර මත යැපීමට සිදුවේ.

# 11. අරමුදල් විකල්ප

CCBO විසින් HELP-O සහ ගාල්ල මහා නගර සභාව සමග සහයෝගිත්වයෙන් 2023 නොවැම්බර් මාසයේ දී නගරයේ ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වයෙන් අරමුදල් විකල්ප වැඩමුළුවක් පවත්වන ලදි. වැඩමුළුවේ ප්‍රධාන අරමුණ වූයේ පාරිසරික සහ ආර්ථික වශයෙන් මනාව කළමනාකරණය වූ සහයෝගී ක්‍රමයක් සබල කරන්නා වූ GMC ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය සඳහා තීරණාත්මක සහ ක්‍රියාත්මක කළ හැකි අරමුදල් විකල්පයන් හඳුනා ගැනීමයි. එසේම, එදිනෙදා සේවා අඛණ්ඩව සැපයීම සඳහා ගාල්ල මහා නගර සභාවෙහි 3R/ඝන අපද්‍රව්‍ය කළමනාකරණය යටිතල පහසුකම් (මෙහෙයුම් වියදම්) දිගටම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විභව ආදායම් ප්‍රභවයන් ලෙස අරමුදල් විකල්පයන් සැලකේ (CCBO, 2022). ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අරමුදල් සඳහා විකල්ප සොයා ගැනීම දිගු කාලීනව සෞඛ්‍ය සම්බන්ධ වියදම් සඳහා දරන පිරිවැය කපා හැරීමට උපකාරී වේ. අරමුදල් විකල්ප වැඩමුළුව සඳහා මූලික පදනම වූයේ COSA හි අනාවරණයන්ය.

ව්‍යාපෘතියේ කාලසීමාව තුළ පවත්වන ලද අරමුදල් විකල්ප වැඩමුළුව සහ විවිධ උපදේශන සැසි හරහා පහත අංශ ආවරණය වන පරිදි අරමුදල් විකල්ප සංවර්ධනය කරන ලදි.

අ. ස්වයං-උත්පාදිත අරමුදල් විකල්ප

- ✧ පවතින පද්ධති වැඩිදියුණු කිරීම මගින් අරමුදල් නිදහස් කර ගැනීම
- ✧ අපද්‍රව්‍ය පද්ධති ගාස්තු සහ බදු
- ✧ කසළවලින් නිපදවන නිෂ්පාදන විකිණීම

ආ. තෙවන පාර්ශ්වීය අරමුදල් විකල්ප

- ✧ රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව (PPPs)
- ✧ අවිධිමත් කසළ එකතු කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය සැකසීමේ ව්‍යාපාර
- ✧ රාජ්‍ය නොවන සංවිධාන
- ✧ ජාත්‍යන්තර ප්‍රදානක ආයතන

## අ. ස්වයං-උත්පාදිත අරමුදල් විකල්ප

### *පවතින පද්ධති වැඩිදියුණු කිරීම මගින් අරමුදල් නිදහස් කර ගැනීම*

මෙයින් අදහස් වනුයේ පිරිවැය වළක්වා ගැනීමේ ක්‍රියාමාර්ග සහ පවතින 3R/ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පද්ධතියේ කාර්යක්ෂමතාව ළඟා කර ගැනීම මගින් අරමුදල් ලබා ගැනීමේ විකල්පයන්ය. අධික 3R/ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වියදම් හඳුනා ගැනීම සඳහා COSA අනාවරණයන් යොදා ගැනීමෙන් සහ සේවා සැපයීම සඳහා නව්‍ය ප්‍රවේශයන් අනුගමනය කිරීමෙන්, ගාල්ල මහා නගර සභාව හට පහත විකල්ප හරහා මෙම අංශයේ කාර්ය සාධනය ළඟා කර ගත හැකි ය.

අ. පිරිවැය වළක්වා ගැනීම
ආ. සේවා කාර්යක්ෂමතා පිරිවැය ඉතිරි කිරීම
ඇ. පුරවැසියන්ගෙන් /කසළ ජනනය කරන්නන්ගෙන් වඩා හොඳ ගෙවීම් එකතු කිරීමක්

**පිරිවැය වළක්වා ගැනීම:**

I. අඩු කිරීම, නැවත භාවිතය කිරීමට සහ ප්‍රතිචක්‍රීකරණය සඳහා නිවැසියන් සහ ව්‍යාපාර දිරිගන්වනු පිණිස මහජන දැනුවත් කිරීම් සහ අධ්‍යාපන ව්‍යාපාරයන්හි ආයෝජනය කිරීම. මනා අවබෝධයෙන් යුත් ප්‍රජාවක් මෙම ක්‍රියාකාරකම් සඳහා සහභාගී වීමට වැඩි ඉඩක් ඇති අතර, බැහැර කළ යුතු කසළ ප්‍රමාණය මෙම ක්‍රියාමාර්ග මගින් අඩු කෙරෙනු ඇත.

II. ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය සහ කාබනික අපද්‍රව්‍ය ගෘහස්ථ හා ව්‍යාපාරික මට්ටමින් ප්‍රභවස්ථානයේ දී වෙන් කිරීමට දිරිමත් කිරීම. දූෂ්‍ය වීම මෙමගින් අඩු කරන අතර ප්‍රතිචක්‍රීකරණය සහ කොම්පෝස්ට් කිරීම පහසු කරයි, ඒ අනුව පිරියම් කිරීමේ පිරිවැය අඩු කරයි.

III. කවාෂිමා කම්හල ක්‍රියාත්මක කිරීමේ පිරිවැය නිරීක්ෂණය කර, මෙමගින් බිම් පිරවුම් පිරිවැයෙන් කොපමණ මුදලක් ඉතිරි වේදැයි සහ කොම්පෝස්ට් විකිණීමෙන් කොපමණ ආදායමක් උපයා ඇත්දැයි තක්සේරු කිරීම

IV. රජයේ සහ පෞද්ගලික අංශයේ මෙහෙයුම්වලදී කසළ ජනනය අවම කිරීම සඳහා කාර්යාල පද්ධති ස්වයංක්‍රීයකරණය (උදා: හරිත ප්‍රසම්පාදන) භාවිතාවන් ක්‍රියාවට නැංවීම. එමගින් බැහැර කිරීමට අවශ්‍ය කසළ ප්‍රමාණය අඩු කිරීම.

V. කසළ එකතු කිරීමේ යන්ත්‍ර ඇණියේ ඇති යල් පැන ගිය වාහන වෙනුවට නව වාහන ප්‍රතිස්ථාපනය කර එමගින්, යල් පැන ගිය වාහන නඩත්තු කිරීම සහ ඉන්ධන (අඩු කාර්යක්ෂම මට්ටමින්) සඳහා වැය වන අධික මෙහෙයුම් පිරිවැය මගහරවා ගැනීම

VI. ඉන්ධන (උදා: වාහන, බර යන්ත්‍රසූත්‍ර සඳහා හරිත ඉන්ධන) සහ විදුලි බලය සඳහා (උදා: හීන්පැන්දල සහ දඩැල්ල කසළ සැකසුම් පහසුකම් සඳහා සූර්ය පැනල පද්ධතිය) ඉහළ මෙහෙයුම් පිරිවැය අඩු කිරීමට බලශක්ති කාර්යක්ෂම වාහන, යන්ත්‍ර සහ තාක්ෂණයන් හඳුන්වා දීම.

VII. "ඉවතලන විට ගෙවීමේ" (PAYT) පද්ධති පොදු ස්ථානවල ඇති කසළ එකතු කිරීමේ මධ්‍යස්ථානයන්හි ස්ථාපනය කර (අ) යෝජනා ක්‍රමයේ ක්‍රියාකාරී පිරිවැය පියවා ගැනීමට සහ (ආ) ගාල්ල මහා නගර සභාව වෙත භාර දෙන කසළ ප්‍රමාණය අඩු කිරීමට යම් බලපෑම් කරනු පිණිස ගාස්තුව තීරණය කිරීම. මෙමගින් ජල මාර්ගවලින්/නීතිවිරෝධී ලෙස කසළ බැහැරලන ස්ථානවලින් ගාල්ල මහා නගර සභාවට කසළ එක්රැස් කිරීමට සිදු වීම අඩු වනු ඇති අතර එමගින් 2022 දී මෙ. ටොන් එකකට රු.85,163ක් තරම් වූ ඉහළ පිරිවැය අඩු කර ගත හැකි ය.

VIII. පරිසර පොලිසිය සහ ප්‍රජා ස්වේච්ඡා පිරිස් සමග අත්වැල් බැඳගෙන ගාල්ල මහා නගර සභාව විසින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ නීති බලාත්මක කරනු ලැබීම ශක්තිමත් කිරීම. මෙම ක්‍රියාමාර්ගය ඉහත 1 සහ VI ක්‍රියාමාර්ග සමග ගත් කල, නීති විරෝධී ලෙස කසළ බැහැර කිරීම අවම කිරීමට හේතු වනු ඇත (එවැනි ස්ථාන 13ක් ගාල්ල මහා නගර සභාව ප්‍රදේශය තුළ පවතින අතර පරිසර පොලිසිය විසින් මාස 3ක් තුළ නීතිය ක්‍රියාත්මක කිරීමේ නඩු 25ක් ගොනු කර ඇත). මෙය නීතිවිරෝධී කසළ බැහැරලීම් සහ ජල මාර්ග පිරිසිදු කිරීම සඳහා වැය වන මෙ.ටොන් එකකට රු.85,163ක් තරම් වන ඉතා ඉහළ පිරිවැයක් අඩු කිරීමට උපකාරී වේ.

**සේවා කාර්යක්ෂමතා පිරිවැය ඉතිරිකිරීම්**

I. එකතු කිරීමේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ ඉන්ධන සහ ශ්‍රම පිරිවැය අවම කිරීම සඳහා එකතු කිරීමේ ගමන්මාර්ග සහ කාලසටහන් ප්‍රශස්ත කිරීම. ගමන්මාර්ග ප්‍රශස්තකරණය 2023 දී CCBO සහාය ඇතිව ගාල්ල මහා නගර සභාව විසින් සිදු කරන ලද අතර එහි ප්‍රතිඵලයක් ලෙස, කසළ එකතු කිරීමේ ගමන් දුර දිනකට කිලෝමීටර 54කින් (18%) අඩු වූ අතර එය දිනකට රු. 100633.32ක ඉතිරි කිරීමකි (එනම් COSA අනාවරණයන්ට අනුව 54 54 Km * 1863.58 LKR/ Km).

II. මහජනතාව සමඟ සම්බන්ධවීමට ඩිජිටල් වේදිකා සහ ජංගම යෙදුම් සංවර්ධනය කිරීම. මෙම වේදිකා මගින් කසළ එකතු කිරීම් කාලසටහන් ගත කිරීම, ගැටලු වාර්තා කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය සහ කසළ අඩු කිරීම පිළිබඳ තොරතුරු ප්‍රජාවට ලබා දීමෙන් සේවා විමසීම් අඩු කිරීමට සහ ප්‍රජා සහභාගීත්වය වැඩි කිරීම සඳහා පහසුකම් සපයනු හැකි වේ. මෙමගින් සම්පත් (මිනිස්බල සහ යන්ත්‍ර-වාහන) නාස්තිය අවම කරන අතරම අධික පිරිවැය ඉතිරි කර ගනිමින් සේවා කාර්යක්ෂමතාව වැඩි දියුණු වේ.

III. ගාල්ල මහා නගර සභාවෙහි 3R/ඝන අපද්‍රව්‍ය කළමනාකරණ යන්ත්‍ර-වාහන ඇණිය ප්‍රතිසංවිධානය කර යන්ත්‍ර ඇණිය වෙන් කිරීම/භාවිතය ප්‍රශස්ත කිරීම. මෙය කසළ එකතු කිරීමේ පිරිවැයෙන් 35%ක් වන වාහන-යන්ත්‍ර ඇණිය මත පදනම් වූ පිරිවැය සැලකිය යුතු ලෙස අඩු කිරීමට හේතු වනු ඇත (COSA වාර්තාවේ 3 වන ප්‍රස්ථාරය බලන්න). මීට අමතරව, වාහන-යන්ත්‍ර නිතර බිඳවැටීම, කසළ හැසිරවීමේ ක්‍රියාවලියට බාධාවක් වන අතර පරිශ්‍ර මට්ටමින් බොහෝ ගැටලු ඇති කරන අතර ගාල්ල මහා නගර සභාවෙහි 3R/ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පද්ධතියේ කාර්යක්ෂමතාව ද විශාල ලෙස අඩු කරයි.

IV. ද්‍රව්‍ය ප්‍රතිසාධන පහසුකමක් ක්‍රියාත්මක කිරීම වැනි කසළ එකතු කිරීමේ සහ ප්‍රතිචක්‍රීකරණය කිරීමේ සේවා කළමනාකරණය කිරීම සඳහා කසළ ඒකරාශි කරන්නන් සහ පුද්ගලික සමාගම් සමග සහයෝගයෙන් කටයුතු කිරීම. ධාරිතාවට වඩා අඩුවෙන් ක්‍රියාත්මක වන දඩැල්ල, COWAM මධ්‍යස්ථානයේ වියළි කසළ එකතු කිරීමේ පිරිවැය අඩු කිරීමට සහ හීන්පැන්දල මධ්‍යස්ථානයෙහි ද එලෙස පිරිවැය අඩු කිරීමට මෙමගින් මං පාදනු ඇත.

V. නිශ්චිත තාක්ෂණික සහ යටිතල පහසුකම් අවශ්‍ය වන කසළ ප්‍රවර්ග නිසි ලෙස කළමනාකරණය කිරීම සඳහා විශේෂිත පෞද්ගලික අංශයේ කසළ හැසිරවීමේ නියෝජිතායතන සමග හවුල්කාරිත්ව ගොඩනගා ගැනීම. මෙම ක්‍රියාව සාමාන්‍යයෙන් එකතුවෙහි "තෙත්" හෝ "වියළි" වශයෙන් කසළ ප්‍රවර්ග මිශ්‍ර වීම අඩු කිරීමට, කසළ හැසිරවීමේ පිරිවැය අඩු කිරීමට, ගාල්ල මහා නගර සභාවෙහි සේවා කාර්යක්ෂමතාව වැඩි කිරීමට ඉවහල් වේ.

**පුරවැසියන්ගෙන්/කසළ ජනනය කරන්නන්ගෙන් වඩා හොඳ ගාස්තු එකතු කිරීමක්**

සේවා පිරිවැය විශ්ලේෂණ (COSA) ප්‍රතිඵල මගින් පෙන්වා දෙන පරිදි, 3R/ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ක්‍රියාවලියෙන් ලැබෙන වාර්ෂික ආදායම වාර්ෂික වියදමෙන් 6%ක් පමණක් වන අතර, එබැවින් ආදායම වැඩිකර ගැනීමේ සැලකිය යුතු අවශ්‍යතාවයක් පවතී. "කසළ එකතු කිරීමේ ගාස්තු" සහ "කසළ ප්‍රතිචක්‍රීකරණය" මගින් ලැබෙන ආදායම වැඩිකර ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතු ය. වත්මන් ආදායම් මූලාශ්‍රවල පහත පරතර පවතින බව සේවා පිරිවැය විශ්ලේෂණය මගින් පෙන්වා දෙන අතර අරමුදල් විකල්ප වැඩමුළුවේ දී යෝජිත/අනුමත විසඳුම් පහත පරිදි වේ.

I. සේවා ගාස්තුවක් ගෙවීමට යටත් වන කසළ ජනනය කරන්නන් තෝරා ගැනීම සඳහා පැහැදිලිව නිර්වචනය කරන ලද, නිර්ණායක මත පදනම් වූ තීරණ ගැනීමේ පද්ධතියක් නොමැති වීම.

II. තොග වශයෙන්/විශේෂ කසළ ජනනය කරන්නන්ගෙන් වත්මන් අයකිරීමේ ක්‍රමය පදනම් වන්නේ මිනුම් ප්‍රමාණයක් මත නොව හස්තීය, නිරීක්ෂණ පාදක විනිශ්චය මත ය. මෙම ක්‍රියා පටිපාටියෙහි ද ප්‍රමාණවත් විනිවිදභාවයක් නොමැත.

III. දඩැල්ල සහ හීන්පැන්දල පරිශ්‍රයන්හි වියළි කසළ ප්‍රතිචක්‍රීකරණ පහසුකම්වලින් සමන්විත වත්මන් GMC "කසළ ප්‍රතිචක්‍රීකරණ පද්ධතියේ" හිඩැස්

*IV.* බලපත්‍ර ලබා ගැනීම සපුරා නොමැති අදාළ සියලුම කර්මාන්ත දත්ත සමුදාය මගින් හඳුනා ගනිමින් එම කර්මාන්ත විසින් බලපත්‍ර ලබා ගන්නා පරිදි පරිසර ආරක්ෂණ බලපත්‍ර ක්‍රමය කාර්යක්ෂමව බලාත්මක කිරීම සහ බලපත්‍ර අලුත් කිරීම ඇතුළු නිසි පසු විපරම් ක්‍රියාමාර්ග සහතික කිරීම සඳහා දත්ත සමුදාය නිසි ලෙස අධීක්ෂණය කිරීම සහ පවත්වාගෙන යෑම.

*අපද්‍රව්‍ය පද්ධති ගාස්තු සහ බදු*

ගාල්ල මහා නගර සභාව විසින් ඔවුන්ගේ නිර්මිත ලද යටිතල පහසුකම්, ජංගම සහ මානව සම්පත් හරහා සපයන 3R /ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සේවාවන් ආශ්‍රිත අරමුදල් විකල්ප මෙහි දී සලකා බලනු ලැබේ.

**කසළ එකතු කිරීමේ ගාස්තු:**

අරමුදල් විකල්ප වැඩමුළුවේ දී සාකච්ඡා කළ යෝජනා කිහිපයක් පහත දැක්වේ.

I. ඝන අපද්‍රව්‍ය එකතු කිරීම, ප්‍රවාහනය, බැහැර කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය සම්බන්ධ නගර සභාවේ වියදම් මෙන්ම පරිපාලන වියදම් ද ආවරණය වන පරිදි ගාස්තුව සැලසුම් කළ යුතු ය. තථ්‍ය වියදම් නිර්ණය කිරීම සඳහා සම්පූර්ණ පිරිවැය විශ්ලේෂණයක් සිදු කිරීම සලකා බැලීම.

II. මහා නගර සභාව එහි අයවැය අවශ්‍යතා සමග සමපාත වන පැහැදිලි ආදායම් ඉලක්ක නිශ්චය කළ යුතු ය. මෙම මූල්‍ය අරමුණු සපුරාලීම සඳහා සේවා ගාස්තුව ව්‍යුහගත කළ යුතු අතර එය නිවැසියන්ට බරක් නොවන බවට සහතික විය යුතු ය. උදා: වාණිජ, සේවා සහ කර්මාන්ත ආයතනවලින් දිනකට කසළ කිලෝග්‍රෑමයකට ගාස්තුවක් අය කිරීම සහ නීති විරෝධී කසළ බැහැර කරන්නන්ගෙන් දඩ මුදල් අය කිරීම.

III. ගාස්තු ව්‍යුහය සාධාරණ වූවක් බවට සහතික වීම. කසළවල පරිමාව/බර මත පදනම්ව විවිධ සේවා ගාස්තු ව්‍යුහයන් සලකා බැලිය හැකි ය. කසළ ජනනය කරන සියලුදෙනා සඳහා සාධාරණ ගාස්තු නියම කිරීම සහ අඩු හා ඉහළ කසළ පරිමාව ජනනයකරන්නන් සඳහා දැරිය හැකි මිලක් සහතික කිරීමට සමතුලිතතාවයක් ඇති කිරීම වැදගත් වේ.

IV. කසළ බඳුන්වල ප්‍රමාණය, එකතු කිරීමේ වාර ගණන, හෝ කසළ වර්ගය (උදා. ප්‍රතිචක්‍රීකරණය කළ හැකි නොහැකි) මත පදනම්ව විචල්‍ය මිල ගණන් සලකා බැලීම. මෙය කසළ අඩු කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය කිරීම දිරිමත් කරන අතර එමඟින් ගාල්ල මහා නගර සභා මැදිහත්වීම අඩු කළ හැකි අතර එවිට කල් ගත වන විට කසළ බැහැර කිරීමේ පිරිවැය අඩු වේ.

V. කසළ එකතු කිරීමේ ගාස්තුව සම්බන්ධයෙන් ඉහත කොටසේ සඳහන් සියලුම අංශවලට අමතරව, පහත සඳහන් විශේෂිත උප අංශ ද සලකා බැලිය යුතු ය;

- ✧ සංචාරක හෝටල්, ආපනශාලා ආදියෙන් සෘජුවම අය කළ යුතු ‘සංචාරක ගාස්තුවක්’ හඳුන්වා දීම.

- ✧ පරිසරය පිරිසිදුව පවත්වා ගැනීමේ අරමුණින්, "ගාලු වරාය පිවිසුම් දොරටුව" අසල දී දේශීය හා විදේශීය සංචාරකයන්ගෙන් ඇතුල්වීමේ ගාස්තුවක් අය කිරීම. මෙය ප්‍රදේශයේ පරිසර සංරක්ෂණය සහ පිරිසිදුකම සඳහා වූ ප්‍රයත්නයන්ට අරමුදල් සැපයීම සඳහා ශක්‍ය ප්‍රවේශයක් විය හැකි ය.

- ✧ ඉදිකිරීම් සහ බිඳ හෙලීම් ව්‍යාපෘති මගින් විශාල කසළ ප්‍රමාණයක් ජනනය කෙරේ. ගාල්ල මහා නගර සභාව විසින් බලපත්‍ර ලබා දීමේ දී හෝ එවැනි පරිශ්‍රයන්ගෙන් කසළ ඉවත් කිරීම සඳහා සේවා ගාස්තු අය කළ යුතුය.

- ✧ උත්සව, ප්‍රදර්ශන, සහ ප්‍රජා රැස්වීම් වැනි අවස්ථා මගින් කසළවල තාවකාලික වැඩිවීමක් ඇති කෙරේ. මෙම අවස්ථා අතරතුර අමතර කසළ එකතු කිරීමේ සහ බැහැර කිරීමේ සේවා සැපයීමේ පිරිවැය ආවරණය කිරීම සඳහා ගාල්ල මහා නගර සභාව ගාස්තු අය කළ යුතු ය.

- ✧ ගෘහ භාණ්ඩ සහ උපකරණ වැනි විශාල අයිතම ඉවත් කිරීම සඳහා, අතිරේක ශ්‍රම සහ බැහැර කිරීමේ පිරිවැය ආවරණය කිරීම සඳහා ගාල්ල මහා නගර සභාව විසින් සේවා ගාස්තු අය කළ හැකි ය.

- ✧ රෝහල්, සායන සහ අනෙකුත් සෞඛ්‍ය සේවා ආයතන මගින් ජනනය කෙරෙන අන්තරායකර නොවන අපද්‍රව්‍ය සඳහා බොහෝ විට විශේෂිත හැසිරවීම් සහ බැහැර කිරීම් අවශ්‍ය කෙරෙන අතර, එය විශේෂිත සේවා ගාස්තු අය කිරීමට තුඩු දෙයි.

- ✧ ගෘහයන් හෝ ව්‍යාපාර ගණනාවක් විසින් භාවිත කිරීම සඳහා හවුල් එකතු කිරීමේ බඳුන් හෝ ඩම්ප්ස්ටර් සැපයීම. මෙම පහසුකම්වලට ප්‍රවේශ වීම වෙනුවෙන්, භාවිත කරන්නන්ගෙන් ගාස්තු අය කිරීම GMC හට සිදු කළ හැකි ය.

- ✧ මහල් නිවාස සංකීර්ණ සහ බහු ඒකක නේවාසික ගොඩනැගිලි ගත් කල, දේපල හිමිකරුවන්, ඉඩම් හිමියන්, තනි කුලී නිවැසියන් හෝ පෞද්ගලික එකතු කරන්නන්ගෙන් කසළ එකතු කිරීමේ සේවා ගාස්තු අය කළ හැකි ය.

VI. ව්‍යාපාරික ප්‍රජාව, ප්‍රජා නායකයන්, කසළ අංශයේ නිරත වන්නන් (අවිධිමත් එකතු කරන්නන්, කසළ ඒකරාශි කරන්නන් සහ MRF ක්‍රියාකරුවන්) සහ ඌන සම්පත් සහිත ප්‍රජාවන්හි නියෝජිතයන් (කාන්තාවන් ඇතුළුව), සමීක්ෂණ හා රැස්වීම් මගින් මහජන අදහස් විමසමින් තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා සම්බන්ධ කර ගැනීම. මෙය පාර්ශවකරුවන්ගේ ගෙවීමට ඇති කැමැත්තට සහ සේවා මට්ටම් සඳහා ඔවුන්ගේ මනාපයට හේතු වේ.

VII. තිරසර අරමුදල් විකල්ප සහතික කිරීම පිණිස කසළ කළමනාකරණය සඳහා දිගුකාලීන මූල්‍ය සැලැස්මක් සකස් කිරීම. මෙහිදී උද්ධමනය සහ අනාගත යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම් වැනි සාධක සැලකිල්ලට ලක් කළ යුතු ය.

VIII. උද්ධමනය, කසළ ජනනයෙහි වෙනස්වීම්, හෝ ප්‍රතිචක්‍රීකරණ වෙළඳපොළ වෙනස්වීම් යනාදී වෙනස්වනසුලු තත්ත්වයන් මත පදනම්ව සේවා ගාස්තුව කාලානුරූපීව සකස් කිරීමට සූදානමින් සිටීම.

**පහසුකමෙහි කසළ හැසිරවීමේ ගාස්තු :**

මහා පරිමාණයෙන් කසළ සපයන්නන් සඳහා හීන්පැන්දල දී සහ දඩැල්ල ගොඩනැගිලි අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ දී මෙම ගාස්තු ක්‍රමය අනුගමනය කෙරේ. 2022 දී හීන්පැන්දල දී ට්‍රැක්ටරයක පැටවූ බර ප්‍රමාණයකට රුපියල් 500.00ක් අය කරන අතර දඩැල්ල ගොඩනැගිලි අපද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථානයේ දී ට්‍රැක්ටරයක පැටවූ බර ප්‍රමාණයකට දළ වශයෙන් රුපියල් 2,000.00ක් අය කරන ලදි. කෙසේ වෙතත්, මෙම යෝජනා ක්‍රම මනාව ලේඛනගත කර නොමැති අතර එහෙයින් පැහැදිලි ආදායම් වාර්තා වෙත ද පහසුවෙන් ප්‍රවේශ විය නොහැකිව ඇති අතර අයවැය අරමුණු සඳහා ද ඒවා භාවිත නොවේ.

කෙසේ වෙතත්, COSA ක්‍රියාවලිය සහ අරමුදල් විකල්ප වැඩමුළුව අතරතුර, හීන්පැන්දල සහ දඩැල්ල මධ්‍යස්ථාන ද්විත්වයේම ක්‍රියාකාරීත්වය ද්‍රව්‍ය ප්‍රතිසාධන පහසුකම් ලෙස පහත විෂයපථය සමඟ උසස් කිරීමට යෝජනා කරන ලදි.

- ✧ හීන්පැන්දලː තෙත් කසළ පිරියම් කිරීම (කවාෂිමා කම්හල) සහ වීදුරු සහ ගොඩනැගිලි අපද්‍රව්‍ය හැර ප්‍රතිචක්‍රීකරණය කළ හැකි කසළ ප්‍රතිසාධන/ පිරියම් කිරීමේ පහසුකම්.
- ✧ දඩැල්ලː PET බෝතල්, වීදුරු සහ ගොඩනැගිලි අපද්‍රව්‍ය ප්‍රතිසාධන / පිරියම් කිරීමේ පහසුකම.

කසළ හැසිරවීම් පිරිවැය (tipping fee) ව්‍යුහය තීරණය කිරීමේ දී, සමස්ත පහසුකම් මෙහෙයුම් පිරිවැය, පවතින වෙළඳපළ මිල ගණන් සහ සහයෝගිතා හවුල්කරුවන් සමග ගාල්ල මහා සභාව එළඹ ඇති ගිවිසුම්වල ප්‍රතිඥා ඇතුළත් කොට එය තීරණය කළ යුතු බවට අරමුදල් විකල්ප වැඩමුළුවේ දී සියලුම පාර්ශ්වකරුවෝ එකඟ වූහ.

**දේපළ බදු:**

ගාල්ල මහා නගර සභාව විසින් එහි බල ප්‍රදේශයේ සියලුම පදිංචිකරුවන්හට දේපළ බද්ද පනවනු ලබන අතර එම ප්‍රදේශයේම සියලුම ව්‍යාපාරික ආයතනවලින් "වෙළඳ බලපත්‍ර ගාස්තුවක්" අය කෙරේ. මෙම බදු යෝජනා ක්‍රම දෙක අයවැය අරමුණු සඳහා ප්‍රධාන සාධකයක් වන දත්ත කළමනාකරණ ක්‍රමය සමඟ මනාව සංවිධිත ආයතන පද්ධතියක් හරහා ඉතා ඵලදායි ලෙස පනවනු ලබන අතර,. කසළ එකතු කිරීමේ ගාස්තුව එකතු කිරීම සඳහා අත්‍යවශ්‍ය වෙනස්කම් සහිතව ඒ හා සමාන ආයතනික සහ මූල්‍ය/දත්ත කළමනාකරණ පද්ධතියක් භාවිත කළ හැකි ද යන්න පිළිබඳව අරමුදල් විකල්ප වැඩමුළුවේ දී සහ අදාළ පූර්ව උපදේශන සැසිවලදී සාකච්ඡා කෙරිණි.

*කසළවලින් නිපදවන නිෂ්පාදන විකිණීම*

ගාල්ල මහා නගර සභාව දැනට හීන්පැන්දල කවාෂිමා කම්හලේ කොම්පෝස්ට් නිෂ්පාදනය කරයි. එහි නිෂ්පාදනය කරන ලද කොම්පෝස්ට් තවමත් ගැනුම්කරුවන් අතර බෙදා හැරීමට නියමිතව ඇත. කෙසේ වෙතත්, කොම්පෝස්ට් පරීක්ෂා කිරීම සහ අලෙවි කිරීම සිදු වෙමින් පවතී. කොම්පෝස්ට් විකිණීමෙන් ලැබෙන ආදායම පුරෝකථනය කිරීම දුෂ්කරය, කෙසේ වෙතත්, මෙය කසළ ආශ්‍රිත නිෂ්පාදන විකිණීමෙන් ලැබෙන ආදායමක් ලෙස සැලකිය හැකි ය.

මීට අමතරව, දඩැල්ලේ ඇති වීදුරු සහ ගොඩනැගිලි අපද්‍රව්‍ය පිරියම් කිරීමේ මධ්‍යස්ථානයේ නිමැවුම් තෙවන පාර්ශ්වයකට ද්‍රව්‍ය ලෙස විකුණා අනාගතයේ දී ආදායමක් උපයා ගැනීමේ හැකියාවක් පවතී.

මෙම පහසුකම්වල ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කිරීම සඳහා සහ මෙම පහසුකම්වලින් නිපදවන නිෂ්පාදනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා පහත යෝජනා ඉදිරිපත් කළ හැකි ය.

i. පහසුකම් සම්පූර්ණ ධාරිතාවයෙන් ක්‍රියාත්මක කිරීම. දැනට, පහසුකම් ක්‍රියාත්මක නොවීම හෝ අර්ධ ධාරිතාවයෙන් ක්‍රියාත්මක වීම දැකිය හැකි ය.

ii විශ්වවිද්‍යාල සහ/හෝ ඕනෑම පෞද්ගලික අංශයක සහය ඇතිව කොම්පෝස්ට්වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ ගාල්ල හා ඒ අවට කෘෂිකර්ම/ ගෙවතු වගා අංශයේ අවශ්‍යතා සපුරාලීම.

iii. කුඩු කරන ලද වීදුරු, කුඩා කොටස්වලට කඩා දැමූ ප්ලාස්ටික් (shredded plastic), බේල් කරන ලද PET බෝතල් ආදිය සම්බන්ධයෙන් විවිධ ගැනුම්කරුවන් හඳුනාගෙන සාකච්ඡා කිරීම.

## ආ. තෙවන පාර්ශ්වීය අරමුදල් විකල්ප

පාර්ශ්වකරුවන්ගේ උපදේශන සහ අනෙකුත් අධ්‍යයනයන්ට අනුව, පහත දැක්වෙන තෙවන පාර්ශවීය අරමුදල් මූලාශ්‍ර හඳුනාගනු ලැබ ඇති අතර ගාල්ල මහා නගර සභා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා විභව අරමුදල් විකල්ප ලෙස ඒවා ඉදිරිපත් කළ හැකි ය.

1. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පද්ධතියේ හඳුනාගත් කොටස් සඳහා රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්ව (PPP) ආකෘතිය
2. ආයතනික සමාජ වගකීම් (CSR) අරමුදල්
3. රාජ්‍ය නොවන සංවිධාන
4. ජාත්‍යන්තර ප්‍රදානක ආයතන

## *ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියේ හඳුනාගත් කොටස් සඳහා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ආකෘතිය*

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ක්‍රියාවලියේ නිශ්චිත කොටස් කළමනාකරණය කිරීම සඳහා පෞද්ගලික අංශය සමග රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය මත පදනම් වූ සහයෝගිතා සඳහා යොමු වීමට ගාල්ල මහා නගර සභාව හට හැකියාව ඇත. නිදසුනක් වශයෙන්, හීන්පැන්දල ද්‍රව්‍ය ප්‍රතිසාධන පහසුකමෙහි සමස්ත මෙහෙයුම් අධීක්ෂණයෙහි වගකීම ගාල්ල මහා නගර සභාව විසින් දරන අතරතුර, , ද්‍රව්‍ය ප්‍රතිසාධන පහසුකමක පරිමාවට සංවර්ධනය කොට ස්වකීය ආයෝජනයන්ගෙන් එහි මෙහෙයුම් කටයුතු සිදු කිරීමේ ශක්‍යතාව ඇති පෞද්ගලික කසළ ඒකරාශි කරන්නෙකුට හීන්පැන්දල පරිශ්‍රයෙහි MRF සංවර්ධනය පැවරීමේ හැකියාව සොයා බැලීම ගාල්ල මහා නගර සභාවෙහි ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය අතර සාකච්ඡාවට ලක්ව ඇත. ශ්‍රී ලංකාවේ සමහර පළාත් පාලන ආයතන දැනටමත් සිදු කර ඇති පරිදි (උදා: කොළඹ මහා නගර සභාව), කසළ එකතු කිරීම සහ ප්‍රවාහනයේ දී ගාල්ල මහා නගර සභාව මත බර අඩු කිරීම අරමුණු කර ගනිමින්, කසළ එකතු කිරීම සහ ප්‍රවාහනය කිරීම පෞද්ගලික සමාගමකට පවරනු ලැබිය හැකි ය. එබැවින්, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය මත පදනම් වූ සහයෝගිතා, විභවීය තෙවන පාර්ශ්වීය අරමුදල් විකල්පයක් ලෙස පවතී.

## *CSR අරමුදල්*

CSR යනු අලෙවිකරණය හරහා ලාභ වර්ධනය කිරීම සඳහා පමණක් නොව, තමා කොටසක් වන සමාජය කෙරෙහි තමන් සතු සමාජ වගකීම තුළ ක්‍රියාකාරී සහ ධනාත්මක කාර්යභාරයක් ඉටු කිරීම සඳහා පුද්ගලික අංශය විසින් භාවිත කරන උපායමාර්ගයකි. ඔවුන්ගේම ආයතනික සමාජ වගකීම් අරමුදල් සහිත පුද්ගලික අංශයේ ආයතන වෙත ගාල්ල මහා නගර සභාව විසින් විස්තීරණ යෝජනාවක් ඉදිරිපත් කර නගරය තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා සැලසුම් කර ඇති වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නිශ්චිත අරමුදල් ප්‍රමාණයක් ලබා ගත හැකි ය. උදාහරණයක් ලෙස, ගාල්ල මහා නගර සභාව මගින් HELP-O විසින් කරන ලද ඉල්ලීමක් මත, සී/ස CleanTech (පුද්.) සමාගම විසින් කරාපිටිය රෝහලට සහ තවත් හඳුනාගත් කසළ ජනනය කරන්නන් කිහිප දෙනෙකු සඳහා සැලකිය යුතු උපකරණ ප්‍රමාණයක් (උදා: විද්‍යුත්-අපද්‍රව්‍ය එකතු කිරීමේ බඳුන් සහ අනෙකුත් සාමාන්‍ය බඳුන්) පරිත්‍යාග කරන ලදි.

## *රාජ්‍ය නොවන සංවිධාන (Non-Governmental Organizations)*

ගාල්ල නගරයේ සහ ඒ අවට 3R/ඝන අපද්‍රව්‍ය කළමනාකරණය අංශයේ කටයුතුවල නියුතු බොහෝ රාජ්‍ය නොවන සංවිධාන (උදා: HELP-O) පවතින අතර එම ආයතන ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කෙරෙහි අවධානය යොමු කරමින් ගාල්ල මහා නගර සභාව සමඟ සහයෝගයෙන් ව්‍යාපෘතිවල නියැලීමට අපේක්ෂා කරයි. සාමාන්‍යයෙන් රාජ්‍ය නොවන සංවිධාන විසින් උපදේශන සේවා ඇතුළුව පළාත් පාලන නිලධාරීන්ට සහ පුරවැසියන්ට දැනුම බෙදාදීම, දැනුවත් කිරීමේ වැඩසටහන් සහ පුහුණුව ලබා දීම සඳහා දැනුමැති කාර්ය මණ්ඩල ඇතුළු සම්පත් ප්‍රදානය කරයි. ඔවුන් උපකරණ මිලදී ගැනීමට, පුහුණු වැඩසටහන් පැවැත්වීමට සහ දැනුවත් කිරීම් හා පුහුණුව මගින් ප්‍රජා ධාරිතාව ගොඩනැගීමට ආදී වශයෙන් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියේ සම්පූර්ණ අංගයකට පවා ආධාර කිරීමට හෝ අරමුදල් සැපයීමට හැකි ය. එබැවින්, ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්ම සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ගාල්ල මහා නගර සභාව සඳහා තුන්වන පාර්ශ්ව අරමුදල් විකල්පයක් ලෙස රාජ්‍ය නොවන සංවිධාන පවතී.

*ජාත්‍යන්තර ප්‍රදානක ආයතන (International Donor Agencies)*

පළාත් පාලන ආයතන, රාජ්‍ය නොවන සංවිධාන හෝ ස්වකීය සහයෝගිතාකරුවන් ලෙස හඳුනාගෙන ලැබ ඇති වෙනත් කවර හෝ සංවිධානයක් විසින් ඉදිරිපත් කරනු ලබන ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ආශ්‍රිත යෝජනා සඳහා අරමුදල් සපයන ජාත්‍යන්තර ප්‍රදානක ආයතන රාශියක් ඇත. එබැවින්, සවිස්තරාත්මක යෝජනාවක් සමගින්, ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලියේ ඇතැම් කොටස්වලට අරමුදල් සපයා ගැනීම සඳහා ගාල්ල මහා නගර සභාව හට එවැනි ප්‍රදානක නියෝජිතායතන වෙත ප්‍රවේශ විය හැකි ය. සමහර ප්‍රදානක ආයතන විසින් විශේෂිත සංවිධාන සමූහයක් මගින් යෝජනා පිළිගනු ලැබිය හැකි අතර (උදා. රාජ්‍ය නොවන සංවිධාන) එවැනි අවස්ථාවන්හි දී, ගාල්ල මහා නගර සභාව හට එවැනි සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කර අරමුදල් වෙත ප්‍රවේශ වීමට යෝජනා ඉදිරිපත් කළ හැකිය.

# 12. ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම

| යොමු අංකය | උපායමාර්ග | ප්‍රමුඛතාව | වගකීම | කාල රාමුව | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 |
| ඉලක්කය 1: මූලික වශයෙන් 3R පදනම් කරගත් සහයෝගී ප්‍රවේශයක් මගින් නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම | | | | | | | | | | |
| අරමුණ 1: 2030 වනවිට පූර්ණ ධාරිතාවයෙන් ගාල්ල මහා නගර සභාවෙහි දැනට පවතින ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පහසුකම් වැඩිදියුණු කිරීම සහ ක්‍රියාත්මක කිරීම (උදා: හීන්පැන්දල දඩැල්ලෙහි පිහිටි PET බෝතල් එකතු කිරීමේ මධස්ථානය සහ COWAM මධ්‍යස්ථානය) | | | | | | | | | | |
| 1,1,1 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය හා සම්බන්ධ කරුණු අධීක්ෂණය කිරීම සඳහා ගාල්ල මහා නගර සභාවෙහි ඝන අපද්‍රව්‍ය කළමනාකරණ තාක්ෂණික කමිටුවක් පිහිටුවීම (උදා: සාමූහික සාකච්ඡා (brainstorm), සංවාද සහ සහයෝගී තීරණ ගැනීම) | 1 | නාගරික කොමසාරිස් | | | | | | | |
| 1.1.2 | මෙම පහසුකම්වල වත්මන් තත්ත්වය තක්සේරු කිරීම සඳහා තාක්ෂණික, මූල්‍ය, සමාජීය හා කළමනාකරණ අංශවල නිලධාරින් සහ එම අංශවලම බාහිර විශේෂඥයන්ගෙන් සමන්විත කණ්ඩායමක් පත් කිරීම. | 1 | SWM තාක්ෂණ කමිටුව | | | | | | | |
| 1.1.3 | සම්පූර්ණ ධාරිතාවට ළඟා වීම සඳහා පහත විශේෂාංග සහිත හීන්පැන්දල, දඩැල්ල COWAM මධ්‍යස්ථානය සහ PET බෝතල් මධ්‍යස්ථානය සඳහා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම;<br>I. ස්වයං මූල්‍ය ක්‍රමවේදය සහ දිගු කාලීන තිරසරබව සඳහා සුදුසු කළමනාකරණ ප්‍රවේශය<br>II.හඳුනාගත් ප්‍රධාන අදියර ළඟා කර ගත හැකි කාල සැලැස්ම<br>III.මෙම ක්‍රියාවලිය හා සම්බන්ධ පාර්ශ්ව සතු කාර්යභාරය හා වගකීම් නිර්වචනය<br>IV.අදාළ පාර්ශ්ව සමග ඵලදායී සහයෝගිතාවක් පවත්වා ගැනීම (එනම් රජය, පෞද්ගලික හෝ අරමුදල් නියෝජිතායතන සමඟ)<br>VI. ගාල්ල මහා නගර සභාව වෙත සෘජු වගවීම | 1 | සැලසුම් සකස් කිරීම:<br>මෙම ගාල්ල මහා නගර සභාවේ පහසුකම් ක්‍රියාත්මක කිරීම සඳහා මේ වන විට සම්බන්ධව සිටින කණ්ඩායම<br><br>සැලසුම් අනුමැතිය:<br>ඝන අපද්‍රව්‍ය කළමනාකරණ තාක්ෂණික කමිටුව | | | | | | | |
| 1.1.4 | අධ්‍යාපනය සහ අනාගත පර්යේෂණ හා සංවර්ධන/ව්‍යාපෘති අරමුණු සඳහා මෙම ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පහසුකම් පාසල්/විශ්වවිද්‍යාල/වෙනත් අධ්‍යයන ආයතන සමඟ සම්බන්ධ කිරීම | 3 | නාගරික ලේකම්/ CDO ඒකකය / සෞඛ්‍ය අමාත්‍යාංශය/ ඉංජිනේරු දෙපාර්තමේන්තුව | | | | | | | |
| අරමුණ 2: 2025 වර්ෂය වන විට ගාල්ල මහා නගර සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පහසුකම් සම්පූර්ණ වශයෙන් වැඩිදියුණු කිරීම හා මෙහෙයුම්කරණය කිරීම (උදා: දඩැල්ල හීන්පැන්දල කවාෂිමා PET බෝතල් එකතු කිරීමේ මධ්‍යස්ථානය හා COWAM මධ්‍යස්ථානය | | | | | | | | | | |
| 1.2.1 | කසළ අවම කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා දිරිගැන්වීම් මත පදනම් වූ උපකරණ හඳුන්වා දීම | 1 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ තාක්ෂණික කමිටුව | | | | | | | |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | I. කසළ ජනනය කරන්නන් සඳහා සුදුසු ප්‍රමිතීන් සහිත ශ්‍රේණිගත කිරීමේ ක්‍රමයක්/ වාර්ෂික ප්‍රදානය කිරීමේ ක්‍රමයක් හඳුන්වා දීම<br>II.ප්ලාස්ටික් භාවිතයෙන් තොර ආයතන ප්‍රවර්ධනය කිරීම (උදා: සංචාරකයන් සඳහා හෝටල් ශ්‍රේණිගත කිරීම)<br>III.සාමාන්‍ය ගෘහස්ථ ඝන අපද්‍රව්‍ය හැර ගාල්ල මහා නගර සභාව විසින් අපද්‍රව්‍ය කළමනාකරණ සේවා සැපයීම සඳහා ප්‍රමාණ පාදක අය පද්ධතියක් හඳුන්වා දීම | | | | | | | | | |
| 1.2.2 | අපද්‍රව්‍ය වශයෙන් ක්ෂණිකව ඉවත් කරනු ලබන ද්‍රව්‍ය සඳහා අඩු වියදම් සහිත විකල්ප, විසඳුම් වශයෙන් හඳුනා ගැනීම, තක්සේරු කිරීම සහ හඳුන්වා දීම (උදා: ප්ලාස්ටික් සාප්පු බෑගය)/ ඒවා ප්‍රවර්ධනය කිරීම සඳහා ගාල්ල මහා නගර සභාවෙහි එවැනි විකල්ප නිෂ්පාදකයන් ලියාපදිංචි කිරීම | 2 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ තාක්ෂණික කමිටුව | | | | | | | |
| 1.2.3 | කසළ අවම කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා සමාජ හැසිරීම් වෙනස් කිරීම<br>I.දැනුවත්භාවය ඉහළ නැංවීම<br>II.ප්‍රචාරණ ව්‍යාපාර<br>III.ගාල්ල මහා නගර සභාව විසින් මෙහෙයවනු ලබන ඩිජිටල් දැන්වීම් පුවරු | 1 | CDO ඒකකය | | | | | | | |
| 1.2.4 | කර්මාන්ත/ වාණිජ ආයතන අතර හරිත නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම | 3 | ඉංජිනේරු දෙපාර්තමේන්තුව/ සෞඛ්‍ය අමාත්‍යාංශය/ CDO ඒකකය | | | | | | | |
| අරමුණ 3: 2025 වන විට සියලු වර්ගවල කසළ ජනනය කරන්නන් අතර විධිමත් කසළ වෙන් කිරීමේ සහ ගබඩා කිරීමේ භාවිතාවන් සහතික කිරීම | | | | | | | | | | |
| 1.3.1 | එක් එක් ගෘහස්ථ, වාණිජ, කර්මාන්ත හා හා සේවා අංශ සඳහා විද්‍යාත්මක හා වඩාත් ප්‍රායෝගික කසළ වෙන් කිරීමේ ප්‍රතිපත්තියක් හඳුන්වා දීම | 1 | ඉංජිනේරු දෙපාර්තමේන්තුව/ සෞඛ්‍ය අමාත්‍යාංශය/ CDO ඒකකය | | | | | | | |
| 1.3.2 | එවැනි ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා නියාමන හා දිරිගැන්වීම් පදනම් කරගත් උපකරණ සංස්ථාගත කිරීම | 1 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය තාක්ෂණික කමිටුව, නීති නිලධාරී, CDO | | | | | | | |
| 1.3.3 | තොග වශයෙන් කසළ ජනනය කරන්නන්ට (කසළ ඒකරාශි කරන්නන් (aggregators) ඇතුළුව) ඔවුන්ගේ මෙහෙයුම් සම්බන්ධයෙන් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මක් සකස්කර ගාල්ල මහා නගර සභාව වෙත ඉදිරිපත් කිරීම අනිවාර්ය කිරීම | 1 | ඉංජිනේරු දෙපාර්තමේන්තුව/ සෞඛ්‍ය අමාත්‍යාංශය/ CDO ඒකකය | | | | | | | |
| 1.3.4 | තොග වශයෙන් කසළ ජනනය කරන්නන්ගෙන් MSW දත්ත ලබාගැනීමේ යාන්ත්‍රණයක් හඳුන්වා දීම | 1 | ඉංජිනේරු දෙපාර්තමේන්තුව/ සෞඛ්‍ය අමාත්‍යාංශය/ CDO ඒකකය | | | | | | | |
| 1.3.5 | ගොඩනැගිලි සැලැස්ම අනුමත කිරීම සඳහා අයදුම් කිරීමේ දී සැලැස්මේ ඇස්තමේන්තුගත කසළ ප්‍රමාණය, කසළ එකතු කිරීම සහ තාවකාලික ගබඩා ස්ථාන දැක්වීම අනිවාර්ය කිරීම | 2 | ඉංජිනේරු දෙපාර්තමේන්තුව/ සෞඛ්‍ය අමාත්‍යාංශය/ CDO ඒකකය | | | | | | | |
| 1.3.6 | කසළ එකතු කිරීම/ ගබඩා කිරීම සඳහා සම්මත කසළ බඳුන් හඳුන්වා දීම | 2 | ඉංජිනේරු දෙපාර්තමේන්තුව/ සෞඛ්‍ය අමාත්‍යාංශය/ CDO | | | | | | | |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ඒකකය | | | | | | | |
| 1.3.7 | ගාල්ල මහා නගර සභා ප්‍රදේශය තුළ කසළ එකතු කිරීමේ මධ්‍යස්ථාන (සියලු කසළ ප්‍රවර්ග සඳහා) පිහිටුවීම | 1 | ඉංජිනේරු දෙපාර්තමේන්තුව/ සෞඛ්‍ය අමාත්‍යාංශය/ CDO ඒකකය | | | | | | | |
| අරමුණ 4: 2030 වන විට ගාල්ල මහා නගර සභා ප්‍රදේශයේ පුළුල් ද්‍රව්‍ය ප්‍රතිසාධන පහසුකමක් (MRF) ස්ථාපිත කිරීම | | | | | | | | | | |
| 1.4.1 | PPP ආකෘතියක් ලෙස MRF ක්‍රියාත්මක කිරීමට අවස්ථා ගවේෂණය කිරීම | 2 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ තාක්ෂණික කමිටුව | | | | | | | |
| 1.4.2 | ගාල්ල මහා නගර සභා ප්‍රදේශය තුළ තෝරා ගත් ස්ථානවල ද්‍රව්‍ය එකතු කිරීමේ සහ බෙදා ගැනීමේ මධ්‍යස්ථාන පිහිටු වීම | 1 | ඉංජිනේරු දෙපාර්තමේන්තුව/ සෞඛ්‍ය අමාත්‍යාංශය / CDO/ ගිණුම් අංශය | | | | | | | |
| අරමුණ 5: ප්‍රතිචක්‍රීකරණය කළ හැකි අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමට විශේෂිත ආයතන හඳුනා ගැනීම සහ 2026 වනවිට නිසි ප්‍රතිචක්‍රීය කසළ කළමනාකරණයක් සඳහා සබැඳි වර්ධනය කිරීම | | | | | | | | | | |
| 1.5.1 | ගාල්ල මහා නගර සභාව ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියට සම්බන්ධ කළ හැකි සියලුම කසළ ප්‍රතිචක්‍රීකරණය කරන්නන්, එකතු කරන්නන්, ප්‍රවාහකයන් සහ ඒකරාශි කරන්නන් (ගාල්ල මහා නගර සභා ප්‍රදේශය තුළ සහ ඉන් පිටත) ලියාපදිංචි කිරීම | 1 | ඉංජිනේරු දෙපාර්තමේන්තුව/ CDO/ ගිණුම් අංශය | | | | | | | |
| අරමුණ 6: 2026 වනවිට පිළිගත හැකි බැහැර කිරීමේ ක්‍රම නොමැති කසළ වර්ග සඳහා සනීපාරක්ෂක ගබඩා සහ බැහැර කිරීමේ ක්‍රම හඳුනා ගෙන ක්‍රියාත්මක කිරීම (උදා: අන්තරායකර [උදා: ඩයපර්, සනීපාරක්ෂක පෑඩ්, ඉවත දැමිය හැකි බැටරි], අන්තරායකර නොවන, භාවිත කළ නොහැකි මිශ්‍ර අපද්‍රව්‍ය, ෆයිබර්, සෙරමික් අපද්‍රව්‍ය, මැටි අපද්‍රව්‍ය ආදිය) | | | | | | | | | | |
| 1.6.1 | නිසි/ පිළිගත හැකි බැහැර කිරීමේ ක්‍රමයක් නොමැති අපද්‍රව්‍ය වර්ග සඳහා එකතු කිරීමේ සහ ගබඩා කිරීමේ පද්ධතියක් සැලසුම් කිරීම | 1 | ඉංජිනේරු දෙපාර්තමේන්තුව/ සෞඛ්‍ය අමාත්‍යාංශය/ CDO ඒකකය | | | | | | | |
| 1.6.2 | එවැනි අපද්‍රව්‍ය සඳහා නිෂ්පාදකගේ විස්තීර්ණ වූ වගකීම (EPR) ප්‍රතිපත්තිය/ රෙගුලාසි යෙදීමේ හැකියාව ගවේෂණය කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය, පරිසර අමාත්‍යාංශය සහ පළාත් පාලන අමාත්‍යාංශය සමග සම්බන්ධ වීම | 1 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ තාක්ෂණික කමිටුව | | | | | | | |
| 1.6.3 | මෙම වර්ගයේ අපද්‍රව්‍ය (ගාල්ල මහා නගර සභා ප්‍රදේශය තුළ හෝ ඉන් පිටත) සම්බන්ධයෙන් කටයුතු කරන සංවිධාන සමග සම්බන්ධතා හඳුනාගෙන ස්ථාපිත කර පිළිගත හැකි බැහැර කිරීමේ ක්‍රම භාවිත කිරීම | 1 | ඉංජිනේරු දෙපාර්තමේන්තුව/ සෞඛ්‍ය අමාත්‍යාංශය/ CDO ඒකකය | | | | | | | |
| 1.6.4 | මධ්‍යම පරිසර අධිකාරියේ උපදෙස් මත හීන්පැන්දල ප්‍රදේශයේ සුළු අපද්‍රව්‍ය දහන යන්ත්‍රයක් ස්ථාපිත කිරීම. | 3 | සිවිල් ඉංජිනේරු/ යාන්ත්‍රික ඉංජිනේරු/මහජන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී | | | | | | | |
| ඉලක්කය 2: ඵලදායී 3R පාදක ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා හැකියාව සහ දැනුමැති මහා නගර සභාවක් | | | | | | | | | | |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| අරමුණ 1: 2030 වනවිට එකතු කිරීමේ අනුපාතය 22% සිට 50% දක්වා වැඩි කිරීම සඳහා ආධාරක ද්‍රව්‍ය සම්පත්, යටිතල පහසුකම් සහ සේවා වැඩිදියුණු කිරීම | | | | | | | | | | |
| 2.1.1 | ගාල්ල මහා නගර සභාවෙහි දැනට පවතින ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වාහන ඇණිය 2030 වන විට උත්ශ්‍රේණි කිරීම | 2 | සිවිල් ඉංජිනේරු/ යාන්ත්‍රික ඉංජිනේරු | | | | | | | |
| 2.1.2 | 2025 වනවිට මහ නගර සභාවට අයත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ආශ්‍රිත පහසුකම් වැඩිදියුණු කිරීම සහ ක්‍රියාත්මක කිරීම (උදා: මහ නගර සභා පරිශ්‍රයේ නාගරික ගරාජය/ කිතුලම්පිටිය, හීන්පන්දල වාහන පිරිසිදු කිරීමේ මධ්‍යස්ථානය) | 1 | සිවිල් ඉංජිනේරු/ යාන්ත්‍රික ඉංජිනේරු | | | | | | | |
| 2.1.3 | වත්මන් කසළ එකතු කිරීමේ යාන්ත්‍රණය ඇගයීම, පරතර හඳුනා ගැනීම සහ 2027 වනවිට වැඩි දියුණු කිරීම<br>I.මාර්ග ප්‍රශස්තකරණය (පවතින එකතු කිරීමේ ගමන්මාර්ගය, GPS අධීක්ෂණය යනාදිය වැඩි දියුණු කිරීම)<br>II.කසළ එකතු කිරීම සහ ප්‍රවාහනය අධීක්ෂණය කිරීම සඳහා ජංගම යෙදුම් සහ ඩිජිටල් තාක්ෂණ භාවිත කිරීම<br>III.කසළ මත පදනම් වූ ආදායම් ජනනය මූලප්‍රවාහගත කිරීම | 2 | සිවිල් ඉංජිනේරු | | | | | | | |
| 2.1.4 | අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා භාවිතයට නොගත් යන්ත්‍රසූත්‍ර ඵලදායී ලෙස භාවිත කිරීම | 1 | සිවිල් ඉංජිනේරු | | | | | | | |
| 2.1.5 | මධ්‍යම පරිසර අධිකාරියේ උපදෙස් මත ආසාදක අපද්‍රව්‍ය පුළුස්සා දැමීම සඳහා කුඩා දහන යන්ත්‍රයක් ස්ථාපිත කිරීම | 3 | සිවිල් ඉංජිනේරු | | | | | | | |
| අරමුණ 2: 2026 වනවිට වෘත්තීය නිපුණතා වැඩිදියුණු කිරීම මගින් නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ශ්‍රමබලකාය සඳහා පිළිගැනීම ඉහළ නැංවීම | | | | | | | | | | |
| 2.2.1 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය මත NVQ මට්ටමේ පුහුණුවක් ලබා ගැනීම සඳහා ශ්‍රමබලකායට පහසුකම් සැලසීම | 2 | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී/ නාගරික ලේකම්/ සිවිල් ඉංජිනේරු | | | | | | | |
| 2.2.2 | ශ්‍රමබලකාය සඳහා දිරිගැන්වීම් සහ සුභසාධන පහසුකම් (උදා: සෞඛ්‍ය සේවා) ප්‍රවර්ධනය කිරීම | 1 | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී/ නාගරික ලේකම්/ CDO | | | | | | | |
| 2.2.3 | ශ්‍රමබලකාය සඳහා අවශ්‍ය උපකරණ සහ පුහුණුව ලබා දීම | 1 | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී/ නාගරික ලේකම්/ සිවිල් ඉංජිනේරු/ යාන්ත්‍රික ඉංජිනේරු / CDO | | | | | | | |
| 2.2.4 | තාවකාලික සේවකයන් සඳහා රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීම | 2 | මහා නගර සභාව / ගිණුම් අංශය | | | | | | | |
| අරමුණ 3: 2026 වනවිට අවශ්‍ය වැඩිදියුණු කිරීම් සහිතව ගාල්ල මහා නගර සභාවෙහි කළමනාකරණ යාන්ත්‍රණ සහ මෙවලම් ශක්තිමත් කිරීම | | | | | | | | | | |
| 2.3.1 | නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය ශක්තිමත් කිරීම සහ නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ දත්ත සමුදාය කළමනාකරණය ඇතුළුව ගාල්ල මහා නගර | 1 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය තාක්ෂණික කමිටුව | | | | | | | |

| | | | |
|---|---|---|---|
| | සභාවෙහි ප්‍රධාන නිලධාරීන් සමග සාකච්ඡා කර ISWAMP සම්බන්ධීකරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා කැප වූ ප්‍රධානියෙක් පත් කිරීම | | වගකීම් දරනු ලබන පුද්ගලයා: නාගරික කොමසාරිස් |
| 2.3.2 | ගාල්ල මහා නගර සභාවෙහි ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකයට අවශ්‍ය සම්පත් පිරිස් සහ උපකරණ සමග පහසුකම් සැලසීම | 1 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය තාක්ෂණික කමිටුව |
| **2.3.3** | 2027 වන විට ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකයේ පර්යේෂණ හා සංවර්ධන ඒකකයක් පිහිටු වීම (උදා: ප්‍රජා විශේෂිත විසඳුම්, ගමන්මාර්ග වෙනස්කම්, ආරක්ෂාව සහ පාරිසරික වැඩිදියුණු කිරීම් ආදිය කෙරෙහි අවධානය යොමු කිරීම) | 3 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය තාක්ෂණික කමිටුව |
| 2.3.4 | එක් එක් දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකුගේ සහභාගිත්වයෙන් කසළ ජනනය, එකතු කිරීම, වර්ග කිරීම, අවසන් බැහැර කිරීම, එකතු කිරීම යනාදිය සඳහා යාවත්කාලීන දත්ත සමුදායක් පවත්වා ගෙන යාම (පරිගණක පාදක දත්ත සමුදායක් සහ වැඩසටහනක් සංවර්ධනය කිරීමේ අවශ්‍යතාව) | 1 | මහා නගර සභා කොමසාරිස්/ මහා නගර සභාව |
| 2.3.5 | හදිසි ප්‍රතිචාර යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම (උදා: ජංගම සේවා ඒකකයක් පිහිටුවීම) | 2 | සිවිල් ඉංජිනේරු/ යාන්ත්‍රික ඉංජිනේරු |
| 2.3.6 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ආශ්‍රිත කටයුතු සඳහා දුක්ගැනවිලි නිරාකරණ යාන්ත්‍රණ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම (උදා: මේ සඳහා e-Sabha යෙදුම අභිරුචිකරණය (customize) කිරීම) | 3 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය තාක්ෂණික කමිටුව |
| 2.3.7 | වාර්ෂික ලියාපදිංචි ගාස්තුවක් අයකරමින් අවිධිමත් කසළ එකතු කරන්නන් අධීක්ෂණය කිරීම සහ තාක්ෂණික සහාය ලබාදීම | 2 | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී/ නාගරික ලේකම්/ සිවිල් ඉංජිනේරු / යාන්ත්‍රික ඉංජිනේරු / CDO |
| Objective: To uplift the financial capacity of the ගාල්ල මහා නගර සභාව via managing expenses and strengthening revenue generation by 2026<br>අරමුණ 4( 2026 වනවිට වියදම් කළමනාකරණය සහ ආදායම් ජනනය ශක්තිමත් කිරීම තුළින් මහා නගර සභාවේ මූල්‍ය ධාරිතාව ඉහළ නැංවීම | | | |
| 2.4.1 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් ගාල්ල මහා නගර සභාව විසින් සපයනු ලබන හඳුනාගත් සේවාවන් සඳහා සේවා ගාස්තු අය කිරීම හඳුන්වා දීම (උදා: සැණකෙළියක් පැවැත්වීම තුළින් ජනනය වන කසළ කළමනාකරණය කිරීම) - අය කිරීමේ යෝජනා ක්‍රමය හොඳින් ව්‍යුහගත සහ ප්‍රමාණ පාදක විය යුතු අතර සේවා ලබන්නාට පැහැදිලිව දැනුම් දිය යුතු ය (කසළ අවම කිරීමට හෝ ස්වයං කළමනාකරණය කිරීමට බලපෑම් කිරීම). | 1 | සිවිල් ඉංජිනේරු/ ගිණුම් අංශය |
| 2.4.2 | හීන්පැන්දල, දඩැල්ල සහ PET බෝතල් එකතු කිරීමේ මධ්‍යස්ථානයේ කසළ පිරියම් කිරීමේ මධ්‍යස්ථාන සඳහා සූර්ය පැනල පද්ධතියක් ස්ථාපිත කිරීම | 2 | සිවිල් ඉංජිනේරු/ යාන්ත්‍රික ඉංජිනේරු |
| අරමුණ 5: 2026 වනවිට වර්තමාන නෛතික හා නියාමන මෙවලම්වල අවශ්‍යතාව වැඩිදියුණු කිරීම් තුළින් ගාල්ල මහා නගර සභාවෙහි බලතල ඉහළ නැංවීම | | | |
| 2.5.1 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය නිසි ලෙස කළමනාකරණය කිරීම සහ ISWMAP ක්‍රියාත්මක කිරීම සඳහා නව අතුරු ව්‍යවස්ථා හෝ රෙගුලාසිවලින් | 1 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය තාක්ෂණික කමිටුව |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පියවිය යුතු වත්මන් නීතිමය උපකරණවල පරතර හඳුනා ගැනීම. | | | | | | | | | |
| 2.5.2 | ඉහත පරතර සම්බන්ධයෙන් කෙටුම්පත් කර ඇති අතුරු ව්‍යවස්ථා සඳහා අනුමැතිය ලබාගැනීම/ ISWMAP ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම | 1 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය තාක්ෂණික කමිටුව | | | | | | | |
| අරමුණ 6: 2024 වන විට ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලියේ එක් එක් පියවර සඳහා පුළුල් අධීක්ෂණ හා ඇගයීම් යාන්ත්‍රණයක් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම (උදා: කසළ ජනනය, වෙන් කිරීම, කසළ ජනනය කරන්නන් සහ හසුරුවන්නන් අධීක්ෂණය කිරීම) | | | | | | | | | | |
| 2.6.1 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සහ ඇගයීම සඳහා ළඟා විය හැකි කාලරාමුවක් සහිත පුළුල් අධීක්ෂණ හා ඇගයීම් යාන්ත්‍රණයක් සංවර්ධනය කිරීම. KPIs එරෙහිව කාර්තුමය (මාසික 3) ඇගයීමක් සහ WACS, COSA, පාලන පරතර විශ්ලේෂණය සහ අරමුදල් විකල්ප නිතිපතා අනුගමනය කිරීම/ අඛණ්ඩව සිදු කිරීම (උදා: සෑම වසර 3කට වරක්) | 1 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය තාක්ෂණික කමිටුව | | | | | | | |
| 2.6.2 | දත්ත සහ වලංගුකරණය සංසන්දනය කිරීමෙන් ගාල්ල මහා නගර සභාවෙහි නිත්‍ය එකතු කිරීමේ කාර්යක්ෂමතාව අධීක්ෂණය කිරීම | 1 | මහා නගර සභාව | | | | | | | |
| 2.6.3 | දැනුවත්භාවය වැඩිකිරීම සහ නෛතික ක්‍රියාමාර්ග තුළින් නීති විරෝධී කසළ බැහැර කිරීම 80%ක් අඩු කිරීම. | 1 | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි/ CDO/ නීති නිලධාරි | | | | | | | |
| ඉලක්කය 3: ඵලදායී 3R පාදක ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා දැනුමැති හා කැප වූ පාර්ශ්වකරුවන් | | | | | | | | | | |
| අරමුණ 1: 2025 වනවිට ගාල්ල මහා නගර සභාව සහ පාර්ශ්වකරුවන් අතර වේගවත් හා ඵලදායී ද්වි-මාර්ග සන්නිවේදනයක් සඳහා පුළුල් හා නව වේදිකාවක් වැඩිදියුණු කිරීම සහ ක්‍රියාත්මක කිරීම | | | | | | | | | | |
| 3.1.1 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ආශ්‍රිත කටයුතු සඳහා කැප වූ ගාල්ල මහා නගර සභා වෙබ් අඩවිය හා සම්බන්ධ වෙබ් අඩවියක්/වෙබ් පිටුවක් නිර්මාණය කිරීම | 3 | නාගරික ලේකම්/ CDO | | | | | | | |
| 3.1.2 | වේගවත් හා ඵලදායී ද්වි-මාර්ග සන්නිවේදනයක් සඳහා e-Sabha යෙදුම ප්‍රවර්ධනය කිරීම | 1 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය තාක්ෂණික කමිටුව | | | | | | | |
| 3.1.3 | වේගවත් හා ඵලදායී ද්වි-මාර්ගසන්නිවේදනයක් සඳහා WhatsApp කණ්ඩායම්/ වෙබ්පිටුව/ ෆේස්බුක් පිටු භාවිතය ප්‍රවර්ධනය කිරීම | 1 | නාගරික ලේකම්/ CDO | | | | | | | |
| 3.1.4 | සන්නිවේදන කටයුතු සඳහා ගාල්ල මහා නගර සභාව හා දුරකථනයෙන් සම්බන්ධ විය හැකි අංකයක් එකතු කිරීම | 2 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය තාක්ෂණික කමිටුව | | | | | | | |
| අරමුණ 2: මහා පරිමාණ හා බලපෑම් සහිත කසළ ජනනය කරන්නන්/ ක්‍රියාකාරකම් සංවිධායකයන් සතුව ගාල්ල මහා නගර සභාවේ ISWMAP අනුකූලව සකස් කරන ලද පුළුල් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලසුම් විසින් සහතික කිරීම | | | | | | | | | | |
| 3.2.1 | තොග වශයෙන් කසළ ජනනය කරන්නන්/ ක්‍රියාකාරකම් සංවිධායකයන් හඳුනා ගැනීම සඳහා නිර්ණායක ලැයිස්තුවක් සකස් කිරීම | 1 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය තාක්ෂණික කමිටුව | | | | | | | |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | |
| 3.2.2 | කසළ ජනනය අඩු කිරීම (විශේෂයෙන් ප්ලාස්ටික් අපද්‍රව්‍ය), කසළ ප්‍රතිචක්‍රීකරණය, කසළ වෙන් කිරීම සහ ගබඩා පහසුකම් සැපයීම සහ කළමනාකරණය කිරීම සහ විවිධ වර්ගයේ කසළ නිසි ලෙස බැහැර කිරීම සඳහා ක්‍රියාමාර්ග නියම කිරීම මගින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම නෛතික අවශතාවයක් බවට පත් කිරීම. | 1 | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී/ CDO | | | | | | | |
| 3.2.3 | අදාළ සංවිධානවල 3R/ඝන අපද්‍රව්‍ය කළමනාකරණය හැසිර වීමට සුදුසුකම් ලත් (උදා: NVQ) 3R/ඝන අපද්‍රව්‍ය කළමනාකරණ නිලධාරියෙකු සිටීම සඳහා ඵලදායී කසළ ජනනය කරන්නන්/ ක්‍රියාකාරකම් සංවිධායකයන් (විශාල හා අන්තරායකර අපද්‍රව්‍ය ජනනය කරන්නන්) සඳහා අවශ්‍යතාවයක් බවට පත් කිරීම. | 2 | ඉංජිනේරු දෙපාර්තමේන්තුව/ සෞඛ්‍ය අමාත්‍යාංශය / CDO/ ගිණුම් අංශය | | | | | | | |
| අරමුණ 3: 2030 වනවිට දැනුම බෙදා හදා ගැනීම සහ ආකල්පමය වෙනසක් සඳහා පුළුල් වැඩසටහනක් හරහා පාර්ශ්වකරුවන් අතර ධනාත්මක සමාජ හැසිරීම් වෙනසක් සහතික කිරීම | | | | | | | | | | |
| 3.3.1 | නව ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ආශ්‍රිත භාවිතාවන් පිළිබඳ විශ්වවිද්‍යාල, පෞද්ගලික අංශයේ ආයතන සහ අනෙකුත් අදාළ පාර්ශවයන් තුළ නිර්මාණය කරන ලද නව දැනුම අවශෝෂණය කර බෙදා ගැනීම සඳහා වේදිකාවක් නිර්මාණය කිරීම (ගාල්ල මහා නගර සභාවෙහි යෝජිත පර්යේෂණ හා සංවර්ධන අංශයට අනුබද්ධ) | 1 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය තාක්ෂණික කමිටුව | | | | | | | |
| 3.3.2 | අවශ්‍යතා තක්සේරුවක් මත පදනම්ව විවිධ පාර්ශ්වකරුවන් සඳහා අඛණ්ඩ දැනුම වැඩිදියුණු කිරීම සහ පුහුණුව ලබා දීම<br>1. රජයේ නිලධාරීන්/ හෝටල්/ කර්මාන්ත ප්‍රජාව/ සංචාරකයන් ආදිය. | 1 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය තාක්ෂණික කමිටුව | | | | | | | |
| 3.3.3 | දිගු කාලීන සමාජ හැසිරීම් වෙනස් කිරීම අරමුණු කරගත් විශේෂිත කණ්ඩායම් (උදා: කාන්තාවන්, තරුණයන්, පාසල්, දහම්පාසල්, තරුණයන්, උපකාරක පන්ති ආදිය) සඳහා 3R/ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ පුහුණුව සහ දැනුවත්භාවය ලබාදීම. | 1 | නාගරික ලේකම්/ CDO | | | | | | | |
| 3.3.4 | පාසල් මට්ටමින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ භාවිතාවන් ප්‍රවර්ධනය කිරීමට සහ පාසල් විෂයමාලාව තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ආශ්‍රිත දැනුම ඇතුළත් කිරීමේ හැකියාව සොයා බැලීමට අදාළ රජයේ ආයතනවලින් ඉල්ලා සිටීම. | 2 | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී/ CDO | | | | | | | |
| 3.3.5 | නව්‍ය සන්නිවේදන මෙවලම් (උදා: ඩිජිටල් පුවරු සහ වීදි නාට්‍ය) හරහා විශේෂිත කණ්ඩායම් සඳහා 3R/ ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේ මනා පරිචයන් පිළිබඳව දැනුවත්කිරීම | 1 | CDO | | | | | | | |
| 3.3.6 | අනන්‍ය හා සැලකිය යුතු කසළ ගැටලු ඇති කණ්ඩායම් සඳහා විශේෂිත දැනුවත් කිරීමේ සැසි සංවිධානය කිරීම (උදා: ආගමික ස්ථාන) | 1 | CDO | | | | | | | |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| අරමුණ 4: 2026 වන විට දැනට සිටින ක්‍රියාකාරීන්, ස්වේච්ඡා කණ්ඩායම් සහ සංචාරකයන් ගාල්ල මහා නගර සභා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියට 3R/ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ආදර්ශ ලෙස (උදා: ඝන අපද්‍රව්‍ය කළමනාකරණ හදිසි අවස්ථාවල දී ක්‍රියා කිරීම, වැරදි ක්‍රියා හඳුනා ගැනීම සහ ක්‍රියා කිරීම යනාදිය) අවශෝෂණය කර ගැනීම | | | | | | | | | | |
| 3.4.1 | මනා පරිචයන් හඳුනා ගැනීම හා ඒ සඳහා පහසුකම් සැලසීම, සහ පිළිබඳ දැනුම හුවමාරු කරගැනීම සහ සමාජ හැසිරීම් වෙනස් කිරීම සඳහා එම භාවිතාවන් යොදා ගැනීම (උදා: දිරිගැන්වීම්, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය හරහා පාරිසරික සංචාරක ව්‍යාපාරය සහ සෞඛ්‍ය සංචාරක ව්‍යාපාර) | 2 | සිවිල් ඉංජිනේරු/සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී/ CDO | | | | | | | |
| 3.4.2 | ස්වේච්ඡා ක්‍රියාකාරකම් සඳහා ගාල්ල මහා නගර සභාවෙහි අනුමැතිය ලබාදීමේ ක්‍රියාවලියක් ස්ථාපිත කිරීම | 1 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය තාක්ෂණික කමිටුව | | | | | | | |
| 3.4.3 | ගාල්ල මහා නගර සභා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියේ ක්‍රියාකාරීන්, ස්වේච්ඡා සේවකයන් (උදා: කාන්තා/ තරුණ නායකයන්) සහ සංචාරකයන් සම්බන්ධ කරගැනීම | 1 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය තාක්ෂණික කමිටුව | | | | | | | |
| 3.4.4 | වැරදි හඳුනා ගෙන ක්‍රියා කිරීමට ස්වේච්ඡා සුපරීක්ෂක කණ්ඩායම් ප්‍රවර්ධනය කිරීම. | 1 | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී/ CDO | | | | | | | |
| 3.4.5 | ශිෂ්‍ය කණ්ඩායම් ප්‍රවර්ධනය (පාසල් මට්ටමින්) ස්වේච්ඡා හා සුපරීක්ෂක කණ්ඩායම් ලෙස. | 1 | CDO | | | | | | | |
| 3.4.6 | පාසැල් මට්ටමින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ තරග, විවාද සහ ප්‍රදර්ශන සංවිධානය කිරීම | 2 | නාගරික ලේකම්/ CDO/සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී | | | | | | | |
| 3.4.7 | පිරිසිදු නගරයක් සඳහා යහපත් භාවිතයන් සහ කැපවීම අගය කිරීම සඳහා ජනාවාස අතර තරග සංවිධානය කිරීම | 3 | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී/ නාගරික ලේකම්/ CDO | | | | | | | |
| 3.4.8 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණයෙහි සේවය කරන ස්වේච්ඡා පාරිසරික කණ්ඩායම් සහ සමිති සඳහා දිරිගැන්වීම්/ පිළිගැනීම් ලබාදීම | 2 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ තාක්ෂණික කමිටුව / CDO/සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී/ ඉංජිනේරු දෙපාර්තමේන්තුව | | | | | | | |
| ඉලක්කය 4: 3R/ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාමාර්ග සඳහා කැප වූ පාර්ශ්වකරුවන්ගේ සහයෝගී ජාලය | | | | | | | | | | |
| **අරමුණ 1: 2024 වන විට ඒකපුද්ගල පාර්ශ්වකරුවන්ට සහ නගරයට බලපාන 3R/ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ කාරණා සාකච්ඡා කිරීම සඳහා නිතිපතා රැස්වන, ගාල්ල මහා නගර සභාව පිළිගත් පාර්ශ්වකරුවන්ගේ සංසදයක් පැවැත්වීම** | | | | | | | | | | |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 4.1.1 | CACG ව්‍යාපෘතිය යටතේ ස්ථාපිත වත්මන් පාර්ශ්වකරුවන්ගේ සංසදය ගාල්ල මහා නගර සභා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ආයතනික සැකැස්ම බවට පත්කිරීම සහ නීතියෙන් ගාල්ල මහා නගර සභාව හරහා එයට නීත්‍යානුකූල පිළිගැනීමක් ලබාදීම | 1 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය තාක්ෂණික කමිටුව | | | | | | | |
| 4.1.2 | සංයුතිය නිර්වචනය, තීරණ ගැනීමේ ප්‍රොටොකෝලය, SHFහි වාර ගණන සහ කාර්යභාරය වගකීම (උදා: කාර්තුමය රැස්වීම්) | 1 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය තාක්ෂණික කමිටුව | | | | | | | |
| 4.1.3 | ගාල්ල මහා නගර සභාවහි 3R/ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය අධීක්ෂණය කිරීම, ඇගයීම සහ නඩත්තු කිරීම සම්බන්ධයෙන් තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහභාගී වීමට SHFහි හඳුනාගත් සාමාජිකත්වයට පහසුකම් සැලසීම | 2 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය තාක්ෂණික කමිටුව | | | | | | | |
| **අරමුණ 2: 2025 වන විට ගාල්ල මහා නගර සභා ප්‍රදේශය තුළ SWM කළමනාකරණයට අදාළව ක්‍රියා කරන පුද්ගලයන්/ ආයතන ලියාපදිංචි කිරීම සහ කළමනාකරණය කිරීමේ ක්‍රියාවලියක් ස්ථාපිත කිරීම** | | | | | | | | | | |
| 4.2.1 | MSW එකතු කිරීම, ප්‍රවාහනය, ප්‍රතිචක්‍රීකරණය සඳහා සූදානම් කිරීම සහ බාහිර අරමුදල් සහිතව රාජ්‍ය නොවන සංවිධානයේ ව්‍යාපාර/ ජීවන/ ස්වේච්ඡා ක්‍රියා මාර්ගයක්/ ක්‍රියාමාර්ගයක් ලෙස අවසන් බැහැර කිරීම සඳහා ගාල්ල මහා නගර සභාවේ ලියාපදිංචිය ලබාගැනීම සහ සරල ලියාපදිංචි කිරීමේ ක්‍රියාපටිපාටියක් හඳුන්වාදීම අනිවාර්ය කිරීම | 1 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය තාක්ෂණික කමිටුව | | | | | | | |
| 4.2.2 | එක් එක් පුද්ගලයා/ආයතනය විසින් මෙහෙයවනු ලබන MSW ප්‍රවර්ග/ ප්‍රමාණ සමඟ එය එකතු කර යාවත්කාලීන කිරීම සඳහා යාන්ත්‍රණයක් සහිත දත්ත සමුදායක් පිහිටුවීම | 2 | නාගරික ලේකම්/ CDO | | | | | | | |
| 4.2.3 | ගාල්ල මහා නගර සභාව තුළ ඵලදායී ආකාරයෙන් කසළ හැසිරවීම සඳහා අවශ්‍ය පරිදි ආයතන/ පුද්ගලයන් අතර තොරතුරු හුවමාරු කර ගැනීමට සහ සම්බන්ධ කිරීමට පහසුකම් සැලසීම | 3 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය තාක්ෂණික කමිටුව | | | | | | | |
| **අරමුණ 3( 2024 වන විට විකල්ප නිෂ්පාදන සංවර්ධකයන් දිරිමත් කිරීම සහ ඵලදායී 3R/ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා නගර පාර්ශ්වකරුවන් සමග සම්බන්ධ කිරීමට පහසුකම් සැලසීම** | | | | | | | | | | |
| 4.3.1 | අපද්‍රව්‍ය අඩු කිරීම (උදා: කාන්තා විකල්ප නිෂ්පාදන වැඩිදියුණු කරන්නන්/නිෂ්පාදකයන්) ප්ලාස්ටික්/පොලිතින්උපකරණ ප්‍රතිස්ථාපනය කිරීම සඳහා විකල්ප නිෂ්පාදන සංවර්ධකයන් සොයාගැනීම සහ අනාගත ගැනුම්කරුවන් (එනම් හෝටල්, කර්මාන්ත සහ කාර්යාල වැනි පරිශීලකයන්) සමග සම්බන්ධ කිරීම පහසු කිරීම. | 1 | සිවිල් ඉංජිනේරු/සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී/ CDO | | | | | | | |
| 4.3.2 | විකල්ප නිෂ්පාදන සංවර්ධකයන් (විශේෂයෙන් කාන්තාවන් පදනම් කරගත් සංවිධාන හරහා) අපද්‍රව්‍ය ඉහළ නැංවීමේ විකල්පයක් ලෙස භාවිත කිරීම සහ විභව අමුද්‍රව්‍ය සැපයුම්කරුවන් (කසළ ජනනය කරන්නන්/එකතු කරන්නන්) සහ ගැනුම්කරුවන්/ වෙළඳපොළ ස්ථාන සමග සම්බන්ධ කිරීමට පහසුකම් සැලසීම | 1 | සිවිල් ඉංජිනේරු/සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී/ CDO | | | | | | | |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 4.3.3 | සන අපද්‍රව්‍ය කළමනාකරණයේ ව්‍යවසායකයන් (විශේෂයෙන් කාන්තාවන් සහ තරුණයන්) ශක්තිමත් කිරීම සහ ගාල්ල මහා නගර සභාව සහ නව ව්‍යවසායකයන් අතර සම්බන්ධතාවයක් ගොඩ නඟා ගැනීම | 2 | සන අපද්‍රව්‍ය කළමනාකරණය තාක්ෂණික කමිටුව | | | | | | | |
| අරමුණ 4: 2025 වනවිට ගාල්ල මහා නගර සභාවෙහි ඵලදායී 3R/සන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාමාර්ග සඳහා පහසුකම් සැලසීම සඳහා ජාත්‍යන්තර/ ජාතික/ප්‍රාදේශීය ආයතන සමග පවත්නා සහයෝගී සබඳතා ස්ථාපිත කිරීම/වැඩිදියුණු කිරීම | | | | | | | | | | |
| 4.4.1 | වෙනත් හවුල්කරුවන් සමග සහයෝගී සබඳතා ගොඩ නඟාගැනීමට සහ 3R/සන අපද්‍රව්‍ය කළමනාකරණයේ මනා පරිචයන් සඳහා ගෝලීය හා ජාතික පිළිගැනීමක් ලබාගැනීම සඳහා මෙම විශේෂිත විෂයය සඳහා කටයුතු කිරීමට ගාල්ල මහා නගර සභා සන අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය තුළ වගකිව යුතු නිලධාරියෙකු නම් කිරීම | 1 | නාම යෝජනාකරු: නියෝජ්‍ය නාගරික කොමසාරිස් | | | | | | | |
| 4.4.2 | ප්‍රයෝජනවත් ආයතන හඳුනාගෙන ගාල්ල මහා නගර සභාවහි 3R/සන අපද්‍රව්‍ය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා සහයෝගී ක්‍රියාකාරකම්/යාන්ත්‍රණ ගොඩ නඟාගැනීම (උදා: CityNet අත්දැකීම් හුවමාරුව, ජාතික සන අපද්‍රව්‍ය ආධාරක මධ්‍යස්ථානය-තාක්ෂණික සහ මූල්‍ය ආධාරක සැපයුම්කරු, සහ තාක්ෂණික යෙදවුම් සඳහා විශ්වවිද්‍යාල) | 1 | නියෝජ්‍ය නාගරික කොමසාරිස් | | | | | | | |
| 4.4.3 | ගාල්ල මහා නගර සභාවහි 3R/ සන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා සුදුසු ව්‍යාපාරික ආකෘති හඳුනා ගැනීම (උදා: PPP) | 1 | සන අපද්‍රව්‍ය කළමනාකරණය තාක්ෂණික කමිටුව | | | | | | | |
| 4.4.4 | කසළ එකතු කරන්නන් ලියාපදිංචි කර සන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියේ නිශ්චිත කොටස් ඔවුන් වෙත භාර දීමට අවස්ථාවක් සොයා ගැනීම. | 1 | සන අපද්‍රව්‍ය කළමනාකරණය තාක්ෂණික කමිටුව | | | | | | | |
| 4.4.5 | ගාලුකොටුව ලෝක උරුමයක් ලෙස කීර්තිමත් කිරීම සඳහා විශේෂිත සන අපද්‍රව්‍ය කළමනාකරණ යාන්ත්‍රණයක් හඳුන්වා දීමට යුනෙස්කෝවේ මාර්ගෝපදේශ අනුගමනය කිරීම | 1 | සන අපද්‍රව්‍ය කළමනාකරණය තාක්ෂණික කමිටුව | | | | | | | |
| 4.4.6 | 2025 වනවිට වත්මන් නව්‍ය 3R/ සන අපද්‍රව්‍ය කළමනාකරණ භාවිත සහ නියමු නව භාවිත පෝෂණය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා ශාස්ත්‍රීය අංශය සමග සම්බන්ධතා ඇති කර ගැනීම. | 2 | සන අපද්‍රව්‍ය කළමනාකරණ තාක්ෂණික කමිටුව/ මහා නගර සභාව | | | | | | | |
| ඉලක්කය 5: අනුවර්තතනය කළ හැකි, නිර්මාණාත්මක හා නව්‍ය සන අපද්‍රව්‍ය කළමනාකරණ විසඳුම් සහිත ආදර්ශ නගරයක් | | | | | | | | | | |
| **අරමුණ 1( ගාලු නගරය 3R/සන අපද්‍රව්‍ය කළමනාකරණයෙහි ආදර්ශ නගරයක් බවට පරිවර්තනය කිරීම පිළිබඳව විස්තීර්ණ හා පරිශීලක හිතකාමී දත්ත සමුදායක්/ද්‍රව්‍ය එකතුවක් 2025 වනවිට පවත්වා ගැනීම.** | | | | | | | | | | |

| | | | |
|---|---|---|---|
| 5.1.1 | 2030 වන විට 3R/ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමත් සමග නගරයේ පරිවර්තනය වාර්තා කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම | 2 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ තාක්ෂණික කමිටුව/ මහා නගර සභාව |
| 5.1.2 | 2025 වන විට ශ්‍රී ලංකාවේ පිරිසිදුම නගරය බවට පත් කිරීම සඳහා ගාල්ල මහා නගර සභාව විසින් අනුගමනය කරන ලද සමස්ත ක්‍රියාවලිය වාර්තාකර ප්‍රකාශයට පත් කිරීම. | 1 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ තාක්ෂණික කමිටුව/ මහා නගර සභාව |
| 5.1.3 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා භාවිත කරන නව දැනුම, මෙවලම්, ක්‍රියාපටිපාටි සහ තාක්ෂණය වාර්තා කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම<br>I. සහයෝගී ප්‍රවේශ, අරමුදල් විකල්ප, පාලනය සහ ක්‍රියාවලියේ 3R සහ ආරක්ෂිත බැහැර කිරීම් වැනි අංශවල භූමිකා ආකෘති වාර්තා කිරීම සහ ප්‍රකාශයට පත්කිරීම | 1 | මහා නගර සභාව |
| 5.1.4 | ගාල්ල මහ නගර සභාවේ ප්‍රසිද්ධ ස්ථාන/ සංචාරක ස්ථාන සහ විශේෂ ප්‍රදේශ පිළිබඳ වාර්තාගත අපද්‍රව්‍ය කළමනාකරණ දත්ත සහ තොරතුරු ලබා දීම | 3 | මහා නගර සභාව |
| 5.1.5 | දත්ත සහ තොරතුරු පටිගත කිරීම සඳහා අධීක්ෂණ හා ඇගයීම් පද්ධතියක් හඳුන්වා දීම | 1 | මහා නගර සභාව |
| **අරමුණ 2: 2024 වනවිට ගාල්ල මහා නගර සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකයේ කැප වූ කණ්ඩායමක් පිහිටුවීම, 3R/ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේ දී උගත් ප්‍රධාන ආකෘති/ පාඩම් ප්‍රතිනිර්මාණය කිරීම සඳහා දැනුම බෙදාගැනීම ප්‍රවර්ධනය කිරීම සහපහසුකම් සැපයීම තුළින් තිරසරභාවය සහතික කිරීම** | | | |
| 5.2.1 | ගාල්ල මහා නගර සභාවහි 3R/ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ නවෝත්පාදනවල ප්‍රධාන නිලධාරීන්, අදාළ පාර්ශ්වකරුවන්ගේ නියෝජිතයන්, සමාජ කණ්ඩායම්, ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සහ තාක්ෂණික, කළමනාකරණ සහ සමාජීය අංශවල ස්වේච්ඡා කණ්ඩායම් විශේෂ අවශ්‍යතාව හඳුනාගෙන ඔවුන් ප්‍රවර්ධන/ තානාපතිවරුන් ලෙස පුහුණු කිරීම. | 3 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය තාක්ෂණික කමිටුව |
| 5.2.2 | 3R/ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ නවෝත්පාදන අවශෝෂණය කරගැනීම සඳහා සංචාරක, පරිසර කළමනාකරණය සහ යහපාලන අංශවල ප්‍රධාන පාර්ශ්වකරුවන් සමග සම්බන්ධතා ඇති කරගැනීම සහ ගාල්ල තුළින් උගත් 3R/ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ආශ්‍රිත ප්‍රධාන ආකෘති/ පාඩම් ප්‍රවර්ධනය කිරීම. | 2 | සෞඛ්‍ය/ ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ වෛද්‍ය නිලධාරී/ CDO/ මහා නගර සභාව |
| 5.2.3 | යෝජිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය සඳහා පුහුණු කාර්ය මණ්ඩලයක් පත් කිරීම සහ රජයේ කාර්ය මණ්ඩල ස්ථාන මාරු ක්‍රියාවලිය සඳහා පද්ධතියක් සංවර්ධනය කිරීම | 2 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය තාක්ෂණික කමිටුව |

| අරමුණ 3: 2030 වනවිට 3R/ ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේ නව්‍ය භාවිත/ ලෝක උරුම අඩවි කළමනාකරණය සඳහා ජාතික හා ජාත්‍යන්තර "තත්ත්ව ප්‍රමිතී" සහ "සම්මාන" ලබා ගැනීම | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 5.3.1 | ගාල්ල මහා නගර සභාවෙහි ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය විසින් ඉලක්ක ගත ප්‍රදේශවල පවතින "තත්ත්ව ප්‍රමිති" සහ "සම්මාන" හඳුනා ගෙන, හඳුනාගත් තත්ත්ව ප්‍රමිති සහ සම්මාන ලබා ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම. | 1 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය තාක්ෂණික කමිටුව | | | | | | | |

# 13. ප්‍රමුඛ කාර්යසාධන දර්ශක

ඉලක්කගත කාලරාමුව තුළ ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ සාර්ථකත්වය හෝ ප්‍රගතිය මැනීම සඳහා භාවිත කළ යුතු ප්‍රමුඛ කාර්ය සාධන දර්ශක (KPIs) මෙම පරිච්ඡේදය මඟින් ඉදිරිපත් කෙරේ. ඉලක්ක, අරමුණු හා උපාය මාර්ග, සහ BWAS, WACS සහ COSA වාර්තාවන්ගෙන් රැස්කර ගන්නා ලද පවතින දත්ත මත පදනම්ව මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශක හඳුනාගෙන ප්‍රමාණ කර ඇත. යෝජිත ප්‍රමුඛ කාර්ය සාධන දර්ශක සාක්ෂාත් කර ගෙන තිබේ ද, එසේ නොවන්නේ නම් මුහුණ පෑමට සිදුව ඇති අභියෝග කවරේද සහ නිශ්චිත කාලරාමුවක් තුළ, අපේක්ෂිත ඉලක්ක හා අරමුණු සාක්ෂාත් කර ගැනීමට එකී අභියෝගවලට විසඳුම් ලබා දුන්නේ කෙසේද යන්න තක්සේරු කිරීම සඳහා ප්‍රධාන නිලධාරීන්ගේ නියෝජනය සමග ගාල්ල මහා නගර සභාවෙහි නිත්‍ය අධීක්ෂණ සහ ඇගයීම් ක්‍රමයක් ක්‍රියාත්මක වීම වැදගත් වේ.

ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැංවීමේ සාර්ථකත්වය මැනීම සඳහා සකස් කරන ලද ප්‍රමුඛ කාර්ය සාධන දර්ශකයන්හි සාරාංශයක් පහත වගුවේ දැක්වේ. කසළ ජනන/එකතු කරන ප්‍රමාණයන් සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලිය කාලයත් සමග වෙනස් වීම සහ මෙම ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා ගාල්ල මහා නගර සභා සම්පත් උපයෝජ්‍යතාව ඇගයීමෙන් අනතුරුව නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ඒකකය විසින් ප්‍රධාන නිලධරයන් විමසා මෙම කාර්ය සාධන දර්ශක සංශෝධනය (උදා: නව KPI ඇතුළත් කිරීම හෝ KPI ඉලක්ක වෙනස් කිරීම) කළ හැකි ය.

*වගුව 17:* ප්‍රමුඛ කාර්ය සාධන දර්ශකයන්හි *වත්මන් තත්ත්වය හා ඉලක්ක*

| යොමු අංකය | ප්‍රමුඛ කාර්යසාධන දර්ශකය (KPI) | වත්මන් තත්ත්වය | ඉලක්කය (2030 වන විට) |
|---|---|---|---|
| 1 | ගාල්ල මහා නගර සභා පරිශ්‍රය ඇතුළත කසළ ජනනය අඩු කිරීමේ මුළු එකතුව | වත්මන් ඒක පුද්ගල ජනනය=එක් දිනකට කිලෝග්‍රෑම් 0.66 | 0.5 kg/day එක් දිනකට කිලෝග්‍රෑම් 0.5 |
| 2 | ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණයක් සඳහා ගාල්ල මහා නගර සභාව සමග සාමූහිකව වැඩ කරන ආයතන ගණන | දළ වශයෙන් 40 | 75 |
| 3 | කසළ ඒකරාශි කරන්නන් / අවිධිමත් කසළ එකතු කරන්නන් විසින් එකතු කරන ලද ද්‍රව්‍යමය කසළ ප්‍රමාණය | දළ වශයෙන් මසකට මෙ.ටො 61.9 (වියළි කසළ ජනනයෙන් 7.1%ක ප්‍රමාණයක්) | මසකට මෙ.ටො 173 (වියළි කසළ ජනනයෙන් 20%ක ප්‍රමාණයක්) |
| 4 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ශ්‍රම බලකායේ කාන්තා/ තරුණ සහභාගීත්වයේ වර්ධනය | අවමයකි | තරුණ ප්‍රජාව - 40% කාන්තාවන් - 10% |
| 5 | ගාල්ල මහා නගර සභාවේ ලියාපදිංචි වී තිබෙන විකල්ප නිෂ්පාදකයන් / නිෂ්පාදන වැඩිදියුණු කරන්නන් සංඛ්‍යාව | දත්ත නොමැත | 100 (60/100 හෝ ඊට වැඩි කාන්තාවන් ප්‍රමාණයක් සහ 30/100 හෝ ඊට වැඩි තරුණ සහභාගීත්වයක්) |
| 6 | ස්වෙච්ඡා සේවකයන්/ ස්වෙච්ඡා කණ්ඩායම් වශයෙන් හසුරුවනු ලබන අපද්‍රව්‍ය ප්‍රමාණය | දත්ත නොමැත | මෙ.ටො 7.5 |

| | | | |
|---|---|---|---|
| 7 | නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ආදායම් වර්ධනය | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මුළු වියදමෙන් 6%ක මුළු ආදායම් ගණනය | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මුළු වියදමෙන් 50%ක් ආවරණය කර ගැනීම සඳහා ආදායම වර්ධනය කිරීම |
| 8 | ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා නෛතික ලේඛන ගණන | 1 | 3 |
| 9 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේ මනා පරිචය උදෙසා ගාල්ල මහා නගර සභාව විසින් ලබා ගත් සම්මාන/ සහතික ප්‍රමාණය | 0 | 7 |
| 10 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා බාහිර පාර්ශ්වකරුවන්ගෙන් ලබාගත් ආයෝජන ප්‍රමාණය | දත්ත නොමැත | රුපියල් 7,000,000 |
| 11 | සමාජ හැසිරීම් වෙනසක් අරමුණු කර ගනිමින් පවත්වන ලද අවස්ථා (උදා- ව්‍යාපාර, දැනුවත්භාවය ඇති කිරීමේ සැසි, තරග) ගණන | දත්ත නොමැත | 20 |

එක් එක් ප්‍රධාන කාර්යසාධන දර්ශකය ඒවායෙහි අදාළත්වය සහ වැදගත්කම දක්වමින් පහත විස්තර කර ඇත.

1. ගාල්ල මහා නගර සභා ප්‍රදේශය තුළ ජනනනය වන කසළ සමස්ත අඩු කිරීම

සියලුම ගෘහස්ථ, වාණිජ, කර්මාන්ත, සේවා සහ අනෙකුත් අංශවලින් ගාල්ල මහා නගර සභාව ප්‍රදේශය තුළ ජනනය වන කසළ සම්පූර්ණයෙන් අඩු කිරීම ගාල්ල මහා නගර සභාව ප්‍රදේශය තුළ ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ සමස්ත සාර්ථකත්වයේ ඇඟවීමකි. කසළ ජනනය සැලකිය යුතු ලෙස අඩු කිරීම මෙම ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්මෙහි ගාමක සංකල්පය වන 3R පාදක ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පද්ධතියක ප්‍රමුඛ ජයග්‍රහණවලින් එකකි. ගාල්ල මහා නගර සභා ප්‍රදේශයේ සිදු කරන ලද කසළ විභණනය සහ අනුලක්ෂණ අධ්‍යයනයෙහි අනාවරණයන්ට අනුව, ඒක පුද්ගල කසළ ජනනය දිනකට කිලෝග්‍රෑම් 0.66කි. 2030 වන විට මෙම ප්‍රමාණය දිනකට කිලෝග්‍රෑම් 0.5 දක්වා අඩු කිරීමට අපේක්ෂා කරන අතර එය පුළුල් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය යටතේ සුවිසල් ජයග්‍රහණයක් වනු ඇත.

2. සහයෝගිත්ව ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ගාල්ල මහා නගර සභාව සමඟ සාමූහිකව ක්‍රියා කරන ආයතන සංඛ්‍යාව

සහයෝගිත්ව ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ගාල්ල මහා නගර සභාව සමඟ සාමූහිකව ක්‍රියා කරන ආයතන සංඛ්‍යාව මගින්, නගරය තුළ අනෙකුත් පාර්ශ්වකාර සංවිධාන සමඟ වැඩ කිරීමට ගාල්ල මහා නගර සභාව කෙතරම් විවෘත ද යන්න සහ සහයෝගී ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ප්‍රවේශයක් සඳහා එම සංවිධානවල කැපවීම පෙන්නුම් කෙරේ. පාර්ශ්වකරුවන්ගේ සංසදයේ සක්‍රීයව නිරත වීම, මූල්‍ය හා තාක්ෂණික සහාය සැපයීම, ගාල්ල මහා නගර සභා දැනුවත් කිරීමේ වැඩසටහන්, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ව්‍යාපාර ආදියට සහභාගී වීම සහ ඔවුන්ගේම ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

පද්ධති වැඩිදියුණු කිරීම, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පද්ධතියේ ඇතැම් කොටස් භාර ගැනීම සඳහා ගාල්ල මහා නගර සභාව සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම, ස්වේච්ඡා සේවකයන් ලෙස සහභාගී වීම යනාදිය මගින් ගාල්ල මහා නගර සභාව සමඟ සහයෝගිත්වයෙන් කටයුතු කරන ආයතන/ සංවිධාන හරහා මෙම සංඛ්‍යාව ලබා ගත හැකි ය. මෙම දර්ශකය යටතේ අස්ථිත්වයක් ලෙස ගණන් ගැනීමට, ගාල්ල මහා නගර සභාව හෝ අදාළ ආයතනය මෙම සහයෝගී ක්‍රියාමාර්ග තුළින් දෘශ්‍යමාන අන්‍යෝන්‍ය ප්‍රතිලාභයක් ලබා තිබීම අත්‍යවශ්‍ය වේ.

3. කසළ ඒකරාශි කරන්නන් /අවිධිමත් කසළ එකතුකරන්නන් විසින් එකතු කරනු ලබන ද්‍රව්‍යමය කසළ ප්‍රමාණය වැඩි කිරීම

කසළ ඒකරාශි කරන්නන් (aggregators)/අවිධිමත් කසළ එකතුකරන්නන් (IWCs) විසින් එකතු කරන ද්‍රව්‍යමය කසළ ප්‍රමාණය, කසළ එකතු කිරීමේ දී, විශේෂයෙන්ම නැවත භාවිතයට සහ ප්‍රතිචක්‍රීකරණයට අවශ්‍ය ද්‍රව්‍ය ප්‍රතිසාධනය කිරීමේ දී සහ අවසානයේ දී ස්වභාවික පද්ධතිවලට කසළ එක්වීම වැළැක්වීම සඳහා පෞද්ගලික අංශයේ/පෞද්ගලික ව්‍යවසායකයන්ගේ සෘජු මැදිහත්වීම පෙන්නුම් කරයි. මෙම තොරතුරු අඛණ්ඩව වාර්තා කිරීම සඳහා, ගාල්ල මහා නගර සභාවෙහි ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පද්ධතිවල කැපවීම සහ ප්‍රගතිය පිළිබඳව නැවතත් හොඳ ඇඟවුමක් වේ. කසළ ඒකරාශී කරන්නන්/ අවිධිමත් කසළ එකතුකරන්නන් විධිමත් ලෙස හඳුනා ගැනීමට සහ ඔවුන් සමඟ සම්බන්ධ වීමට ගාල්ල මහා නගර සභාව සතුව පුළුල් යාන්ත්‍රණයක් තිබීම ද වැදගත් වේ. මූලික කසළ තක්සේරු සමීක්ෂණය යටතේ කඩිනම් තක්සේරුවේ ප්‍රතිඵලවලට අනුව, කසළ ඒකරාශි කරන්නන් විසින් ගාල්ල මහා නගර සභාව ප්‍රදේශය තුළ මසකට ලෝහ මෙට්‍රික් ටොන් 27.6ක්, PET බෝතල් මෙ.ටොන් 7.8ක්, HDPE මෙ.ටොන් 4.7ක්, පොල්කටු මෙට්‍රික් ටොන් 9ක් සහ කාඩ්බෝඩ් මෙට්‍රික් ටොන් 12.8ක් එකතු කරනු ලැබේ. මසකට ද්‍රව්‍ය මෙ.ටොන් 61.9 කි. මෙය ගාල්ල මහා නගර සභාව ප්‍රදේශයේ මාසික වියළි කසළ එකතුවෙන් ආසන්න වශයෙන් 7.2% කි (මෙ.ටොන් 864.3න් මෙ.ටොන් 61.9). නගරය තුළ සහයෝගී සහ ඵලදායී ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා, මෙය 2030 වන විට ආසන්න වශයෙන් 20% දක්වා වැඩි කිරීමට අපේක්ෂා කළ හැකි ය.

4. ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ශ්‍රම බලකායෙහි කාන්තා සහ තරුණ සහභාගිත්වය වැඩි කිරීම

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ශ්‍රම බලකායේ කාන්තා සහ තරුණ (වයස 18 සිට 24 දක්වා) සහභාගිත්වය වැඩිවීම කාන්තාවන්ගේ සහ තරුණයන්ගේ සක්‍රීය දායකත්වය සහතික කරන්නා වූ සහ තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා සහභාගීත්ව ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ක්‍රියාවලියක් උදෙසා ගාල්ල මහා නගර සභාවෙහි කැපවීම පෙන්නුම් කරයි. මේ වන විට ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ශ්‍රම බලකායේ කාන්තා සහ තරුණ සහභාගිත්වය අවම වන අතර එය 2030 වන විට කාන්තාවන් 10%ක් සහ තරුණයන් 40%ක් දක්වා වැඩි කෙරෙනු ඇත. වෘත්තීය නිපුණතා ඉහළ නැංවීම තුළින් නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ශ්‍රම බලකායට ඇති පිළිගැනීම ඉහළ නැංවීමට මෙම මූලාරම්භය ධනාත්මක බලපෑමක් ඇති කරයි.

5. ගාල්ල මහා නගර සභාවෙහි ලියාපදිංචි විකල්ප නිෂ්පාදකයන්/නිෂ්පාදන සංවර්ධකයන්

ප්ලාස්ටික් සහ අනෙකුත් කසළ ජනනය අවම කිරීම සඳහා විකල්ප නිෂ්පාදකයන්/ නිෂ්පාදන සංවර්ධකයන් ප්‍රවර්ධනය කිරීම වැදගත් වේ. මෙම ප්‍රයත්නයේ දී විකල්ප නිෂ්පාදන සංවර්ධකයන්ගේ/නිෂ්පාදකයන්ගේ දායකත්වය හඳුනා ගැනීම සහ නව විකල්ප නිෂ්පාදන සංවර්ධකයන් ප්‍රවර්ධනය කිරීම සඳහා ගාල්ල මහා නගර සභා මට්ටමින් විධිමත් ලියාපදිංචි කිරීමේ යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම අරමුණු සහ උපායමාර්ග තුළ යෝජනා කර ඇත. මෙම මූලාරම්භය මගින් යම් කසළ වර්ග ජනනය වීම අඩු කිරීම පමණක් නොව, දේශීය සම්පත් මත පදනම් වූ ව්‍යවසායකත්වයන් විශේෂයෙන් කාන්තාවන් සහ තරුණයන් අතර, දිරිමත් කෙරෙනු ඇති අතර එමගින් සාර්ථක ඝන අපද්‍රව්‍ය කළමනාකරණයකට සහ දේශීය ආර්ථික සංවර්ධනයට මග පාදනු ඇත. දැනට,

ගාල්ල මහා නගර සභාවෙහි එවැනි විකල්ප නිෂ්පාදකයන්/නිෂ්පාදන සංවර්ධකයන් ලියාපදිංචි කිරීමට යාන්ත්‍රණයක් නොමැත. එවැනි යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කෙරෙන විට, 2030 වන විට අවම වශයෙන් නිෂ්පාදකයන් 100ක් ලියාපදිංචි කිරීමට අපේක්ෂා කෙරෙනු ඇති අතර, එයින් 60/100 හෝ ඊට වැඩි ප්‍රමාණයක් කාන්තාවන් ද 30/100 හෝ ඊට වැඩි ප්‍රමාණයක් තරුණයන් ද විය යුතු ය.

## 6. ස්වෙච්ඡා සේවකයන්/ස්වෙච්ඡා කණ්ඩායම් විසින් හසුරුවනු ලබන කසළ ප්‍රමාණය

සාර්ථක ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පද්ධතියක් සඳහා ගාල්ල මහා නගර සභාව විසින් ගත යුතු එක් ප්‍රධාන මූලාරම්භයක් වන්නේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය තුළ ස්වේච්ඡා සේවකයන් /ස්වේච්ඡා කණ්ඩායම් දිරිමත් කිරීම සහ ක්‍රියාකාරීව සම්බන්ධ කර ගැනීමයි. දැනට, එසේ කිරීමට යාන්ත්‍රණයක් නොමැති බැවින්, විස්තීරණ යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම ප්‍රමුඛතාවක් විය යුතු ය. ගාල්ල මහා නගර සභාව ඔවුන් සමඟ දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ව්‍යාපාර පුරා සහයෝගයෙන් කටයුතු කළ යුතු අතර එය පුරවැසියන් අතර සමාජ හැසිරීම් වෙනසක් ඇති කිරීමට මං පාදයි. මෙම ස්වේච්ඡා කණ්ඩායම්වලට පාසල් සිසුන්, දහම් පාසල් දරුවන්, උපකාරක පන්තිවලට සහභාගිවන්නන්, පරිසර කණ්ඩායම්වල නියෝජිතයන්, හිතෛෂීන් ඇතුළත් විය හැකි ය. මෙම ස්වේච්ඡා සේවකයන්/ස්වේච්ඡා කණ්ඩායම්වල ක්‍රියාකාරී නියැලීම ගාල්ල මහා නගර සභාව සමග ඒකාබද්ධ ක්‍රියාකාරකම්වල දී ඔවුන් විසින් හසුරුවන කසළ ප්‍රමාණය මත පදනම්ව තක්සේරු කරනු ලැබේ.

## 7. මහා නගර සභා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ආදායම වැඩි කිරීම

COSA සහ අරමුදල් විකල්ප වාර්තාවලට අනුව, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ආශ්‍රිත මාර්ගවලින් ගාල්ල මහා නගර සභාවෙහි වාර්ෂික ආදායම වාර්ෂික වියදම්වලින් 6%ක් වන අතර, එම නිසා ගාල්ල මහා නගර සභාවට ගාල්ල මහා නගර සභාවෙහිම අනෙකුත් ආදායම් මෙන්ම අයවැය අරමුණු සඳහා මධ්‍යම/පළාත් රජය වැනි බාහිර අරමුදල් මූලාශ්‍ර මත යැපීමට සිදු වේ. 2022 දී මුළු 3R/ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පිරිවැය රු. 172,688,261.16ක් වූ අතර මුළු ආදායම රු. 10,644,942.00ක් විය. එබැවින්, 2030 වන විට ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ආශ්‍රිත මාර්ගවලින් උත්පාදනය කෙරෙන නාගරික ආදායම අවම වශයෙන් එහි ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වියදමෙන් 50%ක් ආවරණය වන පරිදි වැඩි කිරීමට මුලපිරීම අත්‍යවශ්‍ය වේ. ඒ අතරතුර වෙනත් විකල්ප (උදා: රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව පදනම් කරගත් ද්‍රව්‍ය ප්‍රතිසාධන පහසුකම) හරහා සේවා පිරිවැය අඩු කිරීමට උපායමාර්ග සෙවිය යුතු ය.

## 8. ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා පවතින නෛතික ලේඛන

ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමට ඉඩ හසර ලබා ගැනීම සඳහා, ක්‍රියාවලියෙහි දී මුහුණ පෑමට සිදු වන අභියෝග මත පදනම්ව, ගාල්ල මහා නගර සභාව සතුව විශේෂයෙන් බලාත්මක කිරීම, ආදායම් උත්පාදනය, කාන්තා හා තරුණ සහභාගිත්වය සහතික කිරීම යනාදිය සම්බන්ධ ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ග ඉලක්ක කරගත් අත්‍යවශ්‍ය හා වැදගත් නෛතික හා ආයතනික බලතල පැවතිය යුතු ය. දැනට, දකුණු පළාත් සභාවේ සම්මත අතුරු ව්‍යවස්ථාව (අංක 1834 - 2013.10.25, අංක 1834 - 2013.10.27) මගින් බොහෝ බලතල ගාල්ල මහා නගර සභාව (සහ අනෙකුත් පළාත් පාලන ආයතන) වෙත පවරා ඇත. කෙසේ වෙතත්, මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන තුළ යම් යම් තීරණ ගැනීමට නොහැකි වන අවස්ථා තිබිය හැකි ය. එබැවින් ගාල්ල මහා නගර සභා බල ප්‍රදේශ තුළ නව අතුරු ව්‍යවස්ථා බලාත්මක කරනු ලැබිය යුතු ය. ගාල්ල මහා නගර සභාව විසින් එවැනි අවශ්‍යතා හඳුනාගෙන අවශ්‍ය විට සුදුසු අතුරු ව්‍යවස්ථා සකස් කර සම්මත කළ යුතු ය.

9. ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මනා පරිචයන් සඳහා ගාල්ල මහා නගර සභාව ලබන සම්මාන/සහතික

තිරසර හා විස්තීර්ණ ඝන අපද්‍රව්‍ය කළමනාකරණයක් සඳහා ගාල්ල මහා නගර සභාවේ සහ එහි පුරවැසියන්ගේ කැපවීම, එලෙස ඝන අපද්‍රව්‍ය කළමනාකරණයෙහිලා යොදන ලද කැපවීම සහ නව්‍ය මනා පරිචයන් සඳහා ගාල්ල මහා නගර සභාව වෙත ලැබෙන සම්මාන හෝ සහතික සංඛ්‍යාව මගින් පෙන්නුම් කෙරේ. සම්මාන/සහතික ලැබීමෙන් ඇඟවෙන්නේ ගාල්ල මහා නගර සභාව විසින් "ශ්‍රී ලංකාවේ පිවිතුරුම ගමනාන්තය" බවට පත් වීමේ ස්වකීය දැක්ම උදෙසා මූලාරම්භයන් ගනිමින් සිටින බවයි. ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්ම සාර්ථකව ක්‍රියාත්මක කිරීම මගින් ගාල්ල මහා නගර සභාව හට 2030 දක්වා සෑම වසරකම අවම වශයෙන් එක් සම්මානයක්/ සහතිකයක් ලබා ගැනීමට උපකාරී වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

10. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා බාහිර පාර්ශ්වයන්ගෙන් ලබා ගන්නා ආයෝජන ප්‍රමාණය

ආදායම වැඩි කිරීම සඳහා ස්ථාවර මාර්ග ගවේෂණය කරන අතරම, ගාල්ල මහා නගර සභාව විසින් සාර්ථක ඝන අපද්‍රව්‍ය කළමනාකරණයක් සඳහා බාහිර ආයතන/පාර්ශ්වකරුවන් සමඟ සහයෝගිතාවක් ගොඩනඟා ගැනීම සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියේ අවශ්‍ය ඇතැම් වැඩිදියුණු කිරීම්වලට ආයෝජන අරමුදල් ලබා ගැනීම වැදගත් වේ. දැනට, එවැනි ආයෝජන අරමුදල් ලබා ගැනීම සඳහා ගාල්ල මහා නගර සභා  මට්ටමින් එවැනි මූලාරම්භයක් ගෙන නොමැති බැවින්, එවැනි යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීමත් සමග, ගාල්ල මහා නගර සභාව විසින් ආයෝජන ගණනාවක් රැස් කරමින් වසර 2030 වන විට ආසන්න වශයෙන් රු. 7,000,000,00ක ආයෝජන රැස් කිරීමේ ඉලක්කයකට යා යුතු ය.

11. සමාජ හැසිරීම් වෙනසක් අරමුණු කර ගනිමින් සංවිධානය කෙරෙන අවස්ථා (ව්‍යාපාර, දැනුවත් කිරීමේ සැසි, තරග)

පුරවැසියන්, පාර්ශ්වකරුවන්ගේ කණ්ඩායම් සහ ගාල්ල මහා නගර සභා කාර්ය මණ්ඩලය ද අතර සමාජ හැසිරීම් වෙනස් කිරීම කෙරෙහි අවධානය යොමු කරමින්, ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්ම මගින් විවිධ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට යෝජනා කර ඇත (උදාඃ ප්‍රචාරණ, දැනුවත් කිරීමේ සැසි, තරග). මෙවන් ආකාරයේ සමාජ හැසිරීම් වෙනසක් සඳහා ගාල්ල මහා නගර සභාවෙහි කැපවීම සහ එවැනි මූලාරම්භයන්හි සාර්ථකත්වය කාලයාගේ ඇවෑමෙන් පවත්වනු ලබන වැඩසටහන් සංඛ්‍යාවෙන් පිළිබිඹු විය හැකි ය. එබැවින්, ගාල්ල මහා නගර සභාව විසින් 2030 වන විට අවම වශයෙන් එවැනි වැඩසටහන් 20ක් පවත්වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ඇමුණුම 1:

18: වගුව සවිස්තරාත්මක දැක්ම-දිශානත SWOT විශ්ලේෂණය

| **ශක්තීන්:** | **දුර්වලතා:** |
|---|---|
| - ගාල්ල මහා නගර සභාවෙහි දැනට පවතින ඝන අපද්‍රව්‍ය කළමනාකරණ යාන්ත්‍රණය<br>- ගෘහස්ථ, වාණිජ, කාර්මික සහ සේවා අංශ සඳහා සපයනු ලබන දොරින් දොරට ළඟා වී කසළ එකතු කිරීමේ නිත්‍ය සේවාව<br>a) වෙන් කළ අපද්‍රව්‍ය දිරාපත් වන - තෙත් (WET) සහ දිරාපත් නොවන - වියළි (DRY) කසළ ලෙස එකතු කිරීම<br>b) දෛනික සාමාන්‍ය අපද්‍රව්‍ය එකතු කිරීම - දිනකට ටොන් 22 (තෙත් -15.5 t/d / වියළි - 4 t/d මිශ්‍ර- 2 t/d )<br><br>- ඵලදායී ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සේවාවක් සැපයීම සඳහා යටිතල පහසුකම් සැපයීම.<br>a) ට්‍රැක්ටර් සහ කොම්පැක්ටර් ඇතුළු අපද්‍රව්‍ය එකතු කරන වාහන 30ක්<br>b) පුහුණු තාක්ෂණික කාර්ය මණ්ඩලය සමග ගාල්ල මහා නගර සභා පරිශ්‍රයේ ගාල්ල මහා නගර සභාවේ වාහන අලුත්වැඩියා වැඩමුළුව පැවැත්වීම<br><br>-ඵලදායී ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සේවා සැපයීම සඳහා ගාල්ල මහා නගර සභා පරිශ්‍රයේ ගාල්ල මහා නගර සභාව සතු පිරවුම් මධ්‍යස්ථානය.<br><br>- ඵලදායී ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සේවා සැපයීම සඳහා ගාල්ල මහා නගර සභාවෙහි කැප වූ ශ්‍රම බලකාය (උදා: ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා සෘජුවම වගකිව යුතු නිලධාරීන් - ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අධීක්ෂකයන් 15 සහ කම්කරුවන් - 110)<br><br>- හෙක්ටයාර 1.72ක භූමි ප්‍රමාණයකින් යුත් හීන්පැන්දල කසළ වෙන් කිරීමේ සහ බැහැරලීමේ අංගනය<br><br>-ටොන් 50ක ධාරිතාවක් සහිත හීන්පැන්දල දැනට පවතින කවාෂිමා කොම්පෝස්ට් කම්හල<br><br>-ඉදිකිරීම් අපද්‍රව්‍ය හා වීදුරු අපද්‍රව්‍ය එකතු කිරීම සඳහා ටොන් 5ක ධාරිතාවක් සහිත දඩල්ල ප්‍රදේශයේ දැනට පවතින COWAM මධ්‍යස්ථානය<br><br>-1 t/d ධාරිතාවයකින් යුත් PET බෝතල් එකතු කිරීමේ හා පිරියම් කිරීමේ මධ්‍යස්ථානය<br><br>-ප්ලාස්ටික් (ආසන්න වශයෙන් මසකට මෙට්‍රික් | -මහා නගර සභාවේ සේවා පිරිවැය සැලකිය යුතු ලෙස ඉහළය (ආසන්න වශයෙන් මෙ.ටොන් එකකට රු. 21,359.00)<br>-ඵලදායී ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාත්මක කිරීම සඳහා ගාල්ල මහා නගර සභාවෙහි භෞතික හා මූල්‍ය සම්පත් හිඟය.<br>a) අපද්‍රව්‍ය එකතු කරන වාහනවලින් බහුතරයක් ඒවායෙහි භාවිත කාලය ඉක්මවා ඇත (භාවිත කරන වාහන සැලකිය යුතු සංඛ්‍යාවක නිෂ්පාදිත වසර 1987, 1989 ආදී වශයෙන් වේ. ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වාහන 30න් 14ක භාවිත කාලය දැනටමත් ඉක්මවා ඇත)<br>b) නිරන්තර යන්ත්‍රෝපකරණ බිඳවැටීම් සහ ඒවා සැකසීම සඳහා මූල්‍ය සම්පත් හිඟය<br>c) ගාල්ල මහා නගර සභා ප්‍රදේශය තුළ පටුමාර්ගවලට ප්‍රවේශ වීමට සුදුසු අපද්‍රව්‍ය එකතු කිරීමේ වාහන නොමැතිකම<br>d) ගාල්ල මහා නගර සභාව සතුව වාහන පිරිසිදු කිරීමේ ස්ථානයක් නොමැති අතර අවශ්‍ය මෙවලම් නොමැත.<br>e) අති නවීන MRF පහසුකම් සහ ප්‍රතිචක්‍රීකරණ පහසුකම් නොමැති වීම.<br>f) ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අධීක්ෂකයන් සහ කම්කරුවන් සඳහා ආරක්ෂණ සහ සනීපාරක්ෂක උපකරණ නොමැති කම (උදා: PPE කට්ටල)<br><br>-පවතින ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පහසුකම් පූර්ණ ධාරිතාවයෙන් ක්‍රියාත්මක නොවේ (උදා: COWAM මධ්‍යස්ථානයේ වීදුරු එකතු කිරීමේ පහසුකම)<br><br>-ගාල්ල මහා නගර සභාවෙහි ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ශ්‍රමබලකායට අදාළ ගැටලු<br>a) ඵලදායී ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා නිපුණතා සහ දැනුමැති මිනිස් බලය නොමැති කම (උදා: අර්ධ-නිපුණ කම්කරුවන් සඳහා ගාල්ල මහා නගර සභාවෙහි වර්තමාන පුරප්පාඩු සංඛ්‍යාව 40කි)<br>b) අවම සාමාන්‍ය වැටුප් (ආසන්න වශයෙන් රු 30,000 – 40,000) හා අවම සමාජ පිළිගැනීම (උදා: ආන්තිකකරණය, අසමාන සැලකීම, අගය කිරීම නොමැති කම ආදිය) හේතුවෙන් කම්කරුවන් අතර අඩු රැකියා අභිප්‍රේරණය<br>c) දැනුම නොමැති කම හේතුවෙන් රාජකාරී වේලාවන් තුළ ආරක්ෂණ සහ සනීපාරක්ෂක උපකරණ (PPE) භාවිත කිරීමට ඇති අකමැත්ත.<br>d) ඝන අපද්‍රව්‍ය කළමනාකරණයෙහි ප්‍රගතිශීලී හැසිරීම් වෙනසක් සඳහා ගාල්ල මහා නගර සභාවේ නිලධාරීන්/ කම්කරුවන් අතර ඇති අකමැත්ත (උදා: වත්මන් කසළ එකතු කිරීමේ ගමන්මාර්ග වෙනස් කිරීමට ඇති අකමැත්ත, ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේ නවීන තාක්ෂණය භාවිත කිරීමට මෙන්ම වාහන නිරීක්ෂණය කිරීම සඳහා GPS භාවිත කිරීමට ඇති අකමැත්ත)<br><br>-වර්තමාන ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ආශ්‍රිත ප්‍රතිපත්ති/ නීතිවල පරතර<br>a) වාණිජ වරාය, ධීවර වරාය, කරාපිටිය රෝහල, |

| | |
|---|---|
| ටොන් 16.5ක්), ලෝහ (මසකට මෙට්‍රික් ටොන් 27.5ක්) සහ කාඩ්බෝඩ් (මසකට මෙට්‍රික් ටොන් 12.8ක්) එකතු කරනු ලබන නගර සීමාව තුළ කසළ ඒකරාශී කරන්නන් 23 දෙනෙක්<br>-ගාල්ල මහා නගර සභා ප්‍රදේශය තුළ ගෘහස්ථ හා ආයතනික මට්ටමින් ජෛව ගෑස් ඒකක 40ක් ක්‍රියාත්මක වේ.<br>-ප්ලාස්ටික් සහ අනෙකුත් අපද්‍රව්‍ය මහා නගර සභාවේ ප්‍රධාන ඇළ මාර්ග ඔස්සේ සාගරයට පා වීම නැවැත් වීම සඳහා මොරගොඩ ඇළ (මකුලුව), මෝඩ ඇළ (කන්දෙවත්ත), කපු ඇළ යන ප්‍රදේශවල සමුද්‍රීය පෙරන (ocean strainers) තුනක් ඇත.<br><br>-ඵලදායී ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා සම්මත අතුරු ව්‍යවස්ථාවක් (දකුණු පළාත් සභාව) පැවතීම<br><br>-සම්මත අතුරු ව්‍යවස්ථාව යටතේ දැනටමත් ගාල්ල මහා නගර සභාව වෙත පවරා ඇති බලතල (උදා: තොග වශයෙන් කසළ ජනනය කරන්නන්ගෙන් සේවා ගාස්තු එකතු කිරීම, නේවාසික අපද්‍රව්‍ය වෙන් කිරීම, 3R සංකල්ප දිරිගැන් වීමේ බලය, ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ වගකීම, කසළ ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා පරිසර බලපත්‍ර නිකුත් කිරීමේ බලය, නීති විරෝධී අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීම)<br><br>-ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ආශ්‍රිත ක්‍රියාකාරකම්වල නියැලෙන පාර්ශ්වකරුවන් (රාජ්‍ය, පෞද්ගලික සහ රාජ්‍ය නොවන සංවිධාන) (උදා: පොලිස් පරිසර අංශය, HELP-O සහ ඩෙයි හර්ම් වැනි රාජ්‍ය නොවන සංවිධාන)<br><br>-කුඩා පරිමාණ ප්‍රතිචක්‍රීකරණය කරන්නන්, විකල්ප නිෂ්පාදන සංවර්ධකයන්/ නිෂ්පාදකයන් ප්‍රජා මට්ටමින් සිටීම (උදා: සන් කඩදාසි පුද්ගලික සමාගම) | බන්ධනාගාරය, ගාලු කොටුව වැනි නගරයේ කසළ සැලකිය යුතු ලෙස එකතු වන ස්ථානවල ඝන අපද්‍රව්‍ය කළමනාකරණයෙහි GMC නිරත විය යුතු ආකාරය පිළිබඳ රෙගුලාසි/ විධිවිධාන නොමැතිකම.)<br><br>b) ඇතැම් අපද්‍රව්‍ය වර්ග සඳහා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ විසඳුම් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්ති/ නීතිවල දක්වා නොමැති වීම (උදා: මාළු අපද්‍රව්‍ය, ෆයිබර් අපද්‍රව්‍ය සහ ධීවර දැල් ආදිය)<br><br>- 3R භාවිත යටතේ අකාර්යක්ෂම විසඳුම් සහ යාන්ත්‍රණ<br><br>a) කසළ අඩු කිරීමේ විකල්ප/ප්‍රතිපත්ති පිළිබඳ ප්‍රමාණවත් අවධානයක් නොමැති වීම<br><br>b) බිම් පිරවුම් හා දහනය මත අධික ලෙස යැපීම<br><br>c) අන්තරායකර අපද්‍රව්‍ය බැහැර කිරීම නොසලකා හැරීම<br><br>d) ප්‍රතිචක්‍රීකරණ රෙගුලාසි දුර්වල මට්ටමින් බලාත්මක වීම සහ ප්‍රමාණවත් ප්‍රතිචක්‍රීකරණ යටිතල පහසුකම් නොමැතිකම<br><br>e) ප්‍රමාණවත් නොවන විද්‍යුත් - අපද්‍රව්‍ය කළමනාකරණය<br><br>ප්‍රජාව සහ ආයතන විසින් යොදා ගන්නා පරිසර හිතකාමී කසළ බැහැර කිරීමේ භාවිතාවන් අල්ප වීම<br><br>a) මිරිදිය ජල මූලාශ්‍රයකට සහ තෙත් බිමකට ආසන්නව පිහිටි හීන්පැන්දල ප්‍රදේශය අනාරක්ෂිත විවෘත බැහැරලීම් (භූගත ජලය දූෂ්‍ය වීම, අවට ප්‍රදේශයේ ජෛව විවිධත්වයට ඇතිවන තර්ජන)<br><br>b) මාර්ගවල සහ පදිංචිකරුවන් නොවන ප්‍රදේශවල නීති විරෝධී ලෙස කසළ බැහැරලීම (උදා: බොම්බේ කාසල්)<br><br>c) නීති විරෝධී ලෙස කසළ දහනය (බොම්බේ කාසල් සහ මොහිදීන් වත්ත)<br><br>d) ආහාර අපද්‍රව්‍ය, උද්‍යාන අපද්‍රව්‍ය සහ දිරාපත් නොවන අපද්‍රව්‍ය (සනීපාරක්ෂක අපද්‍රව්‍ය, ප්ලාස්ටික් සහ විද්‍යුත් අපද්‍රව්‍ය ) ජල මූලාශ්‍රයන්ට, ජලාපවහන සහ හිස් ඉඩම්වලට බැහැර කිරීම (උදා: මොහෝදීන් වත්ත සහ සලාමියාව වත්ත)<br><br>-පුරවැසියන් තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සහ 3R භාවිතාවන් පිළිබඳ දැනුම සහ දැනුවත්භාවය නොමැතිකම<br><br>a) නීති විරෝධී හා විවෘත දහනයෙහි, අනාරක්ෂිත විවෘත බැහැරලීමෙහි හා අනාරක්ෂිත කසළ වෙන් කිරීමෙහි අහිතකර බලපෑම් පිළිබඳ දැනුමක් නොමැතිකම<br><br>b) ගාල්ල මහා නගර සභාව සහ ප්‍රජාව අතර සන්නිවේදනය නොමැති වීම (කසළ එකතු කිරීමේ කාලය සහ දිනයන් නොදැන සිටීම)<br><br>c) සාප්පු සවාරි අතරතුර ප්ලාස්ටික් බෑග් භාවිත කිරීම (කීල්ස්, කාගිල්ස්)<br>-ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ආශ්‍රිත ක්‍රියාකාරකම්වලට බාධා කරන ගාල්ල මහා නගර සභා ප්‍රදේශය තුළ නිතර නිතර ඇති වන ගංවතුර.<br><br>-ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධ නීති උල්ලංඝනය කරන පුද්ගලයන්/ ආයතන සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා පොලිස් පරිසර අංශයේ කාර්ය මණ්ඩල සහ සම්පත් නොමැති කම.<br><br>-නගර ව්‍යාප්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණයෙහි කාන්තා |

| | |
|---|---|
| | නියෝජනයක් නොමැතිකම (උදා: දැනට ගාල්ල මහා නගර සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේ කම්කරුවෙකු ලෙස සේවය කර ඇත්තේ එක් කාන්තාවක් පමණි)<br><br>-නගර ව්‍යාප්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණයෙහි පාර්ශ්වකරුවන්ගේ සහ විවිධ ප්‍රජා කණ්ඩායම්වල සහභාගීත්වය සක්‍රීයව ලබා ගැනීම සඳහා ගාල්ල මහා නගර සභාවේ වර්තමාන ආයතනික යාන්ත්‍රණයේ පවතින හිඩැස් |
| අවස්ථා:<br>-ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම<br><br>-මොනරෝවියා වත්ත කසළ කළමනාකරණ මධ්‍යස්ථානය (ප්ලාස්ටික් හා ආහාර අපද්‍රව්‍ය)<br><br>-ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අරමුදල් සැපයීමේ (UASID/CCBO, IGES) අවස්ථා<br><br>-ජාතික, පළාත් සහ ප්‍රාදේශීය ප්‍රතිපත්ති<br>a)ඒකපුද්ගල ප්ලාස්ටික් භාවිතය සඳහා නිර්දේශිත නීති සහ රෙගුලාසි<br><br>- විශ්වවිද්‍යාල පර්යේෂණ<br><br>- රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව සඳහා අවස්ථා (PPP)<br><br>b) INSEE අවශේෂ අපද්‍රව්‍ය<br>c) සී/ස Sisili Hanaro Encare (පුද්) සමාගම (සෞඛ්‍යය සේවා අපද්‍රව්‍ය)<br><br>d) බාහිර අපද්‍රවය ප්‍රතිග්‍රාහක (ගිංතොට, නාවින්න)<br>e) කොකා කෝලා සහ Eco Splinders (PET බෝතල්)<br><br>-වෙනත් නගරවල (මීගමුව, කුරුණෑගල, මහනුවර) ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලසුම් සහ විධිමත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ භාවිතාවන් පැවතීම<br><br>-නව්‍ය ඝන අපද්‍රව්‍ය කළමනාකරණ භාවිත සහ ක්‍රමවේද ලබා ගැනීමේ හැකියාව (උදා: ස්මාර්ට් අපද්‍රව්‍ය බඳුන්, මුල් භාණ්ඩයේ වටිනාමට වැඩි වටිනාකමක් ලැබෙන පරිදි ප්‍රතිචක්‍රීකරණය කිරීම (upcycling), කසළ කළමනාකරණ පහසුකම් (waste banks))<br><br>-චක්‍රීය ආර්ථිකය (සම්පත් ප්‍රතිචක්‍රීකරණය) | තර්ජන:<br>-වෙනත් රටවල සමුද්‍රීය කසළ<br>-අවට පළාත් පාලන ආයතන ප්‍රදේශයන්ගෙන් අපද්‍රව්‍ය<br>a) අපද්‍රව්‍ය ඇළ මාර්ගවලට බැහැර කිරීම නිසා ජල මූලාශ්‍ර දූෂ්‍ය වීම<br><br>-සතත්ව ඝාතකාගාර අපද්‍රව්‍ය, විද්‍යුත් අපද්‍රව්‍ය, අන්තරායකර අපද්‍රව්‍ය සඳහා නොපවතින විසඳුම්<br><br>-150,000ක් වන දෛනික සංගමන ජනගහනය අපද්‍රව්‍ය ප්‍රමාණය වැඩි කිරීම (සංචාරකයන් ද ඇතුළුව)<br>a) නීති විරෝධී ලෙස කසළ බැහැර කිරීම (මසකට නඩු 20ක් - පොලිස් කොට්ඨාසය)<br><br>-ප්‍රතිචක්‍රීකරණය කළ අයිතම සඳහා අඩු වෙළඳපොළ මිල (උදා: කාඩ්බෝඩ්, ටින්)<br><br>-ඝන අපද්‍රව්‍ය කළමනාකරණය හා සම්බන්ධ රෙගුලාසි නිසි ලෙස ක්‍රියාත්මක නොකිරීම<br><br>-උද්ධමනය<br>-බලශක්ති පිරිවැය වැඩි වීම (විදුලි බලය)<br>-වාහන මිලදී ගැනීමේ පිරිවැය වැඩි වීම<br>-දේශගුණික විපර්යාස<br>-සීමිත බිම්පිරවුම් ධාරිතාව<br>-වාණිජ වරායට පැමිණෙන නෞකා මගින් විශාල හා අන්තරායකර අපද්‍රව්‍ය බැහැර කිරීම<br>-නාගරික ගංවතුර සහ වඩදිය බාදිය<br>-වඩා ලාභදායී හා පහසු වෙළඳපොළ ආනයනික නිෂ්පාදන<br>-මහජන දැනුවත්භාවය නොමැතිකම |

| | |
|---|---|
| -ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය සඳහා වෙළඳපොළ වැඩිදියුණු කිරීම<br><br>-CSR අරමුදල්<br><br>-ලෝක උරුම නගරයක් බවට පත් වීම<br><br>a) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අරමුදල් ලබා ගැනීමට ඉහළ හැකියාවක්<br><br>b) SW අඩු කිරීමේ විකල්ප නිෂ්පාදන/ ක්‍රියාවලීන් හරහා ඉපැයීම් සඳහා ඉහළ විභවයක්<br><br>c) ඵලදායී ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අමතර ඉපැයීම් මූලාශ්‍ර ලබා ගැනීම<br>අවස්ථාඃ<br><br>d) ඝන අපද්‍රව්‍ය කළමනාකරණයෙහිලා ආදර්ශ නගරයක් බවට පත්වීමට ඉහළ විභවතාවක් පැවතීම | |

## ඇමුණුම 2:

## 3R/ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සේවා සැපයීමේ පිරිවැය

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය හා සම්බන්ධ සේවා බෙදාහැරීමේ පිරිවැය කසළ එකතු කිරීම, ප්‍රවාහනය, පිරිසැකසුම, වීදි අතුගා දැමීම, ජල මාර්ග/නීතිවිරෝධීව ඉවතලන කසළ කසල පිරිසිදු කිරීම සහ අවසන් බැහැර කිරීම යන මාතෘකා යටතේ සාකච්ඡා කෙරේ.

### කසළ එකතු කිරීමේ පිරිවැය

ගාල්ල මහා නගර සභාවෙහි ඝන අපද්‍රව්‍ය එකතු කිරීමේ පිරිවැය මගින් ගෘහයන්, වාණිජ, සේවා සහ කර්මාන්ත අංශයේ ආයතන මගින් ජනනය වන ඝන අපද්‍රව්‍ය එකතු කිරීම, වීදි පිරිසිදු කිරීම, ජල මාර්ග සහ නීති විරෝධී ලෙස බැහැර කෙරෙන කසළ පිරිසිදු කිරීම් මෙන්ම එකතු කරනු ලබන කසළ හීන්පැන්දල මධ්‍යම එකතුකිරීමේ සහ බැහැර කිරීමේ පහසුකම වෙත ප්‍රවාහනය කිරීමේ පිරිවැය ආවරණය කෙරේ (COSA පාදක වර්ෂය, 2022).

මේ අනුව, ගාල්ල මහා නගර සභාව කසළ එකතු කිරීමේ පිරිවැයට කසළ එකතු කිරීමේ සේවකයන්ගේ (ස්ථිර සේවකයන් 103 සහ අනියම් සේවකයන් 23) වැටුප් හා අනෙකුත් ප්‍රතිලාභ සහ වාහනයේ මෙහෙයුම් පිරිවැය සහ කසළ හැසිරවීමේ යන්ත්‍ර ඇණියෙහි මෙහෙයුම් පිරිවැය (වාහන 38 සහ යන්ත්‍ර 2) ඇතුළත් වේ.

තෙත්, වියළි, සහ ජලමාර්ග පිරිසිදු කිරීම ද ඇතුළත්ව වීදි පිරිසිදු කිරීමේ කසළ මෙ.ටොන් 8030ක සමස්ත ප්‍රමාණය එකතු කිරීමේ මුළු වාර්ෂික පිරිවැය රු. 102,430,113.72ක් වේ. ඒ අනුව, කසළ මෙ.ටොන් 1ක් එකතු කිරීම සඳහා වන සමස්ත සාමාන්‍ය පිරිවැය මෙ.ටොන් එකකට රු. 12,755ක් වේ.

එකතු කිරීමේ පිරිවැයට පිරිවැය කාණ්ඩවල දායකත්වය පහත වගුවේ දැක්වේ.

*වගුව 19 : එකතු කිරීම් පිරිවැයෙහි ප්‍රවර්ග විභේදනය*
*(මූලාශ්‍රය: COSA වාර්තාව. 2023)*

| පිරිවැය කාණ්ඩය | වාර්ෂික පිරිවැය | % |
|---|---|---|
| 1. වැටුප් හා වේතන | 72,901,648.39 | 63 |
| 2. සේවක ප්‍රතිලාභ | 1,130,070.00 | 1 |
| 3. මෙහෙයුම් හා නඩත්තු කිරීම (O&M) | 17,344,474.24 | 23 |
| 4. සාමාන්‍ය හා පරිපාලන | 1,317,292.52 | 1 |
| 5. ගාස්තු (කසළ හැසිරවීම-Tipping) | - | |
| 6. ගිවිසුම්ගත සේවා | - | |
| 7. වෙනත් පිරිවැය | - | |
| 8. ක්ෂය වීම | 9,736,628.57 | 12 |
| 9. ණය සේවා | - | |
| 10. ප්‍රාග්ධන වියදම් | - | |
| සමස්ත කසළ එකතු කිරීම් පිරිවැය | 102,430,113.72 | 100 |

## ප්‍රවාහනය/මාරු කිරීම

2022 දී ගාල්ල මහා නගර සභා කසළ ප්‍රවාහන පිරිවැයට හීන්පැන්දල සිට මොන්රෝවියා වත්ත පරිශ්‍රය වෙත එකතු කරන ලද කසළ ප්‍රවාහනය කිරීමේ පිරිවැය ඇතුළත් විය. මෙම ප්‍රවාහන පිරිවැයට ඉන්ධන, මෙහෙයුම් සහ නඩත්තු පිරිවැය සහ මෙම මෙහෙයුම සඳහා භාවිත කළ ට්‍රක් රථයේ ක්ෂයවීම් ඇතුළත් වේ.

සමස්ත තෙත් සහ වියළි කසළ මෙ.ටොන් 6,195ක් ප්‍රවාහනය කිරීම සඳහා මුළු වාර්ෂික පිරිවැය රු. 17,906,427.00කි. එබැවින්, කසළ මෙ.ටොන් 1ක් ප්‍රවාහනය කිරීම සඳහා සමස්ත සාමාන්‍ය පිරිවැය මෙ.ටොන් එකකට රුපියල් 2,890.50ක් වේ.

ප්‍රවාහන පිරිවැය සඳහා පිරිවැය කාණ්ඩවල දායකත්වය පහත වගුවෙහි දැක්වේ.

වගුව 20 : කසළ ප්‍රවාහන පිරිවැය
*(මූලාශ්‍රය: COSA වාර්තාව. 2023)*

| පිරිවැය කාණ්ඩය | වාර්ෂික පිරිවැය |
|---|---:|
| 1. වැටුප් හා වේතන | 11,402,875.00 |
| 2. සේවක ප්‍රතිලාභ | |
| 3. මෙහෙයුම් හා නඩත්තු කිරීම් (O&M) | 4,363,552.00 |
| 4. සාමාන්‍ය හා පරිපාලන | - |
| 5. ගාස්තු (කසළ හැසිරවීම-Tipping) | - |
| 6. ගිවිසුම්ගත සේවා | - |
| 7. වෙනත් පිරිවැය | - |
| 8. ක්ෂය වීම | 2,140,000.00 |
| 9. ණය සේවා | - |
| **සමස්ත මාරු කිරීම් - ප්‍රවාහන පිරිවැය** | **17,906,427.00** |

මොන්රෝවියා වත්තට යැවීම සඳහා හීන්පැන්දල පරිශ්‍රයේ කසළ නැවත පැටවීමේ මෙහෙයුම් කටයුතුවල නිරත වූ වාහන-යන්ත්‍ර ඇණිය සහ කම්කරුවන් සඳහා වියදම ද මෙම පිරිවැයට ඇතුළත් වේ

## වෙන් කළ කසළ පිරියම් කිරීම - COWAM මධ්‍යස්ථානය

වෙන් කරන ලද කසළ පිරියම් කිරීමේ පිරිවැය යනු ද්‍රව්‍ය ප්‍රතිසාධන පහසුකම මගින් එහි ක්‍රියාකාරිත්වය සහ නඩත්තුව සඳහා දරනු ලබන පිරිවැය වේ. වැටුප් හා සේවක ප්‍රතිලාභ ඇතුළුව ශ්‍රම බලකාය සඳහා ගෙවීම් මෙන්ම භාවිතයේ පවතින යන්ත්‍ර උපකරණවල නඩත්තු කිරීමේ සහ අනෙකුත් මෙහෙයුම් සහ ක්ෂයවීම් වියදම් මෙයට ඇතුළත් වේ.

21 වගුව: COWAMහි වෙන් කළ කසළ පිරියම් කිරීමේ පිරිවැය
(මූලාශ්‍රය: *COSA* වාර්තාව, 2023)

| වැය විෂය | පිරිවැය (රු.) |
|---|---|
| පෞද්ගලික සේවා | |
| වැටුප් හා වේතන | 1,801,253 |
| සේවක ප්‍රතිලාභ | |
| නඩත්තු හා වෙනත් මෙහෙයුම් වියදම් | |
| විදුලිය | 42,720 |
| ඉන්ධන, තෙල් හා ලිහිසි තෙල් | |
| වෙනත් සැපයුම් හා ද්‍රව්‍ය | 29400 |
| මූල්‍ය වියදම් | |
| පොලී වියදම් | |
| මුදල් නොවන වියදම් | |
| ක්ෂය වීම (Building Crusher/Baler/Bob cat) | 321,083 |
| ඉඩම් වටිනාකම (නඩත්තු වටිනාකම)) | - |
| ලීසිං වටිනාකම | |
| එකතුව | 1,873,373.00 |

පරිශ්‍රයේ ඇති ප්‍රධාන වියළි කසළ පිරියම් කිරීමේ ඒකක තුන සඳහා සම්පත් යෙදවීම් ප්‍රතිශතයට සමානුපාතිකව පිරිවැය පහත වගුවෙහි දක්වා ඇත.

වගුව 22: ගාල්ල මහා නගර සභාවේ දඩැල්ල COWAM පහසුකමෙහි
කසළ පිරියම් කිරීමේ පිරිවැය විභේදනය

(මූලාශ්‍රය: *COSA* වාර්තාව, 2023)

| පහසුකම | යොදාගත් සම්පත් ප්‍රමාණය (%) (%) | පිරියම් කළ ප්‍රමාණය (මෙ.ටොන්) | භාවිත කළ ධාරිතාව ප්‍රතිශතයක් වශයෙන් | වාර්ෂික පිරිවැය (රුපියල්) | වාර්ෂික ආදායම (රුපියල්) | ලාභ හෝ පාඩු (-) | ඒකකයක් සඳහා පිරිවැය (මෙ.ටොන් එකකට රු.) |
|---|---|---|---|---|---|---|---|
| ගොඩනැගිලි ද්‍රව්‍ය ප්‍රතිසාධනය | 40 | 450 | 22.5% | 877,782 | 1,575,000 | 697,218 | 1950 |
| PET එකතු කිරීම | 40 | 630 | 12.33% | 877,782 | 6,500 | -871,282 | 1393 |
| වීදුරු අපද්‍රව්‍ය එකතු කිරීම | 20 | 45 | 0.17% | 438,891 | 125, 000 | -313,891 | 9753 |

## අවසන් බැහැර කිරීමේ පිරිවැය

කසළ අවසන් බැහැර කිරීම පහත සඳහන් පරිදි ප්‍රවේශයන් දෙකකින් සමන්විත වේ.

- ✧ අවශේෂ/මිශ්‍ර/ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි කසළවලින් කොටසක් හීන්පැන්දල ගාල්ල මහා නගර සභා පරිශ්‍රයට බැහැර කිරීම සහ
- ✧ මොන්රෝවියා වත්ත කොම්පෝස්ට් සහ කසළ ප්‍රතිසාධන පහසුකම මගින් සමස්ත තෙත් කසළ එකතුව සහ ඉතිරි වියළි කසළ කොටස බැහැර කිරීම.

විශ්ලේෂණයට අනුව, හීන්පැන්දල දී කසළ අවසාන් බැහැර කිරීම සඳහා වන පිරිවැය හීන්පැන්දල පරිශ්‍රයේ සම්පූර්ණ මෙහෙයුම් පිරිවැයෙන් 20%කට සමාන වේ. හීන්පැන්දල පරිශ්‍රයෙහි කසළ පිරියම් කිරීමේ පිරිවැය ප්‍රභේදනය පහත වගුවෙන් පෙන්නුම් කෙරේ.

වගුව 23: හීන්පැන්දල පහසුකමෙහි කසළ පිරියම් කිරීමේ පිරිවැය විභේදනය

(මූලාශ්‍රය: *COSA* වාර්තාව, 2023)

| පිරිවැය කාණ්ඩය | වාර්ෂික පිරිවැය |
|---|---|
| 1. වැටුප් හා වේතන | 3,546,712.19 |
| 2. සේවක ප්‍රතිලාභ | - |
| 3. නඩත්තු හා වෙනත් මෙහෙයුම් වියදම් (O&M) | - |
| 4. සාමාන්‍ය හා පරිපාලන | - |
| 5. ගාස්තු (කසළ හැසිරවීම-Tipping) | - |
| 6. ගිවිසුම්ගත සේවා | - |
| 7. වෙනත් පිරිවැය | - |
| 8. ක්ෂය වීම | 2,980,000.00 |
| 9. ණය සේවා | |
| 10. ප්‍රාග්ධන වියදම් | - |
| සමස්ත කසළ පිරියම් කිරීම සඳහා පිරිවැය | **6,526,712.19** |

මේ අනුව, හීන්පැන්දල පරිශ්‍රයෙහි කසළ අවසන් බැහැර කිරීමේ පිරිවැය රු. 1,305,342ට (රු. 6,526,712.19න් 20%) සමාන වේ.

මොන්රෝවියා වත්ත පහසුකම හරහා කසළ බැහැර කිරීමේ පිරිවැය යනු ඉහත දක්වා ඇති පරිදි කසළ මාරු කිරීමේ පිරිවැය වන (එනම් හීන්පැන්දල කසළ හැසිරවීමේ පිරිවැය සහ හීන්පැන්දල සිට මොන්රෝවියා වත්තට කසළ ප්‍රවාහනය කිරීමේ පිරිවැය) රු. 17,906,427කි.

මොන්රෝවියා වත්තට කසළ යැවීම සඳහා ගාල්ල මහා නගර සභාව විසින් දකුණු පළාත් පළාත් පාලන දෙපාර්තමේන්තුවට (SPDLG) ගෙවන ලද සමුච්චිත කසළ හැසිරවීම් ගාස්තුව 2022 දී රුපියල් 4,694,250ක් විය. මෙම ගාස්තුව SPDLG විසින් ගණනය කර ඇත්තේ මොන්රෝවියා වතු කළමනාකාරිත්වය විසින් වාර්තා කරන ලද ට්‍රක් රථ සංඛ්‍යාව මත මිස බර හෝ පරිමාව අනුව මනින ලද අපද්‍රව්‍ය ප්‍රමාණය මත නොවන බව සඳහන් කළ යුතු ය.

ගණනය කිරීම්වලට අනුව, කසළ ප්‍රවර්ගය අනුව අවසන් බැහැර කිරීමේ පිරිවැය පහත පරිදි සාරාංශගත කළ හැකි ය.

*24 වගුව : කසළ ප්‍රවර්ගය හා ස්ථානය අනුව බැහැර කිරීමේ පිරිවැය විභේදනය*
(මූලාශ්‍රය: *COSA* වාර්තාව, 2023)

| බැහැර කිරීමේ පරිශ්‍රය | අපද්‍රව්‍ය ප්‍රවර්ගය | ප්‍රමාණය (මෙ.ටො) | පිරිවැය (රු) | ඒකක පිරිවැය (රු/මෙ.ටො) |
|---|---|---|---|---|
| හීන්පැන්දල | වියළි කසළ | 720 | 656,671 | 912.04 |
| | වෙන් නොකළ කසළ | 720 | 656,671 | 912.04 |
| මොන්රෝවියා වත්ත | තෙත් කසළ | 5475 | 15,820,473 | 2,889 |
| | වියළි කසළ | 720 | 6,780,203 | 9,416 |

## වීදි පිරිසිදු කිරීම (Street Sweeping)

වීදි පිරිසිදු කිරීමේ පිරිවැයට පහත වගුවේ දක්වා ඇති පරිදි වේතන සහ සේවකයන් සඳහා වෙනත් ප්‍රතිලාභ ඇතුළත් වේ.

*25 වගුව : වීදි පිරිසිදු කිරීමේ පිරිවැය විභේදනය*
(මූලාශ්‍රය: *COSA* වාර්තාව, 2023)

| වැය විෂය | පිරිවැය (රු.) |
|---|---|
| පෞද්ගලික සේවා | |
| වැටුප් හා වේතන | 658,809.68 |
| සේවක ප්‍රතිලාභ | |
| නඩත්තු සහ අනෙකුත් මෙහෙයුම් වියදම් (උපකරණ මිලදී ගැනීමේ පිරිවැය) | |
| වෙනත් සැපයුම් හා ද්‍රව්‍ය | |
| මුළු පිරිවැය | 658,809.68 |

වීදි පිරිසිදු කිරීමේ පිරිවැයට මෙම කාර්යය සඳහා යොදවා ඇති කම්කරුවන් දෙදෙනෙකුගේ වැටුප් සහ වේතන ඇතුළත් වේ. එකතු කරන ලද කසළ අදාළ ගමන්මාර්ගයේ සාමාන්‍ය කසළ එකතු කිරීමේ වාහන මගින් ප්‍රවාහනය කරන ලද බැවින්, මෙම පිරිවැය කාණ්ඩයට අමතර ප්‍රවාහන පිරිවැයක් ඇතුළත් නොවේ. විශ්ලේෂණයට අනුව, වීදි පිරිසිදු කිරීමෙන් මුළු වාර්ෂික කසළ එකතුව මෙ.ටොන් 180ක් වන අතර, ඒ අනුව වීදි පිරිසිදු කිරීම සඳහා ඒකක පිරිවැය මෙ. ටොන් එකකට රු. 3,660 වේ.

### ජල මාර්ග සහ නීතිවිරෝධී බැහැරලීම් පිරිසිදු කිරීම

ජල මාර්ග සහ නීතිවිරෝධී බැහැරලීම් පිරිසිදු කිරීමේ පිරිවැය යනු එකතු කිරීමට පෙරාතුව, නගරය හා ඒ අවට ඇති ගංගා ඇළ දොළ, ජලාපවහන සහ අගල් පිරිසිදු කිරීම සම්බන්ධ පිරිවැය වේ. කසළ එකතු කරන ස්ථාන ලෙස නීත්‍යානුකූලව නම් කර නොමැති ස්ථානවල බැහැරලන කසළ පිරිසිදු කිරීම ද ඊට ඇතුළත් ය.

*වගුව 26 : ජල මාර්ග හා නීති විරෝධී ලෙස කසළ බැහැරලීම් ස්ථාන පිරිසිදු කිරීමේ පිරිවැය ප්‍රභේදනය*

(මූලාශ්‍රය: *COSA* වාර්තාව, 2023)

| වැය විෂය | පිරිවැය (රු.) |
|---|---:|
| පෞද්ගලික සේවා | |
| වැටුප් හා වේතන | 19,316,232.00 |
| සේවක ප්‍රතිලාභ | |
| නඩත්තු සහ අනෙකුත් මෙහෙයුම් වියදම් | |
| වෙනත් සැපයුම් හා ද්‍රව්‍ය | 318,7069 |
| මුළු පිරිවැය | 21,949,540 |

ගාල්ල මහා නගර සභාවෙහි ඉංජිනේරු දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවය කරන අධීක්ෂකවරුන් ඇතුළු කම්කරුවන් 79 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් විසින් මෙම මෙහෙයුම සිදු කරන ලදි. මෙය ප්‍රධාන කාර්යයක් වන බැවින්, මෙහෙයුම් සඳහා සැහැල්ලු උපකරණ වැනි අනෙකුත් සැපයුම් ද ඇතුළුව පිරිවැය ගණනය කිරීම් සඳහා ඔවුන්ගේ කාලයෙන් 60%ක් වෙන් කිරීමෙන් සලකා බලන ලදි. එකතු කළ ද්‍රව්‍ය කසළ එකතු කිරීමේ වාහන මගින් ප්‍රවාහනය කරන ලද බැවින් මෙම මෙහෙයුම සඳහා අමතර ප්‍රවාහන පිරිවැයක් නොවීය. විශ්ලේෂණයට අනුව, මුළු වාර්ෂික එකතුව මෙට්‍රික් ටොන් 365ක් වන අතර ඒ අනුව ඒකක පිරිවැය (මෙ'ටො එකකට රු. 85,163) ලෙස ඉහළ අගයක් වේ.

## පරිපාලන පිරිවැය

COSA මෙවලම් මාර්ගෝපදේශයට (2022) අනුව, ප්‍රජා ප්‍රවේශය, බලාත්මක කිරීම, මූල්‍ය කළමනාකරණය, මානව සම්පත්, සැලසුම් කිරීම සහ ප්‍රතිපත්ති සංවර්ධනය යනාදී ගාල්ල මහා නගර සභාවෙහි සමස්ත 3R/ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය කළමනාකරණය කිරීම සඳහා වන ක්ෂේත්‍ර පාදක වියදම්, පරිපාලන පිරිවැයට ඇතුළත් විය යුතු ය. මෙම පිරිවැය ගණනය කර සැබෑ අගය සොයා ගැනීම සඳහා අවශ්‍ය දත්ත කට්ටල ලබා ගැනීමට නොහැකි වූ බවද අවධානයට ලක් විය.

කෙසේ වෙතත්, පවතින COS මධ්‍යස්ථානවලින් එක්රැස් කරන ලද දත්ත අනුව, 2022 වර්ෂයේදී ප්‍රජා සත්කාරක පිරිවැය රු 952,800.00 (මෙ.ටොන් එකකට රු. 124 ක්) වූ අතර, මූල්‍ය කළමනාකරණයේ පිරිවැය රු. 6,665,992.00 ( මෙ.ටොන් එකකට රු. 865 ක්) විය. ප්‍රධාන ගණකාධිකාරීවරයා ඇතුළු ගාල්ල මහා නගර සභාව ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය මෙම තොරතුරු ලබා ගැනීමේ ප්‍රතිලාභය සහ මෙම අභ්‍යාසය පහසු කිරීම සඳහා 3ඝෘ/ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ආශ්‍රිත මූල්‍ය දත්ත කළමනාකරණ පද්ධතිය යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාව තහවුරු කරන ලදි.